ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)
Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative

The Diamond Realty Inc.
Tel: 416 822 2789
www.gaminiabeysinghe.com

Pages 52 MAY 2019 Issue : 113 මාසික සංග්‍රහය 2019 මැයි, 113 කලාපය $ 1.00



කොයි හංවඩුව ඇති වුව ආගමැයි කියා
කොයි පණිවිඩය තිබිණිද බයිබලේ ලියා
'ආදරයයි' ආගම යනු හිතේ තියා
මල් ගෙන පුදමි ඒ ආගම ලොවේ සොයා

\- ගරු මර්සලීනු ජයකොඩි පියතුමා

# ඔන්ටේරියෝ අයවැයෙහි ප්‍රධාන යෝජනා

ඔන්ටේරියෝ PC රජයේ පළමු අයවැය මුදල් අමාත්‍ය Vic Fedeli විසින් 2019 අප්‍රේල් 11 වෙනි දින ප්‍රකාශයට පත්කරනු ලැබුණි. පුළුල් කප්පාදු රැසක් සමග එළිදැක්වුණු මෙවර අයවැයෙන් ඉදිරිපත් කෙරුණු විශේෂ යෝජනා කීපයක් මෙසේය.

## CHILD CARE TAX CREDIT

මෙවර අයවැයට අනුව Childcare tax credit ආධාරය ගෘහ ඒකකයක වාර්ෂික ආදායම ඩොලර් 150,000 දක්වා වන පිරිසට ලබාදෙනු ඇත. මෙම Childcare Access and Relief from Expenses credit (CARE) 2019 වසරේ ජනවාරි 01 දා සිට බලපවත්වන පරිදි ක්‍රියාත්මක වන බව රජය පවසයි. මෙහිදී අවම වශයෙන් එක් දරුවකු සඳහා වසරකට ඩොලර් 1,250 ක් දක්වා ලැබෙන අතර ආදායම් තත්ත්වය අනුව මෙම ආධාරය වැඩි වනු ඇත.

Childcare tax credit ආධාරය අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැඩි ප්‍රතිලාභ ලැබෙන සේ සැකසුණු වැඩසටහනකි. එහිදී වසරකට ඩොලර් 20,000 කට අඩු ආදායමක් උපයන පවුල්වල දරුවන්ට ඔවුන්ගේ මාසික වියදම්වලින් සියයට 75 ක් දක්වා ලබාගැනීමට හැක. උදාහරණයක් දැක්වුවහොත්, වයස අවුරුදු 7 ට අඩු දරුවකු සඳහා Childcare tax ලෙස වසරකට ඩොලර් 6,000 ක් පමණ ලැබේ. එසේම ඉහත ආදායම් තත්ත්වය සහිත අවුරුදු 7-16 ත් අතර පසුවන දරුවකු සඳහා වසරකට ඩොලර් 3,750 ක්ද ආබාධිත දරුවකු සඳහා වසරකට ඩොලර් 8,250 ක් පමණද ලැබේ.

දරුවන් වෙනුවෙන් ලබාදෙන මෙම ප්‍රතිපාදන සඳහා වසරකට දළ වශයෙන් ඩොලර් මිලියන 390 ක් පමණ වැය වන බව රජය පවසා සිටියි.

## CAR INSURANCE

මෙවර අයවැය මගින් මෝටර් රථවාහන සඳහා වන රක්ෂණ අනුපාත අඩු කිරීමේ සැලැස්මක් පිළිබඳව අනාවරණය කොට ඇතත් එම ක්‍රමය තුළින් රියදුරන්ට ලැබෙන ප්‍රතිලාභය කොපමණදැයි පැහැදිලි සටහනක් සිදුකොට නොමැත. නමුත් මෙම වෙනස්කම් මගින් රියදුරන්ට ලබාගත හැකි සැලසුම් පරාසය වැඩි කිරීමත් රක්ෂණ හිමිකම් සපයන්නන් අතර වැඩි තරගයක් නිර්මාණය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ වැඩි කිරීමත් සිදුකෙරෙන බව රජය පවසයි.

ඔන්ටේරියානු වැසියන් කැනඩාව තුළ ඉහළම ඔටෝ රක්ෂණ වාරිකය ගෙවන්නන් වන අතර ඒ අතරිනුත් GTA කලාපය රක්ෂණයේ උපරිම ගාස්තුවට හසුව සිටී. පැවති ලිබරල් රජය ඔටෝ රක්ෂණ ගාස්තු සියයට 15 කින් අඩු කරන බවට ජනතාව වෙත කිහිප

8 වන පිටුව බලන්න

CHAI
CANADIAN HOME APPRAISALS INC.
For Residential and Commercial

S.K.Bales CRA ,DAR, MVA Residential,FRI,CRES.
President
Bus: 416-438-2200
Cell: 416-801-3219
Email: skbales@hotmail.com
If you need a accurate and speedy appraisal for Street Capital "A" side or "B" side, Genworth Canada, CMLS Financial, Industrial Alliance, ICICI Bank, IC Savings, MCAP, RMG, Most Private Lenders, Canada Revenue Agency (CRA) and Legal and Listing Purpose you can order via our website WWW.CHAINC.CA or please contact


VESAK 2019
BUDDHA'S BIRTHDAY CELEBRATION
"Blessings on the City, the Nation, and the World."
The Largest Annual Canadian Buddhist Festival
MAY 26
SUNDAY
MISSISSAUGA CELEBRATION SQUARE
300 City Centre Drive
Mississauga
Ontario L5B 3C1
Parade: 2:00 p.m.
Program: 3:00 p.m.
For more information visit www.vesakcelebration.com
Co-organized by
West End Buddhist Temple
And Meditation Centre
Fo Guang Shan
Temple of Toronto

# මෝටර් රථ අංක තහඩුවේ වෙනසක් !

ෆෝඩ් රජයේ පළමු අයවැය ලේඛනය සභාගත කිරීම පසුගිය අප්‍රේල් 11 වෙනි දා සිදුකරනු ලැබූ අතර ඔන්ටේරියෝවේ සියලුම මෝටර් වාහන අංක තහඩු බලපත්‍ර වෙනස් කළ යුතු බවට වූ යෝජනාවක්ද එයට ඇතුළත් කොට තිබුණි.

මෙම වාහන අංක තහඩු බලපත්‍ර වෙනස් කිරීම පිළිබඳව අයවැය මගින් යෝජනා කෙරුණද එම කතා බහ ඊට පෙර සිටම එනම් අප්‍රේල් මුල් සතියේ සිටම පුවත්පත් මගින් ප්‍රචාරය කරමින් පැවතුණි.

එම පුවත්වලට අනුව මේ වන විට වාහන අංක තහඩුවල පවතින නිල පාඨය සහ වර්ණය සහමුලින්ම වෙනස් කෙරෙනු ඇත. මේ වන විට භාවිතයේ පවතින අංක තහඩුවේ සඳහන් නිල පාඨය (official slogan) YOURS TO DISCOVER වන අතර ඒ වෙනුවට A PLACE TO GROW ලෙස පාඨය යෙදීමට නියමිතව ඇත. වර්තමානයේ නොම්මර තහඩුවෙහි සුදු පසුබිමෙහි නිල් පැහැ අකුරු මුද්‍රණය කොට ඇති අතර ඉදිරියේදී ඒ වෙනුවට නිල් පසුබිමෙහි සුදු පැහැ අකුරු සහිත නොම්මර තහඩුවක් පැමිණෙනු ඇත. එසේම මෙම නව අංක තහඩුවට ඔන්ටේරියෝවේ නව ලාංඡනය වන ට්‍රිලියම් ලාංඡනයද (Ontario Trillium logo) ඇතුළත් කොට ඇත.

මෙම නොම්මර තහඩු වෙනස් කිරීම ඉතාමත් නුදුරු කාලයේදීම සිදුකරන බවත් ඒ සඳහා වන වියදම් මහජනතාවට දැරීමට සිදු නොවන බවත් ඒ සඳහා පූර්ණ අනුග්‍රහය රජය මගින් දරණ බවත් මේ වන විට රජය ප්‍රකාශ කොට ඇත.

ඩග් ෆෝඩ් රජය විසින් ඔන්ටේරියෝ සඳහා නවතම ලාංඡනයක් (Trillium logo) එළිදැක්වීම පසුගිය දා සිදුකරනු ලැබුණු අතර මින් ඉදිරියට කාර්යාල, වෙබ් අඩවි, ප්‍රචාරණ කටයුතු, ලිපි ශීර්ෂ ඇතුළු ඔන්ටාරියෝ පළාත් රජය මගින් පාලනය කරන සියලුම කාර්යයන් සඳහා මෙම ලාංඡනය යොදා ගනු ඇත. මෙම ලාංඡනය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා ඩොලර් 89,000 ක පමණ මුදලක් වැය වී ඇතැයි මේ පිළිබඳව CBC News වෙත අදහස් දැක්වූ රජයේ නිලධාරියෙකු පවසා තිබුණි.

වසර 37 ක කාලයක් පුරා YOURS TO DISCOVER ලෙස භාවිත වුණු නොම්මර තහඩුව වෙනස් කිරීම ගැන බොහෝ දෙනෙකු විවිධ අදහස් පළ කරන අතර විශාල පිරිසක් ඊට අප්‍රසාදය පළ කොට තිබෙන ආකාරයක් දක්නට ලැබේ. බහුතරයකගේ අදහස වන්නේ පළාත තුළ සෞඛ්‍යය, අධ්‍යාපන ආදිය වැඩිදියුණු කිරීම සඳහා සිදුකළ යුතු වැදගත් කටයුතු රැසක් තිබියදී අනවශ්‍ය වෙනසක් සිදුකිරීමට රජය ජනතා බදු මුදල් නිකරුණේ වැය කරන බවකි.

# පරිස්සමින් ! කෑවත් දඩ !

දිනෙන් දින ඉහළ යන රිය අනතුරු ප්‍රමාණය පිළිබඳව සැලකිලිමත් වූ කැනඩා රජය රිය පදවන්නන් සඳහා ඉතාමත් දැඩි නීති රීති ගෙන ඒමට කටයුතු කොට ඇත.

ඒ අනුව රියදුරන් අතින් පහත සඳහන් කුමන හෝ ආකාරයේ වරදක් සිදුවුවහොත් ඒ සඳහා විශාල දඩ මුදල්වලට මෙන්ම දැඩි දඬුවම්වලටද යටත් වීමට සිදුවනු ඇත. රිය පැදවීමේදී ජංගම දුරකතනය භාවිතය සම්බන්ධයෙන් වූ නීති රෙගුලාසි පද්ධතියක් පෙර සිටම ක්‍රියාත්මක වූ අතර මෙවර එයින් ඔබ්බට ගොස් රථ වාහන පැදවීමේදී එම කාර්යයට බාධා සිදුකෙරෙන ක්‍රියාකාරකම් රැසක් පිළිබඳව සැලකිල්ල යොමු කොට ඇත.

එහිදී රියදුරු අසුන මත සිටින රියදුරෙකු විසින් පහත සඳහන් ක්‍රියා සිදුකිරීම සපුරා තහනම් කොට ඇත.

- ජංගම දුරකථනයෙන් කතා කරමින් යෑම
- කෙටි පණිවිඩ ලිවීම ආදි ජංගම දුරකථන ආශ්‍රිත ක්‍රියාකාරකම්
- පොත්, සිතියම්, පුවත්පත්, ලියකියවිලි ආදිය කියවීම හෝ අතේ තබාගෙන සිටීම
- දුම් පානය කිරීම
- හිස පීරීම, හැඩ වැඩ ගැන්වීම (මේක්අප් දැමීම වැනි කාර්යයන්)
- රේඩියෝ යන්ත්‍රය සැකසීම හෝ අතිශයින් ඝෝෂාකාරී සංගීතය රථයෙහි ක්‍රියාත්මක වීම
- රථයෙහි ගමන් ගන්නා සෙසු අය සමග බරපතල සාකච්ඡාවල නිරත වීම
- ආහාර පාන ගන්නා අතර රිය පැදවීම

රිය පැදවීම හා ආහාර ගැනීම සම්බන්ධයෙන් පොලිසිය නිර්දේශ කොට ඇත්තේ මෙසේය. 'රිය පැදවීමේදී ආහාර ගැනීමෙන් සහ පානය කිරීමෙන් වළකින්න' නමුත් 'ඔබට පානයක් ගැනීම අත්‍යවශ්‍ය නම් සංඥා පුවරුවල රතු සංඥාව දැල්වී රථය එහි නතර කළ පසු එය පානය කරන්න'

ඉහත ආකාරයේ ක්‍රියාවන් සිදුකරමින් අපරික්ෂාකාරීව රිය පදවන්නන් සම්බන්ධයෙන් රටෙහි සෑම පළාතකම නිශ්චිත නීති මාලාවක් ක්‍රියාත්මක වන අතර ඒ ඒ පළාතෙහි අදාළ වැරදි සම්බන්ධයෙන් පනවන දඬුවම්වල වෙනස්කම් පවතී. බොහෝ පළාත්වල මේ වැරදි සඳහා ඩොලර් දහසකට වැඩි දඩයක් සහ demerit points 4 දක්වා කපා හැරීම හෝ එසේ නොමැති නම් රියදුරු බලපත්‍රය අත්හිටුවීමට හැකි අයුරින් දඬුවම් ලබාදෙනු ලැබේ.

රිය පදවන අතරතුර ආහාර ගැනීම, මත්පැන්, මත්ද්‍රව්‍ය භාවිත කර තිබීම ආදිය සම්බන්ධයෙන් මෑතක සිට ඉතාමත් දැඩි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පොලිසිය කටයුතු කර ඇත.

# සැබෑ සහ ව්‍යාජ පුවත් අරගලය

කැනඩාවෙහි පළවන ප්‍රවෘත්ති අතරින් සැබෑ සහ ව්‍යාජ පුවත් වෙන් කොට හඳුනාගැනීමේ අරගලය දිනෙන් දිනම උග්‍ර වෙමින් පවතින බව ඒ පිළිබඳව කරන ලද මාර්ගගත සමීක්ෂණයකින් හෙළිදරව් වී ඇත.

කැනේඩියානු මාධ්‍යවේදීන්ගේ පදනම විසින් කරන ලද මෙම සමීක්ෂණ සඳහා ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 40 ක්ම පවසා ඇත්තේ මාධ්‍ය තුළ බෙදාගත් වාර්තාවන්හි සත්‍ය හා අසත්‍ය තත්ත්වය අතර වෙනස පැවසීමට එම වාර්තා පළකරන්නන් පවා අපොහොසත් වී ඇති බවයි. එසේ වූ විට එම වාර්තා පිළිබඳ කෙසේ විශ්වාසයක් තබන්නේදැයි යන්න ගැටලුවක් බව බොහෝ දෙනෙකුගේ අදහසයි.

සමීක්ෂණයට සහභාගි වූවන් වැඩි දෙනෙකු පවසා ඇත්තේ, සමබර ප්‍රවෘත්ති වාර්තාවක් කියවීමේ බලාපොරොත්තුවෙන් සිරස්තල මත ක්ලික් කළද ඒ සියල්ල එක් එක් අයගේ න්‍යාය පත්‍රයන්ට අනුව සැකසුණු පුවත්ම පමණක් වන බවය.

මෙවන් විටෙක සත්‍ය සහ බොරුව අතර වෙනස හඳුනාගැනීම ඉතාමත් දුෂ්කර බවද මහජනයා ප්‍රවෘත්තිවල අව්‍යාජත්වය පිළිබඳ සැක සංකා ඇති කර ගැනීම සාධාරණ බවද ඔවුන් පෙන්වා දී ඇත. විශේෂයෙන්ම මැතිවරණයක් ආසන්න වන විට මාධ්‍ය මගින් සමබර සත්‍ය තොරතුරු මහජනයා වෙත ලබාදීම අත්‍යවශ්‍ය වූවක් බවත් එය මාධ්‍ය සදාචාරය සහ වගකීම වන බවත් සමීක්ෂණයට එක් වූවන් පවසා ඇත.

පසුගිය මාස පහක කාලයක් තුළ කැනේඩියානු ජනමාධ්‍ය පදනම විසින් සමස්ත කැනඩාවම ඉලක්කගත කොට මෙම සමීක්ෂණය පවත්වා තිබුණි.

# විදේශ සංචාර වලදී OHIP නවතින ලකුණු

විදේශයන් වෙත සංචාරය සඳහා යන ඔන්ටේරියානුවන් හට එම අවස්ථාවලදී සිදුවන හදිසි අනතුරු, ලෙඩ රෝගවලදී දැරීමට සිදුවන වියදම් පිළිබඳව පසුතැවීමේ අවශ්‍යතාවක් නොවූ අතර එහිදී ඔවුන්ට OHIP ආවරණය මගින් සැලසෙන ප්‍රතිලාභ ලබාගැනීමේ අවස්ථාව සැලසී තිබුණි. නමුත් ඔන්ටේරියෝ PC රජය මගින් සංචාරයේ යෙදෙන ඔන්ටේරියෝනුවන්ට එම රටවලදී සිදුවන හදිසි වෛද්‍ය අවශ්‍යතා සඳහා මෙතෙක් ලබාදුන් OHIP ආවරණය කපා දැමීමට තීරණය කොට ඇත.

ඒ සඳහා වන යෝජනාව Ministry of Health and Long-Term Care මගින් ඉදිරිපත් කොට ඇති අතර කැනඩාවෙන් පිටත සංචාරය කරන ඔන්ටේරියානුවන්ට OHIP යටතේ සලසා තිබූ හදිසි සේවා සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන ආවරණය කිරීම අවසන් කිරීමට එහිදී යෝජනා වී ඇත. මෙය සෞඛ්‍ය රක්ෂණ පනත යටතේ නියෝග 552 සංශෝධනය වීමට නියමිත වේ.

වර්තමානයේදී සංචාරකයන් සඳහා වන මෙම හදිසි සේවා සෞඛ්‍ය සේවා රක්ෂණය යටතේ දිනකට ඩොලර් 400 ක සීමාවක් දක්වා රටින් පිටතදී තම හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යතා සඳහා ලබාගත හැක. එම සෞඛ්‍ය රක්ෂණය වර්තමානයේ ලබාගත හැකි ආකාර මෙසේය.

- ශල්‍යකර්ම, ICU නතරවීම් හෝ වෙනත් මට්ටමේ හදිසි වෛද්‍ය අවශ්‍යතා සඳහා දිනකට ඩොලර් 400 ක් දක්වා ලබාගත හැක.
- වෙනත් ඕනෑම මට්ටමක හදිසි වෛද්‍ය අවශ්‍යතා සඳහා දිනකට ඩොලර් 200 දක්වා ලබාගත හැක.
- බාහිර රෝගී සේවාවන් ලබා ගැනීම සඳහා දිනකට ඩොලර් 50 දක්වා ලබාගත හැක.
- වකුගඩු කාන්දු පෙරණ (renal dialysis) සඳහා දිනකට ඩොලර් 210 දක්වා ලබාගත හැක.

කෙසේ වෙතත් ෆෝඩ් රජය මගින් ගෙන එන ඉහත යෝජනාව මගින් කැනඩාවෙන් පිටත සංචාරය කරන ඔන්ටේරියානුවන් සඳහා සැපයෙන ඉහත සියලු පහසුකම් කපා හැරෙනු ඇත.

බදු ගෙවන්නන්ගේ ඩොලර් රජය විසින් භාවිත කිරීමේදී එහි පැවතිය යුතු වගකීම සහ විශ්වාසය වඩාත් ස්ථාපනය කිරීම මෙම සංශෝධනයේ අරමුණ බව රජය පවසයි. එසේම OHIP ආවරණය විශාල වශයෙන් නවීකරණය කොට වඩා කාර්යක්ෂමවත් හා විනිවිදභාවයෙන් යුතුවත් සෞඛ්‍ය සේවා සපයන්නන්ට සහ රෝගීන්ට ඉහළ පහසුකම් සැපයීමටත් මෙවැනි පියවර ගැනීමට සිදුවන බව රජයේ අදහසයි.

ඔන්ටේරියෝ ෆෝඩ් රජය මගින් ගෙන එනු ලබන මෙම නව සංශෝධනය අනුමත වුවහොත් 2019 ඔක්තෝබර් 01 දා සිට විදේශ සංචාරයන්හි යෙදෙන ඔන්ටේරියානුවන් හට OHIP ආවරණය තවදුරටත් නොලැබෙනු ඇත.

# 400 වේග සීමාවේ වෙනසක් !

ඔන්ටේරියෝ ප්‍රවාහණ අමාත්‍යාංශය මගින් අධිවේගී මාර්ගයන්හි වේග සීමාවල වෙනසක් සිදුකිරීමට සැලසුම් කර ඇති බව වාර්තා වේ.

මැයි මාසයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත මෙම වේග සීමාවන්වලදී 400 අධිවේගී මාර්ග යේ මෙතෙක් පැවති පැයට කිලෝමීටර 100 ක වේග සීමාව පැයට කිලෝමීටර 120 සීමාව දක්වා වැඩි කර ඇත.

ප්‍රවාහණ කටයුතු සම්බන්ධ විවිධ ගැටලු රාශියක් විසඳීම සඳහා නීති රීති ගෙන ඒම පිළිබඳව ඔන්ටේරියෝ ප්‍රවාහන අමාත්‍යාංශයේ අවධානය මේ වන විට යොමු කොට ඇති අතර එහිදී අධිවේගී මාර්ග නීති කඩ කරන්නන් සඳහා පමුණුවන දඬුවම් දැඩි කිරීමට පියවර ගනු ඇතැයි සඳහන් වේ. විශේෂයෙන්ම අධිවේගයේ වම්පස මංතීරුවෙහි අනවශ්‍ය ලෙස සෙමින් රථ ධාවනය කිරීම ඉතාම අන්තරාදායක වූවක් වන හෙයින් එසේ අනෙක් අය අවදානමට ලක් කරන රියදුරන් වෙත පනවනු ලබන දඩ මුදල වැඩි කිරීමට කටයුතු යොදන බව පැවසේ.

තවද මහා මාර්ග නඩත්තු කටයුතු හා ඉදිකිරීම් සිදුකරන කම්කරුවන්, ඉන්ධන සපයන යන්ත්‍ර ක්‍රියාකරවන්නන් ඇතුළු සියලුම පුද්ගලයින්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් නොවී රිය පදවන්නන් සඳහාද දැඩි දඬුවම් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

# නොමිලේ දන්ත වෛද්‍ය සේවා

අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ දන්ත වෛද්‍ය පහසුකම් ලබාදෙන බව මෙවර ඔන්ටේරියෝ අයවැය නිවේදනයේ සඳහන්ව ඇත.

ඒ අනුව වයස අවුරුදු 65 ඉක්මවූ වැඩිහිටි පුද්ගලයෙකු වෙනුවෙන් ඩොලර් 19,300 ක් හෝ අඹුසැමි යුවළක් සඳහා ඩොලර් 32,300 ක මුදලක් ලැබීමට සුදුසුකම් ලබයි.

මෙම සේවාවන් public health units, community health centres and aboriginal health access centres ආදියෙන් ලබාගත හැකි අතර අනාගතයේදී මෙම පහසුකම් තවත් ව්‍යාප්ත කරමින් ජංගම දන්ත වෛද්‍ය ඒකකද ඇති කිරීමට රජය අදහස් කර ඇත.

අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා වන මෙම දන්ත වෛද්‍ය සේවාව සඳහා වසරක ඩොලර් මිලියන 100 ක් පමණ වැය වෙනු ඇතැයි රජය පවසයි.


නමෝ බුද්ධාය !
අභිනවයෙන් ඉදි කළ මනරම් විහාර මන්දිරයකින් සුසැදි
"බුද්ධ භාවනා ශාලාව"
ගෞතම බුදු සසුනට පූජා කිරීමේ අසිරිමත් පුණ්‍ය මහෝත්සවය
මහමෙව්නාව භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ
අපගේ ගුරුදේවෝත්තම අතිපූජනීය
කිරිබත්ගොඩ ඤාණානන්ද පින්වත් ලොකු ස්වාමීන් වහන්සේගේ සහභාගිත්වයෙන්
2019 ජුනි මස 15 වන දින
උදෑසන 8.30 සිට පසුදා උදෑසන දක්වා
අසිරිමත් පින්කමේ පෙළගැස්ම
ජුනි 15 සෙනසුරාදා
පෙ.ව 8.30 - පෙ.ව 10.00 බුද්ධ භාවනා ශාලාව බුදු සසුනට පූජා කිරීමේ පුණ්‍ය මහෝත්සවය
පෙ.ව 10.30 - පෙ.ව 11.10 දහවල බුද්ධ පූජාව
පෙ.ව 11.00 - ප.ව 1.00 සාංඝික දානමය පින්කම
ප.ව 1.00 - ප.ව 2.30 ගිහි පින්වතුන් උදෙසා දහවල දානය
ප.ව 2.30 - ප.ව 5.00 සදහම් දේශනය
ප.ව 6.00 - ප.ව 7.00 සම්බුද්ධ වන්දනාව සහ අග්‍ර ශ්‍රාවක වන්දනාව
ප.ව 7.00 - ප.ව 8.00 ගිහි පින්වතුන් උදෙසා රාත්‍රී ආහාරය
ප.ව 8.00 - ප.ව 8.30 පිරිත් අනුශාසනාව
ප.ව 8.30 සිට අළුයම දක්වා සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව
ජුනි 16 ඉරිදා
පෙ.ව 10.30 - ප.ව 12.30 ළමුන් විසින් පිරිනමණ සාංඝික දානමය පින්කම
ප.ව 4.00 - ප.ව 5.00 ඉංග්‍රීසි බසින් පැවැත්වෙන සදහම් වැඩසටහන
ජුනි 18 අඟහරුවාදා
ප.ව 6.30 - ප.ව 8.30 බ්‍රැම්ටන් නගරයේ සදහම් දේශනය
Venue - Dreams Convention Centre
75 Hedgedale Rd, Brampton, ON L6T 5P3, Canada
මෙම උතුම් පින්කම මහා සංඝ රත්නයේ සහ සැදැහැවත් උපාසක
උපාසිකාවන්ගේ සහභාගීත්වයෙන් කැනඩාවේ ටොරොන්ටෝ නුවර මහමෙව්නාව
භාවනා අසපුවේදී සිදු කිරීමට නියමිතව ඇත.
මෙලොව පරලොව සැප සලසන, නිවන් සැපෙන් සියළු දුක් දුරලන මහත් පින් වල
හොඳමට පින්වත් ඔබ සැමට මෙත් සිතින් ආරාධනා කර සිටිමු .....
+1 905 927 7117
info@mahamevnawa.ca
www.mahamevnawa.ca
Mahamevnawa Buddhist Monastery
11175 Kennedy Rd, Markham, ON, L6C 1P2 Toronto, Canada.

# බුර්කාව ත්‍රස්තවාදය හා අපේ උගතුන්



■ කුසල් පෙරේරා

මේ ගෝලීය සමාජයෙහි ගිලා බහින 'ලෝකෙන් උතුම් රට' පිළිබඳ මෙහි ඇති කියැවීම අප්‍රේල් 25 වැනි බ්‍රහස්පතින්දා දින දක්වා වූ තොරතුරුවලට සීමා වන බැව් අවධාරණය කළ යුත්තේ ඉන් පසු දිනවල පළ කෙරෙන තොරතුරු මගින් මේ කියවීම අනාථ විය හැකි බැවිණි.

නිදසුනක් කිවහොත් කවුරුත් නොදන්නා වැට අද්දර සිටි අවිනීත, මදාවි කුඩා අන්තවාදී පිරිසක් වූ 'ජාතික තවුහීද් ජමාත්' වැනි ආධුනික සංවිධානයකට මෙවැනි අතිශය බරපතල් ඉතා පුළුල් ජාලගත ත්‍රස්ත ප්‍රහාර ගණනාවක් එකවර එල්ල කිරීම සඳහා නිපුණතාවක් හැකියාවක් අත්දැකීමක් නැතැයි බදාදා දින තර්ක කළ පසු, බ්‍රහස්පතින්දා උදය ප්‍රවෘත්ති කියවන්නේ - එම ප්‍රහාර සියල්ල බොහෝ විට 'ජාතික තවුහීද් ජමාත්' සංවිධානයෙන් කැඩී වෙන් වූ කිහිප දෙනෙකුගේ පතුරු සංවිධානයකින් එල්ල කළ බවට සැක කෙරෙන බවය.-

එය මාධ්‍යයට කියන්නේද ආරක්ෂක රාජ්‍ය ඇමැතිවරයාය. එවැනි තොරතුරු අර්බුදයක් සහිත කාලයක මෙතෙක් නිල වශයෙන් තහවුරු කෙරුණු තොරතුරුවලට පමණක් සීමා වී මේ මහා කුරිරු අපරාධය කියවා ගැනීමට උත්සාහ කරමි.

මේ වනවිට සැක නොකෙරෙන පිළිගත් නිල ප්‍රකාශවලට අනුව, පාස්කු ඉරිදා මිලේච්ඡ ත්‍රස්ත ප්‍රහාර සියල්ලෙන් 359 දෙනෙකු මිය ගොස් 500 ක් පමණ තුවාල ලබා ඇත. බ්‍රහස්පතින්දා දින සෞඛ්‍ය අමාත්‍යාංශ ප්‍රකාශයකට අනුව නිවැරදි මිය ගිය සංඛ්‍යාව 253 ක් යැයි කියනු ලැබුයේ ඇතැම් මෘත ශරීර බරපතළ ලෙස විකෘති වී හා වෙන්ව තිබූ හෙයින් ඒවා දෙවරක් ගණන් කෙරී ඇති නිසා යැයි පැහැදිලි කිරීමත් සමගය. එම ප්‍රහාර සියල්ල 'ජාතික තවුහීද් ජමාත්' සංවිධානය විසින් එල්ල කර ඇත. බෝම්බකරුවන් 07 දෙනෙකු එම ප්‍රහාරවලට සහභාගි වී ඇත.

රජයේ රස පරීක්ෂකට අනුව සියල්ලන්ම සියදිවි නසා ගන්නා බෝම්කරුවන්ය. රාජ්‍ය බුද්ධි අංශයට අනුව සියල්ලන්ම ශ්‍රී ලාංකිකයන්ය. ෂැංග්‍රි-ලා හෝටලයේ බෝම්බ පුපුරවා ගත් දෙදෙනා අයියා මලෝය. ඔවුන්ගේ පියා පිළිගත් ධනවත් ව්‍යාපාරිකයෙකි. එක් සහෝදරයකු සතු තඹ වාත්තු කම්හලක් අවිස්සාවේල්ලේ තිබිණ. එහි සේවය කළ කම්කරුවන් සියල්ල දැනට අත් අඩංගුවට ගෙන ඇත. එක් සහෝදරයකු ෂැංග්‍රි-ලා හෝටලයට ලබා දී තිබුණු ලිපිනය ඔවුන්ගේ ඇත්ත පදිංචි ලිපිනය විය.

ඒ අනුව දෙමටගොඩ ඔවුන්ගේ නිවස පරීක්ෂාවට පොලිස් කණ්ඩායමක් ගිය විට එහි සිටි එක් සහෝදරයකුගේ බිරිඳ ඔවුන්ගේ දරුවන් තිදෙනාද සමග බෝම්බයක් පුපුරුවා ගෙන මිය ගොස් ඇත. පොලීසියේ තිදෙනකුද ඉන් මිය ගියහ. මේ වනවිට 60 කට ආසන්න පිරිසක් අත්අඩංගුවට ගෙන ඉන් 09 දෙනෙකු මහේස්ත්‍රාත් හමුවට පමුණුවා ඇත. සියලුදෙනා අපරාධ පරීක්ෂණ අංශය භාරයේ රඳවා ඇති අතර 04 දෙනෙකු පමණක් ත්‍රස්ත විමර්ශන ඒකකය යටතේ ඇත. පොලීසියේ අපරාධ පරීක්ෂණ අංශයට අවශ්‍යව ඇති පුද්ගලයින් සය දෙනෙකුගේ නම් සහ ඡායාරූප බ්‍රහස්පතින්දා දින ප්‍රකාශයට පත් කරනු ලැබුණි.

ඉන් එක් තරුණියකගේ ඡායාරූපය මෙරට කිසිදු ඉස්ලාමීය සංවිධානයකට අයත් නොවන ඇමෙරිකාවේ බ්‍රවුන් විශ්වවිද්‍යාලයෙහි උපාධි ශිෂ්‍යාවකගේ ඡායාරූපයක් වැරදීමකින් ප්‍රසිද්ධ කෙරුණකැයි එය පසුව නිවැරදි කරනු ලැබිණ. ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ට හා පොලිස්පතිට ඉල්ලා අස්වන ලෙස ජනාධිපති ඉල්ලා ඇති අතර ආරක්ෂක ලේකම් ඉල්ලා අස් වී යැයි ප්‍රකාශ විය.

පසුගිය ඔක්තෝබරයේ වූ දේශපාලන ආරවුලෙන් පසුව තමන්ව හා නියෝජ්‍ය ආරක්ෂක ඇමැතිවරයාව ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම් සඳහා නොකැඳවූ බැව් අගමැති ප්‍රකාශ කළේය.

මේ අතර තහවුරු නොවුණු එහෙත් සැබෑ යැයි සළකාගෙන ප්‍රකාශ කෙරෙන තොරතුරුද ඇත. 'ජමාත් අල් මුජහිදීන්' ත්‍රස්වාදීන්ට ජාත්‍යන්තර සම්බන්ධකම් ඇතැයි කියනු ලැබේ. ආරක්ෂක රාජ්‍ය ඇමැති පසුගිය අඟහරුවාදා පාර්ලිමේන්තුවට කියූවේද ඔවුන් හා 'ඉන්දියානු ජමාත් අල් මුජහිදීන්' සංවිධානය සම්බන්ධකම් පවත්වා ඇති බවට සැක කෙරෙන බවය. එය බංග්ලාදේශයේ තහනම් කරනු ලැබ ඇති 'බංග්ලාදේශ ජමාත් අල් මුජහිදීන්' සංවිධානය විසින් මීට අවුරුද්දකට පමණ ඉහතින් ඉන්දියාවෙහි පිහිටුවනු ලැබූ කලල ශාඛා සංවිධානයකි.

මේ අතර ඉස්ලාමීය අන්තවාදී සංවිධානයක් වන 'අයි-එස්-අයි-එස්' සංවිධානයේ මාධ්‍ය වන 'අමාඛ්' විසින් කරන ලද ප්‍රකාශයකට අනුව පාස්කු ඉරිදා ප්‍රහාර වැල ඔවුන්ගේ ජිහාඩ් සටන්කරුවන්ගේ ජයග්‍රාහී ශුද්ධ ප්‍රහාරයකි. ඔවුන් විසින් සියදිවි නසාගැනීමේ 08 කුගෙන් යුත් කණ්ඩායමක ඡායාරූප පළ කර තිබුණද ඒවා රටින් බැහැරව ගන්නා ලද ඡායාරූපද මෙරට කොතැනකදී හෝ ගන්නා ලද ඡායාරූප දැයි කිව නොහැක. ආරක්ෂක රාජ්‍ය ඇමැති බදාදා මාධ්‍ය වෙත කියුවේ 'ජාතික තවුහීද් ජමාත්' සංවිධානය මෑතදී කැඩී ඇති අතර මේ ප්‍රහාර ඉන් බිඳී ගිය කණ්ඩායමක් විසින් කරන්නට ඇතැයි දැන් තොරතුරු ඇති බවය.

මේවා සම්බන්ධව මේ වනවිට විවිධ අර්ථකථන හා විචාර පළ වන්නේය. මේ තොරතුරු සම්බන්ධයෙන් ඇති පරස්පර සහ අපැහැදිලි තැන් නිසාම තමන් රිසි අර්ථකථන සැපයීමේ හා ප්‍රශ්න කිරීමේ ඉඩක් සැමට ඇත. නමුත් එක් දෙයක් තර්ක සියල්ලෙන් තොරය. මේ අතිශය මෘග ත්‍රස්ත ප්‍රහාර සියල්ල ඉතා පහසුවෙන් වළකා ගත හැකිව තිබුණි. එසේ සිතීමට අවශ්‍ය පමණටත් වඩා හේතු ඇත.

පසුගිය අප්‍රේල් 04 වන දින කොළඹ නගරයේ ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීමේ සැලසුම් ඇතැයි විස්තර සහ තොරතුරු ඉන්දීය ආරක්ෂක අංශ විසින් නිල වශයෙන් ලබාදී ඇත. ඒ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය පොලිස්පති දැනුවත් කළ බවද කියනු ලැබේ. අනතුරුව 'ජාතික තවුහීද් ජමාත්' සංවිධානය සහ ඔවුන්ගේ ක්‍රියාකාරීන්ගේද විස්තර සහිත වාර්තාවක් සමග අනතුරු ඇඟවීමේ ලිපියක් අප්‍රේල් 11 වන දින ඇතිව විශේෂ ආරක්ෂක අංශ නියෝජ්‍ය පොලිස්පති විසින් අවශ්‍ය අංශ වෙත යොමු කරනු ලැබ තිබිණ.

එම ත්‍රස්ත ප්‍රහාර සම්බන්ධ අදාළ තොරතුරු පිළිබඳව තමන් දැනුවත්කර නොතිබිණැයි ජනාධිපති පවසන විට, ජනාධිපති රටින් බැහැරව සිටි නිසා අගමැති විසින් කැඳවූ ආරක්ෂක මණ්ඩල රැස්වීම ඔවුන් ප්‍රතික්ෂේප කළේ යැයි කීමත් එකතු කළ විට මතු කෙරෙන්නේ බරපතළ ප්‍රශ්නයකි. අප්‍රේල් 04 වන දින ඉන්දීය අනතුරු ඇඟවීම් ලැබුණු පසු දෙසතියක් පුරා එම තොරතුරු ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් විසින් හෝ ආරක්ෂක මණ්ඩලයේදී හෝ ජනාධිපති සමග කිසිදු සාකච්ඡාවකට බඳුන් නොකෙරුණු බව ඉන් කියැවෙන්නකි. එසේ නොවුණා නම් මේ විනාශය වළකා ගත හැකිව තිබිණ.

ඒ අතපසු කිරීම්වලටද කලින් දැන් ප්‍රකාශයට පත්කර ඇති නිල තොරතුරුවල සඳහන් 'ජාතික තවුහීද් ජමාත්' සංවිධානය හා එහි ක්‍රියාකාරීන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමද මග හැර තිබිණැයි හෙළි වන්නේ දැන් ප්‍රසිද්ධියට පත්ව ඇති නියෝජ්‍ය පොලිස්පතිගේ ලියැවිල්ලට අනුවය. පසුගිය දෙසැම්බරයේ මාවනැල්ලේ බුදු පිළිමවලට හානි කරන ලද්දේ 'ජාතික තවුහීද් ජමාත්' සංවිධානය බැව් පොලිස් බුද්ධි අංශ මගින් තහවුරු කරගනු ලැබිණ. ඉන්පසුව ඔවුන් පිළිබඳව කරනු ලැබූ පරීක්ෂණ මගින් පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුවේ විශාල පොල් වත්තක ඔවුන්ගේ කඳවුරකදී පුපුරන ද්‍රව්‍ය තොගයක් සමග සිව් දෙනෙකු අත්අඩංගුවට ගනු ලබිණ.

වැඩි දුර පරීක්ෂණ මගින් සහරන් හෂීම්, ශාහීඩ්, රිල්වාන් වැනි එහි නායක පුද්ගලයන් ගැනද බුද්ධි අංශ තොරතුරු සොයා ගෙන තිබිණ. ඔවුන් අක්කරෙයිපත්තු, කුලියාපිටිය, පුත්තලම, මාවනැල්ල සහ තිහාරිය වැනි ප්‍රදේශවල සැරිසරා ඇත. බොහෝ විට ප්‍රසිද්ධ වූ තොරතුරුවලට වඩා වැඩි තොරතුරු බුද්ධි අංශ සතුව තිබිය යුතුය. ඊටත් අමතරව සහරන් හෂීම්ට සහ ඔහුගේ කණ්ඩායමට කාත්තන්කුඩිය ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාව ඔවුන්ගේ අප්‍රසාදය හා විරෝධය කිහිප විටක් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇති අතර පොලිස් පැමිණිලිද කර ඇත.

මේ තොරතුරු මත අප්‍රේල් 04 වන දින ලැබුණු ඉන්දීය අනතුරු ඇඟවීම්වලට කලින් ආරක්ෂක පියවර ගත හැකිව තිබිණ. වනාතවිල්ලුවේ පුපුරන ද්‍රව්‍ය තොගය සමග සිව් දෙනෙකු අත්අඩංගුවට ගැනීමෙන් පසු ඉතිරි සැකකරුවන් කිහිප දෙන අත්අඩංගුවට නොගැනීම බරපතළ ප්‍රශ්නයකි. එවැනි තොරතුරු මත ඕනෑම අයෙකු සැකපිට අත්අඩංගුවට ගැනීමේ නීතිමය අවසරයක් පොලීසියට ඇත.

ඒ වෙනුවෙන් ජනාධිපතිගේ හෝ අගමැතිගේ හෝ අදාළ ඇමැතිවරයාගේ විශේෂ අවසරයක් නියෝග යක් අවශ්‍ය වන්නේ නැත. මීට ඉහතින් සැකපිට එවැනි අත්අඩංගුවට ගැනීම් මේ රටේ ඕනෑ තරම් සිදුව ඇත. මේ තොරතුරු අනුව එළෙසින් පියවර ගනු ලැබිණි නම්, මිය ගිය අහිංසකයන් 253 සහ තුවාලකරුවන් 500 වෙනුවෙන් අඳෝනා තබන්නට මේ රටට සිදු වන්නේ නැත.

අතපසුවීම්, තීන්දු නොගැනීම්, වගකීම් භාර නොගැනීම් අද මේ රටේ පොදු ලක්ෂණයකි. පත් කෙරුණු මන්ත්‍රීවරුන් හා ආණ්ඩුද එවැනිය. බලයේ කෑදරකමට බෙදුණු මෙයද එවැනි ආණ්ඩුවකි. එනිසා ඔවුන් අතර ඇත්තේ එකිනෙකාට දොස් පවරා ගැනීමකි. ආණ්ඩුවේ ඇමැතිවරුන් හා අගමැතිද ජනාධිපති වෙත දොස් පැවරීමට කාලය ගත කරති. ඔක්තෝබරයෙන් පසු තමන්ව හා නියෝජ්‍ය ආරක්ෂක ඇමැතිවරයාව ආරක්ෂක මණ්ඩලයට නොකැඳවූ බැව් අගමැති කියන්නේ දැන්ය. දැන් එය කියන්නේ දේශපාලන නෝක්කාඩුවක් ලෙසය.

එහෙත් පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් ෆොන්සේකා කියූ අයුරින් ඒ ගැන පාර්ලිමේන්තුවට කිව යුතුව තිබූයේ මීට මාස 05 කට කලින්ය. නොවැම්බරයේ අලුත් ඇමති මණ්ඩලය පිහිටුවායින් පසුව ආරක්ෂක මණ්ඩලයට නොකැඳවීම පිළිබඳව අගමැති විසින් කළ යුතුව තිබූයේ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව තමන්ට හා තම ආණ්ඩුවට වගකීම් භාරගත නොහැකි බැව් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයක් කිරීමය. එහෙත් එවැනි වගකීමක් අගමැතිට හා ඔහුගේ ඇමැතිවරුන්ටත් නැත.

එය දැකිය හැකි වූයේ පසුගිය අඟහරුවාදා පාර්ලිමේන්තුව රැස් වූ විට පමණක් නොවේ. ඊට ඉහතින් හරීන් ප්‍රනාන්දු සහ මනෝ ගනේෂන් ඇමැති දෙපළද එය ඔප්පු කළහ. ත්‍රස්ත ප්‍රහාරය ගැන කලින් දින තමා දැන ගත්තේ තම පියාගෙන් යැයි හරීන් ප්‍රනාන්දු 'ට්විටර්' සටහනකින් කියා තිබුණා පමණක් නොව, නියෝජ්‍ය පොලිස්පතිගේ ලියැවිල්ලෙහි පිටු කිහිපයක්ම 'ට්විටර්' සටහන සමග පළකර තිබිණ.

ඉන් ඇඟවෙන්නේ පියාගේ දුරකථන ඇමතුමට පෙර ඔහු ඒ ගැන දැන සිටි බවය. ඇමැතිවරු ඉලක්ක කරගත් මරාගෙන මැරෙන බෝම්බකරුවන් දෙපළක් කොළඹට පැමිණ

10 වන පිටුව බලන්න

දසත Dasatha
2019 මැයි May 2019

**Published by Dasatha Publications**
**Publisher** - Gamini Abeysinghe
**Consultant Editor** - Sirisena Vithanage
**Editor in Chief** - Chamari Abeysinghe
**Graphic Design & Layout** - Sampath Ranaweera
**Creative graphics** - Jagath Hewapanna
**Web Master** - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the financial support of the Government of Canada. «Nous reconnaissons l'appui financier du gouvernement du Canada'
www.canada.ca

# අපේ මවුබිම ගැන අපි දුක් වෙමු

ශ්‍රී ලංකාවෙන් ඈත්ව බොහෝ දුරු රටක වෙසෙන අපට යළිත් වරක් මවුබිම පිළිබඳව නෙත කඳුළැලි වගුරුවන්නට සිදුවී තිබීම කොතරම් නම් අවාසනාවක්ද? අප මවුබිමෙන් ඈත්ව සිටියත් අප කාගේත් නිරතුරුවම හද ගැහෙන්නේ මවුබිම පිළිබඳ සිතුවිලිවලිනි. අප ළඟ නැති මවුපියන්, සහෝදර සහෝදරියන්, නෑදෑයන්, හිතමිතුරන් මේ මොහොතේ කෙලෙස ජීවත් වනු ඇතිද? යන කල්පනාවෙන් අප කිසිවෙකුටත් ගැලවිය නොහැකි තරමට අපි මවුබිම පිළිබඳ කල්පනාවෙන් වෙලී සිටින්නෙමු. එසේ තිබියදී රුදුරු මරාගෙන මැරෙන බෝම්බ කරුවන් යළි අප රට බිලිගෙන ඇතැයි සිතන්නට වීමම අවාසනාවක් නොවන්නේද?

තිස් වසරක් මුළුල්ලේ අප රටේ අපේ මවුපියෝ, සොයුරු සොයුරියෝ, ඥාතීහු, අසල්වැසියෝ කොයි මොහොතේ බෝම්බ පුපුරනු ඇද්දැයි බියෙන් පසුවූහ. මරණය නිරතුරුවම ඔවුන් සමගම ගැවසුණේය. හිත්පිත් නැති මරාගෙන මැරෙන ත්‍රස්තවාදී බෝම්බකරුවන් නිසා අපේ මවුපියෝ, සොයුරු සොයුරියෝ, ඥාතීහු, අසල්වැසියෝ කොතරම් නම් ප්‍රමාණයක් අපට අහිමි වූවෝද? ඒ මින් අවුරුදු දහයකට පමණ පෙරය. යළිත් එවැනි යුගයක් උදා වේ යැයි අප නොසිතූ මොහොතක දැන් නැවතත් එම උවදුර එළඹ තිබේ. ඒ දුක අප වෙත පැමිණ තිබේ.

එවර එය ආවේ දෙමළ අන්තවාදීන් යැයි කියාගත් කොටි වෙස් ගත් ම්ලේච්ඡ නොමිනිසුන් පිරිසකගේ වෙසිනි. අවුරුදු තිහක් මුළුල්ලේ මේ නොමිනිස්සු අප මව්බිමේ සාමකාමී, නිර්දෝෂී, අහිංසක මිනිසුනට බියෙන් සැකෙන් තොරව ජීවත් වන්නට, මඟ බැස යන්නට ඉඩ නොදුන්හ.

මෙවර එය පැමිණ ඇත්තේ ලේ පිපාසාවෙන් පෙලෙන අයි.එස්. ත්‍රස්තවාදීන් විසින් මෙහෙයවනු ලබන තව්හිද් ජමාත් නම් ශ්‍රී ලාංකේය අන්තවාසී මුස්ලිම් ජාතික නොමිනිසුන් පිරිසකගේ වෙසිනි. දැනට හෙළි වී ඇති අන්දමට මොවුන් රට පුරා කරන්නට සූදානම්ව සිටි සැලසුම් ක්‍රියාත්මක වූයේ නම් මොන තරම් දරුණු විනාශයක් සිදුවන්නට තිබුණේදැයි යන්න සිතන්නටවත් බැරි තරම්ය. පාස්කු ඉරිදා මුල් දිනයේම සිදු වූ කොච්චිකඩේ සහ කටුවපිටිය යන පල්ලිවලත් ෂැංග්‍රි ලා ආදි හෝටල්වලත් බෝම්බ පිපිරීමත් සමග පොලිසියත් යුද හමුදාවත් නාවික හමුදාවත් එක්ව ගත් ක්‍රියාමාර්ග නිසා ඔවුන්ගේ ඒ සැලසුම් අසාර්ථක විය. මේ එක් දිනයක් තුළ ක්‍රියාත්මක වූ පිපිරීම්වලින් පමණක් දැනට හඳුනාගෙන ඇති ආකාරයට විශාල පිරිසක් මිය ගොස් ඇති අතර තවත් විශාල පිරිසක් තුවාල ලබා තිබේ. මේ පිරිස් අතර දේශීය ජනයා මෙන්ම විදේශීය ජනයාද වූහ.

මේ සමගම තවත් කිව යුතු කරුණු දෙකක් ඇත. මේ ම්ලේච්ඡ තිරිසන් ත්‍රස්තවාදීන්ගේ අරමුණ වූයේ මෙලෙස බෝම්බ අටවා මිනිසුන් මරා දැමීම පමණක් නොවේ. මේ රටේ පුරවැසියන් අතර අන්‍යෝන්‍ය වෛරයක් ඇති කොට තවත් දහස් ගණනක් ඔවුනොවුන් මරා ගැනීමේ අවස්ථාවක් උදා කිරීමද ඔවුන්ගේ යටි අරමුණක්ව තිබුණේය. ප්‍රහාරය සඳහා පාස්කු ඉරිදාම තෝරා ගත්තේත් ප්‍රධානතම පල්ලියක් සහ ප්‍රාදේශීය පල්ලියක් ඉලක්ක වශයෙන් තෝරා ගත්තේත් එම යටි අරමුණ මත පිහිටාය. ක්‍රිස්තියානි ජනයා හා බෞද්ධ ජනයා අතර මෙමගින් ගැටුම් ඇතිවනු ඇතැයි ඔවුහු බලාපොරොත්තු වූහ. එදිනම බී.බී.සී. ප්‍රවෘත්ති සේවාව මගින් 'සිංහල බෞද්ධයෝ කතෝලිකයින් මරති' යන්න ප්‍රචාරය වූයේ ඔවුන්ගේ අරමුණ ඉටුකර ගැනීමට ඔවුන් විසින් ලබා දී තිබුණු තොරතුරු අනුවය.

එහෙත් ලක් මවගේ වාසනාවට බුද්ධිමත්, විචාරවත්, දූරදර්ශී දේවදූතයකු පැමිණ එය වළක්වාලීය. ඔහු නම් කතෝලික අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රන්ජිත් පියතුමාය. සැබවින්ම ඔහු 'අති උතුම්' යන විරුදාවලියෙහි ගෞරවය ආරක්ෂා කළේය. එයට තමන් සුදුසු බව ඔප්පු කළේය. මේ සිදුවීම සැලවූ මොහොතේ සිටම එතුමන් හැසිරුණු විලාශය, කතාබහ, කළ දේ, ක්‍රියා කළ ආකාරය සැබවින්ම 'අති උතුම්' විය. එතුමන් අදූරදර්ශීව, ආවේග ශීලීව, අවිචාරවත්ව කතා කළේ නම්, ක්‍රියා කළේ නම්, හැසුරුණේ නම් පෙර කී ත්‍රස්තවාදීන්ගේ අරමුණ ඉටු වන්නට හොඳටම ඉඩ තිබුණේය. එබැවින් එබඳු විපතකින් රට ගැළවූ අගරදගුරු තුමන්ට ශ්‍රී ලංකාවාසී වූත් ශ්‍රී ලංකාව මවුබිම කොට ගත්තා වූත් සියල්ලන්ගේම ප්‍රණාමය හිමි විය යුතු වන්නේය.

දෙවැනි කරුණ නම් මේ බිහිසුණු අවස්ථාවේ රටේ වගකිව යුතු සියලු දේශපාලනඥයන් හැසුරුණු, ක්‍රියා කළ, කථා කළ ආකාරයයි. කිසිදු වගකීමකින් තොරව හැසුරුණු, ක්‍රියා කළ, කථා කළ ඔවුහු සුපුරුදු පරිදිම එකිනෙකා පිට වරද පටවන බොළඳ, අමන, හාස්‍යජනක රංගනයක යෙදුණහ. කලක සිට තමන් පක්ෂ, පාටවලට බෙදී, තනතුරුවල එල්බ ගනිමින් ගහ ගැනීම මේ අමන ත්‍රස්තවාදීන්ට පාළු ගෙයි වළං බිඳීමකට ඉඩකඩ සලසා දීමක් වූවා නොවේදැයි සිතා දැන්වත් සමගියෙන් සමාදානයෙන් ජනතාව රකින්නට නොසිතා ඔවුහු මෙතැනදීද අනුගමන කළේ එකිනෙකාට චෝදනා කර ගැනීමේ සුපුරුදු ප්‍රතිපත්තියමය.

කවුරුන් කෙසේ කුමක් කීවත් රටට ලැදි තම වගකීම අවබෝධ කොට ගත් යුද හමුදා, ගුවන් හමුදා, නාවුක හමුදා හා පොලිස් හමුදා භට පිරිස් මේ අවස්ථාවේ ක්‍රියා කළ ආකාරය ප්‍රශංසා කටයුතුය. ඔවුන් දිවි පරදුවට තබා රටවැසියන් රකින්නට ගත් උත්සාහයට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

අප ලක්වැසි ජනතාවට ඉතාම කෙටි කලකින් මේ උවදුරින් මිදී නිදහසේ සිය ජීවිත ගත කරන්නට අවස්ථාව සැලසේවා යි අපි ප්‍රාර්ථනා කරමු.

# තිබුණොත් එච්චරයි දැන් ඉතිං ඒකත් ඉවරයි

■ ජී. කේ. ජී. සරත්

ශ්‍රී ලංකාව වැර වෑයමෙන් නැගී සිටින්නට උත්සාහ දරන වකවානුවක ඉකුත් පාස්කු ඉරිදා සිදුවූ භයානක මරාගෙන මැරෙන ප්‍රහාර මාලාව රටට විශාල ආර්ථික කුණාටුවක් නිර්මාණය කරන ලද බව සඳහන් කළ යුතුය. විද්‍යුත් මාධ්‍ය සිද්ධි හදිසි වාර්තා වශයෙන් යම් යම් සිදුවීම් විකාශය කරයි. නමුත් පැයකට දෙකකට පසු එකී සිද්ධීන් අනවශ්‍ය තැති ගැනීම් බව අනාවරණය වෙයි. කටුනායක ගුවන් තොටුපොළ, කටාන, කුරුණෑගල, මිනුවන්ගෙ ාඩ, බදුල්ල, කොල්ලුපිටිය යනාදී වශයෙන් දීර්ඝ ස්ථාන ලේඛනයක් මෙම සටහනට ඇතුළත් කළ හැකිය. නමුත් එම සිද්ධි පසුව හාස්‍යෝත්පාදක හේතුවලින් අවසන් වී තිබේ. ආරක්ෂාව හාස්‍යයට ලක් විය යුතු නැත. ආරක්ෂක ප්‍රධානීහු කරන ප්‍රකාශ ජනතාව භීතියට පත් කර තිබේ. සංචාරක හෝටලයක් ආරක්ෂා කිරීම රටේ වගකීමක් නොවන අතර දේවස්ථාන ආරක්ෂා කරන්නට පුළුවන්කමක් නැතැයි ආරක්ෂක ලේකම්වරයා කියා සිටින පසුබිමක රටේ පවතින අනියත බිය සාධාරණය.

රට පුරා දෛනික රාජකාරී අඩාල වී තිබේ. බැංකු, කාර්යාල හා ව්‍යාපාරික ස්ථානවලට පවා අතිරේක ආරක්ෂක විධි විධාන යොදවා ඇත. රෝහල්වල රෝගීන් ඇතුළත් කිරීමේදී පවා වාහන හා පුද්ගල පරීක්ෂා කිරීම් කරන්නට නැඹුරු වී තිබේ. මේවා අතිරේක පිරිවැයක් බව සඳහන් කළ යුතුය. අනපේක්ෂිත කාලයක් අතිරේක ශ්‍රමයක් වැය කරන අතර අවසානයේදී මෙම පිරිවැය ආර්ථිකයට බරකි.

දින ගණනාවක් තිස්සේ රට පුරා හදිසි නීතිය පනවා තිබේ. භාණ්ඩ ප්‍රවාහනයට බාධා සිදුවී ඇත. වරාය භාණ්ඩ හැසිරවීමට බාධා සිදුවී ඇති අතර තොග වෙළෙඳපොළ භාණ්ඩ හිඟයක් පවතින බව වාර්තා වෙයි. ප්‍රශස්ථ මට්ටමකින් අඛණ්ඩව ආරක්ෂක තත්ත්වය ගැන අවධානය පවත්වා ගැනීමට සමත් වූයේ නම් මෙවැනි හදිසි විපත් ඇති නොවන බව පැහැදිලිය. යුද වාතාවරණය පහ වී වසර දහයක් ගතවන විට ආරක්ෂාව සැහැල්ලුවට ගත් අතර බුද්ධි අංශ සේවාව නොවැදගත් එකක් සේ සැලකීය. ආර්ථිකයට හා සමාජයට ගෙවන්නට සිදුවී ඇති වන්දිය බරපතළය.

2019 වසර ආරම්භ කළේ කිසියම් ආකාරයක ආර්ථික පසුබෑමක් සමගය. අයවැය ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර එය ආර්ථික කටයුතු සීමා කරන්නටද බලපෑවේය. රජයේ අපේක්ෂාව සියයට 3.5 ක පමණ ආර්ථික වර්ධනයකි. 2018 වසරේ වර්ධනය සියයට 3 ක් වූ අතර එය දහ හත් අවුරුද්දකට පසු වාර්තා වූ අඩුම වර්ධන වේගයයි. කිසියම් ප්‍රතිසංස්කරණ මාලාවකට පසු ආයෝජනය වැඩි කර, නිෂ්පාදනය නංවන අවුරුද්දක් සැලසුම් කරන ලද නමුත් එය බරපතල අභියෝගයක් විය හැකි බව පෙනේ.

පාස්කු ඉරිදා ප්‍රහාරය සංචාරක ව්‍යාපාරයේ පැවැත්මට සෘජුව බලපෑමක් කර තිබේ. සාමය තහවුරු කිරීමෙන් පසු ගත වූ වසරේදී රටේ සංචාරක ඉදිකිරීම් අංශයෙහි වේගවත් වර්ධනයක් පෙන්නුම් කළ අතර විනිමය ඉපැයීම සම්බන්ධයෙන් සලකන විට සංචාරක ව්‍යාපාරය කැපී පෙනෙන ප්‍රගතියක් අත් පත් කරගත්තේය. ජාත්‍යන්තර පර්යේෂණ අංශ ශ්‍රී ලංකාව සංචරණයට ඉතාම සුදුසු ස්ථානයක් බවට නම් කර තිබුණි. එය ඉතා වාසිදායක වාතාවරණයක් නිර්මාණය කළ අතර මෙම හදිසි තත්ත්වය උද්ගත වන විට එය ශ්‍රී ලංකාවේ විනිමය ඉපැයීම් අතින් තුන්වැනි තැනට පත්වීමට සමත්ව සිටියේය. විනිමය උපයන මාර්ග වශයෙන් තේ, රබර් හා පොල් යනුවෙන් කියමින් සිටි රට, අද වන විට විදේශවල රැකියා කරන ලාංකිකයන් එවන විනිමය, ඇඟලුම් කර්මාන්තය හා සංචාරක ව්‍යාපාරය වශයෙන් සඳහන් කරන තත්ත්වයකට පත්වෙමින් තිබුණි. නමුත් මරාගෙන මැරෙන පාස්කු ඉරිදා ප්‍රහාර වැල විදේශිකයන් 45 දෙනෙකු ජීවිතක්ෂයට පත් කළේය. ප්‍රධාන තරු හෝටල් තුනක පිපිරීම් සිදුවූ අතර තවත් හෝටල්වල පිපිරවීමේ ප්‍රයත්න ව්‍යවර්ථ විය. ඉතාම ඉහළ පැලැන්තියේ සංචාරක ව්‍යාපාරයට එය විශාල බලපෑමක් වනු වැළැක්විය නොහැකිය. දින කිහිපයක් ඇතුළත ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, චීනය, ඕස්ට්‍රේලියාව හා දකුණු කොරියාව ශ්‍රී ලංකාවේ සංචාරය අවදානම් බව නිවේදනය කළේය. සෑහෙන සංචාරක පිරිසක් ගමන් වෙනස් කර තිබුණ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් සේවා සමාගම් ප්‍රවේශපත් අවලංගු කරන ලද බව අනාවරණය වෙයි.

මෙම සිද්ධිය වන විට ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය තුන් අවුරුදු ප්‍රචාරක සැලැස්ම සඳහා කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් සිටියේය. පසුගිය අවුරුදු දිනවල රැ ස්වූ කැබිනට් මණ්ඩලය එම ප්‍රචාරණ සැලැස්ම අනුමත කළේ නම් රුපියල් බිලියන තුනක් වැය කරන අන්තර් ජාතික ප්‍රවර්ධන වැඩ සටහනක් දියත් වනු ඇත. එය ප්‍රධාන සංචාරකයන් සිටි කලාප අටක් ආවරණය

7 වන පිටුව බලන්න

# බුදු දහම සහ ජාතිවාදය

■ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන අනු නා හිමි

මිනිසා ජාති, කුල ගෝත්‍ර ආදී වශයෙන් විවිධ කණ්ඩායම්වලට බෙදී සිටීම සහ ඔවුනොවුන් අතර විවිධ ගැටුම් සහ භේදකාරී තත්ත්වයන් ඇති කර ගැනීම ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් එන තත්ත්වයකි. ක්‍රි.පූ. 5000 ටත් වඩා ඈතට ගමන් කරන වෛදික සාහිත්‍යයේ පවා වර්ණයට අනුව මිනිසුන් වර්ග කිරීමක් පැවැති බව පෙනේ.

ව්‍යවහාර වශයෙන් මිනිසුන් අතර නානාත්වයක් ඇති බව බුදුදහම පිළිගන්නා නමුත් (නානත්තකායා නානත්ත සඤ්ඤා) ජාති, වර්ණ, කුල, ගෝත්‍ර, වශයෙන්ම මිනිසා විසින් ඇති කරගෙන තිබෙන එකී සම්මතයන්ට අනුව එක් වර්ගයක් තවත් වර්ගයකට වඩා උසස්ය හෝ පහත්ය යන අදහස බුදුසමය සහමුලින්ම බැහැර කරයි. කවර නම්වලින් හැඳින්වුවද මිනිසුන් අතර ජාති භේදයක් පැවතිය නොහැකි බවත් මිනිසාට ඇත්තේ එකම ජාතියක් බවත් පළමුවරට ප්‍රකාශ කළ ශාස්තෘවරයා බුදුන් වහන්සේය.

බුදුන් වහන්සේ පහළ වන අවධිය වන විට භාරතීය සමාජයේ ඉහළම වරප්‍රසාද හිමි කරගෙන සිටියේ බ්‍රාහ්මණයන්ය.ආගමික වශයෙන්ද බ්‍රාහ්මණ ආධිපත්‍යය සමාජයේ සෑම අංශයක් කෙරෙහිම තදින් බල පැවැත්විය. උත්පත්තිය අනුව මිනිසා උසස් පහත් වශයෙන් වර්ග කිරීමේ ක්‍රමයක් හෙවත් දැඩි වර්ණ භේද වාදයක් එකල සමාජය තුළ තහවුරු වී තිබිණ. බ්‍රාහ්මණ ධර්මයට අනුව මිනිසා බ්‍රහ්මයාගේ නිර්මාණයකි. ඒ අනුව බ්‍රාහ්මණ වංශය බ්‍රහ්මයාගේ මුඛයෙන්ද ක්ෂත්‍රියයා බාහුවෙන්ද වෛශ්‍යයා නාභියෙන්ද ශුද්‍රයා පාදයෙන්ද බිහිවූයේ වෙයි. බ්‍රාහ්මණයා සෑම අතින්ම පාරිශුද්ධ වූ අතර අනෙක් අය ඊට පහත්ය. ශුද්‍රයන් යනුවෙන් හැඳින්වූ කොටස කෙතරම් පහත් තත්ත්වයක ලා සැලකුවේද යත් නිදහසේ ආගම ඇදහීම වැනි මානව අයිතිවාසිකම් පවා අහිමි කර තිබිණි. මෙසේ උත්පත්තිය අනුව මිනිසුන් උසස් පහත් සේ වර්ග කිරීම සහ මිනිස් අයිතිවාසිකම් පාගා දැමීම බුදුරජාණන් වහන්සේ පිළිකුල් කළ අතර, එබඳු තත්ත්වයක් කවර මූලධර්මයකට අනුව වූවත් පිළිගත නොහැකි බව ශාස්ත්‍රීය මෙන්ම විද්‍යාත්මක පදනමකින් යුතුව පැහැදිලි කළහ.

ජාතිවාදය පිළිබඳ බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කරන ඉතාමත් වැදගත් දේශනාව ඇතුළත් වන්නේ මජ්ඣිම නිකායේ වාසෙට්ඨ සූත්‍රයෙහිය. උන්වහන්සේ එය මෙසේ පැහැදිලි කළහ.

"වාසෙට්ඨයෙනි, මම තොපට ප්‍රාණීන්ගේ ජාති විකාශය ඇති සැටියෙන් මෙසේ විවරණය කරමි. ජාතීහු නානාප්‍රකාරයහ. යම් තෘණ, වෘක්ෂ කෙනෙක් ඇත්ද ඔවුන්ගේ වෙන වෙනම ජාතිමය ලිංගයක් ඇත. කවර හෙයින්ද යත් තෘණ ලතාවෝ නානා ප්‍රකාරය. එක ගස් වර්ගයකින් අනෙක් ගස් වර්ගය වෙනස්ය. එය ලතාවකින් අනෙක් තෘණ ලතා වෙනස්ය. එසේම කුරුකුහුඹුවන්ගේ පටන් පණුවන්ද පළගැටියන්ද වෙනස්ය. උන්ගේ ජානමය ලිංගයක් ඇත. පා දෙක ඇති සතුන්, පා සතරක් ඇති සතුන් අතරද ජාති වශයෙන් වෙනසක් ඇත. ඔවුන් නානාප්‍රකාරයහ. ජලයෙහිම උපන් ජලයම ගෝචර කොට සිටින මත්ස්‍යයන් ආදී සතුන්ගේද වෙනස් ජාති ඇත. එක් ජලජ සත්වයෙකුගෙන් අනෙක් සත්වයා වෙනස්ය. පියාපත් විදහා අහසේ පියාසර කරන සත්වයන්ගෙ "ද(පක්ෂීන්) වෙනසක් ඇත. පක්ෂීන් විවිධය. නානාප්‍රකාරය. මෙසේ විවිධ සත්ව කොටස් අතර වෙන වෙනම ජාතිමය ලිංග ඇත්ද, ඒ ආකාරයෙන් මිනිසුන් කෙරෙහි ජාතිමය ලිංගයක් නැත.

**"යථා එතාසු ජාතිසු ලිංගං ජාතිමයං පුථු**
**එවං නත්ථි මනුස්සෙසු ලිංගං ජාති මයං පුථු"**

මෙයින් බුදුරජාණන් වහන්සේ පැහැදිලි කරන්නේ ජීව විද්‍යාත්මක සත්‍යතාවයකි. ජීව විද්‍යාවට අනුව විවිධ සත්ව කොට්ඨාශයන්හි ලක්ෂණ විශ්ලේෂණය කරන විට සතුන් මෙන් මිනිසාගේ විවිධ ජාතීන් දැක්විය නොහැක. මිනිසා කෙබඳු ස්වරූපයන්ගෙන් යුක්ත වූවත් එකම ජීව විශේෂයකි. එම නිසා මිනිසුන් අතර ජාති භේදවාදයක් පවතින්නේ නම් ජීව විද්‍යාත්මක පදනමක් මත බුදු දහම එය ප්‍රතික්ෂේප කරයි.

භෞතික විද්‍යාත්මක සාධකවලට අනුවද මිනිසුන් අතර සත්ව ජාති මෙන් විවිධ වර්ග දැක්විය නොහැක. බුදුරජාණන් වහන්සේ එකී සාධක පැහැදිලි කර දෙමින් වාසෙට්ඨ සූත්‍රයෙහිදී පැහැදිලිවම ජාතිවාදය බැහැර කරති. එනම් ඕනෑම මිනිසෙකුගේ ශාරීරික අංග ලක්ෂණ පිහිටා ඇති ආකාරය බලන විට ඇත්තේ එකම ස්වරූපයකින්ය. කේශයෙන්, හිසින්, කනින්, ඇසින්, මුවින්, නැහැයෙන්, තොලින් විභේදයක් නැත. ග්‍රීවයෙන්, අංශයෙන්, උදරයෙන්, පිටින්, උරයෙන්, අත්වලින්, පාවලින්, ඇඟිලි, නිය, කලවා ආදියෙන් හා මෛථුනයෙන්ද විභේදයක් නැත. මෙම ශරීර අංගවල වර්ණය, උස, පළල, හැඩය,ආදියෙහි නානාත්වයක් දක්නට ලැබුණද විද්‍යාත්මක වශයෙන් ඇත්තේ එකම පදනමකි. එහෙත් සිවුපාවුන් පමණක් ගතහොත් එක් එක් සිව්පා වර්ගයන්ගේ ශරීර අංගයන්හි සංයුතිය වෙනස්ය. ප්‍රජනනය හා මෛථුනයද වෙනස්ය. භෞතිකව බලන විට මිනිසා තුළ ඇති ඒකීයත්වය අනුව ජාතිවාදයක් ඇති කර ගැනීමට පදනමක් නැති බව බුදුදහම පෙන්වා දෙයි.

ආචාර විද්‍යාත්මකව සලකන විට මිනිසුන් අතර ඔවුන්ගේ උප්පත්තියට අනුව ජාති, වර්ග, වශයෙන් ප්‍රභේදයක් ඇති කළ නොහැකි බව ඉතාමත් පැහැදිලිව පෙන්වා දී ඇත. ඒ බව වාසෙට්ඨ සූත්‍රයේහි දක්වා ඇත්තේ මෙසේය.

**"සමඤ්ඤා හෙසා ලොකස්මිං නාමගොත්තං පකප්පිතං**
**සමුච්ච සමුදාගතං තත්ථ තත්ථ පකපපිතං"**

සහ ලේ නෑ ආදීන් විසින් කරන ලද නාම ගෝත්‍රයක් ඇද්ද එය ලෝකයෙහි ව්‍යවහාර මාත්‍රයක් පමණි. බොහෝ කාලයක් තුළ පාරම්පරිකව පැවත එන බැඳීම මුල්කොට ගෙන ඒ ඒ තන්හි උපන් කල්හි කරන ලද නාමගෝත්‍රය සම්මතයක් පමණි. එය නොදන්නාහු ජාතියෙන් බ්‍රාහ්මණ යයි කියති.

මේ අනුව මිනිසුන් උප්පත්තියට අනුව උසස් පහත් වශයෙන් සැලකීමත් එක් කොටසක් වරප්‍රසාද හිමි කරගැනීමත් තවත් කොටසකට අයිතිවාසිකම් අහිමි කිරීමත් සමාජ ධර්මයට එකඟ නොවන බව බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ. යමෙක් ජාති වාදයෙන් ගෝත්‍රවාදයෙන් යුක්තව අන්‍යයන් පහත් කොට සලකා ක්‍රියාකරන්නේ නම් ඔහු පිරිහීමට පත් වන බවද උන්වහන්සේ පැහැදිලි කළහ.

**"ජාති දෙඩා ධනත්තද්ධෝ ගොත්තදඩෝචත්ද්ධෝ යො නරෝ**
**සඤ්ඤාතිං අතිමඤ්ඤති තං පරාභවතො මුඛං"**

බුදුදහමේ උගන්වන අවසාන නිෂ්ටාව හෙවත් නිර්වාණය සියලු බැඳීම්වලින් නිදහස් වීමයි. අම්බට්ඨ සූත්‍රයෙහිදි බුදුරජාණන් වහන්සේ යමෙක් ජාතිවාදයෙන්, ගෝත්‍රවාදයෙන් බැඳුණේ වෙයිද, ඔහු ඒකාන්තයෙන්ම නිවනින් ඈත් වන්නේ යැයි ප්‍රකාශ කරති. එයින් පැහැදිලි වන්නේ බෞද්ධ ප්‍රතිපදා මාර්ගයෙහි උත්තරීතර අවස්ථාව හෙවත් නිර්වාණබෝධය ලැබූ උතුමන් තුළ ජාති, ගෝත්‍ර, කුල වශයෙන් ඇති වන පටු ආකල්ප කවර ආකාරයකින් වුවත් පැවතිය නොහැකි බවය.

බුදුරජාණන් වහන්සේ මෙසේ ජාතිවාදය උන්වහන්සේගේ ඉගැන්වීම් තුළින් බැහැර කළා පමණක් නොව ජාතිවාදයෙන් තොර තෘප්තිමත් සමාජයක් බිහි කළ හැකි බව ආදර්ශයෙන්ද ඔප්පු කළහ. උන්වහන්සේ ඇති කළ භික්ෂු සමාජයට එවකට භාරතයේ සිටි සියලු ජාති, කුල, ගෝත්‍රවලට අයත් පුද්ගලයන් ඇතුළත් කර ගත්හ. එසේම කිසිදු විශේෂයක් නැතිව ඔවුන්ව සංඝ සමාජයේ හිමි විය යුතු ස්ථාන ලබාදුන්හ. බුදුන් වහන්සේ සඳහන් කළේ බෞද්ධ පැවිද්ද හරියටම මහ මුහුද හා සමාන බවය. එනම් සියලු ගංගාවලින් එන ජලය මහ මුහුදට වැටුණු කල (මුහුදුවතුර) එකම ලුණු රසයෙන් යුක්ත වන්නා සේ කවර ජාතියක, කුලයකින් සසුනට ඇතුළු වූවත් ඒ සියලු දෙනාම එකම බුද්ධ ශ්‍රාවකයින් බවය. සසුන බොහෝ කලක් පැවතියේද ඒ ආකාරයෙන්ය. මේ අනුව අවසන් වශයෙන් සඳහන් කළ යුතු වන්නේ දර්ශනයක් වශයෙන් බුදුසමය ජාති භේදය පිළිකුල් කරන අතර සමාජය තුළ ඇති විවිධ ජාති, වර්ණ, කුල,ගෝත්‍ර අභිභවා මනුෂ්‍යත්වයට ජයගත හැකිබව පැහැදිලිවම විවරණය කරන බවය.

## තිබුණෙත් එච්චරයි...

6 වන පිටුවෙන්

කරන වැඩපිළිවෙළක් වන අතර එමගින් මෙම වසරේ දී සංචාරකයන් ලක්ෂ තිහක් ගෙන්වා ගැනීමට සැලසුම් කර තිබුණි. පසුගිය වසර අවසන් වන විට සංචාරකයන් ලක්ෂ විසි තුනක් රටට පැමිණ සිටි අතර එය ඉලක්කයට වඩා ලක්ෂ දෙකක අඩුවකි. එම පසුබෑමද මග හරිමින් ඉදිරියට යන්නට තිබුණ අවස්ථාව දැන් සම්පූර්ණයෙන්ම අවදානමට ලක්ව ඇත.

සංචාරක කර්මාන්තයේ ප්‍රගතිය වැදගත් ඇයි? එක පැත්තකින් රටට විදේශගත ශ්‍රී ලාංකිකයන් එවන විනිමය අඩු වෙමින් තිබේ. ඇඟලුම් කර්මාන්තය පිරිවැය කළමනාකරණය කරගත නොහැකි අවදානම් තැනකය. අඩු වැටුපකට වැඩ කරන්නට කැමති නැති හෙයින් කර්මාන්ත අධික ශ්‍රම හිඟයකට මුහුණ දී සිටී. තේ කර්මාන්තයද සේවක වැටුප් ඉහළ නංවන සේ ඉල්ලා බලකරන අභ්‍යන්තර පීඩනයක හා විදේශ ගැනුම් කරුවන් සීමාසහිත වන තර්ජනයක පවතී. තේ අලෙවිය වෙනුවෙන්ද ජාත්‍යන්තර ප්‍රචාරණ සැලැස්මක් යෝජනා කරන තත්ත්වයක තිබුණි. මෙම පැති තුනම එක්තරා සසල වීමක් තිබියදී සංචාරක කර්මාන්තයේ ප්‍රගතිය රටට ආශිර්වාදයක් වූ අතර පවතින ආරක්ෂක වාතාවරණය එයට කරන බලපෑම එතරම් යහපත් එකක් විය නොහැකිය.

වසර ආරම්භ වන විට ශ්‍රී ලංකාව බරපතළ විදේශ විනිමය අර්බුදයක සිටියේය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සිය තාවකාලික ණය සංචිතය දීර්ඝ කරන ලද අතර ඉන්දියාව හා චීනය හදිසි විනිමය සංචිත නිදහස් කළේය. ආනයනය සඳහා අවශ්‍ය විනිමය ප්‍රමාණවත් නොවීම ගැටලුවක් වූ අතර එය වලකා ගැනීම සඳහා ආනයන අධෛර්යවත් කරන ප්‍රතිපත්තියක පිහිටියේය. ශ්‍රී ලංකාව 2018 දී අමෙරිකානු ඩොලර් බිලියන 23 ක ආනයන කරන විට අපනයනවලින් උපයන විදේශ විනිමය ප්‍රමාණය ඩොලර් බිලියන 11.9 ක මට්ටමක පැවතිණ. රජයේ විදේශ ණය ගෙවා දැමීම ඇතුළු කටයුතු වෙනුවෙන් ඩොලර් බිලියන 3.9 ක් වුවමනා විය. බලශක්ති අර්බුදය හමුවේ තෙල් ආනයන වියදම වැඩි විය හැකිය. විදේශ රටවලින් ගෙන්වන ලද පාවෙන විදුලිය බලාගාරවලට ඩොලර්වලින් බිල් ගෙවීමට සිදුවන අතර එය පහසු නැත. මෙයින් පෙන්වන්නේ විදේශ විනිමය සම්බන්ධ ගැටලු තව දුරටත් වර්ධනය විය හැකි බවය.

ශ්‍රී ලංකාව පසුගිය වසර කිහිපය තුළ අඩු ආර්ථික වර්ධනයක පිහිටියේය. මුදල් අමාත්‍යාංශය තොරතුරු සනාථ කරන අන්දමට වසර 2024 දක්වා සියයට හතර ඉක්මවන වර්ධනයක් නොපවතිනු ඇත. රජයේ ආයෝජන සීමාසහිත වී ඇති අතර අනාරක්ෂිත පසුබිම අනුව පෞද්ගලික අංශයේ ආයෝජනද පහත වැටීමට ඉඩ තිබේ. දෙස් විදෙස් ආයෝජකයන්ට පහසුකම් සම්පාදනය කරන ප්‍රතිපත්ති අනුගමනය කළ යුතුය. ආණ්ඩුව අපේක්ෂා කරන ලද මහා පරිමාණ කර්මාන්ත එනම් වොක්ස්වාගන් කම්හල, හොරණ ටයර් කර්මාන්ත ශාලාව ගැටලු සහගත තැනකය. හම්බන්තොට ඉදිකරන බවට යෝජනා වූ ඕමාන තෙල් පිරිපහදුව පවා අර්බුද මතු කර තිබේ. මේවායෙන් පෙන්වන්නේ අපේක්ෂා කරන ආර්ථික සැලසුම් අඩාල වීම හැර අනෙකක් නොවේ.

ආණ්ඩුව මගින් ව්‍යවසායකත්වය නංවන වැඩ පිළිවෙළක් සඳහා මහත් උත්සාහයක් ගත්තේය. ස්වශක්ති හා ගම් පෙරළිය වැඩ සටහන් මගින් බිලියන ගණනින් ණය නිදහස් කර ලක්ෂ ගණන් ව්‍යාපෘතිවලට සැලසුම් සකස් කළේය. මෙම ඉලක්කවලට ආරක්ෂක තර්ජනය අවහිරයක් වනු වැළැක්විය නොහැකිය. මේවායේ කරන නිෂ්පාදනවලට ලැබෙන අනුබලය කුමක්ද? නිදහස් කරන ණයවලින් අරඹන ව්‍යාපෘතිවලට ආරක්ෂාව හමුවේ දරන්නට සිදුවිය හැකි අතිරේක පිරිවැය ගැන අවධානය යොමු කළ යුතුය. රක්ෂණ අවස්ථා ගැන ඇති සූදානම සොයා බැලිය යුතුව තිබේ. මේවායෙන් පෙන්වන්නේ ඉදිරි කාලය පහසු නැති බවය. අවිනිශ්චිතභාවය මගින් කාර්යක්ෂමතාව හා ඵලදායිතාව අනතුරක හෙළනු නියතය. ආරක්ෂක විධි විධාන අනුව මාර්ග බාධක, වාහන නතර කිරීමේ තහනම, තාවකාලිකව පනවන ඇඳිරිනීතිය හා භාණ්ඩ ප්‍රවාහනයේදී මතුවන දුෂ්කරතා කිසිම නිෂ්පාදන අංශයක වාසියට හේතු නොවේ.

දස වසරකට කලින් රටේ තිබුණ වාතාවරණය අමතක කළ යුතු නැත. ලෝක බැංකුව වරක් අනතුරු අඟවන ලද පරිදි යුද තත්ත්වය හෙයින් දළ දේශීය නිෂ්පාදිතයේ සියයට දෙකක හානියක් වසරකට එවකට සිදුවිය. එය විශාල අවාසියකි. මෙම පැති ගැන සැලසුම් සම්පාදකයන්ගේ අවධානය යොමු විය යුතු අතර සාමාන්‍ය ජනතාව එළැඹිය හැකි දුෂ්කර ආර්ථික වාතාවරණය හමුවේ අලුත් සැලසුම්වලට සූදානම් වීම වැදගත්ය.

# වෙනිසුවෙලා අර්බුදය

## 'කුමන්ත්‍රණයක්' ගැන විපක්ෂ නායකට චෝදනා

(බී.බී.සී. සිංහල පුවත්)

වෙනිසුවෙලා ජනාධිපති නිකලස් මදුරෝගේ පාලනය අවසන් කිරීමේ 'අවසන් අදියර' කරා තමන් පැමිණ ඇති බව විපක්ෂ නායක ජුවාන් ගුඅයිඩෝ ප්‍රකාශ කිරීමෙන් අනතුරුව කුඩා ප්‍රමාණයේ කුමන්ත්‍රණ ප්‍රයත්නයක් බිඳ හෙලමින් සිටින බව එරට බලධාරීහු පවසති.

නිල ඇඳුම් ලා ගත් පිරිසක් සමග වීඩියෝ දර්ශනයක පෙනී සිටි ගුඅයිඩෝ, තමන්ට හමුදා සහාය ඇති බව පැවසීය.

පසුගිය ජනවාරියේදී තමන් අන්තර්කාලීන ජනාධිපතිවරයා බව ප්‍රකාශයට පත් කළ ගුඅයිඩෝ, මදුරෝ විසින් බලය 'පැහැර ගනු ලැබීම' අවසන් කිරීම සඳහා සහය දෙන ලෙස හමුදාවේ සාමාජිකයින් වැඩි දෙනාගෙන් ඉල්ලා සිටින බව කියා සිටියේය.

ගුඅයිඩෝ සමග පැවති අර්බුදය අතරතුර හමුදාවේ සහාය සාමාන්‍යයෙන් මදුරෝ හට ලැබිණි.

නමුත් උද්ධමනය, විදුලිය කප්පාදුව, ආහාර හා ඖෂධ හිඟයෙන් පිරුණු ගෙවී ගිය වසර කිහිපය තුළ ප්‍රතිරෝධය නැග එද්දී එතෙක් හමුදාව තුළ වූ පක්ෂපාතීත්වය වෙනස් කරගනු ඇති බව මදුරෝගේ විවේචකයෝ පැවසූහ.

ඇමෙරිකාව සහ බොහෝ ලතින් ඇමෙරිකානු රටවල් ඇතුළු රටවල් ගණනාවක් ජුවාන් ගුඅයිඩෝ වෙනිසුවෙලාහි නියම නායකයා ලෙස පවසද්දීත්, මේ දක්වා හමුදාව මදුරෝ හට සහය දැක්වීය.

ගුඅයිඩෝගේ අලුත් වැඩපිළිවෙල මදුරෝ බලයෙන් නෙරපීමට තරම් වන අවස්ථාවක් වේද යන්න පිළිබඳව ලෝකය දැන් බලා සිටී.

කෙසේ වෙතත්, මදුරෝ පවසන්නේ තමන්ට තවමත් හමුදාවේ පූර්ණ සහාය ඇති බවකි.

### දැන් සිදුවෙන්නේ කුමක්ද ?

දෙපාර්ශ්වයටම සහාය දෙන පිරිස් කරකස් අගනුවර විවිධ තැන්වලට ඒකරාශී වී සිටිති.

ගුඅයිඩෝට හිතවත් පිරිස් හා සන්නද්ධ හමුදා වාහන අතර ගැටුම් පවතී. විරෝධතාකරුවන් ගල්මුල්වලින් පහර එල්ල කරද්දී කඳුළු ගෑස් හා ජල තුවක්කුවලින් ඔවුන් වෙත ප්‍රති ප්‍රහාර එල්ල වේ.

සන්නද්ධ රථ මිනිසුන් රැසක් අතරට ධාවනය වන අයුරු රූපවාහිනී කැමරාවලටද හසු වුවත්, කිසිවකුට හෝ තුවාල සිදුවීද යන්න පැහැදිලි නැත.

මේ අතර, රූපවාහිනියෙන් ප්‍රකාශයක් කළ වෙනිසුවෙලාහි ආරක්ෂක ඇමති ව්ලදිමීර් පද්‍රිනෝ අවධාරණය කළේ හමුදාව තවමත් මදුරෝ සමග සිටින බවය.

ඇතැම් හමුදා සාමාජිකයින්ගේ නැගී සිටීම 'අර්ධ වශයෙන් පරාජය කළා' යැයි ඔහු පැවසුවද ලේ වැගිරීමක් විය හැකි යයිද අනතුරු ඇඟවීය.

"රටේ ස්වෛරී බව හා නිදහස ආරක්ෂා කිරීම සඳහා ජනරජයේ අවි සූදානම්" යැයිද ඔහුගේ අනතුරු ඇඟවීමේ දැක්විණි.

### විරෝධය නැගුනේ කුමකින්ද?

ගුඅයිඩෝ පෙනී සිටි විනාඩි තුනක වීඩියෝ පටයක් අඟහරුවාදා (අප්‍රේල් 30) අලුයම පළවිය. කරකස්හි 'නිර්භීත සෙබළුන්ගේ' සහය තමන්ට හිමි වූ බව ඔහු එයින් නිවේදනය කළේය.

"වෙනිසුවෙලාවේ ජනතාවනි, වීථි බසිමු... නැවත හැරවිය නොහැකි වන්නා වූ, බලය පැහැර ගැනීම අවසන් කිරීමට සහය දෙමු. රටේ සන්නද්ධ හමුදාව නිවැරදි තීන්දුව ගෙන තිබෙනවා. ඔවුන්ට වෙනිසුවෙලා ජනතාවගේ සහාය තිබෙනවා. ඒ වගේම අපගේ ව්‍යවස්ථාවේ සහාය ලැබෙනවා. ඉතිහාසය තුළ ඔවුන් නිවැරදි පාර්ශ්වයේ හිඳින බව තහවුරු කර තිබෙනවා" යැයි ඔහු පැවසීය.

මේ දර්ශනය තුළ ඔහු අසල සිටියේ තවත් විපක්ෂ නායකයෙකු වන ලියෝපෝල්ඩ් ලෝපෙස් ය. 2014 වසරේ ආණ්ඩුවට එරෙහි විරෝධතා අතර ප්‍රචණ්ඩ ක්‍රියාවල යෙදුණේ යැයි නැගුනු චෝදනාවට වරදකරු වී මේ දක්වා ඔහු නිවාස අඩස්සියේ රඳවා තැබිණි.

ගුඅයිඩෝ වෙත සිය පක්ෂපාතීත්වය පළ කළ හමුදා සාමාජිකයින් විසින් තමන් නිදහස් කරන ලද බව ලෝපෙස් පැවසීය.

### ජුවාන් ගුඅයිඩෝ යනු කවරෙක්ද?

විරුද්ධ පක්ෂයේ පාලනය ඇති ජාතික සභාවේ සභාපතිවරයා වූ ගුඅයිඩෝ, තමන් අන්තර්කාලීන ජනාධිපතිවරයා බව ප්‍රකාශයට පත් කළ තැන් සිට හමුදාවේ සහාය ඉල්ලා සිටියේය.

ජනාධිපති මදුරෝ 'බලය පැහැර ගත්තකු' ලෙස ඔහු හැඳින්වූයේ, ඉතා අර්බුදකාරී වූ ඡන්දයකින් යළි බලයට පැමිණීම හේතුවෙනි. ගුඅයිඩෝ පෙනී සිටින වීඩියෝ දර්ශනය කරකස් හි පිහිටි ලා කාර්ලෝටා ගුවන් කඳවුර තුළ හෝ ඒ ආසන්නයේදී අලුයම් කාලයේ පටිගත කරන ලද්දක් බව පෙනෙන්නට විය.

# මන්දාකිණියක කළු කුහරයක් ඡායාරූපයට

(බී.බී.සී. සිංහල පුවත්)

මන්දාකිණියක පිහිටි කළු කුහරයක ඡායාරූපයක් පළමු වරට කැමරාවක සටහන් කර ගැනීමට තාරකා විද්‍යාඥයින් පිරිසක් සමත් විය. එහි විෂ්කම්භය කිලෝමීටර් බිලියන 40 ක් පමණ වන අතර, පෘථිවිය මෙන් මිලියන තුන් ගුණයක විශාලත්වයෙන් යුක්ත වේ. විද්‍යාඥයන් එය හඳුන්වන්නේ, 'රාක්ෂයකු' ලෙසය.

කිලෝමීටර් ට්‍රිලියන මිලියන 500 ක් තරම් දුරින් පිහිටි එම කළු කුහරය ඡායාරූපයට හසු කරගෙන ඇත්තේ, ලෝකයේ ස්ථාන කිහිපයක රැඳ වූ දුරේක්ෂ 8 ක කැමරා ජාලයක් ආධාරයෙනි. මේ සම්බන්ධ තොරතුරු Astrophysical Journal Letters හි පළ කර තිබේ.

කළු කුහරය ඡායාරූපයට නගා ඇත්තේ, Event Horizon Telescope (EHT) නමැති දුරේක්ෂ 8 ක ජාලයක් මගිනි.

අත්හදා බැලීම යෝජනා කළ නෙදර්ලන්තයේ රැඩ්බවුඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය හෙයිනෝ ෆැල්කේ බීබීසී පුවත් සේවයට පැවසුවේ, එම් 87 නමැති මන්දාකිණියෙන් එම කළු කුහරය සොයා ගැනුණු බවය.

"අපි මේ දකින කළු කුහරය අපේ මුළු සෞරග්‍රහ මණ්ඩලයටත් වඩා විශාලයි," ඔහු පැවසීය.

"එය සූර්යයාගේ ස්කන්ධයට වඩා බිලියන 6.5 ගුණයකින් වැඩියි. ඒ වගේම ඒක විශ්වයේ පවතින බව විශ්වාස කරන විශාලතම කළු කුහර අතරින් එකක්. ඒක ඇත්තෙන්ම රාක්ෂයෙක්. විශ්වයේ කළු කුහර අතරින් හෙවිවේට් ශූරයා වන්නේ මෙයයි."

ඡායාරූපයෙන් පෙනී යන්නේ අතිශය දීප්තිමත් 'අග්නි වළල්ලක්', බව පවසන මහාචාර්ය ෆැල්කේ සඳහන් කළේ, එම අග්නි වළල්ල වෘත්තාකාර කළු කුහරය වටා දක්නට ලැබෙන බවය. එම දීප්තිමත් රැස් වළල්ල ඇති වීමට හේතුව අධික ලෙස දහනය වූ වායු කුහරය තුළට පතිත වීමය. එතරම් දුරක පැවතිය ද, පෘථිවියේ සිට එය දැකගත හැකි වන්නේ, මන්දාකිණියේ ඇති බිලියන ගණනක් තාරකාවන්ට වඩා ඉන් වැඩි ආලෝකයක් නික්මෙන හෙයිනි.

එම කළු කුහරයට වායු ඇතුළු වන්නේ අඳුරු පැහැති වෘත්තයේ දාරය තුළිනි. එය අධික ගුරුත්වාකර්ෂණ බලයකින් යුක්ත වන අතර, ඉන් ආලෝකයට පවා ගැළවීමක් නොලැබේ.

මෙම ඡායාරූපය ලබා ගැනීම සඳහා දුරේක්ෂ ජාලය ඉදි කළ කණ්ඩායමේ සාමාජිකයෙකු වූ

10 වන පිටුව බලන්න

1 වන පිටුවෙන්

## ඔන්ටේරියෝ...

වරක් පොරොන්දු ලබා දුන් නමුත් එම ඉලක්ක කරා ළං වීමට ඔවුන් අපොහොසත් විය.

රක්ෂණ වන්දි ලබාගැනීමේදී හර ගිණුම් ශේෂයක් ලෙස ක්‍රියා කරන කාඩ් පතක් Driver Care Card ලෙස හඳුන්වා දීමට රජය සැලසුම් සකස් කර ඇති බව මෙවර අයවැයේදී සඳහන් විය.

### BOOZE AND GAMBLING

වර්තමානයේදී OLG මගින් පෞද්ගලික සමාගම් වෙත ලබා දී ක්‍රියාත්මක කෙරෙන කැසිනෝ ආකාරයේ සූදු ව්‍යාපාර රජය මගින් ආරම්භ කිරීමට මෙවර අයවැයේදී යෝජනා වී ඇත. මෙය ක්ෂණිකව ක්‍රියාත්මක කළ නොහැකි බවත් ෆෙඩරල් අපරාධ නීතියෙහි ඊට අදාළ වෙනස්කම් සිදුකිරීම කළ යුතු බවත් සඳහන් වේ.

### ALCOHOL REFORM

මත්පැන් පරිභෝජනය හා විකිණීම සම්බන්ධයෙක් වන නීතිරීති වෙනස් කිරීමට යෝජනා වී ඇති අතර මේ සම්බන්ධයෙන් රජය වඩාත් හොඳ ක්‍රියා මාර්ග ගන්නා බව සඳහන් කොට ඇත. එහිදී උද්‍යානවල හෝ වෙනත් ප්‍රසිද්ධ ස්ථානවල මත්පැන් පානය සඳහා ඉඩකඩ ලබා දීමට නීති සම්පාදනය කිරීමට යෝජනා වී ඇත. මත්පැන් අලෙවි සල්, ආපනශාලා, ගොල්ෆ් සමාජ ආදියෙහි උදෑසන 9 සිට මත්පැන් ලබාගැනීමට හැකි වන ලෙස කාලය දීර්ඝ කිරීමටද මෙවර අයවැයෙන් අවධානය යොමු කොට ඇත. ඒ අනුව මෙය එළඹෙන ගිම්හානයේ සිට ක්‍රියාත්මක කෙරෙනු ඇත. ඒ සමගම මීට පෙර සඳහන් වූ පරිදි නගරයේ ග්‍රොසරි වෙළඳසල් තුළින් බියර් සහ වයින් මිල දී ගැනීමේ අවස්ථාව ඔන්ටේරියානුවන්ට හිමි වනු ඇත.

මීට අමතරව මෝටර් රථ වාහන අංක තහඩු වෙනස් කිරීමත්, අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ දන්ත වෛද්‍ය පහසුකම් ලබාදීමත් ආදි වෙනස්කම් රැසක් මෙවර ඔන්ටේරියෝ අයවැය යෝජනා තුළ ඇතුළත් කොට ඇත.

මෙවර අයවැයේදී health care සඳහා වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන සම්බන්ධයෙන් මේ වන විට විශාල මතභේද මතුව ඇත. ඔන්ටේරියෝවේ වත්මන් පදිංචිකරුවන්ට මෙන්ම නව දරු උපත් සහ අලුතින් පැමිණෙන සංක්‍රමණිකයනුත් සමග ක්‍රම ක්‍රමයෙන් වැඩි වන ජනගහනයට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා ඉදිරි තුන් වසර තුළ අවම වශයෙන් ඩොලර් බිලියන 70.3 ක් මුදලක් රජය විසින් සැපයිය යුතුව ඇතත් ෆෝඩ් රජය මගින් මෙවර අයවැයෙන් සෞඛ්‍ය සඳහා වෙන් කොට ඇත්තේ ඩොලර් බිලියන 65.3 ක් බව සඳහන් වේ.

# 'වැරදි' පක්ෂයට ඡන්දය දුන් නිසා ඇඟිල්ල කපා ගත් මිනිසෙක්

(බී.බී.සී. සිංහල පුවත්)

තමන් 'වැරදි' දේශපාලන පක්ෂයකට ඡන්දය භාවිත කළ බව දැන ගැනීමෙන් පසු සිය දබරැඟිල්ල තමන් විසින්ම කපා ගනු ලැබූ පුද්ගලයෙකු පිළිබඳව ඉන්දියාවෙන් වාර්තා වේ.

සමාජ වෙබ් අඩවි ඔස්සේ ව්‍යාප්ත වූ වීඩියෝවක දැක්වෙන්නේ, පවන් කුමාර් නමැති තමන් අත්වැරදීමකින් භාරතීය ජනතා පක්ෂයට ඡන්දය ලබා දී ඇති බවය.

ඔහුට අවශ්‍ය වී ඇත්තේ, උත්තර් ප්‍රදේශ් ප්‍රාන්තයේ ප්‍රාදේශීය වශයෙන් ප්‍රබල දේශපාලන පක්ෂයකට ඡන්දය ලබා දීමටය. එහෙත්, ඡන්ද ප්‍රකාශ කිරීමේ යන්ත්‍රයේ පැවති පක්ෂ සලකුණු රාශිය නිසා ඔහු ව්‍යාකූලත්වයට පත්ව තිබිණි.

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව සෑම ඡන්ද දායකයෙකුගේම දබරැඟිල්ලේ මැකීමට අපහසු තීන්ත සලකුණක් තබනු ලැබේ.

පවන් කුමාර් ඡන්දය භාවිත කර ඇත්තේ, උත්තර් ප්‍රදේශ් ප්‍රාන්තයේ බුලන්ද්ෂාර් ප්‍රදේශයේදීය. ඉන්දීය මහ මැතිවරණ ඡන්ද විමසීමේ දෙවන අදියර යටතේ එහි ඡන්ද විමසීම සිදු කෙරිණි.

"මට ඕන වුණේ අලියාට ඡන්දය දෙන්න, ඒත් වැරදිලා මම ඡන්දය දුන්නේ මලට," පවන් කුමාර් ඔහුගේ වීඩියෝවේ එසේ පවසයි. ඔහු එයින් පවසන්නේ, එක් එක් අපේක්ෂකයින්ගේ පක්ෂ සලකුණු පිළිබඳවය.

භාරතීය ජනතා පක්ෂයේ සලකුණ නෙළුම් මල වන අතර, අලියා සලකුණ හිමි දේශපාලන පක්ෂය වන්නේ, බහුජන් සමාජ් පක්ෂයයි. බහුජන් සමාජ් පක්ෂය යනු තවත් ප්‍රදේශීය පක්ෂ දෙකක් සමග සන්ධානගතව භාරතීය ජනතා පක්ෂයට එරෙහිව තරග කරන ප්‍රාදේශීය වශයෙන් ප්‍රබල පක්ෂයකි.

සාක්ෂරතාව පහළ අගයක පවතින ප්‍රදේශ රැසක් පවතින ඉන්දියාවේ ඡන්දය භාවිත කිරීම සඳහා පක්ෂ සලකුණු ඉතා වැදගත්ය. ඊට අමතරව ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක දේශපාලන පක්ෂ රැසක් පවතින හෙයින් ඉන්දීය ඡන්ද දායකයෝ නිරන්තරයෙන් ව්‍යාකූලත්වයට පත් වෙති.

10 වන පිටුව බලන්න

# අසන්ධිමිත්තා
## විචාරක - රසික අදහස්

### SUPERB PERFORMANCE BY ALL ACTORS

Nilmini Sigera, though it is her first appearance in the big screen, portrays a superb performance in the movie. Her facial expressions, conveying different mental states of the lead character, have been wonderful. Handagama has drawn the maximum from all the actors and actresses. A special mention should be made about Sandali Handagama, who appeared in the movie only briefly. Given her talent as an actress, it is now time for her to graduate from minor roles to a major role in a movie.

***W A Wijewardena,***
*former Deputy Governor of the Central Bank of Sri Lanka,*

**අසන්ධිමිත්තා බැලුවා .....**

තියන්න සංතෝෂයි ...කවල ඇටයක් කන්න. චතුර උලුරක් බොන්නවත් තිසීම චාන්ස් එකක් දුන්නේ නෑ තියන්නකෝ කතාව ඉවරවෙනකම්......ඒ තරමටම හැම සත්පරයකම බලන්න දෙයක් තිබුනා...කතන්දරයක් නෙවෙයි ..චිත්‍රපටයක් ........
කෝටියෙන්ම තියෙන් මේක අශෝක හඳගමගේ හොඳම එක නෙවෙයි රසම එක කියලා ....කිසිම විවාදයක් නෑ......එහෙම තමයි........

**ඉන්දික මිහිර බණ්ඩාර රත්නායක** (මුහුණු පොතෙන් උපුටා ගැණුනකි.)

**මේ චිත්‍රපටියේ මං කැමතිම දේ හඳයා**
**මේ තඩි ගෑනි දිහා බලන විදිහ.**

ඒක සුපුරුදු අනුකම්පාව මුසු පව් හැඟීම නෙමෙයි. ඒ වෙනුවට හඳයා ඒ රාත්තල් තුන්සීයක පිස්සුව ඇතුලෙන් ආපහු සමාජය දිහා බලනවා. අපි දකින්නෙ කිසිම ගිල්ටියක් හෘදයසාක්ෂියක් නැතුව තමන්ට හරස්වෙන ඕන එකෙක් මරාදැමිය හැකි සාපරාධී -නමුත් වරදකාරී නොවන ගැහැනියක්. උමතුව තුල පරාජය කළ නොහැකි තරමට ශක්තිමත් වුනු ගැහැනියක්. ඒක ඇතුලෙ ඉන්නවා පිරිමි දෙන්නෙකුගෙ ආවේශයෙන් බලය ගත් භද්‍රකාලි කෙනෙක්. එයා පව් නෑ. එයා ආපහු හැරිලා ගහනවා. ඒක රාත්තල් තුන්සීයක බර පහරක්.

**චින්තන ධර්මදාස**

අසන්ධිමිත්තාට රඟන නිල්මිණි සිගේරාගේ චරිත නියවීම නැවුම් සෞන්දර්යයකින් යුක්ත ය. වික්‍රම හෙවත් විකීගේ චරිතයට වයස් මට්ටම් දෙකක නළුවන් දෙදෙනෙකු යොදාගැනීම ඔස්සේ හඳගම නව මානයක් චිත්‍රපටය තුළදී කතාවට එකතු කරයි. එය තරමක නැවුම් කලාත්මක ලක්ෂණවලින් යුතු ය.

**අජිත් පැරකුම් ජයසිංහ** (පුජා වෛම අධ්‍යය)

### HIS BEST MOVIE

From the very first moment we encounter the film's protagonlst,and she beckons us with a nod and wink Into the wand of the film, I was captivated. The unreliability of the film's richly developed characters, the Intriguing and eerie element of magic realism, along with surprisingplot twists, create a rich tapestry. While the film is firmly set in a modern Sri Lanka, at the same time the old world is also very much present in the vlvdly captured rituals and mythical trlckster character. With a sure hand, Asoka Handagama draws us Into the film and holds us there. His best movie to date.

***Shyam Selvadurai***

ලාංකීය සමාජයේ ස්ත්‍රිය හා පුරුෂයා ලෙස පවරාගත් කාර්යභාරයන් තම පැවැත්ම මත වෙනස් වී ඇති බව අසන්ධිමිත්තා මගින් ප්‍රකට වන සමාජ යථාර්ථයයි. තවද තම නිර්මාණ සඳහා ශිල්පීන් වෙසෙස් ලෙස හසුරුවා ගැනීමේ හැකියාවක් හඳගමට පවතියි. අසන්ධිමිත්තාගේ චරිතය රඟන නිල්මිණි සිගේරා, කාලයකට පසුව අප හමුවේ පෙනී සිටියද ඇගේ රංග කෞශල්‍ය මන්දගාමී ලෙස නිරූපණය කරමින් අසන්ධිමිත්තා සතු සියලු ස්ත්‍රී ලක්ෂණ සාධාරණ ලෙස නිරූපණය කරයි.

**තරංගා රණසිංහ** (රාවය 2019 -04- 11)

මිනිස් මනසෙහි සංකීර්ණතාව සිනමා රූපයට නැගූ කදිම නිර්මාණයක් බිහිව ඇත. ඒ "අසන්ධිමිත්තා" නැමති සිනමා සිත්තමයි. එම රමණීය සිනමා කාව්‍ය නැරඹීමේ දුලභ අවස්ථාව අත්විඳීමට ලැබීම භාග්‍යයකි.

**දියකඩුවේ සෝමානන්ද හිමි.**

මාව ගන්නෙ පව්වතයකටද කියලා මම හඳගමගෙන් ඇහුවා

**නිල්මිණී සිගේරා**

සිනමා භාවිතාවට ගැලපෙන විදිහට කතාවේ සමහර තැන් වෙනස් වෙලා තියෙනවා.

**-සමන් වික්‍රමාරච්චි**

ඇත්ත කතා කියලා අපි අහන හැම කතාවක්ම එක්තරා ගොඩ නැංවීමක්. කිසියම් සිදුවීමක් සිදුවී ඉවර වුණාට පස්සෙ කවදාවත් ඇත්ත සිදුවීම කියලා එකක් නෑ.

**අශෝක හඳගම (අනිද්දා)**



BRILLIANT PERFORMER
14th OSAKA ASIAN FILM FESTIVAL
2019

Sarasavi
සිනෙරු
Presents

**$15/-**

**ටිකට්පත්:**
**Mississaga Temple 905.566.9741**
**Brampton Temple 905.454.6649**
**GS Accounting 416.571.4270**
**Premalal 647.210.8771**
**Bandara 416.994.2393**
**Rasanthi 416.432.1532**
**Gayan 416.824.6153**
**Nilanthi 416.499.2284**
**Sunil Jayasiri 416.836.7414**
**Chamila Rajapaksa 416.705.8983**

# අසන්ධිමිත්තා
## ASANDHIMITTA

**අශෝක හඳගමගේ චිත්‍රපටයක්**
Based on a Novel by **Saman Wikramarchchi,**
**H D Premasiri Production**

**ජුනි 8 වන සෙනසුරාදා**
**ප.ව. 3.30**

# ALBION CINEMA
1530 ALBION ROAD, ETOBICOKE

## මන්දාකිණියක...

8 වන පිටුවෙන්

යුනිවර්සිටි කොලේජ් ලන්ඩන්හි ආචාර්ය සිරි යවුන්සි පැවසුවේ, න්‍යායාත්මක භෞතික විද්‍යාඥයින් සහ හොලිවුඩ් සිනමා අධ්‍යක්ෂවරුන් කළු කුහර සම්බන්ධයෙන් නිර්මාණය කළ චිත්‍ර රූප මෙම ඡායාරූපය සමග සැසඳෙන බවය.

"න්‍යායාත්මක ගණනය කිරීම් අනුව සකස් කළ ඡායාරූප මේ ඡායාරූපයට බෙහෙවින් සමාන වීම විශේෂත්වයක්. මේ මගින් යළිත් වරක් පෙනෙන්නේ අයින්ස්ටයින් නිවැරදි බවයි," ඔහු පැවසීය. කළු කුහරයේ පළමු ඡායාරූපය හරහා මෙවැනි අද්භූත ආකාශ වස්තු පිළිබඳව අධ්‍යයනය කිරීමට පර්යේෂකයින්ට අවස්ථාව හිමි වනු ඇත. කළු කුහරය වටා ඇති දීප්තිමත් රශ්මි මාලාව නිර්මාණය වූයේ කෙසේ ද යන්න කිසිවෙකු නිවැරදිව නොදනී.

### කළු කුහරයක් යනු කුමක්ද?

කළු කුහරයක් යනු ආලෝකයට පවා ගැළවී යා නොහැකි අවකාශයකි. එය අධික ගුරුත්වාකර්ෂණ බලයකින් යුක්ත වූ හිස් නොවූ අවකාශයකි. කළු කුහරයට ඔබ්බෙන් පිහිටි අවකාශය 'යළි පැමිණිය නොහැකි' අවකාශයක් ලෙස සැලකේ. කළු කුහරයේ පවතින අධික ගුරුත්ව බලය නිසා ඉන් කිසිවකට ගැළවීමක් නොමැත.

### දුරේක්ෂ 8ක ජාලයක්

කළු කුහරය ඡායාරූපයට නැගීමට හැකි ප්‍රබල තනි දුරේක්ෂයක් ලෝකයේ නොමැත. එහෙයින් ප්‍රබල දුරේක්ෂ 8 ක් එක් කර තැනූ දුරේක්ෂ ජාලයක් මේ සඳහා යොදා ගැනිණි. එම දුරේක්ෂ විවිධ ස්ථාන 8 ක ස්ථානගත කර තිබිණි. හවායි සහ මෙක්සිකෝහි ගිනි කඳු, ඇරිසෝනා සහ සියෙරා නවාඩාහි කඳු, චිලීහි ඇටකාමා කාන්තාරය මෙන් ම ඇන්ටාක්ටිකාව ද එම දුරේක්ෂ ස්ථානගත කළ ස්ථාන අතර විය.

එම් 87 මන්දාකිණිය දෙසට යොමු කර තිබූ දුරේක්ෂ ජාලය විද්‍යාඥයින් 200 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් දින 10 ක් පුරා ක්‍රියාත්මක කරනු ලැබීය. ඔවුන් එක්රැස් කළ තොරතුරු ඉන්ටර්නෙට් හරහා හුවමාරු කර ගැනීමට නොහැකි තරම් විශාල වූ හෙයින් එම දත්ත දෘඪාංගවල තැන්පත් කර ඇමෙරිකාවේ බොස්ටන් සහ ජර්මනියේ බොන් යන නගරවල පිහිටි ප්‍රවේශ මධ්‍යස්ථාන වෙත යොමු කරන ලදී. එම දත්ත දෘඪාංගවල තැන්පත් කර ඇමෙරිකාවේ බොස්ටන් සහ ජර්මනියේ බොන් යන නගරවල පිහිටි ප්‍රවේශ මධ්‍යස්ථාන වෙත යොමු කරන ලදී.

!ඉටු කළ නොහැකි බවට පරම්පරා ගණනකට කලින් අනුමාන කළ දෙයක් අපි ජය ගත්තා," මහාචාර්ය ෂෙපර්ඩ් ඩෝල්මන් පැවසීය. මෙම කළු කුහරය ඡායාරූපගත කළ කණ්ඩායම පෘථිවිය අයත් මන්දාකිණිය වන ක්ෂීරපථයේ පිහිටි අතිවිශාල කළු කුහරයද ඡායාරූපයට නැගීමේ උත්සාහයක නිරතව සිටිති.

## 'වැරදි' පක්ෂයට...

8 වන පිටුවෙන්

පවන් කුමාර් යනු දලිත් ජන කොටසට අයත් පුද්ගලයෙකු වන අතර, බහුජන් සමාජ් පක්ෂයේ ඡන්ද බැංකුව ලෙස එම ජන කොටස හඳුන්වයි. බ්‍රහස්පතින්දා පැවති ඡන්ද විමසීම බලවත් ප්‍රාදේශීය දේශපාලන පක්ෂවලට බෙහෙවින් වැදගත් එකක් විය. ඒ, ඔවුන්ට පාර්ලිමේන්තුවට සුදුසුකම් ලැබීම සඳහා ප්‍රාදේශීය වශයෙන් ලබා ගන්නා ඡන්ද සංඛ්‍යාව බලපාන හෙයිනි. ඉන්දීය මහ මැතිවරණය අදියර 7ක් යටතේ පැවැත්වෙන අතර, ඡන්ද ගණනය කිරීම මැයි 23 වන දා සිදුවේ. මෙවර ඉන්දීය මහ මැතිවරණය වෙනුවෙන් සුදුසුකම් ලබා සිටින ඡන්ද දායකයින් සංඛ්‍යාව මිලියන 900 කට අධික වන අතර එය ලෝකයේ විශාලතම මැතිවරණය ලෙස සැලකේ.

## බුර්කාව...

5 වන පිටුවෙන්

ඇතැයි තම ආරක්ෂක නිලධාරීන්ගෙන් දැන ගත් බැව් මනෝ ගනේෂන්ද 'ට්විටර්' සටහනක් තබා තිබිණ. එහෙත් මේ ඇමැතිවරුන් දෙදෙන එවැනි ත්‍රස්ත ප්‍රහාර පිළිබඳව තමන්ට ලැබුණු තොරතුරු තමන්ගේ ආණ්ඩුවේ අගමැතිට වහා දැන්විය යුතු යැයි සිතා නැත. එවැනි වගකීමක් ඔවුන්ට නොතිබිණ.

පාර්ලිමේන්තු විවාදයේද වගකීමකින් සාකච්ඡාවට හවුල් වූවන් නොවිණි. තමා මේ යුගයේ ප්‍රාඥයා යැයි කොළඹ තාප්ප සැරසූ විජයදාස රාජපක්ෂද අතිශය වර්ගවාදී ප්‍රකාශ සමග තර්ක කෙරුවේ බුද්ධි අංශ නිලධාරීන් මේ ආණ්ඩුව විසින් දඩයම් කිරීම නිසා බුද්ධි අංශය මුළුමනින් අඩපණ කිරීමේ වගකීම සමග සියලු ජීවිත හානි සඳහා මේ ආණ්ඩුව වගකීම භාරගත යුතු බවය. විපක්ෂ නායක මහින්ද රාජපක්ෂද එවැනිම චෝදනා නැගීය.

ඇත්ත කතාව 'තොරතුරු නොමැතිය' යන්න නොවේ. ඔවුන්ගේ 'වර්ගවාදී දේශපාලන අවස්ථාවාදය සමග ඔවුන් මග හැර යන්නේ අවශ්‍ය සියලු තොරතුරු හා පූර්ව අනතුරු ඇඟවීම් තිබියදීද අවශ්‍ය පියවර නොගත්තේ ඇයිද' යන බරපතළ කාරණාවය. ඒ අතර උගතුන් පාර්ලිමේන්තුවට යැවිය යුතු යැයි කියනවුන්ට යස පාඩමක් ඉගැන්වූයේ මහාචාර්ය ආංශූ මාරසිංහය.

'බුර්කාව තහනම් කළ යුතු' යැයි ඔහු පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය. ඔහුගේ බුද්ධියේ තරමට ඔහු සිතන්නේ මුස්ලිම් කාන්තාවන් පලඳින බුර්කාව තහනම් කිරීමෙන් ත්‍රස්තවාදය තුරන් කළ හැකි යැයි කියාය. මුස්ලිම් කාන්තාවන් බුර්කාව පලඳින හෙයින් මුස්ලිම් පිරිමින් ත්‍රස්තවාදී ක්‍රියාවලට පෙළඹෙන්නේ යැයි ඔහුගේ දැනුමේ තරමය. ඇඳුම මගින් මනුස්ස කල් කිරියාව තීන්දු කෙරන්නේ නම්, බුදුන්ගේ කසාවත පැලඳ මුස්ලිම් පල්ලිවලට නිවෙස්වලට හා ව්‍යාපාරවලට අලාභ හානි කරනවුන් පමණක් නොව, ළමා අපචාර, ස්ත්‍රී දූෂණ, කප්පම් ගැනීම්, මිනී මැරීම් වැනි අපරාධවලට හිරේ යනවුන්ද මේ රටේ සිටිය නොහැක.

අවුරුදු 30 කට ආසන්න කාලයක් විශාල විනාශයක් සමගින් ඇදී ගිය යුද්ධය මෙන්ම මේ මහා විනාශයද වගකීමක් ඇතිව සංවාදයට ගැනීමට සූදානම් නැති රටක, මෙවැනි විපත් එක අතකින් අරුමයක්ද නොවේ. එනිසාම සාමකාමී බලාපොරොත්තු සහගත අනාගතයක් ඉල්ලා සිටින මිනිසුන්ම පසුගිය මැතිවරණවලදී මෙන්ම මේ මැතිවරණයේදීත් නිවැරදි තීන්දු ගනු ඇතැයි සිතීම උගහටය. මෙවරද ඔවුන් තීන්දු කරනු ඇත්තේ වඩාත් වර්ගවාදී නායකයකු සමග වඩාත් වර්ගවාදී ආණ්ඩුවක් හදා ගැනීමටය. පාර්ලිමේන්තු සංවාදයෙන් පෙන්වූයේද දේශපාලනඥයින් ඒ වෙනුවෙන් සැදී පැහැදී සිටින බවය.

**'ලක්බිම' පුවත්පතින් උපුටා ගන්නා ලදී.**





SPECIAL RATE ON RENEWALS & INSURED MORTGAGES
ANTON DHARMASEELAN
MORTGAGE AGENT
LIC #M14000425
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST FOR ALL YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS - BEST RATES
ANTON@MYHOMEMLS.CA
MORTGAGE ALLIANCE
FAX: 1-800-566-3068



# ඇමෙරිකානු සංචාරයක මතකය....

# GRAND CANYON වටේ රවුමක් ...... !

■ සටහන - අනුරුද්ධ වැලිගමගේ
සේයාරූ - හෙසඳී වැලිගමගේ

Mojave කාන්තාරයේ තිබෙන මේ ඉසව්ව අද ලෝකයේ බොහෝ දෙනෙක් සංචාරය කරන තැනක්. වසර 10,000 ක පටන් Paleo Indian ජනතාව ජීවත් වූ බව සැලකෙන මෙය 1829 දී Antonio Armijo සහ බාලදක්ෂ Rafael Rivera නව මෙක්සිකෝ ප්‍රාන්තයේ සිට ලොස්ඇන්ජලීස් බලා යා හැකි පහසු මගක් සොයා යාමේදී හමුවූ බිම් කඩක්. Las Vegas යන නම Spanish බසින් The Medows යන අරුත දෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ කීර්තිමත් දුම්රිය මාර්ග ආයෝජකයෙකු සහ පතල් කරුවෙකු වූ William A Clark ලාස්වේගාස් නගරය ඉදිකිරීමේ මූලිකයා ලෙස සැලකෙනවා. ලාස්වේගාස් නගරය සහ අවට ඇතුළත් වන පරිපාලන ප්‍රදේශය ඔහුගේ නමින් නම් කර ඇත්තේ ඒ නිසා. 1930 දී ඉදිකෙරුණු Hoover Dam බහුකාර්ය ව්‍යාපෘතිය මගින් නගරයට අවශ්‍ය ජලය සහ විදුලිය ලැබීම නෙවාඩාවේ කාන්තාරගත මේ බිම ඉසුරු පුරයක් කරන්නට පසුතලය හැදුවා.



මගේ මතකය යන්නේ Bugsy චිත්‍රපටයට. 'නිව්යෝර්ක් නගරයේ පාතාල නායකයෙකු තම පවුල අතහැර හොලිවුඩයට යනවා. රූමත් Virginia Hill නම් කාන්තාවට වශී වන ඔහු ඈ වෙනුවෙන් 1946 දී නෙවාඩා කාන්තාරයේ හදන The Flamingo හෝටල් සහ කැසිනෝ සංකීර්ණය Las Vegas වල වර්තමාන සංවර්ධනයේ මූලික අවස්ථාව බවයි කියැවෙන්නේ. අවිවාහක පිරිමින් සහ ගැහැනුන් සූදුව, කම් සැප සහ විනෝදය තකා නිතර දෙවේලේ ගොඩ වැදෙන මේ නගරය හැඳින්වෙන්නේ 'පව්කාර නගරය' (Sin City) නමින්. විවාහකයන්ට පවා වෙනසකට පවුලෙන් මිදී කෙටි නිවාඩුවකට යා හැකි තැනක් ලෙසින් ව්‍යාපාර ප්‍රවර්ධනය කෙරෙන මෙය ජනප්‍රිය සංස්කෘතියේ විස්තර කෙරෙන්නේ සුරලොවක් ලෙසින්.

පහුගිය අවුරුද්දේ 'දසත' හරහා ඔබව ගෙන ගිය 'රොකී කඳුවැටිය වටා රවුමක්' ලිපි පෙළට ඉතා ඉහල ප්‍රතිචාරයක් ලැබුණා. බොහෝදෙනා සඳහන් කර තිබුණේ අපේ ලිපි පෙළ කියවා බැන්ෆ්වලට ගොස් එන්නට ගිය ගමන Jasper, Kamloops කරා දික් කළ බව. ඒ තුළින් රොකී කඳුවැටියේ කැනඩාවේ රුව ගුණ හරිහැටි දකින්නට කළ මග පෙන්වීමට ඔවුන් ස්තුති කර තිබුණා. අපට ඒ ගැන ඇත්තේ සියුම් ආඩම්බරයක්. නිකම්ම එතැනට යනවාට වඩා වැඩි සංචාරක වටිනාකමක් දෙමින් ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි ස්වභාව ධර්මයේ අපූරු නිමැවුමක් වන The Grand Canyon වටා ඔබව එක්කන් යන්නයි අපේ මේ උත්සාහය. අපි ගමන පටන් ගත්තෙ Las Vegasවලින්.

ටොරොන්ටෝවේ ඉඳන් පැය 5 ක පමණ ගුවන්



ගමනකට පස්සෙ අපි ලාස්වේගාස්වල. ගුවන් තොටුපලෙත් කැසිනෝ හලක පසුබිම දකින්නට පුළුවන්. වේගාස් නොනිදන නගරයක්. පොඩි විවේකයක් අරන් කැසිනෝ, බාර්, වැඩිහිටි විනෝදාස්වාදන මධ්‍යස්ථාන තිබෙන නගර සංචාරය පටන් ගත්තෙ හවස. මුලින්ම නවාතැනෙන් පිටත් වෙලා කුලියට ගත්ත වාහනයෙන් අපි ගියේ සුප්‍රකට Las Vegas නගර සලකුණ ගාවට. කැනඩාවේ වගේ නෙවෙයි ඔබට වෙනත් නගරයකට කුලී වාහනය බාර දෙන්න වෙනම ගාස්තුවක් (One way fee) ගෙවන්න ඕනෙ නැති නිසා ඔබට අවශ්‍ය නම් ලොස් ඇන්ජලීස් හරි ෆීනික්ස් හරි නගරයකින් ආපහු යන ගුවන් යානය ගන්න එක කාලයත් මුදලුත් ඉතිරි කරනවා.




## Las Vegas නාම පුවරුව

නියෝන් විදුලි බල්බවලින් අලංකාරවත් වුණු - Welcome to Fabulous Las Vegas - සඳහන ඇති අපූරු නගර පුවරුව නිර්මාණය වුණේ ව්‍යාපාරික Ted Rogich ගේ උවමනාවට Betty Williams අතින්. 1959 මැයි මාසයේදී ඉදි වූ මෙය පසුකාලීනව Clark County පළාත් පාලන ආයතනය විසින් මිල දී ගෙන තිබෙන්නේ එහි වටිනාකම නිසා. අපි ගුවන් තොටුපොළ අද්දර තියෙන වාහන නැවතුමේ වාහනය නවත්වලා සලකුණ බලන්න ගියා. ෆොටෝ ගන්න වාරය එනකම් බලා ඉන්න පෝලිමේ ඉදල ෆොටෝ කීපයක් ගැහුවා. අඩි 25 ක් උස මේ සලකුණ සමහරු හඳුන්වන්නේ Las Vegas strip එකේ දකුණු අන්තය කියල. දියමන්තියක හැඩය ගන්නා මෙහි Welcome වදන ඇති කොටස කැසිනෝවලදී භාවිත වන රිදී කාසි සිහිග න්වන ලෙසයි තනා තිබෙන්නේ.

## MONORAIL



නවාතැනට කිට්ටුව තියෙන නැවතුමෙන් අපි නැග්ගෙ Las Vegas Monorail එකට. Pearson ගුවන් තොටුපළේ, Mexico ගුවන් තොටුපළේ මීට කලින් ලිපියකදී අප ගිය ඩිස්නි ලෝකයේ Epcot හි දුම්රිය ගමන සිහි කරවන මේ දුම්රිය Las Vegas Strip හි MGM Grand කැසිනෝ හලේ සිට Sahara Casino දක්වා ප්‍රධාන කැසිනෝ හල් එක් කරන සංචාරක ප්‍රවාහන මාධ්‍යයක්. අපි ඒකෙ රවුමක් ගිහින් සූදානම් වුණේ රාත්‍රියේ Strip දිගේ ඇවිද යන්න.

## LAS VEGAS STRIP

ලාස් වේගාස් නගරයේ ප්‍රධාන මාවත විදිහට හැඳින්වෙන Las vegas Boulavard හි කිලෝමීටර 6.8 ක කොටස හැදින්වෙන්නේ මේ නමින්. එහි උතුරු අන්තය වන්නේ Sahara Avenue මාර්ගය. දකුණු අන්තය Russel Roadවලින් අවසන් වෙනවා. සමහරු කියන්නේ එය අවසන් වන්නේ Mandalay Bay කැසිනෝ හල අසලින් කියලයි. සුප්‍රකට කැසිනෝ හල්, වැඩිහිටි විනෝදාස්වාදන මධ්‍යස්ථාන, නෘත්‍ය ශාලා බොහොමයක්ම පිහිටා තිබෙන්නේ මේ මාර්ගය දෙපසයි. ඒ ඒ කැසිනෝ හල නමට අනුරූප වන අයුරින් හැඩ වී තිබෙනවා. නිව්යෝර්ක් කැසිනෝ හල නිව්යෝර්ක් නගරයේ සලකුණු වන ලිබර්ටි ප්‍රතිමාව ඇතුළු ගොඩනැගිලිවලින්, පැරිස් කැසිනෝ හල මීට පෙර ලිපිවලදී ඔබව කැඳවාගෙන ගිය පැරිසියේ අයිපල් කුළුණ සහ Arch de Triumph සිහිගන්වන අයුරින් ඉදිකර තිබෙනවා. බෙලාජියෝ කැසිනෝ හල ඉතාලි ගෘහ නිර්මාණ ශිල්ප අනුව ඉදිකර තිබෙනවා. රාත්‍රියට ආලෝකමත් වූ විට මේ වීදිය අප අසා ඇති කථාවල කියැවෙන සුරපුරක් මවනවා.

Bellagio හෝටලය ඉදිරිපිට ඇති ජල තටාකයේ උදෑසන 11 සිට රාත්‍රි 12 දක්වා පැවැත්වෙන Musical Fountain සිහිගන්වන්නේ ඩුබායිහි Burj Khalifa වල ඇති ලෝකයේ උසම වතුර මලේ අසිරිය. නොමිලයේ බලන්නට පුළුවන් මෙය වඩාත් ලස්සන වන්නේ රාත්‍රියට විවිධ වර්ණවලින් පැහැපත් වූ විටයි. සෑම විනාඩි 15 කටම වරක් පැවැත්වෙන මෙය බලන්නට රැස් කන පිරිස් වීඩියෝ ගත කරන්නට හොඳම තැනක් සොයා පොරකන දසුන සුලබ එකක්.





වේගාස්වල අවන්හලක්, චොකලට් කඩයක් පවා අවසන් වන්නේ කැසිනෝ හලකින්. සංචාරකයින් පීරී ඉතිරී යන මෙහි Brand name වෙළඳසල්වල සමරු සදහා පිරිස් පොරකනවා. ඒ අතර Toronto Caribana උත්සවයේදී දකින ආකාරයේ අඩ නිරුවත් ඇඳුමින් සැරසුණු සුරූපී කාන්තාවන් ඇවිද යනවා. ඔවුන් සමග සේය්රුවක් ගන්න සමහරු පොරකන්නේ ඒ සඳහා ගණන් හෙට්ටු කරමින්. ගිනිගහන කතරේ උණුසුම අඩු කරන්නට තැනින් තැන අටවා ඇති පිනි විදින යන්ත්‍ර ගෙන දෙන්නේ සිසිලසක්. මැදියම් රැය වෙද්දී අපි ආපහු නවාතැනට යන්නට සූදානම් වුණේ හෙට උදේ ගමනට සූදානම් වෙන්නයි.

**පසුගිය වසර 2 ක පුරා අප ගිය ගමන්වල ඔබට බලන්නට අතපසු වූ ලිපි දසත වෙබ් අඩවියේ පැරණි විද්‍යුත් පුවත්පත් හෝ මගේ අහස් ගව්වෙන් එහා ලෝකය බ්ලොග් අඩවිය තුළින් බලන්නට පුළුවන්.**

**ඔබේ ඉල්ලීම් සහ තොරතුරු සඳහා අලුත් විද්‍යුත් ලිපිනයක් පටන් ගත්තා.** dasatha.sancharayakamathakaya@gmail.com **විස්තර සඳහා ලියන්න. ඉඩ ලැබෙන පරිදි පිළිතුරු ලියන්නම්.**

**හිරු උදාවත් එක්ක** Antelope Canyon **සහ** Horseshoe Bend **හැඩ බලන්නට ගිය ගමනකින් ඊළග මාසයේදී හමුවෙමු** .





# ඉත්තෑ පුංචට පාඩමක්

මහ කැළෑවෙ සත්තු හැමෝටම එදා හරිම සතුටු දවසක්. විශේෂයෙන්ම මේ සතුට කැළෑ ගමේ වැඩිහිටියන්ටත් වඩා පුංචි පැංචො, පැංචියන්ට හුඟාක් දැනුණා. එදා තමයි එයාලගේ යාළු හා හා පැංචිගේ උපන් දිනේ. කැළේ ඉන්න ගොඩක් අයගේ උපන් දිනය එනවා යනවා. විශේෂ උත්සව එයාලට නෑ. ඒත් හා පැංචිගේ අම්මයි තාත්තයි මෙදා පාර හා පැංචිගේ උපන්දිනය වෙනුවෙන් ලොකු සාදයක් සූදානම් කරල ඒකට කැළේ ඉන්න ලොකු කුඩා හැමෝටමත් ආරාධනා කරල තිබුණා.

දවස් ගාණක් තිස්සේ හැමෝම මේ සාදයට යන්න සූදානම් වෙනවා. ලක ලෑස්ති වී සැරසී යන අන්දම, ගෙන යන තෑගි බෝග, කදමළු ගැනමයි හම්බ වෙන හැමෝම කතා බහ වෙන්නෙ.

ඔන්න ඉතිං ඒ දවසත් ආවා. හා පැංචි එක්ක හැම වෙලාවෙම සෙල්ලමට එන ඉත්තෑ පැංචටත් උත්සවයට ආරාධනා කරල තිබුණා. ඉත්තෑ පැංච, එයාගෙ අම්ම, තාත්ත හැමෝම කල් තියාම උත්සවයට යන්න සූදානම් වුණා.

උත්සවයට යන අයගෙන් කැළෑ ගමේ පාරවල් පිරිලා. එක එක්කෙනා ඒ ඒ අයගේ තරාතිරමට අනුව තෑගි බෝග අරන් යනවා.

මුව පවුල ටිකක් කලබලයි. එයාල දිග කකුල් වලින් ඉක්මනින් ඉක්මනින් යනවා.

ඉබි හාමිල, ගොළුබෙලි හාමිලා එයාලගෙ සුපුරුදු ගමනින් හෙමින් හෙමින් යනවා.

ලස්සන ලස්සන වෛවාරන්න ඇඳුම් ඇඳගත්ත සමනලුන් රංචු පිටින් හා පැංචිගේ ගේ පැත්තට පියඹලා යනවා.

පළාතම සංගීත සංදර්ශනයක් වගේ. නානාප්‍රකාර කුරුළු කොබෙයියන් ගස් උඩ ඉඳගෙන මිහිරි හඬින් ගී ගයනවා. කතා කරනවා.

රිළා හාමි පුංචි පැංචවත් බඩේ බැඳගෙන අත්තෙන් අත්තට පැන පැන හා හාමිගේ ගෙවල් පැත්තට යන්නේ පහළින් යන යහළුවන්ටත් විහිළු කරමින්.

පළාතම සුවඳයි. හා පැංචිගේ උපන්දිනේට සුභ පතන්න වගේ ලස්සනම ලස්සන මල් පිපිලා.

ඉතිං මේ ඔක්කොම දේවල් මැද්දෙන් ඉත්තෑ පුංචත් ගෙදර අයත් එක්ක හා පැංචි බලන්න යනවා. හා පැංචිගෙ ගෙවල් ළං ළං වෙද්දි ඉත්තෑ පුංච ටිකෙන් ටික පහු වෙන බව ඉත්තෑ අම්මට දැනුණා. එයා පුතා දිහාට හැරුණා.

"මොකදෑ දරුවෝ මේ ගාටන්නෙ. අපිත් එක්ක ආපු අය දැන් උත්සවයට ගිහිනුත් ඇති. අඩිය ඉක්මන් කරලා යමුකො"

"අම්මේ... අපි එක්කො ආපහු ගෙදර යමු. මට බෑ එහෙ යන්න"

"මොනවා මොනවා.... ඒ මොකද? මේ ගමනට වැඩියෙන්ම උනන්දු වුණේ පුතා නේද? දැන් ඇයි මේ යන්න බෑ කියන්නෙ?" ඉත්තෑ තාත්තා ඇසුවේ විශ්මයෙන්.

"මම එතනට ගියාට වැඩක් නෑ...."

"වැඩක් නෑ....? ඒ ඇයි....? පුතා යාළුවොත් එක්ක රංඩුවක් වත් වුණාද?" තාත්තා නැවත ඇසුවා.

"නෑ තාත්තේ.... අද මේ මුළු කැළෑවේම යාළුවෝ හා පැංචි බලන්න එනවා. ඒ නිසා හා පැංචි මාත් එක්ක සෙල්ලම් කරන්න එන එකක් නෑ. එයා වෙනදටත් මාත් එක්ක සෙල්ලම් කරන්නෙ බයෙන්. අද කොහොමවත් එන එකක් නෑ...." ඉත්තෑ පුංචා හරිම දුකින් කිව්වා.

"හා පැංචි පුතාගෙ හොඳම යාළුවා නේ.... ඉතිං ඇයි එයා පුතාට බය වෙන්නෙ.... එයා සෙල්ලම් කරන්න ඒවි. අපි යමු..."

ඉත්තෑ පුංචා කඳුළු පුරවගෙන මෙහෙම කිව්වා.... "එයා මගේ මේ කූරු ඇනේවි කියල බයෙන් ඉන්නේ...."

"හා.... හා..... හා..... ඒකද මේ.... අපේ මේ කූරු අපිට වෙනස් කරන්න බෑ. මේ අපේ හැටි... යමු යමු.... පරක්කු වෙනවා..." සිනාසෙමින් එසේ කී ඉත්තෑ තාත්තා පුතාගේ අතින් අල්ලාගෙන හා පැංචිලගේ ගෙවල් පැත්තට ගියා.

කොහොම හරි එදා උත්සවයෙදි ඉත්තෑ පැංච එතරම් සතුටු වුණේ නෑ. එයා හිතුව විදියටම හා පැංචිව අනික් යාළුවෝ වට කරගෙන. එයාගෙ කූරු නිසා ඒ යාළුවෝ මැද්දෙන් රිංගලා යන්නත් බෑ. ඒත් එයා සැරයක් දෙසැරයක් උත්සාහ කළා හා පැංචි ළඟට යන්න. ඒ හැම සැරේකම කාගෙ හරි ඇඟේ කූරු ඇනුන නිසා ඉත්තෑ පැංචව හැමෝම ඈත් කළා.

උත්සවයට ආව හැමෝම කබින්, බොමින්, නටමින් ප්‍රීති වුණාත් ඉත්තෑ පැංචට කිසිම සතුටක් තිබුණේ නෑ. ටික වේලාවක් ඉඳලා එයා අම්මලත් එක්ක ගෙදර ආවා. ඇවිත් හරිම දුකින් කල්පනා කර කර හිටියා. එයාට ඒ ඉත්තෑ කූරු ගැලවිලා එන් තරම් හයියෙන් ඇද්දා.... ඇද්දා.... ඒත් ඒවා ගැලවුණේ නෑ.

'මේ කූරු නිසා මට කවදාවත් මගේ යාළුවොත් එක්ක හිතේ හැටියට සෙල්ලම් කරන්න ලැබෙන එකක් නෑ... මොකක්ද මම දැන් කරන්නෙ...,' මෙහෙම කල්පනා කර කර ගේ පුරා යද්දි අම්මා එකතු කරල තිබුණු පුළුන් ගෝනිය එයා දැක්කා. ඉත්තෑ පුංචට අපූරු කල්පනාවක් ආවා. එයා පහුවදා උදේ වෙනකම් ඉවසගෙන හිටියා. උදෙන්ම කැළෑවට ගිහිං මැලියම් ටිකක් හොයාගෙන ආවා. ඒ මැලියම් එයාගේ කූරුවලට ගාමින් පුළුන් බෝල හදලා කූරුවල අලවා ගත්තා. දැන් ඉත්තෑ පුංචා අමුතුම සතෙක් වගේ.

ඉත්තෑ පුංචා හෙමින් හෙමින් යාළුවන් බලන්න ගියා. කවදාවත්ම දැකලා නැති මේ අලුත් සතාව දැක්ක යාළුවෝ බය වෙලා කෑ ගැහුවා. ඒත් තමන් කවුද කියලා හඳුන්වා දුන්නම යහළුවන් හැමෝම එයා ළඟට ආවා. කූරු අතගාල බලලා වෙනදා වගේ ඇනෙන්නෙ නැති නිසා ඉත්තෑ පුංචව ළඟටම අරන් සෙල්ලම් කළා. කට්ටියටම හරිම සතුටුයි. කාලය ගෙවෙනවා දැනුණේවත් නෑ.

එදා ටිකක් වැසි දවසක්. හවස් වෙද්දි වැස්ස වැඩි වුණා. කරුවළත් වැටෙන නිසා හැමෝම තම තමන්ගේ ගෙවල්වලට දිව්වා. ඉත්තෑ පුංචත් දුවන්න හැදුවත් එයාගේ කූරුවල අලවගෙන හිටිය පුළුන් වැස්සට තෙමිලා බරවෙලා. එයාට හයියෙන් ඇවිදින්නවත් බෑ. ඉත්තෑ පුංචා වැස්සෙ තෙමි තෙමී ගෙවල් පැත්තට ගාටද්දි කලබලෙන් දුවන නරියෙකුට මේ අමුතු සතා ඇස ගැටුණා. නරියත් ඒ වෙලාවෙ බඩගින්නෙ හිටියේ. ටිකක් ළං වෙලා බලද්දි පෙනුමෙන් වෙනස් වුණත් මේ ඉත්තෑ පැටියෙක් බව නරියා දැක්කා. කපටි නරියා තමන්ව අල්ල ගන්න කුරුමානම් අල්ලන හැටි ඉත්තෑ පුංචා දැක්කා. ඒත් පුළුන්වල බර නිසා දුවන්න බෑ. ඉත්තෑ පුංචා මහා හයියෙන් කෑ මොර දුන්නා....

"අම්මේ... තාත්තේ.... මාව බේරාගන්න"

කරුවළත් වැටිලා, වැස්සත් වහිද්දිත් ඉත්තෑ පුංචා ගෙදර ආවෙ නැති නිසා ඒ වෙලාවේ අම්මයි තාත්තයි මේ පුංචව හොයන්න මගට බැහැලයි හිටියේ. එයාලට පුතා කෑ ගසන සද්දය ඇසුණා. ඉක්මනට ඒ පැත්තට දිව්වා....

"දෙවියනේ මගේ පුතා...." ඉත්තෑ අම්මා කෑ ගැසුවා.... ඉත්තෑ තාත්තා නරියා ඉස්සරහට ගිහින් ඉත්තෑ කූරුවලින් පහර දීල නරියව එළවා දැම්මා...

හොඳටම බය වෙලා හිටිය ඉත්තෑ පුංචා අඬ අඬා අම්මගේ ඇඟේ එල්ලුණා.

"අනේ අම්මේ මම මීට පස්සෙ මෙහෙම වැඩ කරන්නේ නෑ.. මගේ කූරුවල වටිනාකම මම අද දැනගත්තා" එසේ කියමින් අම්මට තුරුළු වෙලා ගෙදර ගියා.

## පුංචි අපට ගී

### මෙත් මල් පිබිදේවා

මෙත් මල් පිබිදේවා
සිත් තුළ මෙත් මල් පිබිදේවා
කරුණා ගුණ දේවා
සිත් තුල කරුණා ඉතිරේවා

තණ්හා අශා වෛරී ක්‍රෝධේ
සංකා නැති වේවා
පාපේ ද්වේෂේ මෝහේ මානේ
මෙලොවින් දුරු වේවා

සමගිය සාමේ දෑ අනුරාගේ
යුතුකම් රජවේවා
හොර බොරු වංචා බිය සැක දුරු වී
සැමටම සෙත් වේවා

ගායනය: මොරිස් දහනායක
පද රචනය: සිරිල් ඒ. සීලවිමල
සංගීතය: ස්ටැන්ලි එම් ප්‍රනාන්දු


ALPC
AHANGAMA LAW
PROFESSIONAL CORPORATION
Real Estate Law
Immigration Law
Corporate Law
Wills,
Power of Attorney and Estates
Family Law
Simple Divorce/ Separation and Marriage Agreements
100 Cowdray Court, Unit 328
Toronto, ON
M1S 5C8
Tel: 647-977-2263
Cell: 647-215-7642
Fax: 647-977-2264
E-mail: info@ahangamalaw.com
Anoshan Ahangama
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC


LAL LAW OFFICE
Real Estate
Mortgages
Immigration Law
Family Law
Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com


Install Repair Service
Furnace and Air condition
Roof top Units Heating / Cooling
Water Heaters
Humidifiers
Electronic Air cleaners
Ultraviolet Air Treatment
Gas stove and Gas Dryer
Gas piping
HEATING
COOLING
bryant
Heating & Cooling Systems
RUUD
TRANE
Amana
HEIL
Rheem
Carrier
Goodman
LENNOX
YORK
Coleman
Climax Comfort Air
Your Comfort is our Satisfaction
Contact : Kithsiri Mallawarachchi
3261 Escada Dr. Mississauga. ON. L5M 7V6
Tel : 416-889-5796 Fax : 905 542 1697
Email : info@climaxcomfortair.com
www.climaxcomfortair.com
Rent from us
• Tankless water Heater • Furnace
• Air conditioner
Easy and Low Monthly Payments
VISA
convenient payment
24/7 EMERGENCY SERVICE
REPAIR ON ALL MAKES AND MODELS WARRANTY ON REPAIRS

# තායිලන්ත / ඉන්දියා / වියට්නාම් / මැලේසියා රටවල පොල් නිෂ්පාදන සහ ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදන

## අතර ඇති

# වෙනස කුමක්ද ?

GEISHA® BRAND WAADIYA® BRAND GEISHA® MAKERS TASTE Original Plaza BRAND ANCHOR BRAND

THE ABOVE BRANDS ARE TRADEMARKS OF GEESHA FOODS INTERNATIONAL INC.

Honesty • Quality • Satisfaction
PROVIDING QUALITY PRODUCTS SINCE 1988

EXCLUSIVELY DISTRIBUTED BY GEESHAFOODS INTERNATIONAL INC. FOR MORE INFO 416.804.0762 WWW.GEESHAFOODS.COM

**මැයි දිනය මෙසේමැයි !**

# කම්කරුවන්ගේ ලෙයින් කඳුළින් බිහිවූ




■ **මදුෂාණි විජේවර්ධන**

- **වර්ෂය - 1886**
- **දිනය - මැයි 01**
- **ස්ථානය - ඇමෙරිකාවේ චිකාගෝ නුවර හේමාර්කට් චතුරස්‍රය**

වසර 1886 මැයි මස 01 දින ඇමෙරිකාවේ චිකාගෝ නුවර හේමාර්කට් චතුරස්‍රයට රැස් වූ ලක්ෂ එකහමාරකට අධික වැඩ කරන ජනතාව පැය අටක වැඩ මුරයක් ඉල්ලා කළ අතිවිශාල උද්ඝෝෂණය අතරතුර ඔවුන්ට එල්ල වූ පොලිස් වෙඩි ප්‍රහාරයෙන් කම්කරුවන් හතර දෙනෙකු මිය යෑමත් 200 කට අධික කම්කරුවන් පිරිසක් තුවාල ලැබීමත් ලෝක කම්කරු ඉතිහාසයේ ලෙයින් කඳුළින් ලියවුණු මහා ඛේදවාචකයකි.

### මැයි දින සැමරුමේ අතීත කතාව

වසරේ 122 වැනි දිනය වන මැයි පළමුවැනිදා ලෝක කම්කරුවන්ගේ දිනයයි. ශත වර්ෂයකටත් එපිට කාලයක් දක්වා විහිදෙන මැයි දින ඉතිහාසය 'වැඩ කරන ජනතාව' යනුවෙන් පිරිසක්ද සමාජය තුළ වෙසෙන බව ලොවට මෙනෙහි කරයි. කම්කරු ඉතිහාසය දෙස බැලීමේදී එය එක් පුද්ගලයකු හෝ පුද්ගලයන් කීපදෙනෙකු මත පදනම් වූ ධනවාදී ආර්ථික ක්‍රමයට එරෙහිව ගොඩ නැගුණු කම්කරුවන්ගේ අරගලයක් බව පැහැදිලියි.

අතීතයේ සිටම ධනේශ්වර පන්තියට වහලුන් ලෙස සේවය කළ කම්කරුවන් හා ගොවීන් ගත කළේ දුෂ්කර ජීවිතයකි. විශේෂයෙන්ම අප්‍රිකාවෙන් ගෙනෙන ලද කළු මිනිසුන් යොදාගෙන ඇමෙරිකාවේ හා බ්‍රිතාන්‍යයේ ගොවිපළ හිමිකරුවෝ සිය ගොවිපළවල සේවා ඉටුකර ගත්තේ ඉතා අමානුෂිකවයි. කම්කරුවන් ලොවට හඳුන්වා දෙන්නට පෙර වැටුප් නොලබමින් ප්‍රවේණි වහලුන් ධනවත් ගොවිබිම් හිමිකරුවන්ගේ සේවකයන් ලෙස කටයුතු කළහ.

එහෙත් සංස්කෘතික දියුණුව හා තාක්ෂණික දියුණුවද ලැබූ පසු වහල් යුගය අවසන් වී වහලුන් වෙනුවට වැටුප් ලබන කම්කරුවන් සේවයේ යොදාගන්නට කම්හල් හිමියන්ට සිදු වුවත් කම්හල් හිමියන් කම්කරුවන්ට දුන්නේ සොච්චම් වැටුපකි. ඔවුන්ට සේවය කිරීමේ නිශ්චිත කාල සීමාවක් නොතිබූ අතර දිනකට පැය 12-16 වශයෙන් ඔවුන්ගේ සේවා කාලය දිගු විය. 17 වැනි හා 18 වැනි සියවසේ කම්කරුවකුගේ සේවා කාලය දිනකට පැය 12 ඉක්ම වූවා මෙන්ම පාලකයන්ගේ කුරිරු වධ හිංසා හා අඩන්තේට්ටම්වලට ලක්වීමට සිදු විණි. දැඩි වෙහෙසකාරී බව නිසා කම්කරුවන් නොයෙකුත් ආබාධයන්ට හා රෝගවලට භාජන වීමත් මරණයට පත් වීමත් සිදුවිය.

### මොකක්ද මේ පැය අටේ ඉල්ලීම

1830 පමණ කාලයේදී ඇමෙරිකාවේ කම්කරුවෝ සිය දෛනික සේවා කාලය පැය දහයක් හා ආහාර විවේකය සඳහා පැය දෙකක් ලබා දෙන ලෙස සිය හාම්පුතුන්ගෙන් ඉල්ලා සිටියහ. එහෙත් ශ්‍රමිකයන්ගෙන් තලා පෙළා වැඩ ගැනීමට පුරුදුව සිටි කම්හල් හිමියන් එයට එකඟ නොවීය. කම්හල් හිමියන්, කම්කරු ශ්‍රමයේ දහදිය බිඳුවක අගය තක්සේරු කළේ තමන්ට වියදම් කළ යුතුව තිබූ වැටුප අනුවයි. කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින්නට රජය හෝ නීතියේ ආධිපත්‍යයන් නොවූ නිසා එවැනි ඉල්ලීම් කළ කම්කරු නායකයන්ට නොයෙකුත් වධ බන්ධනවලට ලක්වීමට සිදුවිය. හාම්පුතුන්ගේ තාඩන පීඩනවලට ලක්වූ ඇමෙරිකාවේ කම්කරුවෝ 1863 දී ප්‍රථම වරට කම්කරු සම්මේලනයක් මගින් එකතු වී දිනක වැඩ කරන කාල පරාසය පැය 8 කට සීමා කරන ලෙස සිය කම්හල් හිමියන්ගෙන් ඉල්ලා සිටියහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් කම්කරු සම්මේලනය සමඟ සාකච්ඡා කිරීමට හාම්පුතුන් එකඟ වුවත් ඔවුන්ගේ ඉල්ලීම් ලබාදීමට කම්හල් හිමියන් අකමැති විය.

සාකච්ඡා වට කීපයක් පැවැත්වුවත් සිය ඉල්ලීම් ඉටුකර ගත නොහැකි වූ කම්කරුවන්ගේ ඊළඟ පියවර වූයේ නයිට්ස් ඔෆ් චිකාගෝ නම් කම්කරු සංවිධානය පිහිටුවා ගැනීමයි. නමුත් 1878 ඉල්ලීම් දිනා ගැනීමට නොහැකි වීමෙන් සාකච්ඡාවලින් සිය ඉල්ලීම් දිනාගත නොහැකි බව සහ සටන් මාර්ගයකට අවතීර්ණ වීමේ අවශ්‍යතාව ප්‍රථම වරට ලෝකයේ කම්කරුවන් ඉදිරියේ දැනෙන්නට විය. සටන්කාමී නිර්භීත කම්කරු නායකයන් කීපදෙනෙකු වටා එක්රොක් වූ කම්කරුවෝ සිය ඉල්ලීම් දිනාගන්නට තර්ජනාත්මක සටන් මාර්ගය තෝරා ගත්හ. මේ වන විට නයිට්ස් ඔෆ් චිකාගෝ සංවිධානයට කම්කරුවන් 150,000 ක් පමණ එක් වී විශාල සංවිධානයක් බවට පත් වී තිබුණි.

### 1886 මහා වැඩ වර්ජනය

තත්ත්වය උණුසුම් වුණේ කම්කරු ජනතාව පැය අටක වැඩ මුරය සඳහා කළ ඉල්ලීම චිකාගෝ කර්මාන්ත ශාලා හිමියන් ප්‍රතික්ෂේප කර කර්මාන්ත ශාලා වසා දැමීමට තීරණය කිරීම නිසයි. කම්කරු පිරිස ලක්ෂ එකහමාරක් පමණ චිකාගෝ නගරයට රැස් වී 1886 දී කළ මහා වැඩ වර්ජනය කර්මාන්ත හිමියන්ට එරෙහිව එල්ල කළ පළමුවැනි වෙඩි මුරය ලෙස පෙන්වා දිය හැකියි. කෙසේ හෝ කම්කරුවන්ගේ එක්සත් බව හමුවේ පැය 8 ඉල්ලීම නොදී සිටීමට කම්කරු හිමියන්ට නොහැකි තත්ත්වයට පත් විය. මෙසේ 1886 වැඩ වර්ජනය තොට ඉල්ලීම් දිනාගත් දිනය කම්කරුවන්ගේ ජයග්‍රාහී දිනය වශයෙන් යොදා ගැනිණි. මේ වැඩ වර්ජනයේ ජයග්‍රහණය නිසා උද්දාම වූ කම්කරුවෝ වඩ වඩාත් උද්යෝගයෙන් කම්කරු සංවිධානය වටා එක්රැස් වූහ. මේ නිසාම මැයි 01 දා චිකාගෝ නුවර හේමාර්කට් ප්‍රදේශයට රැස් වූ කම්කරුවෝ පැය 8 වැඩ මුරය නීතිගත කරන තුරු සටන් කරන්නට තීරණය කරමින් උද්ඝෝෂණයේ නිරත වුණි. මැයි 01 වැනිදා රැස්වූ පිරිස ඇමතූ සැමුවෙල් ෆිල්ඩන් නම් කම්කරු නායකයා මැයි 01 දිනය ඓතිහාසික දිනයක් බව ප්‍රකාශ කළේය.

### පොලිස් ප්‍රහාර මැද ඉදිරියට ආ අරගලය

කම්හල් නිලධාරීන්ගේ අණ ලැබූ පොලිස් නිලධාරීන් පිරිසක් හදිසියේම එතැනට කඩා වැදී කම්කරුවන්ට පහර දෙන්නට විය. හිස් ලූ ලූ අත දිව යන කම්කරුවන්ට පොලිසිය වෙඩි තැබූ අතර කම්කරුවන්ගේ ශරීර ලෙයින් තෙත් වී මාර්ගයද ලෙයින් වැසී ගියේය. මේ සිදුවීමෙන් සිය ගණන් කම්කරුවෝ ලේ පෙරාගෙන ඇද වැටුණහ. වෙඩි වැදුණු කම්කරුවෝ හතර දෙනෙක් මිය ගියහ. මිනීමැරුම්වලින් ඇවිස්සුණු කම්කරුවෝ ඊට විරෝධතාව දැක්වීමට මැයි 04 වැනි දා හේමාර්කට් චතුරස්‍රයට රැස් වූහ. කම්කරුවන් හා කම්හල් හිමියන් අතර සටන ආරම්භ වූයේ එතැන් සිටය. කම්කරු හිමියන් විසින් අවුස්සන ලද හා අල්ලස්වලින් සප්පායම් ලද පොලිසිය කම්කරුවන් ඒකරාශී වීම වැළැක්වීමට නොයෙක් උපක්‍රම යෙදුවත් පොලිස් බාධක මධ්‍යයේ හේමාර්කට් චතුරස්‍රයට දස දහස් ගණන් පිරිස් එක්රොක් වීම වැළැක්විය නොහැකි වුණි. නායකයන් සමඟ පොලිසිය සාකච්ඡා කරමින් සිටියදී එක්වරම පොලිසිය දෙසට බෝම්බ ප්‍රහාරයක් එල්ල වූ අතර පොලිසියද කම්කරුවන්ට වෙඩි තබන්නට විය. කම්කරුවෝද ගල්-මුල් හා අතට හසුවන දෙයින් පොලිසියට ප්‍රහාර එල්ල කළහ. මේ ප්‍රහාරවලින් පොලිස් භටයකු එතැනම මිය ගිය අතර තවත් හය දෙනෙක් පසුව මිය ගියහ. මිය ගිය කම්කරුවන්ගේ ගණන සිය ගණනක් විය. කම්කරු මර්දනයට හොඳ අවස්ථාවක් ලද කම්හල් හිමියෝ පොලිසිය ලවා තව තවත් කම්කරුවන්ට ප්‍රහාර එල්ල කළහ. හේමාර්කට් චතුරස්‍රය එදා 1886 මැයි 01 දා එකම ලේ විලක් බවට පත් විය. කම්හල් හිමියන්ගේ ඉල්ලීම පරිදි අරගලයට සම්බන්ධ වූ ඔගස්ටස් ස්පයිස්, සැමුවෙල් ෆිල්ඩන්, ඇල්බට් පාර්සන්ස්, ජෝර්ජ් එන්ගල්ස්, ඇඩොල්ෆ් ෆිෂර්, ලුයිස් ලින්ග්, මයිකල් ස්ට්වැට්, ඔස්කා නිබේ යන කම්කරු නායකයෝ අත්අඩංගුවට පත් වූහ. ඔවුන්ට එරෙහිව පොලිසියට ප්‍රහාර එල්ල කිරීමේ චෝදනාව මත නඩු පැවරුවේය. මෙහිදී විත්තිකරුවන්ට ඔවුන් වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොලැබිණි. සැමුවෙල් ෆිල්ඩන් හා මයිකල් ස්ට්වැට් ට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම වුණි. ඔස්කා නිබේට වසර 15 ක සිර දඬුවමක් හිමි වූ අතර අනික් සියලු දෙනාම එල්ලා මැරීමට නියම විය. ලුයිස් ලින්ග් එල්ලා මරා දැමීමට පෙර බෝම්බයක් පුපුරුවාගෙන මිය ගියේය. අනෙක් සිව්දෙනා වූ ඔගස්ටස් ස්පයිස්, ඇල්බට් පාර්සන්ස්, ඇඩොල්ෆ් ෆිෂර් හා ජෝර්ජ් එන්ගල්ස් 1887 නොවැම්බර් 11 දා එල්ලා මරනු ලැබීය. මෙය ලෝක කම්කරු ඉතිහාසයේ කඳුළින් ලියවුණු සිද්ධියකි.

### ලෙයින් කඳුළින් ලියවුණු මැයි දිනය

1889 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ රැස්වීමේදී පැය අටක සේවා මුරය සඳහා අරගල කරමින් සිටියදී පොලිස් වෙඩි පහරින් මිය ගිය කම්කරුවන් සිහි කිරීම පිණිස සෑම වසරකම මැයි 01 දා ජාත්‍යන්තර කම්කරු දිනය වශයෙන් සැමරිය යුතු යැයි ලෝකවාසී කම්කරු ජනතාව තීරණය කළේය. මේ අනුව 1890 ඇමෙරිකාවේ, චිලී රටේ හා කියුබාවේ අතිවිශාල කම්කරු පිරිසකගේ සහභාගිත්වයෙන් මුල්ම කම්කරු දිනය සැමරූහ. 1893 ජූනි 26 වැනි දා ඇල්වගේට් ආණ්ඩුකාරවරයාගේ නියමයෙන් එතෙක් සිරගතව සිටි සැමුවෙල් ෆිල්ඩන්, මයිකල් ස්ට්වැට්, ඔස්කා නිබේ නිදහස් කරනු ලැබීය. එල්ලා මැරූ අය හා බෝම්බයක් පුපුරුවාගෙන මිය ගිය ලුයිස් ලින්ග් ද නිවැරදි කරුවන් ලෙස ප්‍රකාශයට පත් කළේය. මෙසේ කම්කරුවන්ගේ ලෙයින් කඳුළින් උපන් මැයි දිනය අද වන විට ජාති ආගම් කුලමල භේද රහිතව ලොව පුරා කම්කරුවෝ සමරති. දිනකට පැය 12 ක් 16 ක් වැඩ කළ කම්කරුවන් පැය 8 සේවා මුරයෙන් සතුටට පත් වූ අතර තම අයිතිවාසිකම් උදෙසා කම්කරු සංගම් පිහිටුවා ගැනීමටද වරම් ලැබූහ.

### කම්කරු අරගල හා බැඳි සාහිත්‍යය

කම්කරුවන්ගේ මේ අරගල ලෝකය වෙත ප්‍රකාශ වීමත් සමඟ ඒ හා බැඳී අපූර්ව වූ සාහිත්‍යාංගද ලෝකයට දායාද වුණි. කම්කරු සාහිත්‍යාංග අතර ලොව වැඩි වශයෙන් ජනප්‍රියව පවතින්නේ රුසියානු සාහිත්‍යයට අයත් පොත්පත් වේ. මේ අතරින් කම්කරු ජනතාවගේ පූජනීය මුදුන්මල්කඩ වන්නේ මක්සිම් ගෝර්කි (අලෙක්සේයි මක්සීමොවිච් පෙෂ්කොව්) විසින් රචනා කරන ලද 'අම්මා' නම් වූ කෘතියයි. ඒ සමඟ මිහායෙල් ෂොලෝහොව්ගේ 'පෙරළුණු නැවුම් පස' හා 'දොන් නදිය නිසලව ගලා බසී' කෘති ඉතා ප්‍රසිද්ධය. ගෝර්කිගේ කතාවන් වඩා වැදගත් වන්නේ කුඩා කල සිට මෙහෙකරුවකු, උද්‍යාන පාලකයකු, වරාය කම්කරුවකු, රාත්‍රී මුරකරුවකු, බත්කරේ කෙනෙකු ආදී වශයෙන් ඔහු ලද ආභාසය හා පන්නරය මෙම කෘති නිර්මාණයේදී අතිශයින් වැදගත් පදනමක් වී ඇති බැවිනි. ඔහුගේ සුප්‍රසිද්ධ නවකතාවක් වූ අම්මා ලියන්නේ දේශපාලන සරණාගතයකු ලෙස ඉතාලියේ කැෆ්රි දූපතේ නැවතී සිටි කාලය තුළයි. කම්කරු පන්තියේ ජීවන තතු අතිශය දයාන්විත ලෙසත් පැහැදිලිවත් පළමුවරට ප්‍රකාශ කෙරුණු සාහිත්‍ය කෘතිය වන්නේත් එයයි. ලොව පුරාම කම්කරු ජනතාව එය මහත් ආදරයෙන් වැළඳ ගත්තා පමණක්ම නොව, විදේශීය භාෂා ගණනාවකට එය පරිවර්තනය වී ලොව පුරා පිටපත් කෝටියකට අධික ප්‍රමාණයකින් අලෙවි විය. එහෙත් විචාරකයෝද සාර් ආණ්ඩුවද අම්මා කෘතියට එරෙහිව අවි ගත්තෝය.

### අප කළ යුත්තේ කුමක්ද?

මේ වන විට ලෝකයේ බොහෝ රටවල් මැයි දිනය නිවාඩු දිනයක් ලෙස නම් කර ඇත්තේ කම්කරු අයිතිවාසිකම්වලට ගරු කිරීමක් වශයෙනි. එක් පුද්ගලයෙකු හෝ පුද්ගලයක් කීපදෙනෙකු මත සම්පත් එක්වෙමින් පැවති ධනවාදී ආර්ථික ක්‍රමයට එරෙහිව ගොඩ නැගුණු කම්කරු දිනය ලෙයින් කඳුළින් ගොඩ නැගුණක් බව කම්කරු ඉතිහාසය දෙස බලන විට පෙනෙයි.

ලෝක කම්කරු ජනතාව දැඩි සහෝදරත්වයෙන් එකට එක් වී සමරන මැයි දිනය දියුණු බුද්ධිමත් තාක්ෂණික යුගයක සිටින මිනිසා බුද්ධියෙන් පෝෂණය වූ දිනයක් ලෙස සැලකිය හැකිය. එනිසා සේව්‍ය - සේවක දෙපිරිසගේම වගකීම හා යුතුකම වන්නේ අන්‍යෝන්‍ය සබඳතාවයෙන් යුතුව දෙපිරිසම තම තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් කොටස නොපිරිහෙලා ඉටු කිරීමයි. එය රටක සංවර්ධනය කරා යන ගමනටද මහත් පිටිවහලක් වනු ඇත.


කැන්ඩි ලමිස්සි
Mariyasel Gunathilaka
MARIAZELLE
GOONETILLEKE
WITH
FIRE
DINNER DANCE
Saturday, 20th July, 2019 - 7:00pm
TICKET $65 PER PERSON
J&J SWAGAT CONVENTION CENTRE
415 HOOD ROAD, #22
MARKHAM
FOR TICKETS: Suraj: 647-856-9598 Aloka: 647-986-2393 Kevin: 647-447-8792
Chamara : 647-865-2121 Rukshana : 416-996-9474

# CanLanka BUSINESS ASSOCIATION

A NON- PROFIT ORGANIZATION ESTABLISHED IN 2011

## PROFESSIONAL SERVICES OFFERED BY MEMBERS



REAL ESTATE
**GAMINI ABEYSINGHE**
www.gaminiabeysinghe.com
**416.822.2789**



FINANCIAL SERVICES & INSURANCE
**ANURA RANAWEERA**
**647.872.6356**
**647.361.7509**EXT**100**



ACCOUNTING & TAX SERVICE
**SIRI & SRIYANI GAMAGE**
GS ACCOUNTING CO
www.gsaccounting.ca
**416.571.4270**



MONEY TRANSFER
**SURANJAN MAHADURAGE**
THISAL FINANCIAL SERVICES
**416.546.4488**



HEATING & AIR CONDITIONING
**ASHOK HETTIGE**
AIR CARE PLUS LTD.
**416.605.8300**



MORTGAGE
**SAM PREMARATNE**
**647.833.5783**



PASTRY CHEF
**DIMUTHU PERERA**
ANDRO CAKES
SWEETS FOR ANY REASON & SEASON'S
**416.857.4566**



CONSTRUCTION & RENOVATION
**THILAK WEERAKOON**
TOWERIIN SERVICES
**647.994.6377**



ELECTRICAL CONTRACTOR
**DON HERMAN**
MASTER ELECTRICIAN
309A NDT ELECTRICAL INC
**416.906.2341**



WORLDWIDE OCEAN & AIR SHIPPING
**ALOKA SAM WIJESINGHE**
CEYCAN TRANSHIPPING INC
**647.986.2393**



VEHICLE REPAIRS & SERVICES
**HAROLD FERNANDO**
TECH LAN CA AUTO INC
**647.378.9242**

**1274 WARDEN AVENUE, TORONTO ON MIR2R6, CANADA**

*Phone: 647.361.7509* *Fax: 289.813.5529* *Website: www.canlankabusiness.com*
*Toll free: 1.800.611.2882* *Email: info@canlankabusiness.com*

*DISCLAIMER – CAN LANKA BUSINESS ASSOCIATION WAIVES ITSELF FROM BEING LIABLE FOR ANY PROFESSIONAL SERVICES PROVIDED BY INDIVIDUAL MEMBERS*

# දේශපාලන Gossip

■ නිරූ වික්‍රමසිංහ

මෙවර සිංහල සහ හින්දු අලුත් අවුරුද්ද ප්‍රීතිමත්ව සහ ඉතා සාමකාමීව ගෙවී ගියේය. උත්සව නිවාඩුව සමඟින් රටේ දේශපාලන නායකයන් බොහෝ දෙනෙක් විදේශ සංචාර සඳහා රටින් බැහැරව ගොස් සිටියහ. මේ අතර ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාද පවුලේ සාමාජිකයන් සමඟින් ඉන්දියාව බලා පිටත්ව ගියේ පසුගිය 16 දා අවුරුදු චාරිත්‍ර නිම කිරීමත් සමඟය. ඉන්දියානු සංචාරය නිමා කළ ඔවුන් නිවාඩුවේ ඉතිරි දින ගත කිරීම සඳහා ඉන් අනතුරුව සිංගප්පූරුව බලා පිටත්ව ගියේය.

ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතා තෝරා ගෙන තිබුණේ කැනඩාවයි. ඔහු කැනඩාවට ගොස් තිබුණි.

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා සුපුරුදු පරිදි අලුත් අවුරුද්දට තෝරාගෙන තිබුණේ නුවරඑළි සංචාරයයි. ඔහු කොළඹ පැමිණීමට නියමිතව තිබුණේ පාස්කු දිනයේදීය. එහෙත්, ආණ්ඩුව පෙරළීමේ හා අගමැති මාරු කිරීමේ කුමන්ත්‍රණයක් පිළිබඳ සැලවීමත් සමඟින් අගමැතිවරයා කොළඹ පැමිණ සුපුරුදු රාජකාරි ආරම්භ කළේය. එහිදී නිලධාරීන් රැසක් අවුරුදු නිවාඩුව ගෙවමින් සිටි නිසා විදෙස් ආයෝජනවලට අදාළ වාර්තා රැසක් අධීක්ෂණය කිරීම සඳහා අගමැතිවරයා දකුණු මුහුදු තීරයේ බෙන්තොටට යෑමට සිදුව තිබුණි.

අනෙකුත් දේශපාලන නායකයන්ද යුරෝපයේ මෙන්ම වෙනත් රටවල විදේශ සංචාරයන්හි නිරත වී සිටියහ.

අප්‍රේල් 21 වෙනිදා දිනය අවුරුදු නිවාඩුවේ අවසන් දිනයයි. එසේම ක්‍රිස්තුස්වහන්සේගේ උත්ථානය සිදු වූ පාස්කු ඉරිදාවයි. කතෝලික බැතිමතුන්ට ඉතා වැදගත් දිනයක් වූ එදින කතෝලික දේවස්ථානයන් පාස්කු දේව මෙහෙය සඳහා සූදානම් වූ අතර සංචාරක හෝටල්වල පාස්කු දින විශේෂ උදෑසන+දිවා ආහාරය (Brunch) සඳහා සූදානම් කර තිබුණි.

ඔරලෝසු බට්ටා උදෑසන 8.45 නාද කර ගත වී ගියේ සුළු මොහොතකි. රූපවාහිනී තිරය මත විශේෂ ප්‍රවෘත්තියක් පිළිබඳ සනිටුහන් වන්නට විය. සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවි අතරද තොරතුරු හුවමාරු වූයේ එකිනෙකාගේ ආරක්ෂාව පිළිබඳ විමසිලිමත් වෙමින්ය.

එහි කෙටි සටහන වූයේ "Are you safe" යන්නය.

නිමේෂයක් ගතවීමට පෙරාතුව රටේ ජනතාව ත්‍රාසයටත් භීතියටත් පත්කරන ප්‍රවෘත්තියක් අසන්නට දකින්නට ලැබුණි.

"පල්ලි වලටයි කොළඹ හෝටල් වලටයි බෝම්බ ගහලා...."

"කවුද බෝම්බ ගහල තියෙන්නේ ....?"

"කොටි ආයෙත් බෝම්බ ගහලද....?" යන්න තවත් ඇතැමෙකුගේ ප්‍රශ්නාර්ථය විය....

"කොටි කොයින්ද දැන්....!" බොහෝ දෙනෙක් මවිතයට පත්වෙමින් අසන්නට විය. ඉතා කෙටි කාලයක් තුළදී මුළු රටම බෝම්බ බියෙන් ඇළලි ගියේය.

යුද්ධය නිම වී දස වසරක සැමරුම ආසන්නව තිබියදී රටේ නැවත ත්‍රස්ත ප්‍රහාරයක් දියත් වීම දේශපාලන කරළිය උඩුයටිකුරු කරවීමට සමත්විය.

රටේ ප්‍රධාන දේවස්ථාන සහ සංචාරක හෝටල් ඉලක්ක කරමින් එල්ල වූ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාරයෙන් සිය ගණනකගේ ජීවිත අහිමි වී ගොස් තිබුණිඩ් දහස් ගණනක පිරිසක් රෝහල්ගත කර තිබුණි. වචනයෙන් විස්තර කළ නොහැකි ශෝකයකින්ද භීතියකින්ද කුතුහලයකින්ද ජන හදවත් පිරී ගියේය.

බෝම්බ ප්‍රහාරය එල්ල වූ කොච්චිකඩේ දේවස්ථානයට ගිය විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ මහතා "මට මේ මොහොතේ කැබිතිගොල්ලෑවෙ ඝාතන සිදුවීම සිහිපත් වෙනවා. ඒකත් මේ හා සමාන මිනිස් ඝාතන සිදුවූ අවස්ථාවක්" යැයි ඉතා හැඟීම්බරව කියා සිටියේය.

"රටේ ආරක්ෂාව පිළිබඳ ඔබතුමා කුමන මතයක් දරන්නේදැ" යි යන්නය එහිදී මාධ්‍යවේදීන්ගේ ප්‍රශ්නය විය. එයට විපක්ෂනායකවරයාගේ පිළිතුර වූයේ "කතා කිරීමට තරම් ජාතික ආරක්ෂාවක් රට තුළ තිබේදැ" යි යන්නය.

අනතුරුව අගමැති රනිල් වික්‍රමසිංහ, කතානායක කරු ජයසූරිය මහත්වරුන්ද දේවස්ථානය කරා පැමිණ කණගාටුව ප්‍රකාශ කරමින් සිදුව ඇති ජීවිත සහ දේපළ හානි පිළිබඳ සොයා බැලීය.

සිද්ධිය සිදුවන අවස්ථාවේ ජනාධිපතිවරයා රටින් බැහැරව දින පහක් ගත වී ගොස් තිබුණි.

එහෙත් සිංගප්පූරුවේ සිටි ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවට පැමිණියේ ත්‍රස්ත ප්‍රහාරය එල්ල වී පැය විසිහතරකට ආසන්න කාල සීමාවක් ගත වූ පසුවය.

සිද්ධිය සිදුවන අවස්ථාවේ රටේ ආරක්ෂාව භාර ජනාධිපතිවරයා විදේශගත වී සිටි බැවින් අගමැතිවරයා විසින් රටේ ඉදිරි ආරක්ෂක වැඩපිළිවෙළ පිළිබඳ සාකච්ඡා කිරීමට ආරක්ෂක මණ්ඩලය අරලියගහ මන්දිරයට කැඳවා තිබුණි. එහෙත් ආරක්ෂක ලේකම්වරයා සහ ආරක්ෂක ප්‍රධානීන්ගේ අදහස වූයේ එම හමුව ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැත්විය යුතුය යන්නයි. කඹ ඇදිල්ල අවසානයේ ආරක්ෂක අමාත්‍යාංශය වෙත යෑමට අගමැතිවරයා තීරණය කළේය. එහෙත් කමිටුවේ ප්‍රධානීන්ගේ අඩුලුහුඬු පැවැතියත් ආරක්ෂක මණ්ඩලය රැස් වී රටට අවශ්‍ය තීන්දු කිහිපයක් ගැනීමට අගමැතිවරයා ක්‍රියා කළේය.

එදින රාත්‍රියේ හදිසි කැබිනට් රැස්වීමක් කැඳවූ අගමැතිවරයා රටේ ඉදිරි වැඩපිළිවෙළ පිළිබඳ සාකච්ඡා කළ අතර එහිදී තදින්ම දෝෂාරෝපනයට ලක් වූයේ ජනාධිපතිවරයායි. බොහෝ ඇමතිවරුන් කියා සිටියේ බුද්ධි අංශයන් අප්‍රේල් මස මුල් සතියේ සිට මේ ප්‍රහාරය පිළිබඳ ආරක්ෂක අංශ දැනුවත් කර තිබුණද එම ප්‍රහාරය වැළැක්වීම සඳහා ඔවුන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැති බවයි.

නීතිය, සාමය සහ අභ්‍යන්තර කටයුතු භාර ඇමැතිවරයා ලෙස ජනාධිපතිවරයා නිසි ලෙස ක්‍රියා නොකළ බව ආණ්ඩුවේ ඇතැම් ඇමැතිවරුන්ගේ අදහස විය. සිදුවූ මහා ව්‍යසනය පිළිබඳ විපක්ෂයද, විවිධ පාර්ශවයන්ද රජයට එරෙහිව නොයෙක් චෝදනා එල්ල කරද්දී අගමැතිවරයා රටේ ඉදිරි ආරක්ෂාව වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග සඳහා විවිධ අංශ වෙත උපදෙස් ලබා දුන්නේය.

මේ වන විට මළමිනී උඩින් දේශපාලන අරමුණු ඉටුකර ගැනීමට උත්සාහ දරණ ඇතැම් දේශපාලඥයන් ජනතාවගේ දැඩි අප්‍රසාදයට ලක්ව තිබේ.

මාරක ත්‍රස්ත ප්‍රහාරය එල්ල වී සතියකට වැඩි කාලයක් ඉක්ම වී ගොස් තිබුණද සාමාන්‍ය ජන ජීවිතයේ කටයුතු නිසි පරිදි සිදු නොවන අතර ජනතාවට තවමත් ජීවත් වීමට සිදුව ඇත්තේ මරණයේ අඳුරු සෙවණැලි දකිමිනි. මේ වන විට සියලු දේශපාලඥයන් පිළිබඳ දැඩි ලෙස කලකිරීමට පත්ව සිටින ජනතාවගේ එකම සැනසීම සහ විශ්වාසය ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය බවට පත්ව තිබේ.

★ ★ ★ ★

බෝම්බ පිපිරීමට අදාළ සිද්ධිය අගමැතිවරයාට සැල වූයේ බෙන්තොටදීය. එය සැල වූ වහාම අගමැතිවරයා අරලියගහ මැදුරට පැමිණියේ සෙසු මැති ඇමැතිවරුන්ද කැඳවමිනි. ඒ වන විට ජනාධිපතිවරයා දින 8 කට අධික කාලයක් ඉන්දියාව හා සිංගප්පූරුවේ සංචාරය කරමින් සිටියේය.

කොළඹ පැමිණි අගමැතිවරයා ඇමැති මණ්ඩල සාකච්ඡාවෙන් පසු ආරක්ෂක මණ්ඩලය වහාම කැඳවීමට තීරණය කළේය. එහෙත් හමුදාපතිවරුන් ඇතුළු ආරක්ෂක අංශ ප්‍රධානීන් හා ආරක්ෂක ලේකම්වරයාගේ අදහස වූයේ එය රැස්විය යුත්තේ අරලියගහ මැදුරේ නොව ආරක්ෂක අමාත්‍යාංශයේ බවය. "හරි, එහෙම නම් මා අමාත්‍යාංශයට එන්නම්" යයි කී අගමැතිවරයා අමාත්‍යාංශය වෙත ගියේය. එහෙත් රැස්වීමට අවශ්‍ය මූලික පියවරවත් අදාළ නිලධාරීන් ගෙන තිබුණේ නැත. රාජ්‍ය ඇමැති රුවන් විජයවර්ධනගේ කාර්යාලයට ගිය අගමැතිවරයා විනාඩි 25 ක් පමණ එහි රැඳී සිටිය අතර විවිධ කඹ ඇදීම් තුළ රටේ ජාතික ආරක්ෂාවට අදාළ වැදගත් රැස්වීම පැවැත්වීම විනාඩියෙන් විනාඩිය ප්‍රමාද වෙමින් තිබුණි.

අවසානයේ ආරක්ෂක කවුන්සිලයට අනිවාර්යයෙන් පැමිණිය යුතු ප්‍රධානීන්ගේ අඩුලුහුඬුතාව මත හෝ රැස්වීම ආරම්භ කළ අතර එහිදී විශේෂ තීන්දු තීරණ රැසක් ගත්තේය. රැස්වීමෙන් අනතුරුව අගමැතිවරයා තමා සමග ගිය පිරිසට හදිසි අවස්ථාවකදී ආරක්ෂක කවුන්සිලයට අදාළ අතීත සිදුවීම් සිහි කළේ තම වසර 41 ක දේශපාලන අත්දැකීම්ද සමගිනි.

"ජනපති ප්‍රේමදාස ඝාතනය වුණාම 1993 දී මා ආරක්ෂක කවුන්සිලය කැඳවා රටේ ආරක්ෂාව සහතික කළා. ජේ.ආර් ගේ කාලේ එතුමා ලංකාවේ නොව කොළඹින් පිට හිටියත් රන්ජන්ල, ගාමිණීල, ලලිත්ලා වගේ අයට මේ කවුන්සිලය කැඳවා තීන්දු ගන්න ක්‍රමවේද ඇති කළා."

ආරක්ෂාව තහවුරු කිරීමට සියලු විධිවිධාන කකුල් මාට්ටු මැදින් වුවද තහවුරු කළ අගමැතිවරයා බෝම්බ පිපිරවූ කොච්චිකඩේ පල්ලියටද ගොස් වූ විපත නිරීක්ෂණය කළේය. එදින රාත්‍රියේ අගමැතිවරයා කැබිනට් රැස්වීමද කැඳවීය. එහිදී සාධක සහිතව හෙළිවූයේ අප්‍රේල් මාසය ඇරඹීමත් සමගින් ඉන්දියානු බුද්ධි අංශ මෙන්ම ලංකාවේ බුද්ධි අංශද මෙවැනි ප්‍රහාර එල්ල විය හැකි බවට තොරතුරු වාර්තා කර තිබූ බවය. ඒ බුද්ධි අංශ තොරතුරු අනුව ආරක්ෂක සහ නීතිය සාමය හා අභ්‍යන්තර කටයුතු පිළිබඳ ඇමැතිවරයාව සිටි ජනපති ඇතුළු වගකිව යුත්තන් ප්‍රහාරය වලකා ගැනීමට ක්‍රියා නොකිරීම පිළිබද ඇමැතිවරු රැසක් චෝදනා නගන්න වූහ.

"මේ තොරතුර අගමැති හැටියට මට හෝ කැබිනට් එකටත් හෝ ලැබුණේ නැහැ. ලැබිලා තිබුණා නම් අප ප්‍රහාරය වළක්වා ගන්නවා." එහිදී අගමැතිවරයා කීය.

ජනපති ලංකාවට පැමිණි පසු හමුවන මුල් අවස්ථාවේදී අදාළ සිද්ධිය වළකා ගැනීමට ක්‍රියා නොකිරීම ගැන ප්‍රශ්න කිරීම සඳහා ලක්ෂ්මන් කිරිඇල්ලගේ ප්‍රධානත්වයෙන් කමිටුවක්ද පත්කෙරිණ. ඊට

29 වන පිටුව බලන්න

Tutoring
From Grade 08 to 12

| Mathematics Physics Programming (Java, C#) | Grade 12 Mathematics Advance Functions Limits Calculus |
| --- | --- |

• Supporting for homework and tests
• Full attention for improving knowledge
• Home Visits possible

Experience and qualified teacher for excellent results

Contact
Kithsiri Jayasinghe
(BSc. , MSc. Mathematics & Comp. Science)
Email: jayakithsiri@hotmail.com
Phone - 647 705 1606 / 647 946 9504

# ආඬිවරුන්ගේ හින්දු බලපෑමෙන් සිරිපතුල බේරාගැනෙයි



■ **රාජා ඒ. කුලතුංග**

ශ්‍රීපාදස්ථානය වූ කලී මහ රහත් එලයට පැමිණි මහ රහතන් වහන්සේලාගේද දෙවි බඹුන්ගේද නොමඳ පූජනීයත්වයට ලක් වූ ස්ථානයකි. ලක්දිව විසූ රජවරුන්, ලෝකයේ විවිධ ශාස්තෘවරුන් හා පඬිවරුන්ගේ නොමඳ ගෞරවයට පත් සමනොළ කන්දේ පිහිටි සම්බුදු සිරිපතුළට ලක්දිව කෝට්ටේ සීතාවක යුගයේ විසූ පීතෘ ඝාතක චෝදනාව ලත් පළමුවැනි රාජසිංහ රජුගේ (ක්‍රි.ව. 1581 - 93) රාජ්‍ය වර්ෂයේදී මහත් වූ අභාග්‍යසම්පන්න යුගයක් එළඹිණි.

## අත්වැරදීම

ක්‍රි.ව. 1505 දී ලංකාවට ගොඩ බට පෘතුගීසී මුහුදුබඩ බලය අල්ලාගෙන සිටි අවධියේදී ලක් රජය කළ කෝට්ටේ සීතාවක මායාදුන්නේ රජ දුර්වල හා කම්මැලි පාලකයෙක් ලෙස හැඳින්විණි. එහෙත් එතුමාගේ පුත් ටිකිරි කුමරු දක්ෂ දුනු හා කඩු ශිල්පියෙහි අගතැන් පත් අයෙකි. පුතාගේ එඩිතරකම දුටු රජතෙමේ සිය පුත්‍රයාට යුවරජකම ලබා දුන්නේය. පෘතුගීසීන් සමඟ කවරදා හෝ යුද්ධයකට පිවිසිය යුතු අවදානම පහදා ගත් මායාදුන්නේ රජු සිය පුතාට රණ ශූරයෙක් ලෙස කටයුතු කරන ලෙසින් උපදෙස් ලබා දුනි. සිය රජ මාළිගය තුළම කඩු හරඹය පුහුණු වන ලෙස රජතුමාගෙන් උපදෙස් ලැබුණ අතර දිනක් තමාගේ පුත්‍රයාගේ දස්කම් බලන අදහසින් තිරයකින් මුවා වී බලා සිටියදීම හදිසියේ එල්ල වුණු කඩු පහරක් වැදී ගසක් කපා හෙලුවාක් මෙන් තම පියා බිම පතිත වී මිය ගියේය.

සිද්ධිය කිසිවෙක් නුදුටු බැවින් මුළු රජ මාළිගය පුරා පැතිර ගියේ රාජසිංහ යුවරජ මහරජකම ලබා ගැනීම සඳහා සිය පියා ඝාතනය කළ බවයි. රට පුරා ලැව් ගින්නක් පැතිර යන්නා සේ මෙම කටකතාව පැතිර ගියේය. දැඩි ශක්තිමත් හා ක්‍රියාශූර එඩිතර ගතිවලින් යුත් ටිකිරි කුමරු නම් වූ රාජසිංහ යුව රජු කිසි දා සිහිනයකින්වත් නොසිතූ දෙයක් සිදුවී අවසානය. හේ මහත් කම්පාවට හා ශෝකයට පත්විණි. සිංහල රාජ්‍යයේ නායකයන්ට අවවාද උපදෙස් ලබා දෙන ගරු මහ සඟරුවන රජවාසලට කැඳවිණි. පියාගේ මරණය සිදුවූ අන්දම හිමිවරුන්ට පැවසිනි. එහෙත් කටකතා ඊටත් එහා පැතිර ගොස් තිබිණි. රජවාසලට පැමිණි හිමිවරුන්ටද රජතුමා වැඳ වැද දෙපා සිඹ සිඹ තමා නිවැරදිකරු බව පැවසූවද පිළි නොගත් හිමිවරුන් දැඩි සේ ප්‍රකාශ කළේ තමා බරපතල පාපකර්මයක් සිදුකරගෙන ඇති බවය. ආනන්තර්ය පාපකර්මයෙන් තමාට කිසි දිනක් ගැලවිය නොහැකි බවය.

තමා අතින් සිය පියා මැරුම් කෑ සිත් වේදනාවෙන් අසරණව කම්පනයකට පත්ව සිටි රාජසිංහ යුවරජ පිළිසරණක් සොයා රජ මැදුරට කැඳවූ මහ සඟරුවනෙන්ද තමා තවත් අසරණ වූ රජ කෝපාග්නියෙන් වෙළී ගියේය. ගල්පහරක් වැදුනු විෂඝෝර සර්පයෙක් සේ හේ හැසිරිණි. කෝපාවිෂ්ඨ විය. රජ මාලිගයට පැමිණි හිමිවරුන්ද රාජ්‍ය ලෝභයෙන් රාජසිංහ රජතුමා මායාදුන්නේ පියරජතුමා මාළිගය තුළදී රහසිගතව මරා දැමූයේ යයි ප්‍රකාශ කළ කට කතා ලැව්ගින්නට පිදුරු දමන්නා සේ රට තුළ පැතිර ගියේය. රජතුමාගේ කෝපය නිම්හිම් නැති විය.

## රාජා හෝ මා හෝ ගංගා හෝ

මෙම සිද්ධිය වහා දැනගත් දකුණු ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ සිට පැමිණි අරිට්ඨ කීවෙන්ඩු යයි සමහර පොත්පත්වල සඳහන් වන පූජකයෙක් රජ හමුවට පැමිණ ඇත. හිස ළැමැද උදරයේ හා දෑත්වල විවිධ වර්ණයන්ගෙන් සුණු තවරාගත් මෙම අමුතුම මාදිලියේ පූජකයා රජමාලිගාවට පැමිණ වියෝවට පත්ව සිටි රජතුමාට උපදෙස් ලබාදිනි. පියා මැරීමේ පාපකර්මයෙන් රජ ගලවා ගැනීමට හැකි බව හේ පැවැසීය. ඒ සඳහා පව් සෝදා හැරීමට සීතාවක ගඟ හරවා එහි යාගයක් කළ යුතු බව පූජකයා පැවසීය. පූජකයාගේ වචනය ඇදහූ සීතාවක රජ වහා අවැසි කටයුතු සම්පාදනය කෙරිණි.

සීතාවක ගඟ ගමන් ගන්නා මාර්ගය වෙනස් කර එතන 'බහිරන්ඩි' නම් කෝවිළක් තැනවීය. එළුවන්, කුකුළන් දහස් ගණනක් කප්පවා ගඟදිය පාකර හැර රජුට සාන්තිය ලබාදීම සඳහා 'රාජා හෝ මා හෝ ගංගා හෝ' යන වැකිය පවසමින් දින කීපයක් මෙම යාගය පැවැත්විණි. මෙම වැකිය ඇසීමෙන් මනෝවිද්‍යාත්මකව රජ පැහැදිනි. පියා මැරූ පවින් ගළවා ගැනීමට සමත් එකම ගැළවුම්කාරයා තමාට හමුවීම ගැන අතිශය ප්‍රමෝදයට පත් රජතෙම සියලුම බෞද්ධ භික්ෂූන් කෙරේ වෛරී වූහ.

## ආඬි පාලනය

තමාට සහනයක් ලබාදීමට අසමත් වූ භික්ෂූන් වහන්සේලා විසූ විහාරස්ථානවලින් එලවා දැමූහ. විහාර පන්සල් ගිනි තැබූහ. ධර්ම පුස්තකයන් පුළුස්සා දැම්මේය. රාජ නියෝගය මත අල්ලාගත් භික්ෂූන් වහන්සේලා එකසිය විසි දෙදෙනෙක් දෙන්නා බැගින් හරකුන් ඈදෙන්නාසේ සේ ඈදා ගෙනවිත් සීතාවක ගඟේ කණාමැදිරියන්වල නමැති ස්ථානයේ ගිල්වා මරා දැමූ බව ඉතිහාස ග්‍රන්ථවල හා සාසන වංශ කථාවලින් හෙළිවේ. කෝට්ටේ, සීතාවක හා සබරගමු ප්‍රදේශයේ පන්සල් හා පොත්ගුල් ගිනි තැබූ හෙතෙම ශ්‍රීපාද ස්ථානයේ භාරකාරත්වයද ආඬින්ට පැවරීය.

එතැන් සිට විමලධර්මසූර්ය, සෙනරත්, දෙවැනි රාජසිංහ, දෙවැනි විමලධර්මසූර්ය, ශ්‍රී පරාක්‍රම නරේන්ද්‍රසිංහ හා ශ්‍රී විජය රාජසිංහ රාජ්‍ය කාලය වූ අවුරුදු එකසිය හැත්තෑ එකක කාල පරිච්ජේදයක් දකුණු ඉන්දියානු කේරළ ප්‍රාන්තයේහි විසූ ආඬින් විසින් ශ්‍රීපාදස්ථානය පාලනය කරනු ලැබීය. සිංහල රජවරුන් ශ්‍රීපාද පද්මයට පූජා කරන ලද රන් රිදී, මුතු මැණික් හා අපමණ වූ වස්තු සම්භාරය ඔවුහු කොල්ල කෑහ. රාජසිංහ රජුගේ මෙම ශාසන විරෝධී ක්‍රියාව නිසා ලංකාවේ උපසම්පදා භික්ෂූන් වහන්සේලාද අභාවයට පත් වූ අතර කහ සිවුරක් හැඳ සිටි භික්ෂුවක් දුටු තැන මරා දමන ලෙස සිය රාජ නියෝගයක්ද පැනවීය.

## කුට්ටාපිටිය සන්නස

භික්ෂූන් වහන්සේලා දෑතට හසු වූ දේත් පුස්කොළ හා වෙනත් ධර්ම ග්‍රන්ථයන් හා අවැසි දෑ රැගෙන සීතාවක රාජ්‍යයෙන් බැහැරට කන්ද උඩරට හා වයඹටත් රුහුණු ප්‍රදේශයටත් පැන ගියහ. පැවිදිව සිටි හිමිවරුන් සිවුරු ගලවා දමා සුදු රෙදි හැඳ දහම් පොත්පත්ද රැගෙන කඳු ආශ්‍රිතව ගල් ගුහාවල ජීවත් වූ අතර සමහරෙක් සත්ව ගම්බිම්වලට ආපසු ගොස් මහණ දම් පිරූහ. 'ගණින්නැහැ' නම් වූ සඟ පරපුරක් ලංකා සාසන ඉතිහාසයේ බිහිවූයේ මෙතැන් පටන්ය. රාජසිංහ රජුගේ රාජ්‍ය උපදේශකයෙකු වූ හා දක්ෂ කවියෙක් හා ග්‍රන්ථ කර්තෘවරයෙක් වූ අලගියවන්න මුකවෙටි කිවිඳුන් තමා සතු දහම් පොත් පත් රැගෙන රජ වාසලේ ඇතු පිටින් පැන ගිය බවට පැරණි පුරාවෘත්ති හෙළි කරයි.

ශ්‍රී විජය රාජසිංහ රජ සමයේදී පාලි භාෂාව මනාව පුහුණු කළ වැලිවිට සරණංකර සාමනේර හිමිනම 'භේසජ්ජ මංජුසා' නමැති පාලි වෙදපොතට සිංහල තේරුම් සහිත භාවසන්නසක් ලියූ අතර එයට පැහැදුනඅ මහරජතෙමේ සාමණේර හිමිනමට තෑගි බෝග හා ගම්වර දීමට නියෝග කෙරිණි. තමන් හට රජුගෙන් ලැබෙන තාන්න මාන්න උදව් උපකාර වෙනුවට රජුගෙන් අයැද සිටියේ ආඬින් සතුව පවතින ශ්‍රීපාදස්ථානය ඇතුළු කෝට්ටේ සීතාවක ප්‍රදේශයේ ඇති වෙහෙර විහාරත්, රත්නපුරය සමන් දේවාලය ඇතුළු විනාශ කළ වෙහෙර විහාර නැවත අලුත්වැඩියා කර දෙන ලෙසත් හා භික්ෂු සාසනය ප්‍රතිෂ්ඨාපනය කරන ලෙසත්ය. ශ්‍රී විජය රාජසිංහ රජතුමා හදිසියේම අභාවප්‍රාප්ත වූයෙන් රජකමට පත් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා එම ඉල්ලීම ඉටුකිරීමට සමත් විය. සියම් දේශයෙන් උපාලි මහ ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු පිරිසක් නැව් මගින් ලංකාවට වැඩමාගෙන මල්වතු මහා විහාරයේදී නැවත උපසම්පදාව පිහිටුවීම ක්‍රි.ව. 1752 අගෝස්තු මාසයේ පුරපසළොස්වක දිනයේ දිග අඟල් විසිහතරක් හා පළල අඟල් දෙකහමාරක් වූ දෙපැත්තේ පේලි දින අටකින් යුත් රජ විසින් රන් අකුරින් ලියා අත්සන් කර දෙන ලද 'කුට්ටාපිටිය සන්නස' ලියා ශ්‍රීපාදස්ථානයට පූජා කරන ලදී.

ශ්‍රීපාදස්ථානයේ ආවතේව කටයුතු කරන භික්ෂූන් වහන්සේලාට හා ශ්‍රීපාදස්ථානයට අවැසි කටයුතු සපුරා ගැනීම සඳහා එකසිය හැටපස් අමුණක ගොඩ මඩ ඇතුළු දේපළ මෙම කුට්ටාපිටිය සන්නසේ දේපළවලට අයිතිය ලැබී ඇත.

වැලිවිට සරණංකර හිමියන්ගේ සිසු පරපුරට පරම්පරාවෙන් පරම්පරාවට ශ්‍රීපාද ස්ථානයේ භාරකාරත්වය මෙසේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ක්‍රි. ව. 1752 වර්ෂයේදී පවරා දෙන ලදී. එතුමාගේ අභාවයෙන් පසු ගෙවුන අවුරුදු 171 කාලය ශ්‍රීපාද ස්ථානයට අවට පිහිටි ගම් දනව්වල දකුණු ඉන්දියානු විවිධ දෙවියන් ඇදහීම සඳහා කෝවිල් ඉදිකෙරුණු අතර අදත් සමනොළ කන්ද ආශ්‍රිතව පිහිටි වතුවලත් නගරවලත් ගනේවත්ත, මරේවත්ත, මස්කෙළිය, සාමිමලේ, වාලමලේ ප්‍රදේශයේ හා හැටන් ප්‍රදේශයේද විශාල කෝවිල් ප්‍රමාණයක් දක්නට හැක. මේ අනුව දකුණු ඉන්දීය කෝවිල් ප්‍රභවය ලංකාවේ බිහිවූයේ පළමුවැනි රාජසිංහ යුගයෙන් පසුව යයි සිතිය හැක.

DENTAL OFFICE
Dr. Iru Vijayanathan, BDS(Peradeniya), MFDS, FAGD
Dental Surgeon (දන්ත ශල්‍ය වෛද්‍ය)

3150 Eglinton Ave E, Scarborough, Unit 5
Phone: (416) 264-3232
3351 Markham Rd, Scarborough, Unit 129 (Red Building)
Phone: (416) 609-2022

- Emergency Dental Care
- Filling - Silver, White
- Root Canal Treatment
- Crown and Bridges
- Cosmetic Dentistry
- Gum Treatment
- Minor Oral Surgery
- Partial Denture
- Complete Denture
- Tooth Extraction
- Wisdom Tooth Extraction



LESSON 21

This month's Dasatha issue presents you a vocabulary list. It will help you enrich your French vocabulary and improve your French reading and pronunciation apart from improving your conversing skills. Moreover, it will help you get an idea about sentence structures and how the words are used in sentences. The grammar lesson continues as usual to improve your grammar knowledge and to help you construct sentences using correct grammar. Exercises will help you put what you learnt so far in to practice. Enjoy learning! Thank you!

## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary



In order to converse well in a foreign language, it is necessary to have a rich vocabulary. The words presented in this issue are related to the names of vegetables.

| | |
|---|---|
| Leeks | Le poireaux (ලපුඅරෝ) |
| Green onion | L'oignon vert (m) (ලුඅැංඤොංවෑර්) |
| Scallion | La ciboule (ලාසිබුල්) |
| Shallot | L'échalote (f) (ලෙෂාලොත්) |
| Water chestnut | La châtaigne d'eau (f) (ලාෂතෙඤදෝ) |
| Garlic | L'ail (m) (ලෙයිල්) |
| Chives | La ciboulette (ලාසිබුලෙත්) |
| Yellow onion | L'oignon jaune (m) (ලුඅැංඤොංජෝන්) |
| Red onion | L'oignon rouge (ලුඅැංඤොංරූජ් ) |
| White onion | L'oignon blanc (ලුඅැංඤොංබ්ලොංක්) |
| Pickling onions | Les oignons à mariner (ලුඅැංඤොංආමරිනේ) |
| Cassava | Le manioc (ලමැනියොක්) |
| Crosne | Le crosne (ලක්‍රොස්න්) |
| Taro | Le taro (ලතරෝ) |
| Tropical yam | L'igname (f) (ලිග්නාම්) |
| Jerusalem artichoke | Le topinambour (ලතොපිනාම්බූර්) |

| | |
|---|---|
| Sweet potato | La patate (ලාපතාත්) |
| Potatoes | Les pommes de terre (f) (ලෙපොංම්දතෑර්) |
| Asparagus | L'asperge (f) (ලැස්පැර්ෂ්) |
| Swiss chard | La bette à carde (ලාබෙත්ආකර්ද්) |
| Kohlrabi | Le chou-rave (m) (ලෂුරාව්) |
| Bamboo shoot | La pousse de bambou (ලාපුස්දබම්බු) |
| Fennel | Le fenouil (ලෆෙනුයි) |
| Cardoon | Le cardon (ලකර්දොං) |
| Celery | Le céleri (ලසෙලරි) |
| Fiddlehead | La crosse de fougère (ලාක්‍රොස්දෆුජෑර්) |
| Rhubarb | La rhubarbe (ලාරුබාර්බ්) |
| Leaf lettuce | La laitue frisée (ලාලෙයිතුෆ්‍රිසේ) |
| Romaine lettuce | La romaine (ලාරොමෙයින්) |
| Celtuce | La laitue asperge (ලාලෙයිතුඇස්පැර්ජ්) |
| Sea kale | Le chou marin (ලෂුමරඇං) |
| Collards | Le chou cavalier (ලෂුකවලියෙ) |

| | |
|---|---|
| Escarole | La scarole (ලාස්කරොල්) |
| Butter lettuce | La laitue pommée (ලාලෙයිතුපොම්මේ) |
| Iceberg lettuce | La laitue iceberg (ලාලෙයිතුඉස්බැර්ෂ්) |

| | |
|---|---|
| Radicchio | La chicorée de Trévise (ලාෂිකොරේදත්‍රෙවිස්) |
| Ornamental Kale | Le chou laitue (ලෂුලෙයිතු) |
| Curly kale | Le chou frisé (ලෂුෆ්‍රිසේ) |
| Grape leaves | La feuille de vigne (ලාෆයිදවීඤ) |
| Brussels sprouts | Le chou de Bruxelles (ලෂුදබෲක්සෙල්) |
| Red cabbage | Le chou pommé rouge (ලෂුපොමේරූජ්) |
| White cabbage | Le chou pommé blanc (ලෂුපොමෙබ්ලොංක්) |
| Savoy cabbage | Le chou de Milan (ලෂුදමිලොං) |
| Green cabbage | Le chou pommé vert (ලෂුපොමෙවෑර්) |
| Bok choy | Le pak-choi (ලපක්ෂුආ) |
| Purslane | Le pourpier (ලපුර්පියෙ) |
| Nettle | L'ortie (f) (ලොර්තී) |
| Watercress | Le cresson de fontaine (ලාක්‍රෙසොංදෆොංතැං) |
| Dandelion | Le pissenlit (ලපිසොංලී) |
| Corn salad | La mâche (ලාමෂ්) |
| Arugula | La roquette (ලාරොකෙත්) |
| Spinach | L'épinard (m) (ලෙපිනාර්) |

## Grammaire (ග්‍රාමෑර්) Grammar



After mastering the agreements of adjectives and their various forms, you should now be able to construct complicated sentences and converse well during conversations held in French. In your dissertations, you should now be able to compare and contrast objects or people. In this issue, we are going to learn another important grammar lesson on the formation of adverbs in French language. This helps in constructing proper, grammatically sound and complicated sentences.

**Adverbs**
An adverb is a word that qualifies the action of the verb. It specifies how or when the action is performed. In English, the –ly ending indicates many adverbs. In French, most adverbs end in –ment.

| | |
|---|---|
| Lentement | slowly |
| Attentivement | carefully |
| Souvent | often |

**Formation:**
1.) To form the adverb on the adjectives ending in a vowel, add –ment directly to the masculine singular.

| | |
|---|---|
| Vrai | Vraiment (truly, sincerely) |
| Absolu | Absolument (absolutely) |
| Rapide | Rapidement (rapidly) |

2.) To form the adverb on the adjectives ending in a consonant, add –ment to the feminine singular of the adjective.

| | |
|---|---|
| Furieux | Furieusement (furiously) |

| | |
|---|---|
| Actif | Activement (actively) |
| Premier | Premièrement (firstly) |
| Doux | Doucement (softly, quietly) |

3.) Few adjectives form their adverbs irregularly.

| | |
|---|---|
| Bon (good) | Bien (well) |
| Mauvais (bad) | Mal (badly) |
| Petit (small, little) | Peu (little) |

- It is also important to note that the adverb Vite by itself is already an adverb. It is not required to add –ment to form the adverb of this word. Vite has the same meaning as the adverb Rapidement that means rapidly or fast.

## Exercices (එක්සැර්සිස්) – Exercises

Cont. from last month
2) Form the superlative with the following words.
Ex : C'est un beau tableau ____ la salle.
C'est le plus beau tableau de la salle.

1) C'est une petite maison______ la rue.
2) Françoise est une bonne élève______ l'école.
3) C'est une longue histoire _____ le livre.
4) Cassim est un bel homme _____ le royaume.
5) C'est un exercice difficile _______ la leçon.
6) Nous avons de bonnes chambres ______ l'hôtel.
7) C'est un garçon intelligent _____ la classe.
8) Henriette est une vieille locomotive _____ la gare.
9) Le mouton est un animal stupide _____ la ferme.
10) Les grandes vacances sont amusantes _____ l'année.

*Cited from J.R Watson

---

Translation exercises are the best to test yourself on all the learnt grammar forms. Therefore, some sentences are provided here for you to translate. You will come across new French words in these exercises. You can simply refer to a dictionary for all the words that you do not know the meaning. This is also a good way to enrich your vocabulary. Note down the new words you come across along with their genders and the meanings in a separate book and study them. There is another exercise provided in order for you to practice the grammar lesson learnt in this issue. If you have any questions please direct them to the above mentioned email address.

1) Translate into French
a. They are my brothers.
b. These elephants are old.
c. Our books are new.
d. She is a very courageous girl.
e. The class starts at 10.45 in the morning.
f. I am 62 years old.
g. I am having a toothache.
h. I am so thirsty and my parents are hungry.
i. She is going to play with her dog.
j. What is the name of your brother?
k. What is the time now?
l. How many brothers and sisters do you have?
m. She is a cruel girl.
n. They play with the fat cat.
o. We go to church on Mondays.
p. Her aunt is very old but strong.
q. My brother is very active.
r. She is my mother and this is my aunt.
s. What is the date today?
t. Are they friends?
u. Why are you eating an apple?
v. He is my cousin's son.
w. Their aunt is my grandmother.
x. We are not making a pizza.
y. The small black cat is under the big green table.
z. When are you singing?
aa. Who is your sister?
bb. They like my friend who is a doctor.
cc. The book that my father gives me is hard to read.
dd. The birthdays are very amusing.
ee. The animals are at the zoo.
ff. We like the castles on the beach.
gg. How much is that cake?

**Kumudu Abeywardena**
Masters (French Literature), BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

## අදිකාරම් සිතුවිලි

# හිතන්න බැරි ඇයි?



මනුෂ්‍ය සමාජය සෑදී තිබෙන්නේ පුද්ගලයන්ගේ එක්තැන් වීමෙනි. එහෙයින් සමාජය යහපත් හෝ අයහපත් වන්නේ ඒ සමාජයට අයත් පුද්ගලයන්ගේ යහපත්කම හෝ අයහපත්කම අනුවය. කෙනකුගේ හොඳ හෝ නරක සාමාන්‍යයෙන් අප මැන ගන්නේ ඔහුගේ වචනයෙන් සහ ක්‍රියාවෙන්ය. වචනයේ සහ ක්‍රියාවේ උල්පත සිතය. එහෙයින් අප එකිනෙකාගේ සිත පැහැදිලිව ක්‍රියා කරයිද නොකරයිද යනු සොයා බැලීම අපේ පුද්ගලික යුතුකමක් පමණක් නොව සමාජයට අපෙන් ඉටුවිය යුතු යුතුකමක්වද පවතියි. එක්කෙනෙකු සමර්ථ වන්නේ තමාගේ සිත පමණක් ක්‍රියා කරන පිළිවෙළ සොයා බැලීමටය. එබැවින් මෙම පර්යේෂණය කළ යුත්තේ සාමූහික වශයෙන් නොව තනි තනිවය. මෙහි පහත දක්වනු ලබන්නේ මගේ සිත පිළිබඳව යම් යම් අවස්ථාවලදී මවිසින් කරන ලද පර්යේෂණ නිසා දැනගන්නට ලැබුණු කරුණු ස්වල්පයකි. මෙය පුද්ගලික පර්යේෂණයක් වුවද සාමාන්‍ය වශයෙන් අප කාගේත් සිත්වල ක්‍රියා කිරීමේ සමාන බවක් ඇති හෙයින් එය මෙසේ ප්‍රකාශ කිරීමෙන් අවැඩක් සිදුවෙතැයි නොසිතමි.

සිතුවිලි දෙකක් එකවිට ඇති නොවෙයි. එක සිතක් ඇති වන්නේ ඊට කලින් ඇතිවූ සිතිවිල්ල යටපත් කර දැමීමෙනි. එම නිසා එක සිතකින් තවත් සිතක් පරීක්ෂා කර බැලිය නොහැකියි. තවද සිත ක්‍රියා කරන වේගය නිසා සිතිවිලි පරීක්ෂා කර බැලීම අපහසු වෙයි. එහෙයින් අත්හදා බැලීමක් වශයෙන් කඩදාසියක් සහ පැන්සලයක් ගෙන මිනිත්තු දහයක් පමණ කාලය තුළදී සිතේ ඇතිවුණු සිතිවිලි ඒ ඇති වුණු ආකාරයට ලියා ගනිමි. මෙම අත්හදා බැලීම කිහිප දිනයක කිහිප වතාවක කළෙමි. ලියන දෙය තවත් කෙනෙක් දකී යැයි සිතන විට සිතිවිලි ස්වාභාවික ලෙස ගලාගෙන ඒම නතර වෙයි. හොඳ සිතිවිලි පමණක් ඉදිරියට එයි. එසේ වූවොත් සිතේ යථා ස්වභාවය බලාග ැනීමට නුපුළුවන් වන හෙයින් අත්හදා බැලීම අවසාන වූ වහාම ලියවිල්ල ඉරා දැමීමට නියම කර ගතිමි.

කෙනකු සමග අප කතා කරන විට අපෙන් පිට වන්නේ අපට පාඩුවක් හෝ අපහාසයක් ඇති නොවේ යැයි ඒ මොහොතේදී අපට හැඟෙන සිතිවිලි පමණක් ප්‍රකාශ වන වචන වෙයි. බොහෝ විට අපේ සිතිවිලි අපෙන්ම සඟවා ගැනීමේ පුරුද්ද අප තුළ පවතියි. මෙසේ සමහර සිතිවිලි යටපත් කරදැමීම නතර වන්නේ සිහින පෙනෙන විටත් මත්වන ද්‍රව්‍යයක් පාවිච්චි කිරීමෙන් හෝ වෙන යම්කිසි කාරණයකින් සිහිය විකල වූ විටත්ය. නමුත් එබඳු අවස්ථාවලදී තමාගේ යථා ස්වභාවය දැනගැනීමට ශක්තියක් කෙනකුට ඇති නොවෙයි. එහෙයින් සිතේ පවත්නා බය තාවකාලික වශයෙන් නමුදු කියවා අහක් කොට තමා තුළ ඇති වන සිතිවිලි ලියා ඊට පසු එය කියවා බැලීමෙන් පරීක්ෂණයට භාජන කිරීම තමාගේ සිතේ නියම ස්වභාවය දැනගැනීමට තිබෙන එක්තරා ප්‍රයෝජනවත් මාර්ගයක් වශයෙන් සැලකිය හැකියි.

මෙසේ ලිවීමේදී එක සිතිවිල්ලක් ලියා අවසන් කිරීමට මත්තෙන් තවත් සිතිවිලි බොහෝ ගණනක් පොරබදමින් මතුවෙයි. හැකි පමණ ඉක්මණින් ලිවූවත් ලියාගත හැකි වන්නේ සිතට නැඟෙන සිතිවිලි සමූහයෙන් කොටසක් පමණය.

ලියාගත් දෙය නැවත කියවා බැලීමේදී මා තුළ පළමුකොටම පුදුමයත් ඊළඟට සංවේගයත් ඇති විය. පුදුමයට හේතුව වූයේ මගේ සිත ක්‍රියා කරන්නේ මෙතරම් ව්‍යාකූල ආකාරයකින් බව මීට කලින් මා අවබෝධ කරගෙන නොසිටීමයි. මා මහජන වැඩවල යෙදුණේත් අනුන්ට දේශන කළේත් මෙතරම් අවුල් සහිත සිතක් තබාගෙන නොවේදැයි පෙනුණු විට සංවේගයක් ඇති විය. සිත සම්පූර්ණයෙන් නිරවුල් කර නොගෙන කෙනෙකු විසින් මහජන වැඩට බැසීම සමාජයට කරන විපතක් බැව්ද මට හැඟී ගියේය.

පැහැදිලිව සිතීමට බාධක වන කරුණු බොහෝ ගණනක් කෙනකුට ඇති බැව් මෙම අත්හදා බැලීම්වලදී පෙනිණි. එයින් එකක් සමාජය වන්නේය. සමාජය සැදී තිබෙන්නේ අවුල් වූ සිත් ඇති මිනිසුන්ගෙන් හා ගැහැනුන්ගෙන්ය. එහෙයින් ඔවුන්ගේ වචනයකින් හෝ ක්‍රියාවකින් මගේවත් වෙන කෙනකුගේවත් සිත නිරවුල් වීමට ආධාරයක් වෙතැයි සිතීම මෝඩකමකි. මේ අතින් ආධාරයක් තබා මධ්‍යස්ථතාවක්වත් කෙනකුට සමාජයෙන් නොලැබෙයි. එසේ වීමට හේතුව සමාජයට අයත් මිනිසුන්ගෙන් සහ ගැහැනුන්ගෙන් ඉතා ස්වල්ප දෙනකු හැර අනෙක් සියලු දෙනාම තමන් මුළා වූ සිතින් යුක්ත වූවන් බව නොදැන සිටීමයි. තවත් කාරණයක් නම් සමාජයේ පරමාර්ථය ඉන්ද්‍රියයන් පිනවීම වීමයි. සමාජයෙන් කෙරෙන සියලු වැඩ යොමු වන්නේ ඉන්ද්‍රියයන් පිනවීම දෙසටය. උදේ සිට රෑ වන තුරු අපට අසන්ට ලැබෙන්නේත් දකින්නට ලැබෙන්නේත් ඉන්ද්‍රියයන් පිනවීම නිමිති කරගෙන කියන කරන දේය. ඉන්ද්‍රියයන් පිනවීමත් සිත සන්සුන්වීමත් යන දෙක එක තැන සිදුවිය හැකි නොවෙයි.

සිතට රුචි දෙයක් **34 වන පිටුව බලන්න**

## දේශපාලන...

19 වන පිටුවෙන්

කබීර්, සජිත්, මංගල, මනෝ, රවී ඇතුළු ඇමැතිවරු පිරිස පත් කළහ.

"කොන්දක් තියාගෙන ප්‍රශ්න අහන්න ඕනෑ. මුල්ම ප්‍රශ්නේ අහන කෙනා කවුද කියා කියන්න." ලක්ෂ්මන් කිරිඇල්ල කම්ටුවෙන් විමසීය.

ඇමැතිවරුන් එකිනෙකාගේ මුහුණ බලා ගනිද්දී කිරිඇල්ල කීවේ, "හරි මා මුල් එක අහන්නම් ගිය පාර පක්ෂය හා ආණ්ඩුව වෙනුවෙන් කතා කර මගේ බලතල නැති වුණා. සමහර ඇමතිවරුන් රහසේ ගිහින් මගේ බලතල ඉල්ල ගත්තා කියා ජනාධිපතිතුමාම මට නම් ගම් එක්කම කිව්වා." කිරිඇල්ල කීවේ උපහාසාත්මක සිනහවක් මුව සරසාගෙනය.

★ ★ ★ ★ ★

'ත්‍රස්ත ප්‍රහාරයක් පිළිබඳ තොරතුරු ලැබී තිබුණාද ප්‍රහාරය වළක්වා ගන්න ක්‍රියා කළේ නැත්තේ ඇයිදැ' යි යන්න ලක්ෂ්මන් කිරිඇල්ල ඇමැතිවරයා ජනාධිපතිවරයාගෙන් ප්‍රශ්න කර සිටියේය.

"මට තොරතුරු ලැබුණේ නැහැ" ජනපති කෙටි වචනයෙන්ම පිළිවදන් දුන්නේය.

"ආරක්ෂක කවුන්සිලයට අගමැති කැඳවන්නේ නැත්තේ ඇයිදැ" යි යන්න මංගල සමරවීර ඇමැතිවරයා ප්‍රශ්න කර සිටියේය.

"ආරක්ෂක කවුන්සිලයේ තොරතුරක් ඩේලි මිරර් පත්තරේ පළවුණා. පසුව අගමැති කැඳවීම නැවැත්වූවා" යනු ඊට ලැබුණු පිළිතුර විය.

"ඩේලි මිරර් එක කිසි දවසක මට වාසි දෙයක් දාලා නැහැ. එහෙම දාපු දෙයක් තියනවානම් මට පෙන්නන්න" අගමැතිවරයා තදින්ම කීවේය. සියලු ඇමැතිවරු එය සනාථ කරමින් කතා කරන්නට වූහ. සිද්ධිය වූ පසුගිය ඉරිදා සවස අගමැතිවරයා ජාතිය අමතා ප්‍රකාශයක් කරනු ලැබුණි. දැන් බුද්ධි අංශ තොරතුරු නිසැක ලෙසම ජනාධිපතිතුමාට ලැබුණු බව ආරක්ෂක ලේකම්ගේ ප්‍රකාශයෙන් තහවුරු වෙනවා. දැන් පහළ තැන්වලින් වතුර බස්සලා මා දන්නේ නැහැ කියා ජනාධිපතිතුමාට බේරෙන්න බැහැ, චමින්ද විජේසිරි, හේෂා විතානගේ, මුජිබර් රහුමාන් ඇතුළු පසුපෙළ කණ්ඩායම අගමැතිවරයාට පසු අවස්ථාවකදී ඉදිරිපත් කළ තර්කය එය විය.

"ලෝකයම මේ සිද්ධියෙන් සසල වෙලා. ලෝක නායකයින් සියලු දෙනාම අගමැතිතුමාට කතා කළා නේද?" නවීන් දිසානායක විමසීය.

"ජනපති ට්‍රම්ප් මට කතා කළේ ලංකාවෙ වෙලාවෙන් හවස 6 ටයි. සිද්ධිය වෙලා ඇමරිකාවට එළිය වැටුණු පළමුවැනි තප්පරයේදී ට්‍රම්ප් මට කතා කර තිබෙන්නේ. ඕනෑම උදව්වක් කරන්නත් පොරොන්දු වුණා."

ඉන්දියාවේ මෝදි, සිංගප්පූරුවේ අගමැති, බ්‍රිතාන්‍යයේ අගමැතිනිය, පකිස්තානයේ අගමැති ඇතුළු ලෝක නායකයින් රැසක් මට කතා කළා. චීන නායකයින් ඇතුළු අය තානාපති අතේ ලිපි එවා තිබුණා. සියලු දෙනාම අපට සහාය දෙන්නයි පොරොන්දු වුණා.

★ ★ ★ ★ ★

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සර්ව පාක්ෂික සමුළුවක් හදිසියේම කැඳවීය. ජනාධිපති කාර්යාලයේදී ආරම්භවූ සර්ව පාක්ෂික සමුළුවට අගමැති රනිල් වික්‍රමසිංහ, විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ, ආර් සම්බන්ධන්, මහින්ද අමරවීර, නිමල් සිරිපාල, දිනේෂ් ගුණවර්ධන, බැසිල් රාජපක්ෂ, වාසුදේව, විජිත හේරත්, විමල් වීරවංශ, චම්පික රණවක, උදය ගම්මන්පිල, ඩිව් ගුණසේකර, ඩග්ලස් දේවානන්ද, රවුෆ් හකීම්, රිෂාද් බදුර්දීන්, ඩලස් අලහප්පෙරුම, දිගම්බරන්, මනෝ ගනේෂන් ඇතුළු පක්ෂ නායකයෝ රැසක් ඒ සඳහා එක් වී සිටියහ.

සමුළුවට සහභාගි වූ පක්ෂ නායකයින්ට ස්තුතිය පළකරමින් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා "මේ ප්‍රහාරය ගැන ඉන්දීය ඔත්තු සේවය අපේ රටට දැනුම් දීල තියෙනවා. නමුත් ඔවුන් මාව දැනුවත් කර නැහැ. අලුත් අවුරුද්දට සුබ පතන්න ආරක්ෂක ලේකම් සහ පොලිස්පති දෙන්නම ආවා. හැබැයි ඒ කවුරුවත් මට මේ ගැන කිව්වෙ නෑ. එවැනි අනතුරක් ගැන කිව්වා නම් මම මේ ගමන යන්නෙ නැහැ. මම 16 වැනිදා ගියේ තිරුපති. ලංකාවේ ඉඳල තිරුපතිවලට පැයයි. මට එහෙදී කිව්වා නම් මම ආපහු එනවා. පස්සේ මම සිංගප්පූරුවට ගියා. සිංගප්පූරුවේ ඉඳලා ගමන පැයයි විනාඩි 30 යි. මට එහිදී කිව්වා නම් මම ෆ්ලයිට් එකක් අරගෙන හරි එනවා. මට කියන්නෙ නැතිව නිලධාරීන් එක එක්කෙනාට ලියුම් ලිය ලියා සිටියා..." යැයි ජනාධිපතිවරයා කීවේ වරද සිදුව ඇත්තේ නිලධාරීන්ගෙන් බව අඟවමිනි.

"වගකීම් බාරගෙන ආරක්ෂක ලේකම්වරයාටයි පොලිස්පතිටයි දෙන්නටම අයින් වෙන්න කියා මම මේ වන විටත් දැනුම් දී අවසන්" යැයි ජනාධිපතිවරයා කියා සිටියේය.

ජනාධිපතිවරයාගේ කතාවෙන් පසුව මුලින්ම අදහස් දැක්වූයේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ඩිව් ගුණසේකරය. ඔහු කතා කළේ ජනාධිපතිවරයාගේ කතාව පිළිගත නොහැකි බව කියමිනි. "ජනතාව බලය දීලා තියෙන්නෙ නිලධාරීන්ට නෙමෙයි දේශපාලනඥයින්ටයි. දේශපාලනඥයින් තමයි නිලධාරීන්ට නියෝග දෙන්නෙ. ඔබට ඕනෑ නිලධාරීන් පත් කර ගත්තෙ ඔබතුමා. මේ වගේ ආරක්ෂක ලේකම් කෙනෙක් පත්කර ගන්න එපා කියලා අපි දිගින් දිගටම කිව්වා. ඒ නිසා මේකෙ වගකීම ඔබතුමාත් බාරගන්න" යැයි ඩිව් කීවේය.

"මේ විනාශයේ වගකීම ආණ්ඩුවට බාර ගන්න වෙනවා. වනාතවිල්ලුවේදී අත්අඩංගුවට ගත්ත සමහර අන්තවාදීන් දේශපාලන බලපෑම් නිසා නිදහස් කරන්න වුණා. ඒක නොවුණා නම් මේ තරම් විනාශයක් වෙන්නෙ නැහැ" යැයි කීවේ කබීර් හෂීම් ඇමැතිවරයාය. මේ ප්‍රශ්නයට ඇමෙරිකාවේ අත පෙවීම ගැන පැහැදිලි කළේ විමල් වීරවංශ මන්ත්‍රීවරයායි. "අයිඑස්අයිඑස් සංවිධානය බටහිර රටවල නිර්මාණයක්. අයිඑස් ත්‍රස්තවාදීන් අල්ලන්න ඇමෙරිකාවේ උදව් ඉල්ලනවා කියන්නේ හරියට පුතා අල්ලන්න තාත්තාගෙන් උදව් ඉල්ලනවා වාගේ වැඩක්. ජනාධිපතිතුමත්, අගමැතිතුමත් මේ වගකීම බාරගෙන ජනතාවගෙන් සමාව ගන්න ඕනෑ" යැයි විමල් කීවේය.

ජවිපෙන් සහභාගි වූයේ විජිත හේරත්ය. ඔහු කීවේ "ත්‍රස්තවාදීන් මර්දනය කිරීමේදී ත්‍රස්තවාදීන් වැඩිවෙන විදියට වැඩ කරන්න එපා" කියාය. "හදිසි නීතිය පාවිච්චි කරල ජනතාව පෙළන්න කටයුතු කරන්න එපා" යැයි විජිත හේරත් කීවේය. අනතුරුව රිෂාද් බදියුදීන් කතා කළේ ඔහුට එල්ල වන චෝදනාවලටද පිළිතුරු දෙමිනි. "මට චෝදනාවක් තියෙනවා අබ්දුල් රහීම් මගේ යාලුවෙක් කියලා. මම වෙළෙඳ ඇමැති. අබ්දුල් රහීම් කොළඹ ව්‍යාපාරික සංගමයේ සභාපති. ඒ නිසා මට එයා නිතර හම්බ වෙන්න වෙනවා. එහෙම නැතිව ඉස්ලාම් අන්තවාදයට අපේ සහායක් නැහැ" යැයි රිෂාද් කීවේය. අසාද් සාලිද කතා කළේ ඔහුට එරෙහිව එල්ල වන චෝදනාවලට උත්තර බඳිමිනි. "ත්‍රස්තවාදීන් නිදහස් කරන්න මම බලපෑම් කළා කියලා මටත් චෝදනා එල්ල වෙනවා. සර් මම එහෙම කළා නම් මම ඕනෑ දඬුවමක් විඳින්න ලෑස්තියි." යැයි සාලි කීවේය.

# ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT



## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# MONEY PROBLEMS?™

ඔබගේ සියලුම ණය
එක් කුඩා මාසික වාරිකයකින්
ගෙවන්න

gta™ credit

**ඔබගෙන්ම විමසන්න....**

- ඔබගේ බැංකු අයිරාව (overdraft) සෑම විටම භාවිත කරන්නේද?
- ඔබ රැකියාවේ නිරතව සිටින විටත් නිවසේ පසුවන විටත් නිරතුරුව ණය හිමියන්ගේ තර්ජන හිරිහැරවලට ලක්වන්නේද?
- ඔබ නිවාස කුලිය, නිවාස උගස් වාරිකය හෝ වාහන සඳහා වන ගෙවීම් වෙනුවෙන් බලවත් පරිශ්‍රමයක් දරන්නේද?
- ඔබගේ විවාහය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය ගැටලු නිසා මූල්‍යමය ගැටලුවලට මුහුණ පා සිටිද?
- ඔබගේ ණය තක්සේරුව (credit rating) සෑම විටම අන්තරාකාරී මට්ටමක තිබේ යැයි ඔබ සිතනවාද?
- ඔබගේ වාහනය, නිවස, RRSP, ව්‍යාපාර කොටස් හා වෙනත් වත්කම් කොයි මොහොතක හෝ අහිමි වේ යැයි බියෙන් පසුවෙත්ද?
- ඔබට විරුද්ධව උසාවි නියෝග පනවා ඇත්ද?
- ඔබ කැනඩා රජය හා සම්බන්ධිත ආදායම් බදු ගැටලුවලින් පීඩාවට පත්වී සිටිද?



ඉහත ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුර 'ඔව්' යන්න නම් ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට වහාම අප හමුවන්න

**Scarborough / Downtown Toronto: 416-489-2000**
**Mississauga / Brampton: 416-650-5400**

| Scarborough | Toronto/Downtown | North York | Mississauga | Brampton |
|---|---|---|---|---|
| 201-4433 Sheppard Ave. E | 800-120 Eglinton Ave. E | 306-1280 Finch Ave. W | 110-93 Dundas Street E. | 201-7990 Kennedy Rd. South, |
| Scarborough, ON, M1S 1V3 | Toronto, ON, M4P 1E2 | North York, ON, M3J 3K6 | Mississauga, ON, L5A 1W7 | Brampton, Ontario, L6W 0B3 |



Mark Shamly
Sinhalese Consultant

*Proudly Served over 15,000 Clients since 2004*
Visit : GtaCredit.Com



Ajay Oberoi
Government Certified Counsellor

IMPERIAL MORTGAGES INC.

Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

Abby Sri Haran
Senior Mortgage Specialist

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782



TB TISSA BOYAGODA, LLM

KNOW YOUR RIGHTS

TISSA BOYAGODA, LLM
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law with Manitoba Legal Aid, Former Judge, Sri lanka

Areas of Practice
| Criminal Law
| Family Law
| Real Estate
| Immigration Matters
| Civil Litigation
| Small Claim Court Matters
| Power of Attorneys
| Last Wills
| Notarizations

GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED

1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4

100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3

TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com

www.tissaboyagodalaw.com



# සරම්ප වසංගතය සහ එන්නත්කරණය

# ලෝකයේ පවතින මිථ්‍යා මත



■ (බී.බී.සී. වෙබ් අඩවියෙන්)

සරම්ප වසංගතය ප්‍රකාශයට පත් කළ අලුත්ම ආසියානු රට බවට පත්වෙමින්, 2018 වසරට සාපේක්ෂව සරම්ප රෝගීන් සංඛ්‍යාව 74% ක ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති බව පිලිපීනයේ සෞඛ්‍ය බලධාරීහු පෙබරවාරි මස 07 වන දා නිවේදනය කළහ.

ඇමෙරිකාවේ ජාතික සෞඛ්‍ය ආයතනය සහ ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශ වාර්තා අනුව 2013 වසරේදී ශ්‍රී ලංකාවේද සරම්ප රෝගය ව්‍යාප්ත වී තිබිණ.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ දත්ත අනුව 2013 වසරේදී ශ්‍රී ලංකාව තුළ සරම්ප රෝගීන් 4079 දෙනෙකු වාර්තා වී තිබිණි. කෙසේ වෙතත්, මේ වන විට ශ්‍රී ලංකාවේ වාර්තා වන සරම්ප රෝගීන් සංඛ්‍යාව අවම මට්ටමක පවතී.

බරපතල ආසාදන වෛරස් රෝගයක් ලෙස සැලකෙන සරම්ප රෝගය නිසා 2017 වසරේදී පමණක් 111,000 ක් මියගොස් ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි.

ලෝක සෞඛ්‍ය සංවිධානය, නොවැම්බර් මාසයේදී නිකුත් කළ නවතම වාර්තාවෙහි දැක්වෙන්නේ, එන්නත් සම්බන්ධයෙන් පළ වන ව්‍යාජ පුවත් සහ සෞඛ්‍ය පද්ධතිය කඩා වැටීම් හේතුවෙන් 2016 සහ 2017 අතර සරම්ප රෝගීන් 30% කින් ඉහළ ගොස් ඇති බවය.

"එන්නත්වලින් ලැබෙන ආරක්ෂාව නොමැති වුවහොත් ඇතැම් රටවල දැනට වාර්තා වන සුළු සංඛ්‍යාව දහස් ගුණයකින් වැඩි විය හැකි" බව ලෝක සෞඛ්‍ය සංවිධානය පවසයි.

## එන්නත් සම්බන්ධයෙන් පවතින මිථ්‍යා මත 8 ක්

### 1. එන්නත් නිසා ඔටිසම් රෝගයට ගොදුරු විය හැක

බටහිර රටවල පසුගිය දශක කිහිපයේදී සරම්ප එන්නත්කරණ ක්‍රියාවලිය පහළ වැටීමට හේතු වූයේ, Andrew Wakefield නමැති බ්‍රිතාන්‍ය ශල්‍ය වෛද්‍යවරයෙකු ඉදිරිපත් කළ අදහසක් හේතුවෙනි.

සුප්‍රකට The Lancet නමැති වෛද්‍ය සඟරාවේ 1997 දී ඔහු පළ කළ ලිපියක දැක්වුණේ, සරම්ප, කම්මුල්ගාය සහ රුබෙල්ලා සඳහා ලබා දෙන එන්නත (MMR) සහ බ්‍රිතාන්‍ය ළමුන් අතර ඔටිසම් රෝගය ඉහළ යාම අතර සම්බන්ධයක් පවතින බවය.

එහෙත්, ඉන්පසුව කරන ලද අධ්‍යයනයන් කිහිපයකදීම තහවුරු වූයේ, අදාළ එන්නත සහ ඔටිසම් රෝගය අතර කිසිදු සබඳතාවක් නොමැති බවය. ඒ අනුව, 'ද ලැන්සෙට්' සඟරාව අදාළ වෛද්‍යවරයාගේ ලිපිය ඉවත් කළ අතර, එක්සත් රාජධානියේ ලියාපදිංචි වෛද්‍ය ලේඛනයෙන්ද ඔහු ඉවත් කරන ලදී.

කෙසේ වෙතත්, ඔහු ඉදිරිපත් කළ මිථ්‍යා මතය නිසා 1996 වසරේදී එක්සත් රාජධානියේ MMR එන්නත්කරණය 92% කින් පහත වැටුණු අතර 2002 වසරේදී 84% කින් පහත වැටී තිබිණි. මේ වන විට එම එන්නත්කරණ ක්‍රියාවලිය 91% ක් ලෙස වැඩි වී ඇතත්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශය වන 95% ප්‍රතිශතයට වඩා තවමත් පහළ මට්ටමක පවතී.

### 2. දරුවන්ගේ ප්‍රතිශක්තිකරණ පද්ධතියට එන්නත් රැසක් දරා ගත නොහැකිය

වයස අවුරුදු දෙක වන විට දරුවන්ට දිය යුතු එන්නත් සංඛ්‍යාව 11 කි. එහෙත්, එන්නත් වැඩි සංඛ්‍යාවක් ලබා දීමෙන් සිය දරුවන්ගේ ප්‍රතිශක්තිකරණ පද්ධතියට හානි වන බවට ඇතැම් දෙමාපියෝ බිය පළ කරති.

සාමාන්‍යයෙන් එන්නත් මගින් සිදු කරනුයේ, යම් රෝගයකට අදාළ වෛරසය හෝ බැක්ටීරියාව ශරීරයට හඳුන්වා දීමයි. ඒ අනුව, යම් වෛරසයක් හෝ බැක්ටීරියාවක් ශරීරගත වූ විට ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා ශරීරය සූදානම් කිරීම එන්නත් මගින් සිදු වේ.

"අලුත උපන් දරුවන් තුළ ඔවුන් ඉපදීමට පෙර සිට ම ආගන්තුක ප්‍රතිදේහවලට (foreign antigens) ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වර්ධනය වී තිබෙනවා," ඇමෙරිකානු ළමා රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු වන පෝල් ඒ ඕෆිට් පවසයි.

"ඔවුන් ඉපදී පැය කිහිපයක් ඇතුළත එන්නත්වලට ප්‍රතිචාර දැක්වීමේ ප්‍රතිශක්තිය වර්ධනය වනවා."

### 3. එන්නත් හඳුන්වා දීමට පෙර එම රෝග පැවතුණේ නැහැ

මෙහිදී නගන තර්කය වන්නේ, එන්නත්වලින් සිදු කෙරෙන කාර්යය වඩා හොඳ සමාජ ආර්ථික තත්ත්වයන් එනම් යහපත් පෝෂණය සහ සනීපාරක්ෂාව යන සාධකවලින් ඉටු වන බවය.

එන්නත් හඳුන්වා දීමට පෙර සමයේ ඉහත කී සාධක හේතුවෙන් මරණ ප්‍රතිශතය අඩු වූ බව සත්‍යයකි. එහෙත්, ආසාදනය වීම් අඩු වීම හේතුවෙන් එන්නත් මගින් විශාල මෙහෙයක් සිදු වන බව පැහැදිලිව පෙනී යයි.

උදාහරණයක් වශයෙන් ඇමෙරිකාවේ රෝග පාලන හා වැළැක්වීමේ මධ්‍යස්ථානයට අනුව එරට තුළ 1960 වසරේදී සරම්ප රෝගයෙන් පුද්ගලයින් 5300 ක් මිය ගොස් ඇති අතර 2012 වසර වන විට එම අගය 450 ක් දක්වා අඩු වී තිබේ. පළමු වරට සරම්ප එන්නත භාවිතයට ගැනුණේ, 1963 වසරේදීය.

එන්නත් භාවිතයෙන් පසුව මරණ සංඛ්‍යාව අඩු වූවා පමණක් නොව රෝගීන්ගේ සංඛ්‍යාවද විශාල ලෙස අඩු වූ බව 1963 සහ 1968 අතර වාර්තා අධ්‍යයනය කිරීමෙන් තහවුරු වෙයි.

### 4. රෝගයට ගොදුරු වූවන්ගෙන් බහුතරය එන්නත් ලබා ගත් අයයි

එන්නත්කරණයට විරුද්ධ පාර්ශව සිය මතය තහවුරු කිරීම සඳහා මෙය තර්කයක් ලෙස ඉදිරිපත් කරති.

කිසිදු එන්නතක් 100% ක් ප්‍රතිඵල ලබා නොදෙන අතර ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන්නේ, එන්නත් ලබා ගන්නා දරුවන්ගෙන් 85% ත් 95% ත් අතර ප්‍රතිශතයකට එය සාර්ථක වන බවය.

පුද්ගලයින්ගේ ශරීර ප්‍රතිශක්තිකරණයේදී ප්‍රතිචාර දක්වනුයේ, එකිනෙකට වෙනස් ආකාරයටය. ඒ අනුව, එන්නත් ලබා ගන්නා සෑම පුද්ගලයෙකුගේම ප්‍රතිශක්තිකරණය වර්ධනය වන බව කිව නොහැකිය.

එන්නත් ලබා නොගත් පුද්ගලයින්ට සාපේක්ෂව එන්නත් ලැබූ පුද්ගලයින් රෝගී වීම වැඩි ප්‍රතිශතයක් ලෙස දක්නට ලැබෙනුයේ, ලෝක ජනගහනය තුළ එන්නත් ලැබූ සංඛ්‍යාව වැඩි හෙයිනි.

### 5. ඖෂධ නිෂ්පාදකයෝ එන්නත් ව්‍යාපාර කිරීමට වැඩි කැමැත්තක් දක්වති

ලෝක සෞඛ්‍ය සංවිධානයේ සෞඛ්‍ය ආර්ථික විද්‍යාඥ මිලෝද් කාදර් ඇස්තමේන්තු කර ඇති ආකාරයට, 2013 වසරේ ලෝකයේ එන්නත් වෙළෙඳ පොළේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 24 කි.

එම වසරේ සමස්ත ලෝක ඖෂධ වෙළෙඳ පොළේ වටිනාකමින් එන්නත් නියෝජනය කර ඇත්තේ, 3% ක් පමණි.

ලෝකය පුරා ප්‍රතිශක්තිකරණ එන්නත් ව්‍යාපෘති ව්‍යාප්ත වීම ඇතුළු විවිධ හේතු නිසා එන්නත් වෙළෙඳ පොළ ඉහළ යාමක් දක්නට ලැබේ. එහෙත්, රෝගී වී ප්‍රතිකාර ලබනවාට වඩා එන්නත් ලබා ගැනීමෙන් රෝග පාලනය කර ගැනීම වියදම් අඩු කර ගත හැකි ක්‍රමයකි.

### 6. මගේ රටේ මෙම රෝගය තුරන් කර ඇති නිසා එන්නත් අවශ්‍ය නැත

එන්නත් භාවිතයෙන් බොහෝ රටවල වැළැක්විය හැකි රෝග අඩු වී ඇතත්, එම රෝග ගෝලීය වශයෙන් පාලනය වී ඇති බව ඉන් තහවුරු නොවේ.

ඇතැම් රෝග ලෝකයේ සමහර රටවල වසංගත තත්ත්වයට පවා පත්ව තිබේ. ගෝලීයකරණය හේතුවෙන් එම රෝග වෙනත් රටවලට පැතිර යාමේ ඉඩකඩ පවතී. එමෙන්ම, එන්නත්කරණය අඩු කර ඇති රටවල යළිත් එම රෝග හිස එසවිය හැකිය.

2017 සහ 2018 වසර අතර කාලය තුළ යුරෝපයේ සරම්ප රෝගීන් සංඛ්‍යාව 83000 ක් දක්වා තුන් ගුණයකින් ඉහළ ගිය අතර මෙම දශකයේ වාර්තා වූ වැඩි ම සංඛ්‍යාව එයයි.

### 7. එන්නත් තුළ අනාරක්ෂිත විෂ ද්‍රව්‍ය අන්තර්ගත වේ.

දෙමාපියන් තුළ පවතින තවත් මිථ්‍යා මතයක් වන්නේ, එන්නත් තුළ ෆෝමල්ඩීහයිඩ් (ජලයේ දිය වන වායුවකි), රසදිය හෝ ඇලුමිනියම් පවතින බවය. එවැනි ද්‍රව්‍ය යම් ප්‍රමාණයකින් ශරීරගත වීම හානිදායකය.

එහෙත්, ඇමෙරිකාවේ ආහාර හා ඖෂධ පරිපාලන ආයතනය පවසන පරිදි ඇතැම් එන්නත්වල ඉහත කී ද්‍රව්‍ය පැවතිය හැකි වුවද, මිනිස් ශරීරයට හානිදායක වන තරම් ප්‍රතිශතයක් ඒවායෙහි අන්තර්ගත නොවේ.

එහි අඩංගු වන්නේ කෙලවල්ලන් ග්‍රෑම් 85ක අඩංගු රසදිය ප්‍රමාණයට ආසන්න ප්‍රමාණයක් බවද එම ආයතනය පවසයි.

### 8. එන්නත් යනු බටහිර කුමන්ත්‍රණයකි

එන්නත්කරණය සිවිල් ජනගහනය පාලනය කිරීම සඳහා භාවිත කරන්නක් බවට වන මිථ්‍යා මත තවමත් පවතී.

පෝලියෝ එන්නත් මගින් කාන්තාවන් වඳභාවයට පත් වන බවටත්, එච්.අයි.වී ව්‍යාප්ත වන බවටත් වන මිථ්‍යා මත උතුරු නයිජීරියාවේ පවතී.

කෙසේ වෙතත්, එන්නත්කරණය අයුතු ලෙස භාවිත කරන වැඩසටහන් නොමැති බව එකහෙළා කිව නොහැකිය. 2011 වසරේදී ඇමෙරිකානු මධ්‍යම රහස් ඔත්තු සේවය (CIA) විසින් අල්-කයිඩා නායක ඔසාමා බින් ලාඩින් සොයා ගැනීම සඳහා ව්‍යාජ හෙපටයිටිස් බී එන්නත්කරණ වැඩසටහනක් හරහා ඩී.එන්.ඒ. එකතු කර ගැනීමේ වැඩපිළිවෙළක් ගෙන ගියේය.

එම උපක්‍රමය එළිදරව් වීමත් සමගම, එන්නත්කරණය පසුගාමී මට්ටමක පවතින එරටේ එන්නත් වැඩසටහන් කෙරෙහි පැවති විශ්වාසය තවත් බිඳ වැටිණ.


UTHAYA'S SU
FRESH FISH MEATS FRUITS VEGE
5010 Steeles Ave. W. T
Flowers Specials
Wedding Pooja item
Garland loose flowers also available
4.99 1pk
DAT'CHA Dates
3.25 100g
Bru Coffee
Fresh Vegeta
රතඹලා කෙසෙල්
(Red Banana)
4.99 - 1LB
Fresh Fruits
4.99 1LB
ඉන්නල
නෙළුම් දඬු (Lotus
Available
Every Friday
Fresh Fish
(Tuna, Thalapth, Shrimps)
Fresh Fruits , Vegetables
.99¢ 1pk
Munchee Lemon Puff
1.99 1 bottle
MD Jam
3.79 1pk
MAGGI Coconut Milk Powder
4.99 8LB
Priya Basmati Rice
මුරුංගා කොළ
4.99 1LB
ගොටුකොළ
4.99 1LB
මුගුණුවැන්න
Importers of VEGETABLES, SEA FOODS
FRESH & FROZEN Products
DIRECTLY from SRI LANKA
3.99 8LB
Maso
අලුත් නැවුම් එළවළු, පලතුරු, මස්, මාලු ඇතුළු ඔබට අවශ්‍ය සියලුම
ශ්‍රී ලාංකේය නිෂ්පාදන ලබාගැනීමට පැමිණෙන්න UTHAYA'S SUPER MARKET
UTHAYA'S SUPER MARKET
5010 Steeles Ave. W.
Toronto ON M9V 5C6


PER MARKET
TABLES TROPICAL FINE FOODS
Toronto ON M9V 5C6
WEEKLY SALES START
EVERY FRIDAY
bles
Root)
Dry Fish &
Frozen Seafood
QUALITY CHEF
PREMIUM
JUMBO
Samudra
Sea Foods
Fresh Fish Market
4.99
1LB
Fresh Shrimp
or Dal
Tel: 416 740 7971
Fax : 416 740 8568



# 'මා හුඟාක් බිත්තර විසිකර තිබෙනවා' - ලී ක්වාන් යූ

■ **පරිවර්තනය - එස්. කේ. ජේ. කුරේරා**

සිංගප්පූරුවේ හිටපු අගමැති ලී ක්වාන් යූ 2009 වසරේදී National Geographic සඟරාවේ Mark Jacobson සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවේ සිංහල පරිවර්තනයයි මේ.

**Q ප්‍රශ්නය - ඉතිහාසය දෙස ආපසු හැරී බලන්නේ නම් 1945 වර්ෂය මානව සංහතියට උපද්‍රව සහිත වර්ෂයක් ලෙස පෙනේ. පරමාණු බෝම්බය පුපුරුවා හැරීම සහ නාසි කඳවුරු සොයා ගැනීම අතර ඇති වෙනසද ඔබට පෙනේ. ඒ පිළිබඳව ඔබ සිතන්නේ කුමක්දැයි මට කියන්න පුළුවන්ද? තමාගේ ස්වරූපයට අනුව මැවුම්කරුවන් විසින් මිනිසුන් මවා ඇති බව සිතීම මිනිසුන් විසින්ම නවතා ඇති බව පෙනේ?**

ලී ක්වාන් යූ - එම තර්කය අනුව මාගේ මෙහෙය ඇරඹුවා යැයි මා කිසි විට නොසිතමි. මා සෑම විටම සිතුවේ මානව සංහතිය සතුන් මෙන් බව සහ කොන්ෆියුසියස්ගේ තර්කය අනුව මිනිසා දියුණු කළ හැකි බවය. එය එසේ කළ හැකි බව මට එතරම් ස්ථිර නොවුවද, නිසි ලෙස හැසිරීමට පුහුණු කළ හැකිය. මිනිසාගේ චරිතය ඔබට වෙනස් කළ හැකිදැයි ඇත්ත වශයෙන්ම මට ස්ථිරවම කිව නොහැක. නමුත් ඔබට ඔහුව මනාව හැසිරීමට සැලැස්විය හැකිය. වම් අතින් ලියන අයකුට දකුණු අතින් ලියන්නට සැලැස්විය හැකිය. නමුත් ඔහුට ස්වාභාවිකව උපතින් ලැබුණු සහජ බුද්ධිය මගින් වම් අත පාවිච්චි කිරීම වෙනස් කළ නොහැක. කොන්ෆියුසස්වාදී විශ්වාසය අනුව මනුෂ්‍යයා නිර්දෝෂීභාවයට පත් කළ හැකිය. එහෙත් එය සියල්ල යහපතට සිදුවේ යැයි සිතන මතයක් පමණකි.

**Q ප්‍රශ්නය - එය එසේ යැයි මාද කියමි.**

ලී ක්වාන් යූ - නමුත් එම මතය නිවැරැදි බව ඔප්පු කිරීමට කැමැත්තෙන් බොහෝ ඇමරිකන් ජාතික සමාජ විද්‍යාඥයෝ සිටිති. ඔවුන් අතරින් මේ පිළිබඳව පර්යේෂණ පැවැත්වූ මහාචාර්යවරයකු එල්බ සිටින්නේ එක්තරා මතයකය. ඔහු දක්වා සිටින්නේ එය එසේ නම්, වාර්ගික යුදෙව්වන් ආසියානු ජාතිකයන් සහ ඉන්දීය බටහිර කොදෙව්වල කළු ජාතිකයන් ඇමරිකාවේ ඉතා සතුටින් ජීවත් වන්නේ කෙසේද? වර්ගවාදී චීනුන් මෙන්ම වර්ගවාදී ඉන්දියානුවන්ද මෙහි ජීවත්වෙනවා. අපිට අලුතෙන් පැමිණි සංක්‍රමණිකයෝද සිටිති. ඔවුන් සිටින්නේ කුසගින්නේය. ඔවුන් ජයග්‍රහණය සඳහා අධිෂ්ඨානයෙන් කටයුතු කරති. ඔවුන් අපට වඩා හොඳින් කටයුතු කරති.

**Q ප්‍රශ්නය - ඒක එහෙම හරිද?**

ලී ක්වාන් යූ - නැහැ. එයින් පැරැණි පුරවැසියන් කරදරයට පත්වෙනවා. ඔවුන් පවසන්නේ මෙය දරුණු තරගයක් බවයි. මගේ ළමයින්ට ශිෂ්‍යත්ව හිමිවන්නේ නැහැ. මක් නිසාද යත් ඔවුන් පාසලේ හොඳට ඉගෙන ගැනීමේ කටයුතු කරනවා. සංක්‍රමණිකයන්ගේ දරුවන්ද ඒ විධියටම හැඩගස්වනවා. ඔවුන්ට වුවමනා තල්ලුවයි. ඔවුන් මෙහි එන්නේ ඉංග්‍රීසි පිළිබඳ දැනුමක් නැතිවයි. ඔවුන් දන්නවා ඉංග්‍රීසි නැතිව ඔවුන්ට ඉදිරි කටයුතු කර ගන්න බැරි බව. මේ හේතුව නිසා වයස 12 සහ 13 අවුරුදුවල පිරිමි සහ ගැහැනු ළමයි අපේ ද්විතියික පාසල්වලට ඇවිත් හොඳින් ඉගෙන ගෙන ඉංග්‍රීසි භාෂාව හදාරා උසස්ම ප්‍රතිඵල ලබා ගන්නවා.

**Q ප්‍රශ්නය - ඒක ඉතා වැදගත්.**

ලී ක්වාන් යූ - ඇත්ත වශයෙන්ම රංචුව සමඟ එක්වීම සඳහා ඔබ වේගයෙන් ගමන් කළ යුතුයි. සංක්‍රමණිකයන්ගේ දරුවන් වේගයෙන් ඉදිරියට යමින් සිටිනවා. සිංගප්පූරු ජාතිකයන් වගේම ඔවුන්ද එම පාසල්වල වැඩෙද්දී එම ක්‍රීඩා පිට්ටනිවලම, එම පරිසරයේම තම කටයුතුවල නියැලෙද්දී ඔවුන්ද සිංගප්පූරු ජාතිකයන් ලෙස අප අනුගමනය කරමින් අපේ පුරුදුවලට හැඩ ගැහෙනවා. අපි වගේ ජීවිත ගත කරනවා. අපි වගේ හිතන්න පුරුදු වෙනවා. ඉතින් මට හොඳටම ස්ථිරයි. ඔවුන්ද අපගේ තත්ත්වයට පත්වෙන බව.

**Q ප්‍රශ්නය - මට ඇත්ත වශයෙන්ම වුවමනා ඒ පිළිබඳව ඔබගෙන් අසා දැන ගන්නයි.**

ලී ක්වාන් යූ - අපගේ ජනගහනය ඉතා කුඩායි. ඉන්දියන් සහ චීන ජාතිකයන්ගේ ජනගහනය අති විශාලයි.

**Q ප්‍රශ්නය - අතිරේකව යෙදවීමට ජනයා ඔවුන්ට සිටිනවා. ස්ථිර වශයෙන්ම?**

ලී ක්වාන් යූ - නැහැ. ඔවුන්ට මෙහි තියුණු තරගයක් තියෙනවා. ඒ නිසා ඔවුන් මෙහි ආවාම ඒ කාලයේදී උසස් ජීවන තත්ත්වයක් හොඳ සමාජ පරිසරයක් සමඟ හොඳ රැකියාවක් ඔවුන්ට ලැබෙනවා.

**Q ප්‍රශ්නය - සිංගප්පූරු ජාතිකයන්ගේ දෙවැනි හෝ තෙවැනි පරම්පරාවල දෙමාපියන්ට මෙන්ම ඔවුන්ගේ දරුවන්ට අලුතෙන් සංක්‍රමණය වූ ජනතාව සමඟ තරඟකාරිව ජීවත්වීමට හැකි යැයි ඔබ සිතනවාද? ඔබ ඔවුන් ගැන කියන්නේ කුමක්ද?**

ලී ක්වාන් යූ - මම කියන්නේ ඔවුන්ට (සිංගප්පූරු ජාතිකයන්ට) දැඩි කැපවීමකින් මහන්සියෙන් වැඩ කළ යුතු බවයි. එසේ නොවුණොත් ඔවුන් මෝඩයින් බවට පත්වෙනවා.

**Q ප්‍රශ්නය - මා මෙහි පැමිණ සති දෙකක් පමණ වෙනවා. සිංගප්පූරුවේ ජනතාව කියනවා ඔබ මොනවාද සිංගප්පූරුවේ සිට කරන්නේ කියා. මා ඔවුන්ට කිව්වා මම යන්නේ ලී ක්වාන් යූ සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට කියා. ඔවුන් කීවා ඔබට අවස්ථාවක් ලැබුණොත් කියන්න ජනයාට බොහෝ ප්‍රශ්න තියෙනවා කියා?**

ලී ක්වාන් යූ - ඒවා ඔක්කොම හරි

**Q ප්‍රශ්නය - මා හිතනවා ඔබ ඒවා අගය කරනවා කියා?**

ලී ක්වාන් යූ - මම මේ සැප්තැම්බර් මාසයේදී අසූ වැනි වියට පා තබනවා. මම හුඟාක් බිත්තර විසි කර තිබෙනවා. මම උසස් ලෙස සලකන්නේ පිරිසිදු පරිසරයයි, අකුරු හෝ සටහන් නොවේ. පුද්ගල ආරක්ෂාව, පිරිසිදු වාතය, පිරිසිදු ජලය, පිරිසිදු ආහාර මෙන්ම ළමයින් සඳහා ආරක්ෂක පරිසරයක් මා අදහස් කරන්නේ. අලුයම තුනට පමණ ඔබට කිසිවක් සිදු නොවන පරිදි හෙමින් හෙමින් යෑමට පුළුවන් කොහේද? මට ඔවුන්ව පෙනෙනවා. ඔබ නැවතී සිටින්නේ මේ අසල පිහිටි මැරිනා නමැති ස්ථානයේද?

**Q ප්‍රශ්නය - මා නැවතී සිටින්නේ මර්චන්ට් කෝට් නමැති ස්ථානයේ**

ලී ක්වාන් යූ - මර්චන්ට් කෝට් ඉදිරියේ තිබෙන?

**Q ප්‍රශ්නය - ඇත්ත වශයෙන්ම ක්ලාක් නමැති නැව් බඩු ගොඩබාන තැනට යාමට පිහිටි ස්ථානයේ**

ලී ක්වාන් යූ - එහි අපරාධ ප්‍රමාණය පවතින්නේ ඉතාම අවම මට්ටමේ. ඊට හේතුව හික්මුණු ජනතාවක් සිටීමයි. සෑම අයෙක්ම අධ්‍යාපනය ලැබූ අයෙක්. විවිධ දුරාචාරවලට ඇබ්බැහි වූ අය සිටිනවා. නමුත් ඉතාම සුළු ගණනක්. ඔවුන්ව ගලවා ගන්න අපි සෑම උත්සාහයක්ම දරනවා. තම යුතුකම් පැහැර හරින තරුණ ජනතාව ඉතා අඩුයි. ජීවත්වන පරිසරය අනුව ඔබටත් ඉතා සාධාරණ පුරුදුවලට ඇබ්බැහි වෙන්න සිදුවෙනවා. අපි වර්ගවාදීන්ට එකට ජීවත්වීමට ඉඩ දෙන්නේ නැහැ.

**Q ප්‍රශ්නය - මෙය දැනට ක්‍රියාත්මක වෙනවාද?**

ලී ක්වාන් යූ - ඔව්. මෙය දැනටමත් ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව වඩාත්ම සාමාන ජාතික පරපුරක් බිහිවෙනවා. ඒ වුණත් ඔවුන් තම ආගම වෙනස් කරන්නේ නැහැ. මැලේ යනු මුස්ලිම් වගේ ජන කොටසක්. ඔවුන් සෑම සිකුරාදාම මුස්ලිම් පල්ලියට යනවා. ගතිගුණ පුරුදු ටිකක් වෙනස්. මැද පෙරදිග බලපෑම අනුව හිස් වැසුම් පළඳින්නේ ගායනා කරද්දී පමණයි.

**Q ප්‍රශ්නය - ඇත්ත වශයෙන්ම එය මා ඔබෙන් අසන්නට සිටි වැදගත් ප්‍රශ්නයක්. ජාතික හෝ ආගමික එකමුතුකම සම්බන්ධයෙන් ඔබ විසින් ව්‍යවස්ථාගත සීමාවක් පනවා තිබෙනවාද?**

ලී ක්වාන් යූ - ඔව්. මක්නිසාද යත් ආගමික ගැටුම් හේතුවෙන් විවිධ ප්‍රශ්නවලට මුහුණදීමට නොහැකි නිසා.

**Q ප්‍රශ්නය - සිංගප්පූරුවේ ක්‍රිස්තු ධර්මය පතුරුවන ජනයා වැඩි වුවහොත්?**

ලී ක්වාන් යූ - එය

**34 වන පිටුව බලන්න**



# SILVY FERNANDO LAW

- ✓ Real Estate Law – Real Estate Buying, Selling, Refinance, and Private Mortgages
- ✓ Commercial Law - Sale or Purchase of Business, Company Incorporations, and Legal/Shareholder Agreements
- ✓ Family Law – Separation Agreements, Marriage Contracts and Divorce
- ✓ Personal Injury Law – Motor Vehicle Accidents, Slips and Falls
- ✓ Immigration – Skilled Immigration, Sponsorships, Work Permits, and Visitor Visas
- ✓ Estate Law – Wills
- ✓ Notary Public Services – Notarizations, Commissioning, Powers of Attorney, and Affidavits



Suite 213 - 350 Highway 7 East
Richmond Hill, ON L4B 3N2
Tel: 416-272-6587/ 905-597-1716
Email: Silvy@sfdolaw.com

Silvy Fernando LL.B.
Barrister, Solicitor & Notary Public



CENTURY 21. Green Realty Inc.

invis Canada's Mortgage Experts™

# THUSITH WEERASURIYA

REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT

416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM

"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"



Phone: 905-565-9565 Fax: 905-565-9522
Toll-Free 1-855-223-2100

6980 Maritz Dr # 8, Mississauga ON L5W 1Z3
10220 Derry Road # 204 Milton, ON L9T 7J3

www.century21.ca/greenrealty

*Independently owned and operated.

# ශ්‍රී ලංකාවේ ප්‍රථම තැපැල් කෝච්චිය

## මහනුවර - කොළඹ රෝයල් මේල්

■ **නුවරඑළියේ හේමපාල**

අපේ මුතුන් මිත්තෝ ඈතට ඇසෙන සේ හූ කීමෙන්, ඉහළ අහසට දුම් නැංවීමෙන් සහ වෙනත් ශබ්ද හා සංඥා මඟින් පණිවුඩ හුවමාරු කරගත්හ. අකුරු යොදා ලිවීමට පටන්ගත් දා සිට ඔව්හු ලියුම් ලිවීම ඇරඹූහ. එසේ ලියූ හසුන්පත් දූතයන් හෝ පණිවිඩකරුවන් මාර්ගයෙන් යවා ලිපි හුවමාරු කර ගත්හ. මීට අමතර වශයෙන් බලවත්හු අසුපිටින්ද එක් මුර පොළක සිට තවත් මුර පොළකට විදිනු ලැබූ ඊතල් මඟින්ද පක්ෂීන්ගේ ආධාරයෙන්ද ඔව්හු හසුන් පත් යැවීම් ශීඝ්‍රගාමී කර ගත්හ. එහෙත් බොහෝ විට සාමාන්‍ය හසුන් පත් යැවුණේ පා ගමනේ යෙදුණු දූතයන් මාර්ගයෙනි.

සිංහල රජ කාලයේ මෙන්ම ලන්දේසි අවදියේද රාජකාරී හසුන් පත් පවා එහා මෙහා යවන ලද්දේ එවැනි දූතයන්ගේ මාර්ගයෙනි. ඒ සඳහා ඔවුනට ලැබුණු දීමනාව වූයේ රජයේ ඉඩම්වල බදු රහිතව පදිංචි වී ඒවා භුක්ති විඳීමට අවසර ලැබීමයි.

### පා ගමනේ තැපැල්

1796 දී ඉංග්‍රීසින්ගේ පැමිණීමෙන් පසුවද ලිපි ගනුදෙනු කිරීම පවත්වාගෙන යන ලද්දේ ලන්දේසි ක්‍රමයටය. 1802 දී ඉංග්‍රීසිහු තැපැල් සේවාවේ ප්‍රතිසංවිධානයක් ඇති කළහ. එහිදී ලංකාවේ ප්‍රථම පෝස්ට් මාස්ටර් ජනරාල්වරයා වූයේ ලන්දේසි ජාතික ඇන්තනි බර්තොලලච්චිය. ඔහු රජයෙන් පඩි ගෙවන තැපැල් පියුන් සේවයක් ඇති කරමින් දිනපතා මේල් ගෙන යන තැපැල් සේවයක් ආරම්භ කළේය. දුර ප්‍රමාණය අනුව තැපැල් ගාස්තු අය කළ ක්‍රමයක් යටතේ පවත්වාගෙන ගිය එම සේවය කොළඹ, ත්‍රිකුණාමලය, යාපනය, මුලතිව් සහ හම්බන්තොට හා මඩකලපුව තෙක් විහිදිණි.

උඩරට ආක්‍රමණයෙන් පසු ඇරැඹි කොළඹ - මහනුවර තැපැල් සේවාව රට අභ්‍යන්තරය කරා පැතිර ගියේ මංමාවත් දියුණුවත් සමඟය. තැපැල් ගාස්තු අය කිරීම කොළඹ සිට ත්‍රිකුණාමලයට පනම් 8 ක්ද, මඩකලපුවට පනම් 7 ක්ද වූ අතර, තැපැල් කන්තෝරු දෙකක් අතර ලිපි ගනුදෙනුවකට පයිසා 2 ක්ද විය.

එසේ පවත්වාගෙන යනු ලැබූ තැපැල් සේවය ආණ්ඩුවට වියදම් අධික වූ නිසා දිනපතා සේවය වෙනුවට තෙදිනකට වරක් වූ සේවයකට සීමා විය. වේතන ලත් මේල්කරුවන්ට යළි බද්දෙන් තොර ඉඩම් භුක්ති විඳීමට සලස්වන ලදී.

ඉංග්‍රීසින්ගේ මුල් අවදියේ තැපැල් රට පුරා බෙදීම සඳහා මේල්කරුවන් 200ක් පමණ සිටි බැව් දැක්වේ. දිවයිනේ වැඩි හරියක් ඝන කැළෑවෙන් යට වූ ගමන් මාර්ග ඔස්සේ ගිය මේ තැපැල්කරුවන් සිය දිවි පරදුවට තබා සිය කාර්යභාරය මැනවින් ඉටු කළ බැව් ආණ්ඩුවේ වාර්තාවල දැක්වේ. තැපැල් ගෙන යෑමේ භාරදූර කාර්යය දහවල් කාලයේ එක් කෙනකු විසින්ද රාත්‍රී කාලයේ දෙදෙනකු විසින්ද ඉටු කළ බැව් කියැවේ. කඳු බෑවුම් සහ පාරවල් රහිත ශූන්‍ය භූමිවල දිවා රෑ ගමන්ගත් මේල් කරුවන්ගේ ආරක්ෂාවට තිබුණේ පන්දමක් සහ ගල් තුවක්කුවක් පමණි. අලි, කොටි, වලස් හා වෙනත් විෂ ඝෝර සතුන්ගෙන් ඔවුනට හානි පැමිණි අවස්ථා විරල නොවීය. එසේ අනතුරු සිදු වූ විට ඔවුන්ගේ පවුල්වලට තාරකා පගෝඩි හතර බැගින් වූ දිවෙලක් ගෙවන්නට යෙදිණි.

එවකට මඩකලපුවේ සිටි අලි මන්ත්‍ර හසල දක්ෂ තැපැල් කරුවෙකු වූ සින්නර් පිළිබඳ ලොමු ඩැහැගන්වන කතා රාශියකි. වරින් වර ඔහුට මුණ ගැසුණු වල් අලින්ගේ ග්‍රහණයෙන් බේරුණු අවස්ථා පිළිබඳ කතා එවකට දනන් අතර පැතිර ගියේ ඔවුන් විස්මයට පත් කරවමිනි.

වරක් පුනානේ ප්‍රදේශය දෙවනත් කළ මිනී කන රුදුරු දිවියකු වෙඩි තබා මරා ඇත. උගේ බඩ පළා බැලීමේදී දිවියාගේ අවසන් ගොදුර වී ඇත්තේ තැපැල්කරුවකු බැව් අනාවරණය වීය. එයට හෝඩුවාව සැපයූයේ දිවියාගේ බඩේ තිබී හමු වූ තැපැල්කරු නිල ඇඳුමේ රතු පැහැති පටි කැබැල්ලක් සහ රාජ්‍ය මුද්‍රාව සහිත පිත්තල බොත්තමකි.

### ආසියාවේ පළමු මේල් රථය

මේ අයුරු දිවි පරදුවට තබා අනුපමේය සේවයක් සැලසූ 'පා ගමනේ' තැපැල් සේවාවේ අන්තරාකාරී බව තුරන් වී වඩාත් සුරක්ෂිතව එමෙන්ම කාර්යක්ෂම සේවයක් ඇති වීමට මග සැලසුණේ 1832 පෙබරවාරි මස 15 වැනි දින සිට අරඹන ලද රෝයල් මේල් අශ්වකෝච්චි සේවාවෙනි.

කොළඹ සිට සැතපුම් 37 1/4 ක් දුරින් පිහිටි මහහේන කරා තැපැල් ගෙන යෑමට අරඹන ලද මේ අශ්වකෝච්චි සේවාව ආසියානු රටක තැපැල් ගෙන යාම සඳහා මේල් රථයක් යොදාගත් ප්‍රථම ඓතිහාසික අවස්ථාව බවට වාර්තා වී තිබේ. පසුව එම සේවාව මහනුවර දක්වා දීර්ඝ කෙරිණ.

කොළඹ සහ මහනුවර අතර රෝද හතරේ අශ්ව රථයක් දිනපතා ගමන් කරවීම සම්බන්ධයෙන් ලංකාණ්ඩුකාර විලියම් හෝර්ටන් ප්‍රමුඛ ප්‍රභූන් පිරිසක් විසින් නිකුත් කරන ලද නිවේදනයකින් ඒ පිළිබඳ තතු වැඩි දුරටත් හෙළි වෙයි.

තැපැල් අශ්ව කෝච්චිය හරියටම උදෑසන 4 ට කොළඹින් පිටත්වන විටම මහනුවර අශ්ව කෝච්චියද ගමන අරඹයි. එයට කොළඹ සිට මහනුවරට පැය 14 කින්ද මහනුවර සිට කොළඹට පැය 12 කින්ද ළඟාවිය හැකිව තිබිණි. කෝච්චියෙන් සැහැල්ලු මලු හැර එක් මගියෙකුටද යා හැකි විය. නමුත් විශාල ගමන් මලු ගෙන යෑමට නොහැකි විය.

රෝයල් මේල් අශ්ව කෝච්චි සේවාව පවත්වාගෙන යන ලද්දේ රජය මඟින් නොවේ. රජය සම්බන්ධිත පෞද්ගලික ව්‍යාපාරයක් වශයෙනි. සේවාව ඇරැඹීමට අවශ්‍ය පවුම් 2000, පවුම් 50 කොටස්වලින් ලබාගන්නා ලදී. ඉන් කොටස් 6 ක්ම ලංකාණ්ඩුකාරයාගේ විය. සෙසු කොටස් මෙහි සිටි යුරෝපීයයන් ගත් අතර, සම්පූර්ණ කොටසක් ගත් එකද සිංහලයෙක්වත් නොවීය. මහ මුදලි සොලමන් ඩයස් බණ්ඩාරනායක මහතා විසින් පවා ගනු ලැබුවේ කොටසකින් භාගයක් පමණි.

රෝයල් මේල් අශ්වකෝච්චි සේවාව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය අශ්වයන් හා අශ්ව කරත්ත සඳහා පවුම් 570 ක්ද ප්‍රථම වසරේ වියදම් වශයෙන් පවුම් 1065 ක්ද වෙන් කෙරිණි. ඊට අමතරව පවුම් 350 ක් අලුත්වැඩියා කිරීම් සඳහා වෙන් විණි.

ලියුම් ගෙන යාම සඳහා ආණ්ඩුවෙන් දෙන ලද මුදල සහිත ව මුළු ආදායම පවුම් 1835 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කෙරිණ. මේ හැර කොටස්කරුවන් අතරේ බෙදා දීම සඳහා පවුම් 405 ක ලාභයක් බලාපොරොත්තු විය.

රෝයල් මේල් අශ්වකෝච්චි සේවාව පාලනය කරන ලද්දේ පස් දෙනෙකුගෙන් යුතු කාරක සභාවක් මඟිනි. ඔවුන්ගෙන් තිදෙනෙක් කොළඹද, එක් කෙනෙක් මහනුවරද අනෙක් අය දෙනුවර අතර නැවතුම් පළකද සිටියහ.

රෝයල් මේල් අශ්වකෝච්චියෙන් යැවෙන සැහැල්ලු මලු කොළඹ හෝ මහනුවර තැපැල් ස්ථානයට භාරදිය යුතු විය. මගීන් සඳහා ටිකට්පත්ද නිකුත් කරන ලදී.

මේ ව්‍යාපාරය සඳහා වූ තොටුපල් බදු ආදිය සඳහා වාර්ෂිකව පවුම් 3000 ක් ආණ්ඩුවට ගෙවිය යුතු විය.

රෝයල් මේල් අශ්වරථ සේවාව අරඹා දින තුනකට පසු ඒ පිළිබඳ විස්තරයක් ශ්‍රී ලංකාවේ ප්‍රථම පුවත්පත වූ 'ද කලම්බු ජර්නල්' හි පළ කොට තිබුණි. පසුව එය ලක්මිණි පහන පත්‍රයේ මෙසේ පළ විණි.

"දැන් ඉතින් මේල් අශ්වකෝච්චිය අරඹා ඇති හෙයින් සිලිං 9 ක් සපයාගත හැකි ඕනෑම කෙනෙකුට රට ඇතුළට යෑමට මාර්ගය විවෘතව ඇත. යටත් පිරිසෙයින් මේ කාරණය අතින්වත් අප ඉන්දියාවට වඩා ඉදිරියෙන් ගමන් කර ඇති බව කිව යුතු අතරම ලෝකයේ කුඩා දිවයිනක් වන ලංකාවට ඉංග්‍රීසි ක්‍රම සහ සිරිත් විරිත් හඳුන්වා දීමෙන් කළ හැකි සේවය මහත් බව පෙන්වා දිය යුතුය.

මේ අශ්වකෝච්චි සේවය අයිතිකරුවන්ට සහ කළමනාකරුවන්ට ද ස්තූති කිරීමෙහිලා අපේ පාඨකයන්ද අප සමඟ එක් වන බව නොඅනුමානය. සේවයේ ක්‍රියාත්මක භාවය දැන් ඔප්පු වී අවසාන බැව් කිව හැකිය. අපට දැනගන්නට තිබෙන සැටියට කොළඹ සිට මහහේනට ඇති සැතැප්ම 37 1/4 ක් දුර ප්‍රමාණය පැය 6 කින් සම්පූර්ණ කර තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහනුවර ලියුම් පෙරට වඩා පැය තුනකට කලින් බෙදනු ලැබූ බැව් සැලයි.

අශ්වකෝච්චිය පටන්ගන්නේ අලුයම 4 ට නිසා මහහේන දක්වාම ඉර අව්වක් නැතිවම යා හැකි වේ. රථයේ ලාම්පු හොඳාකාර ඇති හෙයින් රාත්‍රී කාලයේ අන්ධකාරයෙන්ද අනතුරක් සිදු විය නොහැක්කේ, විශේෂයෙන්ම රථාචාර්යා මාර්ගය ගැන හොඳ දැනීමක් ඇති කරගැනීම නියත නිසාය. අශ්වයන් බැඳ තැබීමට ඉස්තාල සෑදූ විගසම මේ සේවය මහනුවර දක්වාම දීර්ඝ කරන්නට යන බැව් දැනගන්නට තිබේ. එය සති කිහිපයකින් සම්පූර්ණ කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. මෙතෙක් කර ඇති සියලු දෙයට අපේ අනුමැතිය හිමි වන හෙයින් මෙතරම් නවීන අත්හදා බැලීමකට ධෛර්යය දීමට මහජනයා කැමැති බැව් පෙන්වීම ඔවුන් සතු කටයුත්තකි.'

මහහේන දක්වා සේවාව අරඹා මාස 5 කට පසු 1832 ජූලි මාසයේදී මේ සේවය මහනුවර දක්වා දීර්ඝ කරන ලදී. මෙහිදී මහහේන දක්වා දිනපතා සේවය වෙනුවට මේල් අශ්වකෝච්චිය සඳුදා, බදාදා සහ සිකුරාදා යන දිනවලට පමණක් සීමා කරන ලදී. උඩරට වතුකාර සුද්දන් අතර ජනප්‍රිය වූ මේ සේවය අශ්වයන් දෙදෙනකු යොදා මගීන් වැඩි සංඛ්‍යාවක් යා හැකි පරිදි පුළුල් කෙරිණි.

1838 දී මේල් අශ්වකෝච්චි සේවය කොළඹ සිට ගාල්ල දක්වාත්, පසුව රත්නපුරය, මාතලේ, කුරුණෑගල, ගම්පොළ හා නුවරඑළිය දක්වාත් දීර්ඝ කිරීමෙන් එය මහා මාර්ග ඉදිකිරීමටද පිටුවහලක් විය.

රෝයල් මේල් අශ්වකෝච්චිය ගමන්ගත් මාර්ග අතරින් මහනුවර ගමන අතිශයින් ප්‍රීතිජනක බැව් වාර්තා වී ඇත්තේ හුදෙක් මඟ දෙපස වූ ස්වභාවික සෞන්දර්යය නිසාය. කොළඹ රත්නපුර ගමන, පාර ජලයෙන් යටවීම නිසා කීප වරක්ම අත්හිටුවා ඇත. ඒ අතරම මේ රථ හදිසි අනතුරුවලටද මුහුණ පෑ අවස්ථාද විය.

වරක් මහනුවර පාරේ අශ්වයන් ගාල් කොට තිබියදී අයිනේ තිබූ රථයක් පල්ලමකට පෙරළී කුඩු පට්ටම් වී ඇත. තවත් වරෙක පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ගිය අශ්වකෝච්චිය පාරෙන් ඉවතට ලිස්සා යෑම නිසා රථය පල්ලමකට පෙරළී දෙපාරක්ම උඩුකුරු වී අනතුරකට භාජනය වීය. බිහිසුණුම අනතුර සිදු වී ඇත්තේ කොළඹ, ගාල්ල අශ්වකෝච්චිය 1859 දී දෙහිවල පාලම මත අනතුරට පත් වීමෙනි.





## 19 වන කොටස

# ප්‍රාර්ථනා මල් පිපුණා

**පද්මිණී ජයතිලක**

කාලය ඉගිල ගියා සේ වසර ගණනාවක් ගෙවී ගියේය.

සඳගිරි වලව්වේ කටයුතු පෙර පරිදිම සිදුවෙමින් පවතී. මේබලාගේත්, සම්පත්ගේත් මිතු දම ප්‍රසිද්ධ රහසක් ලෙස කිසිදු බාධකයකින් තොරව ඉදිරියට ඇදෙමින් පවතී. සම්පත් සමඟ හුදකලා වීමෙන් ප්‍රේමනීය වින්දනයක් ලබන මේබලා ඔහුගේ ආදරණීය බවට වශී වී සිටී.

විවාහකයකු මෙන්ම දෙදරු පියකු වූ සම්පත් මෙතෙක් තම බිරිඳටත් දරුවන්ටත් අසීමිත සෙනෙහසක් දක්වමින් සිටියද ක්‍රමයෙන් ඔහු මේබලාගේ ආයාචනාත්මක දෙඇස් හමුවේ සැබෑ ප්‍රේමවන්තයෙකු බවට නැවත පත්විය.

මේබලා මේ සියල්ල යටපත් කර ලෝකය ඉදිරියේ සියල්ල නිහඬ කිරීමට යොදාගත් උපාය වූයේ අත දිගහැර සම්පත්ගේ පවුලේ අවශ්‍යතා සඳහා මුදල් වැය කිරීමය. වෙනදා මෙන් තුන් හතර ගුණයක මුදලක් සම්පත්ගේ බිරිඳ අතට ලැබෙන බැවින් ඇයද කිසිවිටක සම්පත්ට රැකියාවෙන් අස්වන ලෙස කියා සිටියේ නැත. ඇයට මේබලා මැණිකේ කප්රුකකි. දැන් ඇයද පෙර පැවති අග හිඟකම් නැති කරගෙන තම දරු දෙදෙනා රැකගෙන සුවයෙන් සිටී. මේබලාද ඉඳහිට සම්පත්ගේ නිවසට ගොස් ඔවුන්ගේ සුවදුක් විමසා තෑගි බෝග පිරිනමා පැමිණියේ සියල්ල කලබලයකින් තොරවම සිදු විය යුතු නිසාය.

සෙනුරි දැන් සාමාන්‍ය පෙළ විභාගය ලියා වලව්වේ රැඳී සිටින කාලයයි. මෙවර වලව්වට පැමිණි සෙනුරි වලව්වත්තත් වලව්වත් දුටුවේ වෙනදාට වඩා ලස්සනටය.

"මමී වලව්ව ලස්සන වෙලා."

"ඇයි දුවට එහෙම පෙනෙනවාද?"

"ඔව් මමීත් වෙනදට වඩා ලස්සනයි."

"ඔයාත් ලස්සන වෙලානෙ දුවේ. ඔයාගෙ ඔය ලස්සන ඇස්වලට ලෝකෙම තියෙන ලස්සන ඔයා උරා ගන්නවා. ඒකයි ඔයාට හැමදේම ලස්සනට පේන්නෙ."

"ඇත්තද මමී, මට නම් ඇත්තටම හැම දෙයක්ම පෙනෙන්නෙ ලස්සනට."

මේබලාට තම දියණිය ගැන අනුකම්පාවක් ඇති විය. ඇය තවමත් ලෝකයට ආධුනික තැනැත්තියකි. මේ ලෝකයේ පවතින අප්‍රමාණ දුක්ගැහැට, සිත්වේදනා තවමත් ඇයට විඳීමට හෝ දැකීමට සිදුව නැත. ඇය පිවිතුරුය. එහෙත් ඇයත් මේ සියලු දෙය යම් දිනක අත් විඳිනු ඇත. මේබලාට ඇගේ ලාබාල විය සිහිපත් විය. තාරුණ්‍යයත් සිහිපත් විය. තමා වටා හමා ගිය ආදර කුණාටු ඒ අතර තිබූ බවද, ඒ සියල්ල හමා ගියා විනා තමා ඒවාට හසු නොවූ බවද වින්දනයකින් යුතුව මතකයට නංවා ගත්තාය. තමා පිරිමියෙකුට තුරුළු වූ පළමු දිනය වූයේ සඳරුවන් සමඟ පැමිණි දිනයයි. එතෙක් ඇය විඳි සියලු ප්‍රේමණීය සිදුවීම් ඉඟි බිඟි සිතුවිලිවලට පමණක් සීමා වී තිබූ ඒවා විය.

සඳරුවන් මුල් කාලයේදී ඇයට වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ප්‍රේමනීය ස්වාමි පුරුෂයෙක් විය. වර්තමානයේ ඇය ඔහු සමඟ ගෙවන ජීවිතය අමිහිරි නොවුවද අනාගතය පිළිබඳව ඇයට ඇත්තේ අවිනිශ්චිත බවකි.

'ඇයි අපිට මෙහෙම වුණේ. මගේම කුසින් මට දරුවෙක් ලැබුණෙ නැති හින්දද? සඳරුවන්ගෙ ලෙයින්ම උපන් දරුවෙකු මට ලැබුණා නම් අපේ ජීවිත මේ විදිහට උදාසීන වෙන එකක් නැහැ. ඒත් ඒකමද ප්‍රශ්නය. සඳරුවන් කවදාවත් සෙනුරිට වෙනස් කමක් කළේ නැහැ. එයාගෙ දරුවෙකුට වාගෙම ආදරෙයි. එතකොට මමද වෙනස් වුණේ? මමද සම්පත්ට ආදරය කරන්න පටන් ගත්තෙ. අනේ මන්ද මගෙ ඔළුවත් දැන් අවුල් වෙලා.'

රුවන්ත විශ්ව විද්‍යාලයේ අවසන් වසරේ ඉගෙනුම ලබමින් සිටියදී විශ්ව විද්‍යාලය දින නියමයක් නැතුවම වසා දැම්මේ රටේ පවතින දැඩි අස්ථාවර තත්ත්වය සැලකිල්ලට ගෙනය. විශ්ව විද්‍යාල සිසුන් ඝාතනය කිරීමටද සිර ගෙවල් තුළට ගාල් කිරීමටද රජය පියවර ගනිමින් තිබූ නිසා ළමයි තම නිවෙස් බලා ගියහ. ඔහු නිවසට වී සිටියේ අකමැත්තෙන් නිසා දිනක් වලව්වට ගොස් පුංචි හාමු මුණ ගැසුණේය. පුෂ්පාත් ජයසේනත් එයට තදබල ලෙස විරුද්ධ වූයේ දේශපාලකයින් විශ්ව විද්‍යාල තරුණයින් ඝාතනය කරවන බවට ලැබී තිබූ ආරංචිය නිසාය. ඔවුන් දෙදෙනාද රුවන්ත පිටුපසින් වලව්ව තෙක්ම දුව ගිය අතර ජයසේන වලව්වට ඇතුළු විය. තම පුත්‍රයාටද අනතුරක් වේය යන බියෙන් ඔහු ගැහෙන්නට විය.

ඒත් පුංචි හාමු රුවන්තව හොඳින් පිළි අරගෙන දිනපතා වලව්වට පැමිණෙන ලෙස ඔහුට කියා සිටිනවා ජයසේන අසා සිටියේය.

ඉන්පසු සෑම උදෑසනකම පුෂ්පාගේ අණ පරිදි ජයසේන රුවන්තව වලව්වට ඇරලවා එන අතර සවසට ගොස් ඔහු සමග ආපසු එයි.

"අනේ මෙයා... අපේ පුතාව පරිස්සම් කර ගන්න ඕනි. හැම තැනම අර සංවිධානෙ අය ඉන්නවා. පුතා ඇමතිතුමා ළඟ වැඩ කරන එක හරිම භයානකයි. පාරෙන් යන්නෙ නැතිව මේ වත්ත මැද්දෙන් ගිහින් පුතාව ඇරලල එන්න වලව්වට."

"ඒකනෙ පුච්පො. හාමුට අපේ කොලුව හිච වැච්ලනෙ. ගිහින් උදව් කළාට ඉතින් මොනව වෙන්නජ"

"උදව් කළා වාගෙ නෙමෙයිනෙ. පුතාට අනතුරක් වුණොත් කියලනෙ අපිට බය. ඔය මිනිස්සු අපේ පුතා දිහාත් ඇහැ ගහගෙන ඉඳී."

"නැහැ. නැහැ. පුච්පො... දෙවියො අපි ජිහා බලඥදවා."

"පුතේ ඔය ගමන නවත්තන්න බැරිද?"

"ඒ කොහොමද අම්මෙ මුළු වලව්වෙම පාලනය මට බාර දීලයි හාමු තියෙන්නෙ. මම එළියට යනව නම් මට වෙනම වාහනයක් දීලා තියෙනවා පොලිසියෙ දෙන්නෙක් එක්කම. ආයුධ තියාගෙන පොලිසිය ඉන්නෙ. වලව්ව වටේටමත් පොලිස් ගාඩ් එකක් දාලයි තියෙන්නෙ."

"ආ... එහෙමද? කොහොමත් උඹටත් ඕව අයිතියි. ඕවයැ උරුමයක් තියෙනවා."

"ඒ මොකක්ද අම්මෙ ඒ කථාව. අපිට කොයින්ද වලව්වෙ උරුමයක්. මොකද අපි වලව්වෙ කනත්තෙ ඉන්න හන්දද? නැත්නම් අම්මයි, තාත්තයි වලව්වෙ සේවකයො හින්දද?"

"ඔව් පුතේ උඹෙ අම්මයි තාත්තයි දෙන්නම වලව්වෙ සේවකයෝ. උඹේ තාත්තගෙ පරම්පරාවම වලව්වෙ සේවකයො. අපි පිට මිනිස්සු තමයි. ඔය වලව්ව ඇතුළෙ හැදෙන පුංචි කුමාරිහාමිත් වලව්වෙ උරුමකාරියක් වුණේ ඒකිගෙ පිනට මිසක් ලේ උරුමයක් ඇතිව නෙමෙයි. ඒ හාමුගෙ දරුවෙක් නෙමෙයි. ඒක හින්ද මගෙ පුතාට ඊට වැඩිය උරුමයක් කියන්න පුළුවන් ඔය වලව්වට."

"ආ.... එතකොට ඒ පුංචි මැණිකෙ වලව්වෙ හදාගත්තු කෙනෙක්ද?"

"ඔව් ඕක දන්නෙ ටික දෙනෙක් විතරයි. ඔය වලව්වල කොච්චර නම් දේවල් හැංගිලා තියෙනවාද?"

"එතකොට ඔය හාමුගෙම දරුවො නැද්ද?"

'හ්ම් මම කොහොම ඇත්ත කියන්නද මේ දරුවට.' ඇය සිතින් මිමිනුවාය. සෙනුරි මේ දිනවල වලව්වේ සිටියත් ඇයට උඩු මහලින් පහලට බැසීම පවා සඳරුවන් තහනම් කර තිබුණේය. දේශපාලකයින් මෙන්ම ඔවුන්ගේ පවුල්වල අයද ඝාතනය කිරීම ඝාතන සංස්කෘතියේ අංගයක් විය. සෙනුරිගේ ආරක්ෂාව ගැන සිතා කිසිම විටෙක ඇය වලව්වෙන් පිටතට යැවීමද නොකළේය. මේබලාද වේයන්ගොඩ ෆැක්ටරියට යාම නවතා දමා දුරකථනයෙන්ම උපදෙස් ලබා දෙමින් එහි කටයුතු මෙහෙයවූවාය. වලව් වත්ත තුළ තිබූ ෆැක්ටරියට වුවද ඇය ගියේ ආරක්ෂක රැකවලුත් සමඟය.

එන්න එන්නම රටේ ආරක්ෂක මෙන්ම දේශපාලන වාතාවරණයද දැඩි ලෙස අස්ථාවර තත්ත්වයකට පත් විය. යාපනයේ අවිගත් ත්‍රස්තවාදය මෙන්ම දකුණේ අන්තවාදීන්ගේ ත්‍රස්තවාදයද දිනෙන් දින නරක අතටම යොමු විය. ආණ්ඩු විරෝධී මෙම දේශද්‍රෝහී රැල්ල මැඩපැවැත්වීමට දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට රජයට සිදුවිය.

දේශපාලකයින්ගේ ජීවිත රටේ ඕනෑම තැනකදී ඝාතනය කර දැමීමට මෙම කල්ලි දෙකම පසුබට නොවූහ. මේ වන විටත් ප්‍රධාන පෙළේ ඇමතිවරු, ජනමාධ්‍යවේදීන්, උසස් පොලිස් නිලධාරීන්, පළාත්බද දේශපාලකයන්, නායකයින් රාශියක් ඝාතනය කර හමාරය.

සඳරුවන්ද තමාට රජයෙන් සපයා ඇති ආරක්ෂක නිලධාරීන්ට අමතරව පෞද්ගලික ආරක්ෂක බලඇනියක්ද තනා ගත්තේය. රාජ්‍ය පාලනයට එරෙහිව ගෙන ගිය මෙම ඊනියා නිල නොවන පාලනය රටේ අස්සක් මුල්ලක් නෑරම තම අණසක පවත්වමින් ජන ජීවිතය මුළුමනින්ම ව්‍යාකූල කරමින් සිටී.

සඳරුවන්ද තම බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන මෙම නිල නොලත් පාලනය මර්ධනය කිරීමට පොලිස් සහ හමුදා බල ඇනිදෙකක සේවය ලබා ගත්තේය. දේශපාලකයින් හමුවේ ඇති ප්‍රබලම අභියෝගය මේ දිනවල තම පවුල් ආරක්ෂා කර ගැනීමත් නිල නොවන පාලනයෙන් රට මුදවා ගැනීමත්ය. රටේ සිටිනා තරුණ බුද්ධිමත් රැල්ල මේ කල්ලියේ සාමාජිකයින් වීම රජයට මොවුන් මර්ධනයට කිරීමට මහත් බාධකයක් විය. රටේ සම්පතක් වනසා දැමීමක් මොවුන් මරා දමා කැරැල්ල මර්ධනය කිරීමට ගන්නා උත්සාහය තුළ තිබීම වඩාත් සෝචනීය විය. කෙසේ වුවද රැයක් දවාලක් නැතිව රාජ්‍ය හමුදාව යොදා මොවුන් මර්ධනය කිරීමට රජය පියවර ගෙන ඇත. බොහෝ මිනිස් ජීවිත දෙපිරිස අතින්ම මරු තුරුලට ගියේ උණ්ඩය මතින්ය.

★ ★ ★ ★ ★

සඳරුවන් එදින උදෑසනින්ම නිවසින් පිටව ගියේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන අයවැය විවාදයට සහභාගී වීම සඳහාය.

පාර්ලිමේන්තුවේ සභා ගර්භය අය වැය විවාදයටත් වඩා උණුසුම් තත්ත්වයක් ගෙන තිබුණේ රටේ පවතින අස්ථාවර තත්ත්වය නිසාය. රජය ඉතාමත් දැඩි ක්‍රියා මාර්ග යක් ගෙන මෙය මර්ධනය කිරීමට පියවර ගත යුතු බව හැම දෙනාගේම අදහස විය. වෙනදාටත් වඩා වැඩි පැය ගණනක් පාර්ලිමේන්තුව තුළ ගත කළ මැති ඇමතිවරු රටේ ආරක්ෂක තත්ත්වය ආරක්ෂා කිරීමට මෙන්ම නිල නොලත් දේශපාලන ව්‍යාපාරය මර්ධනය කිරීමට දැඩි මර්ධනකාරී පිළිවෙතක් අනුගමනය කිරීමට එකහෙලාම ජනාධිපති වරයාට බලකිරීමේ ප්‍රතිඵලයක් ලෙස පසුදා සිටම එලෙස ක්‍රියාත්මක වීමට තීරණය කළහ. ත්‍රිවිධ හමුදාවම මේ සඳහා ක්‍රියාන්විතයේ යෙදවීමට රජය පියවර ගෙන තිබුණි.



පාර්ලිමේන්තුවේ උණුසුම් වාද විවාදවලට සහභාගි වී මීරිගම තම නිවස බලා පිටත් වූ සඳරුවන්ගේ රථය අනපේක්ෂිත ලෙස අත් බෝම්බ ප්‍රහාරයකට ලක් වූයේ කොළඹ නුවර මාර්ගයේ නිට්ටඹුව මංසන්දියේදීය. එම බෝම්බ ප්‍රහාරයෙන් සඳරුවන්ගේ රියැදුරු එතනම ජීවිතක්ෂයට පත් වී සඳරුවන්ට බරපතල තුවාල සිදු විය. වතුපිටිවල රෝහලට ගෙන ගිය ඔහු පසුව එහි වූ ගිලන්රථයෙන් කොළඹ මහරෝහල වෙත ගෙන ගියේ හමුදා ආරක්ෂාව මධ්‍යයේය. ඒ වන විට රට පුරාම ඇඳිරි නීතියද

**32 වන පිටුව බලන්න**

# ප්‍රාර්ථනා මල්...

31 වන පිටුවෙන්

ක්‍රියාත්මක වී තිබුණි.

මේබලා සහ සෙනුරීට සඳරුවන් බැලීමට යාමට ඉඩක් ලැබුණේ පසුවදා දහවල හමුදා ආරක්ෂක රථයක් පැමිණි පසුවය. රුවන්තද එම රථයෙන්ම රෝහල වෙත ගියේ ඔහුගේ සාත්තු සප්පායම් වෙනුවෙන් සහාය වීමටය.

සඳරුවන්ගේ එක් ඇසකටද හිසටද බරපතල ලෙස හානි වී තිබූ හෙයින් ඔහු දැඩි සත්කාර ඒකකයේ පසු විය. ශල්‍ය කර්ම දෙකක්ම සිදුකර සිරුර තුළ තිබූ යකඩ කැබලි කිහිපයක් ඉවත් කර තිබුණද තවත් ශල්‍ය කර්මයක් කළ යුතු බව වෛද්‍ය මතය විය. පෙර පරිදි ඔහුගේ ඇස් පෙනුම ලබා ගැනීමට නොහැකි වනු ඇතැයි වෛද්‍යවරු ප්‍රකාශ කර තිබුණි.

දින කිහිපයක් මහ රෝහලේත්, අක්ෂි රෝහලේත් ප්‍රතිකාර ලබා පසුව ඔහු කොළඹ පෞද්ගලික රෝහලකට ඇතුළත් කර ගැනීමට මේබලාට හැකි විය. රජයේ රෝහලේ සිටි කාලය පුරාවටම රුවන්තද සඳරුවන් සමඟ සිටියේය. පෞද්ගලික රෝහලට රැගෙන ආ දින සිට සෙනුරීත් මේබලාත් දිවා කාලයටද රුවන්ත රාත්‍රී කාලයටද සඳරුවන් ළඟ ගත කළහ. රුවන්ත සඳරුවන් අතර දැඩි බැඳීමක් මේ කාලය අතරතුර ඇති විය. සඳරුවන්ගේ පවුල්වල උදවිය පවා ඔහු ළඟ නතර වීමට බිය වූයේ රටේ පවතින බිහිසුණු වාතාවරණය හමුවේ ඔවුන්ගේ ජීවිතවලට හානිවේය යන බියෙනි. හමුදා ආරක්ෂාව මධ්‍යයේ රෝහලේ ගත කළ හැම දවසක්ම ගෙවුනද අනතුරක සේයා පහව ගොස් නැත.

මේබලා රුවන්ත පිළිබඳව තරහකින් පසු වුවද මේ තරම් විශ්වාසවන්තයෙකු සඳරුවන් වෙනුවෙන් සොයා ගත නොහැකි හෙයින් නිහඬව ඉවසා සිටියාය. සඳරුවන් රුවන්තට ඉතාමත් ප්‍රියතාවක් දැක්වූ හෙයින් ඔහු ඉවත් කිරීමට මේබලා පියවර නොගත්තේ සඳරුවන්ගේ මානසික තත්ත්වයට එය බල පෑ හැකි බව සිතන නිසාය. මේ දිනවල සෙනුරී රුවන්ත ආමන්ත්‍රණය කරන්නේ රුවන්ත අයියා යනුවෙනි. රුවන්ත සෙනුරී නංගි යනුවෙන් ඇමතීමට තරමට නිර්භීත විය.

"බලන්නකො අයියෙ. මේ වෙන දේවල්. ඊයෙත් තව පාර්ලිමේන්තුවේ ඇමති කෙනෙකුට වෙඩි තියල. ඔක්කොම ඉස්කෝල වහල. කැම්පස් ටික වහල. මුළු රටම අක්‍රිය වෙලා. මේ ආණ්ඩුව තවත් බලා ඉන්නෙ මොනවද? ඇයි මේවා නවත්වන්න බැරි." කියා සෙනුරී බියෙන් ඇලළී පවසන විට රුවන්ත කීවේ,

"ඉන්නකො නංගී ඉවසගෙන.... ඉක්මනින් ඉවරයක් වෙයි." කියාය.

මේ දෙබස සඳරුවන් සහ මේබලා අසා සිටියත් යමක් පැවසීමට තරම් ධෛර්යයක් ඔවුන් තුළ නොවීය. මේබලා එදින සවස සෙනුරී සමඟ ආපසු එන විටදී තර්ජනාත්මක ස්වරූපයෙන්,

"සෙනුරී, ඔයාට පිස්සුද අර රුවන්තට අයියෙ කියල කියන්නෙ. උන් අපේ වලව්වෙ මෙහෙකාරයොනෙ. ඔය ඩැඩීට කරන සාත්තු සප්පායම්වලට හරියන්න අපි එයාට සලකනවා. ඩැඩී ඒවා කරයි සනීප වෙලා ආව ගමන්ම. ඔයා ඕනවට වඩා ඔය සේවකයො ඇඟට ගන්නෙ නැතිව ඉන්න." කියූ විට,

"මේ වෙලාවෙ ඒ අයිය අපිට පවුලෙ කෙනෙකුට වඩා වටිනවා. කෝ... ඉතින් නැන්දල දෙන්නම ඇවිදින් ගියාට කවුරුත් නැවතුණාද ඩැඩී ළඟ. මම්ගෙ අය ඩැඩීව බලන්න එන්නත් බයයි. ඩැඩී මොනතරම් තනිවෙනවද ඒ අයිය නොහිටියනම්."

"ඔය ඕන තරම් ඉන්නෙ සාත්තුකාරයො. සල්ලි තියෙනවනම්."

"මමී, අපිට ලෙන්ගතුකම සල්ලිවලට ගන්න බැහැ. ආයුධ තියාගෙන ඩැඩී වටේට ඉන්න අය හරියටම ඩියුටි මාරුවෙන වෙලාවට යනවා. සාත්තු කාරයොත් ඒ වගෙ තමයි. ඒත් ඒ අයිය වේලාවට කෑමටවත් යනවද? මොන තරම් නිදි මරනවද? අයිය දොස්තර මහත්තුරු එක්කත් කථා බහ කරල ඩැඩීගෙ අවශ්‍යතා ඉටු කරල දෙනවා. අපිට කවුද වෙන ඉන්නෙ ඒ වගෙ කැපවීමෙන් උදව් කරන. අනිත් අතට ඩැඩීත් වෙන කාටවත් වැඩිය රුවන්ත අයියට කැමතියි."

"ඔව්, ඔයාට වාගෙම ඩැඩීටත් පිස්සු."

"නැහැ. අපි දෙන්නටම පිස්සු නැහැ. මමීට තමයි පිස්සු. මමී මේ වෙලාවෙත් ඩැඩීව සනීප කරගන්න විදිහ ගැන නෙමෙයි හිතන්නෙ වෙන වෙන අනං මනං."

"හා... ඩැඩී සනීප වෙලා ගෙදර ආවහම ඔය අයිය නගෝකම මම නතර කරන්නම්කො."

"කමක් නැහැ. අඩුතරමින් මමී ඩැඩීට සනීප වෙනකම්වත් ඉවසගෙන ඉන්නකො. මේ වෙලාවේ රුවන්ත අයියගෙයි ඩැඩීගෙයි දෙන්නගෙම හිත රිද්දන්නෙ නැතුව. ඩැඩීට දැන් රුවන්ත අයියව නැතිවම බැහැනෙ."

මේ අතරතුර රටේ භීෂණ වාතාවරණය එක වරම නිහඬ කරමින් දකුණේ දේශපාලන කල්ලි නායකයා හමුදා වෙඩි ප්‍රහාරයකින් මරු මුවට පත්විය. කැරැල්ලේ ප්‍රධාන මොළකරුවන් සියලු දෙනාම පාහේ රජයේ හමුදා අතින් මරු වැළඳ ගෙන තිබුණි. තරුණ තරුණියන් දහස් ගණනක් ටයර් සෑයවල දැවෙමින් අවසන් ගමන් ගියේ හමුදා ක්‍රියාන්විතයන් තුළින්ය.

රට සන්සුන් විය. රට අක්‍රිය කරමින් මෙතෙක් පැවති භීෂණකාරී වාතාවරණය ඉවත් විය. ක්‍රමයෙන් රටේ තත්ත්වය යහපත් අතට හැරෙමින් ඇත.

සඳරුවන් ඇමතිතුමාද මාසයක පමණ කාලයක් රෝහල්ගතව සිට නිවසට පැමිණියත් ඔහු පූර්ණ සුවය ලබා තිබුණේ නැත.

සඳරුවන් නිවසට පැමිණි පසු ඔහුට උවටැන් කිරීමේ කටයුත්තට මේබලාත් සොයුරියන් දෙදෙනාත් එක්ව සිටි අතර හෙද සේවකයෙකුගේ සහායද ලබාගෙන තිබුණි. මේබලාගේ ප්‍රබල අධිෂ්ඨානය වූයේ රුවන්ත වලව්වට පැමිණීම නතර කිරීමය.

"රුවන්ත ඔයා බොහොම කැපවීමෙන් හාමු මහත්තයට සැලකුවා. හාමු මහත්තයට දැන් හුඟාක් සනීපයි. අනිත් අතට දැන් එයා ළඟ ඉන්න ඕන තරම් අය ඉන්නවනෙ. රුවන්ත ගිහින් ඔයාගෙ වැඩ ටික කරගන්න. හෙට අනිද්දම යුනිවසිටි පටන් ගනී. කරපු උදව්වලට මෙතන මුදල් ටිකක් තියෙනවා අර ගන්නකො. හාමු මහත්තයා පස්සෙ රස්සාවක් අරගන්න හෙම උදව් කරයි රුවන්තට." කියා පවසා රුවන්ත වලව්වට පැමිණීම තවදුරටත් අවශ්‍ය නැති බව ඔහුට ඇඟවීය.

"හොඳමයි මැණිකෙ. මුදල් තියා ගන්න. මම සල්ලි බලාගෙන උදව් කළේ නැහැ." කියා රුවන්ත වලව්වෙන් පිට වී ආවේය.

සඳරුවන් නිතරම රුවන්ත ගැන විමසුවේ "මොකද රුවන්ත පුතා දැන් එන්නෙ නැත්තෙ" කියමින්ය.

"මොන පුතාද? උන් පුත්තු වෙන්නෙ උන්ගෙ මහ එවුන්ට. දැන් යුනිවසිටි පටන් ගන්න යන හින්ද එන්නෙ නැතුව මග අරිනවා ඇති. එහෙම නැත්නම් ලොකු සල්ලි පොදියක් ගන්න බලාගෙන ඇති." සඳරුවන් සියල්ල නිහඬව අසා සිටියා මිස ඉන් ඔබ්බට වචනයක්වත් ඔහු ගැන කථා නොකළේය.

**ලබන කලාපයෙන් හමුවෙමු**

AIR-SEA-LAND
BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers
Door To Door Service All Part Of sri Lanka
Packing / Moving / WoodenCrating / Storage

| Colombo | Kurunegala | Batticaloa |
|---|---|---|
| LAKSIRI SEVA (PVT) Ltd<br>66 New Nuge Road,<br>Peliyagoda<br>Kelaniya<br>Tel: 011-9411-257-4180 | Laksiri Seva (PVT)Ltd<br>118/96 Negombo Road<br>Malkaduwawa<br>Kurunegala<br>Tel : 037-2052-810 | LAKSIRI SEVA (PVT)Ltd<br>26,Hmyl Lane<br>Main Street,Addapalam<br>Ninthavur,Batticaloa<br>011-94-672051050 |

Toronto: - A.R.Nathan / L.A.Wasanthi 416-321-0400
(Alberta) Edmonton,Calgary Tony: 1-587-708-5665
Ajax / Whitby : Prasad,1-289-200-4288 Montreal: Jeganathan 1-514-519-3213
Ottawa : Kannan -1-613-828-2221 Montreal: Uthayan -1-514-736-2525
Web:www.briskcargo.com Email: info@briskcargo.com
919 Ellesmere Road Suite # 306 M1P2W7



# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2019 මැයි 01 දින සිට මැයි 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)

### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 2 වැන්නේ ගමන් කරන අතර මේ මස 07 වැනි දින සිට 3 වැනි රාශියේ ගමන් අරඹයි. රැකීරක්ෂා දියුණුව ඇති කෙරේ. රැකියා අපේක්ෂිත අයට ලැබීමටත් පත්වීම් ස්ථිර වීමටත් මෙම කාලය ශුභයි. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. විභාග ජය ලැබේ. ආදායම් මාර්ග ශුභ වේ.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 11 වැන්නේ ගමන් කරන අතර මේ මස 10 වැනි දින 12 වැනි රාශියට පැමිණේ. රැකීරක්ෂා ව්‍යාපාර කටයුතු ශුභ වේ. අධ්‍යාපන කටයුතු ශුභ වේ. පදිංචියේ වෙනසක් ඇති විය හැක. කතාවෙහි ශූර වේ. තම මතයට වැඩ කරමින් ඉක්මන් තීරණ ගැනීමට පුළුවන. ආදායම මෙන්ම වියදමද අධික වේ. අනතුරු පීඩා ඇතිවිය හැකි හෙයින් ප්‍රවේශම් වීම මැනවි. පින්දහම් කිරීමෙන් හා ආගමික වතාවත්වල යෙදීමෙන් සහන ලැබිය හැක.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ මේ මස 03 වැනි දින සිට 11 වැනි රාශියේ ගමන් කරයි. රැකියා ව්‍යාපාර දියුණු වේ. තනතුරු වරප්‍රසාද ලැබීමට පුළුවන. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. විභාග ජය ලැබේ. ගමන් බිමන් අධික වේ. අනතුරු පීඩා ඇති විය හැකි හෙයින් ප්‍රවේශම් විය යුතුව ඇත. ආදායම ශුභ වේ.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු 9 වැන්නේ ගමන් කරමින් මේ මාසය ඇරඹේ. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. විභාග, තරගකාරී වැඩකටයුතුවලින් ජය ලැබිය හැක. රැකියා කටයුතු ශුභ වේ. වරප්‍රසාද, රාජ්‍ය අනුග්‍රහය ලැබිය හැක. ව්‍යාපාර කටයුතුවලින් වාසි ලැබේ. ගමන් බිමන් අධික වේ. සංචාරක ගමන් යාමට අවස්ථාව ලැබීමට පුළුවන. ආදායම ශුභ වන අතර වියදමද අධික වේ. අනතුරු පීඩා ඇති වීමට ඉඩ ඇති හෙයින් ප්‍රවේශම් වීම ශුභ වේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 9 වැනි රාශියේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු ශුභ වේ. උසස් අධ්‍යාපනයට අවස්ථාව ලැබේ. විභාග ජය ලැබේ. දෙස් විදෙස් සංචාරක ගමන් යාමට අවස්ථාව ලැබිය හැක. රැකියා ව්‍යාපාර ශුභ වේ. ගේදොර, යාන වාහන, භූමි ලාභ ඇත. ආගමික හා සාමාජික කටයුතුවලට වැඩි වශයෙන් යොමු වේ. ආදායම් මාර්ග ශුභ වේ.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ මේ මස 03 වැනි දින සිට 8 වැනි රාශියේ ගමන් කරයි. පදිංචිය, රැකියාවේ වෙනසක් ඇති විය හැක. රැකියා කටයුතු ශුභ වේ. ව්‍යාපාර කටයුතුවලින් වැඩි වාසි ලැබිය හැක. අධ්‍යාපන කටයුතු ශුභ වේ. ආදායම ශුභ වේ.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු මේ මස 10 වැනි දින සිට 7 වැනි රාශියේ ගමන් කරයි. පිරිස් බලය ලැබේ. මිතුරු මිතුරියන්ගේ ඇසුර ලැබේ. රැකියා කටයුතු ශුභ වේ. වෙළඳ ව්‍යාපාර කටයුතු ශුභ වේ. කීර්ති, ප්‍රශංසා, ප්‍රසිද්ධිය ලැබේ. සතුරු කරදර අඩුය. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. ආදායම් මාර්ග ශුභ වේ.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ මේ මස 07 වැනි දින සිට 8 වැනි රාශියේ ගමන් කරයි. රැකියා කටයුතු ශුභ වේ. උසස් වීම්, තනතුරු ලැබීමට පුළුවන. ව්‍යාපාර කටයුතුද ශුභ වේ. අධ්‍යාපන කටයුතු ශුභ වන අතර වෙනත් අතිරේක දැනුම ලබා ගැනීමට යොමුවීමට පුළුවන. එමෙන්ම සමාජසේවා කටයුතුවලට යොමුවන අතර කලා අංශවලටද යොමු වේ. වැඩ රාජකාරි අධික වේ. ආදායම් මාර්ග ශුභයි. වියදම්ද අධික වේ. අනතුරු පීඩා ඇති වීමට ඉඩ ඇති හෙයින් සැලකිලිමත් විය යුතුය.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 12 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු ශුභ වේ. විභාග ජය ලැබේ. ක්‍රීඩා-කලා අංශයනටද ප්‍රිය වේ. රැකීරක්ෂා ව්‍යාපාර කටයුතු ශුභ වේ. පදිංචියේ, රැකියාවේ වෙනසක් ඇති විය හැක. ප්‍රේම සබඳතා ඇති වේ. අනතුරු පීඩා ඇතිවිය හැකි හෙයින් ප්‍රවේසම් විය යුතුය. ආදායම ශුභ වේ.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. රැකීරක්ෂා ශුභ වේ. ව්‍යාපාර කටයුතු දියුණු වේ. ගේ දොර වාහන ගැනීමේ අවස්ථාව උදා වේ. පිරිස් බලය ලැබේ. අධ්‍යාපන කටයුතු ශුභ වේ. අතිරේක දැනුම ලබාගැනීමට මග පෑදේ. ආදායම ශුභයි. වියදමද අධිකයි. අනතුරු පීඩා ඇතිවිය හැකි හෙයින් ප්‍රවේශම් විය යුතුයි.

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවල නියත අයගේ බලාපොරොත්තු සාර්ථක වේ. රැකීරක්ෂා කටයුතුවල දියුණුවක් දක්නට ලැබේ. වැඩ රාජකාරි අධික වේ. අලුත් ව්‍යාපාර ආරම්භ කිරීම සම්බන්ධයෙන්ද යහපත් වේ. රැකීරක්ෂා අපේක්ෂිත අයට ලැබීමටත් පත්වීම් ස්ථිර වීමටත් මෙම කාලය යහපත් වේ. ආදායම ශුභ වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 9 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. අතිරේකව දැනුම ලබාගැනීමට මග පෑදේ. සංගීත, කලා නිර්මාණ කටයුතුවලට වඩා යොමුවිය හැක. රැකීරක්ෂා කටයුතු සම්බන්ධයෙන් වඩා යහපත් තත්ත්වයක් උදා කරයි. පිරිස් බලය ලැබේ. පිනට, දහමට, ආගමික වැඩ කටයුතුවලට යොමු වේ. ආදායම ශුභ වේ.ආදායම ශුභ වේ.





**එම්. වයි. ධර්මවිජය**
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca

## අදිකාරම් සිතුවිලි...

22 වන පිටුවෙන්

කරන්ට ඉඩ හැරීම සහ සිත මැඬ පැවැත්වීම යන දෙකද අනර්ථකාරවූ මාර්ග වෙති. ඒ එකකින්වත් සංසිඳීමක් හෝ පැහැදිලි ලෙස සිතන්ට ආධාර වීමක් ඇති විය නොහැකියි.

### මිනින්දෝරු මහතා සහ වල් ඌරා

කැළයක් මනින්ට ගිය මිනින්දෝරු මහතකුට වල් ඌරකු මුණගැසුණේලු. වල් ඌරා මිනින්දෝරු මහතා පසුපස එළවන්නට වූයේය. මිනින්දෝරු මහතාද හැකි පමණ වේගයෙන් වල් ඌරාගේ ප්‍රහාරයෙන් බේරීමට දිව්වේය. ගැලවෙන්ට ඔහුට වෙන අතක් නොවීය. මෙසේ දුව යන අතර විශාල තුඹසක් තිබෙනු දැක ඔහු ඒ වටේට දුවන්නට විය. ළඟින්ම ඔහු ලුහුබැඳ ගෙන ආ වල් ඌරාද ඔහු පසුපස තුඹස වටේ දිව්වේය. දැන් දුවන්නාද එළවන්නාද තුඹසේ හරි හරියට දෙපැත්තෙහිය. රවුම් කිහිපයක් මෙසේ යන විට තමා පසුපස මිනින්දෝරු මහතා එළවාගෙන එනවාද යන හැඟීම වල් ඌරා තුළ ඇති විය. ටික වේලාවකදී ඒ හැඟීමෙන් බියට පත්වූ වල් ඌරා ඉවතට පැන වනාන්තරයට රිංගා ගත්තේය.

අප තුළ සිතිවිලි නිරන්තරයෙන්ම ඇති වෙවී නැති වෙවී යන්නේය. එක සිතිවිල්ලක් පවතින්නේ ඉතා සුළු මොහොතකි. ඊළඟ සිතිවිල්ලත් එසේය, ඊළඟ සිතිවිල්ලත් එසේය. සිතිවිලිවල මේ ක්ෂණිකභාවය නිසා සිතීම මිස රඳවාගත හැකි කිසිවක්, අල්ලාගත හැකි කිසිවක්, ඉතිරි නොවෙයි. ඒ සිතීමද එකකට පසු තවෙකක් යනාදී වශයෙන් ගලා යන සිතිවිලි පරම්පරාවක් පමණය.

සිතන්නා සිතීමෙන් නිර්මාණය වූවෙකි. සිතීමක් නැත්නම් සිතන්නෙක්ද නැත. එහෙත් සිතන්නා යන හැඟීම ඇති වූවාට පසු "මම සිතමි" යන හැඟීමක් "සිතන්නා" ඇති කර ගනියි. එතැන් සිට ඒ "සිතන්නා" සිතීම පාලනය කරන්ට පටන් ගනියි.

සිතන්නා මැවුනේ, පහළ වුණේ, සිතීම නිසා බැව් අමතක වෙයි. නිර්මාණය කරන්නාගේත් නිර්මාණයේත් තැන් මාරු වී යයි. දුවන්නා දැන් එළවන්නා වී ඇත.

සිතීමෙන් හටගත්, එහෙත් ඇත්ත වශයෙන් පැවැත්මක් නැති, සිතන්නා යන කල්පිතයට ජීව විලාසයක් පිහිටුවා දෙන එක්තරා භෞතික සිදුවීමක් තිබේ. එනම්, ඇසූ, දුටු, විඳි සෑම දෙයක්ම ඒ ඒ මොහොතේදී මොළයෙහි සටහන් වීමය. මතක්වීම් සිදුවන්නේ ඒ සටහන් නිසාය.

මතක්වීම් වැලක් ඇති වූ විට ඇට වැලක ඇට අමුණන නූල් පට මෙන් සිතන්නා ඒ මතක්වීම් එකිනෙකට සම්බන්ධ කරමින් "මම" නිර්මාණය කරයි. මෙම නිර්මාණය කිරීම මොහොතක් මොහොතක් පාසාම සිදු වෙමින් පවතියි. ඒ සමග "මම" වඩ වඩාත් ඝන වෙයි. තහවුරු වෙයි. ඒ තහවුරු වීමෙන් එක්තරා සුරක්ෂිතභාවයක් සිතන්නාට ඇතිවෙයි. සිතීම ක්ෂණයක් පාසා විනාශ වී යෑම වැළැක්විය නොහැකියි. එය සිතිවිලිවල තාත්වික ස්වභාවයයි. එහෙත් තාත්වික නොවන, නිර්මිත මාත්‍රයක් වන "සිතන්නා" ට දිගටම පැවතගෙන යෑමේ විලාසයක් ආරෝපණය කිරීම අපහසු නැත.

"මම" නිර්මාණයවීම නතර වන්නේ සිතීම මිස සිතන්නකු නැති බැව් පැහැදිලි වූ විට පමණය. මෙලෙස නිර්මාණය වුණු "මම" සිතන්නාගේ පමණක් නොව කරන්නාගේ සහ විඳින්නාගේද විලාසයන් මාරුවෙන් මාරුවට ගනියි. සිතීම, කිරීම, විඳීම, "මගේ සිතීම", "මගේ කිරීම", "මගේ විඳීම" වෙයි.

"මම" හැඟීම මෙසේ තහවුරුවීමෙන් පසු සිතීම, කිරීම, විඳීම, බැඳීම, නිදහස්වීම ආදී සියල්ලෙහි කර්තෘ ඒ "මම" වෙයි. සිතන්නා, කරන්නා, විඳින්නා, බැඳෙන්නා, නිදහස් වෙන්නා ඒ එකම කර්තෘගේ විවිධ අවස්ථා වශයෙන් පෙනෙයි. එවිට කරන්නෙත් විඳින්නෙත් එකම තැනැත්තාය යන හැඟීම තවදුරටත් තහවුරු වන බැවින් ඔහු හොඳ හෝ නරක හෝ කරන්නේ එහි ඵලය බලාගෙනය.

කෙනකු සොරකමක් කරන්නේ සොරාගත් බඩුවෙන් ප්‍රයෝජන ලබන්නා දැන් සොරකම කරන මමමය යන හැඟීමෙන්ය. ඔහු සොරකමින් වළකින්නේ ද සොකරම නිසා ඇති විය හැකි දඬුවම හෝ වෙනත් විපාකයක් හෝ ලබන්නාද දැන් සොරකම් කරන මමමය යන හැඟීමෙන්ය. එසේම කෙනකු පරිත්‍යාගයක් කරන්නේ එයින් ඇති වන සතුට හෝ වෙන ප්‍රයෝජනයක් හෝ ලබන්නා දැන් පරිත්‍යාගය කරන මම මය යන හැඟීමෙන්ය. පරිත්‍යාගය නොකර සිටින්නේද නොදීමෙන් යම් ඉතුරු වීමක් වෙයි නම් එය තමාටම යන හැඟීමෙන්ය.

මෙසේ හොඳ හෝ වේවා නරක හෝ වේවා අප කරන සෑම ක්‍රියාවකටම මූල හේතුව වන්නේ "මම" යන හැඟීමය. සිතන්නකු, කරන්නෙකු, විඳින්නකු ඇත යන හැඟීමය. සිතීම, කිරීම සහ විඳීම, සිතන්නා, කරන්නා සහ විඳින්නා වී තිබේ.

අර වල් ඌරාට සිදුවූ දෙයම නොවේද අපටත් සිදුවී තිබෙන්නේ?

## 'මා හුඟාක් බිත්තර...

28 වන පිටුවෙන්

සිදුවන්නේ ඇමරිකන්වරුන්ගේ වෑයම නිසයි. සිංගප්පූරුවේ චීන ජාතිකයන්ගෙන් බොහෝ දෙනෙක් බෞද්ධ, නැතහොත් පරම්පරා ටාඕවාදීන්. මාත් ඒ අයෙක්. එයින් උගන්වන්නේ ඔබට අවශ්‍ය දේ විශ්වාස කරගෙන ඉන්නයි. මේ අධ්‍යාපනය ලැබූ අය වගේම මේ සැවොම ඉංග්‍රීසි උගත් අය. ඔවුන්ගේ මව් භාෂාව දෙවැනි භාෂාවයි. ඒ නිසා ඔවුන් බටහිර පොත් කියවීමට ඉගෙන ගන්නවා. එසේම බටහිර සංස්කෘතියද ඉන් පසුව අන්තර්ජාලයද හදාරනවා. ඉතින් ඔවුන් කොරියන්වරු වගේ ප්‍රශ්න අහන්න පටන් ගන්නවා. අන්ධ අය මියගොස්, අනිත් අය දේව පිහිට පතා යදිනවා. තරුණ පිරිස් ක්‍රිස්තියානි බවට පත් වී තිබෙනවා. මගේ දුවගේ දැරිය 28 හැවිරිදියි. ඇයත් එවැනි අයෙක්. මගේ බිරිඳ, ඇය කියන්නේ දෙවියන් ඇයට පිහිට වන බවයි.

Q **ප්‍රශ්නය - චීන අධ්‍යාපන ක්‍රමය උගන්වන පාසල් වසා දැමීමට ඔබ තීරණය කළේ කවදා සිටද? ඒ ගැන ඔබ කනගාටු වෙනවාද?**

ලී ක්වාන් යූ - නැහැ. එය ඉක්මනින් සිදුකිරීම ගැන මා කනගාටු නොවෙමි. මා ප්‍රායෝගිකව සලකා බලන්නෙක්. ඔබට චීන භාෂාව දැනගෙන සිංගප්පූරුවේ ජීවිතය ගත කළ නොහැකියි. රජයේ ප්‍රථම යුතුකම වන්නේ ජනතාවට ආහාර සැපයීමයි. මුහුදින් හෝ ගඟින් ඈත පිහිටි ප්‍රදේශයක් හෝ වගා කිරීමක් එහි නැත. එය මා හොඳින්ම අවබෝධ කර ගත්තේ 1968 දී මා හාවර්ඩ් ගිය විටය. මා එහිදී කියා සිටියේ නිෂ්පාදන ව්‍යාපෘති මගින් මගේ රටේ පවතින රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන බවය. ඒ අනුව කර්මාන්ත ශාලා මෙරටට ගෙන්වා විශාල නිෂ්පාදන මධ්‍යස්ථාන අරඹා පරිගණක හා ඒවාවල කොටස් පවා නිපදවනු ලැබිණි. විවිධ ජාතිකයන් වූ ඔවුන් කතා කළේ ඉංග්‍රීසි භාෂාවයි. ඔවුන් කොයි රටක සිට පැමිණියත් කතා කළේ ඉංග්‍රීසි භාෂාවය.

ඒ අනුව චීන භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ අය තුළ කෝපය හට ගැණිනි. මක් නිසාද යත් ඔවුන්ට ලැබුණේ පහත් රැකියා සහ අඩු වැටුප්ය. ඒ කාලයේ විශ්වවිද්‍යාලවල හොඳ සිසුන් අඩුවන්නට වූ අතර ඉතිරි වූයේ වැඩකට නැති සිසුන්ය. දිළිඳු ශිෂ්‍යයන් ඇතුළු කළ අතර ඔවුන් උපාධිය ලබා ගත්තේ අඩු ලකුණු ප්‍රමාණයක් ලබා ගෙනය. ඒ අනුව එම උපාධිය වටිනාකමක් නැති එකක් බවට පත්විය. ඒ අනුව ඔබ රැකියාවකට අයැදුම් කරන විට චීන විශ්වවිද්‍යාලය විසින් ඔබට පිරිනැමූ උපාධි සහතිකය සඟවාගෙන ඔබ ඉදිරිපත් කරන්නේ ඔබේ පාසල් සහතිකයය. එම නිසා එය අධ්‍යාපන අමාත්‍යාංශය තුළින්ම වෙනස් කිරීමට මා උත්සාහ කළෙමි. එයට හේතු වූයේ බොහෝ ගුරුවරු ඇමරිකන් උපාධිධාරීන් වීමය. ඒ නිසා ඔවුන් ඔවුන්ගේ උපාධි ප්‍රබන්ධ සිදුකළේ ඉංග්‍රීසි භාෂාවෙනි. නමුත් ඔවුන් චීන භාෂාවෙන් උගන්වමින් සිටින නිසා ඉංග්‍රීසි භාෂාව අමතක වී ඇත. ඒ අනුව එසේ කළ නොහැකි විය. එම නිසා මා ඔවුන්ව ඉංග්‍රීසි කතා කරන විශ්වවිද්‍යාල සමඟ එකට සම්බන්ධ කළෙමි.

පළමු වර්ෂ කිහිපයේදී විශාල අයහපත් සිදුවීම් ඇතිවිය. නමුත් ඔවුන් උපාධිය ලබන විට ඔවුන්ගෙන් මනාපය ගැන විමසුවෙමි. එනම් ඔවුන්ට වුවමනා වන්නේ පරණ විශ්වවිද්‍යාලයේ ලැබූ උපාධියද එසේ නැත්නම් ඉංග්‍රීසි විශ්වවිද්‍යාලයේ ලැබූ උපාධියද යනුවෙනි. ඔවුන් කැමැත්ත දැක්වූයේ ඉංග්‍රීසි විශ්වවිද්‍යාලයේ ලැබූ උපාධියටය. ඒ අනුව එම ප්‍රශ්නය විසඳීමට හැකිවිය.

Q **ප්‍රශ්නය - මෑත කාලයේදී චීනය දියුණුව කරා පිය නඟමින් සිටියදී ඔබ අදහස් කළේ කුමක්ද?**

ලී ක්වාන් යූ - චීනය අපව ප්‍රාණ ඇපකරුවන් විදියට තබා ගැනීමට උත්සාහ කළත් අපි ඔවුන්ව බැඳීමට කැමැති නෑ. මා අදහස් කරන්නේ අපේ ආයෝජන ඒ රටේ තියෙනවා. මක්නිසාද යත් පැරැණි පරම්පරාවේ අය චීන භාෂාවෙන් අධ්‍යාපනය හැදෑරූ අය. ඔවුන්ට කිසිම අපහසුතාවක් නැහැ. නමුත් තරුණ පරම්පරාව අතර සිටිනවා එහි ගොස් ව්‍යාපාර කළ හැකි අය.

ඔවුන්ට අවශ්‍ය නම් එය ඉක්මනින්ම ඉගෙන ගන්න පුළුවන්. සෑම අයෙකුටම එහි යෑමට අවශ්‍යයි. අපි ඔවුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කරනවා බීජිං, කිංගුආ, හුඩාන් වැනි විශ්වවිද්‍යාලවලට යෑමට. ඒ විශ්වවිද්‍යාල ගන්නේ ටික දෙනෙකුවයි. ඔවුන් ඒත් බැහැ කියා ඇමෙරිකා, බ්‍රිතාන්‍ය, විශ්වවිද්‍යාල වෙත යනවා. ඔවුන් දන්නවා මෙහාට ඇවිත් ඉංග්‍රීසියෙන් තරගකාරීව කටයුතු සිදුවන බව.

Q **ප්‍රශ්නය - සුණු විසුණු වූ රටක් ගොඩනැඟීම විශාල ජයග්‍රහණයක්**

ලී ක්වාන් යූ - එය ජාතියක් නොවෙයි. එය පරිවර්තනය වන සමාජයක්. ජාතියක් ගොඩනැගීමට ඔබට වසර සිය ගණනක් අවශ්‍ය වෙනවා.

Q **ප්‍රශ්නය - ඇත්ත වශයෙන්ම**

ලී ක්වාන් යූ - ඔව්.

Q **ප්‍රශ්නය - තමන් ජාතියක් බව කියන රටවල් බොහෝ ගණනක් තියෙනවා. ඔබ සිතන්න එපා ඒවා ඇත්ත වශයෙන්ම ජාතීන් යැයි කියා.**

ලී ක්වාන් යූ - හොඳයි. අපි ඔවුන්ට ජාතික ප්‍රතිඥාව දීමට සහ ජාතික ගීය ගැයීමට සලස්වමු. නමුත් අපි හිතමු සාගතයක් ආවා කියා. ඔබට කිට්ටුම රටේ සිටින මැලේ ජාතිකයන් ඔබගේ පවුලට යැපීමට හාල් ටිකක් හෝ දෙනවාද?

Q **ප්‍රශ්නය - ඔබගේ අරමුණ බාධක විනාශ කිරීමද?**

ලී ක්වාන් යූ- මම හිතනවා අපි එය මේ මොහොතේ අත්හරිමු කියා.

Q **ප්‍රශ්නය - ඔබ එය එසේ අත්හරිනවාද?**

ලී ක්වාන් යූ - ඔබ උත්සාහ කරන්නේ එය විනාශ කර විශාල අසතුටක් ඇති කරන්නයි. වැඩිහිටි පරම්පරාව කෙලින්ම එයට විරුද්ධව ඡන්දය පාවිච්චි කරනවා.

Q **ප්‍රශ්නය - සිංගප්පූරුව ජයමඟට ගෙන යද්දී, ඉතා අමාරුම කාර්යය ඇත්තේ කාටදැයි කරුණාකර මට කියන්න.**

ලී ක්වාන් යූ - අමාරුම කාර්යය

Q **ප්‍රශ්නය - ඔබටද? නැත්නම් ඔබේ පුතාටද?**

ලී ක්වාන් යූ - එය ඒ ගමනින් යෑමට සැලැස්වීම. එම තත්ත්වයට හැම අංශයෙන්ම පාලනයට එකට එකතු කළ එකක් ලෙස පැවැත්වීමයි අරමුණ. සමානාත්වයට පත් කිරීම නොව එකට එක් කිරීම. සියලු ජනයා සහජීවනයෙන් කල් ගෙවනවා. හැම අංශයෙන්ම අධ්‍යාපනය ලැබූ සමාජයක් බිහිකිරීම මගේ අරමුණයි. විශ්වවිද්‍යාලවල හෝ බහු තාක්ෂණික ආයතනවල උගතුන් කාර්මික ආයතනවල දේශන පැවැත්වීමට යොදවා යන්ත්‍ර සූත්‍ර නිපදවීම, විදුලි උපකරණ තැනීම ආදිය ප්‍රගුණ කොට කාටත් හිතකර පරිසරයක් ගොඩනඟනවා. නැත්නම් පාසල් හැරගිය අය පරාජිතයන් බවට පත්ව අපට දොස් තබයි.

Q **ප්‍රශ්නය - 1960 දශකයේදී නිදහස ලැබූ එමෙන්ම ඔබ තරුණ වියේ පසුවූ සමයේ පැවැති සිංගප්පූරුවට වඩා වත්මන් ලෝකය සංකීර්ණ බව ඔබට හිතෙනවාද?**

ලී ක්වාන් යූ - ලෝකය සෑම දිනයක් පාසාම ගෝලීයකරණය සහ සංකීර්ණය වෙමින් පවතිනවා. ඔබ මේ සූකර වෛරසය දෙස බලන්න. මැක්සිකෝ ජනයාට එය දක්නට ලැබූ කාලයේ එය ගමේදීම විනාශ වන්නට තිබුණා. ඔහු මැක්සිකෝවේ ගමන් නොකිරීමට තිබුණා. දැන් මැක්සිකෝ ගිය විට එය එහි ජනයාට බෝවෙනවා. පැය 24 ක් තුළ ලෝකය පුරාම පැතිරෙනවා.

Q **ප්‍රශ්නය - රටක් ඉදිරියට යද්දී අපි එය හඳුන්වන්නේ ජාතියක් වශයෙන් නොවේ.**

ලී ක්වාන් යූ - ඒ ගොඩනැඟෙමින් පවතින ජාතියක් අපි දකින්නේ සියල්ල හොඳ අතට සිදුවන පැත්තයි.

Q **ප්‍රශ්නය - රටේ ජනතාව සම්බන්ධයෙන් ඔබ තෘප්තිමත්ද?**

ලී ක්වාන් යූ - නැහැ. තෘප්තියක් පිළිබඳව සඳහන් කරද්දී කිව යුතුව ඇත්තේ ඔවුන්ගේ අපේක්ෂා ඉතා ඉහළ බවයි. ඒ උසස් අදහස් ඉටු කර ගැනීමට ඔවුන් බලාපොරොත්තු වෙනවා. නමුත් ඔවුන්ට වුවමනා ඒ සඳහා වැඩි වැඩියෙන් අවස්ථා ලබා ගැනීමටයි.

Q **ප්‍රශ්නය - සිංගප්පූරුව හැම අංශයකින්ම අංක එකට තැබීමට ඔබ අපේක්ෂා කරන්නේ ඇයි? ඇයි ඔබට සිංගප්පූරුව ආසියාවේ විශාල නගර දහය අතුරින් එකක් ලෙස තබන්නට බැරි? එම අදහසේ වරදක් තිබෙනවාද?**

ලී ක්වාන් යූ - අපි අංක එක බවට පත් වීමට වෑයම් කරන්නේ නැත්නම් අපට අංක දහය වෙන්න ලැබෙන්නේ නැහැ. ඔබ අංක දහය වුණොත් අංක එක වීමට වෑයම් කරනවා. ඔබ අංක දෙක හෝ තුන වෙන්න පුළුවන්. ඔබ ඉතා හොඳින් වැඩ කරන්න. ඔබව අංක එකට පත්වන්නේ නැහැ. නමුත් අංක එක වීමට උත්සාහ කරන්න. එය අපේ ආකල්පයයි. දැන් බලන්න අපිට ස්වභාවික සම්පත් නැහැ. උපායශීලී බව පිහිටා ඇති මිනිස් සම්පතක් මිස වෙන කිසිවක් අපට නැහැ.



# ලන්දේසි මඩකළපුවට ආවේ කෙසේද?

**ළඟදී මා ඇමෙරිකාව ගැන අමුතුම ප්‍රවෘත්තියක් ඇසිමි. එහි සත්‍යාසත්‍යතාවය ගැන මට සහතික වීමට නොහැකි වුවද පුවත මෙසේය. ලෝකයේ විවිධ ජාතීන් නියෝජනය වන මානව සාම්පල එහි පදිංචි කරවීමට ඒ රට මහත් වැයමක් ගන්නා බවයි. මෙවන් දෙයක් සුළු වශයෙන් හෝ අපේ රටේ අත් හදා බැලූ අයෙක්ද විය. ඒ දෙවෙනි රාජසිංහයින්ය. රත්‍රං පැහැති කෙස්, සුදෝ සුදු ජව වර්ණ නිල් හා කොළ පාට ඇස් මෙයින් ඔහු කෙතරම් වශී වූවාද යත් ඔවුන්ගෙන් කීප දෙනෙක් අල්ලා කන්ද උඩරට සිර කර තැබීය.**

■ **පද්මා එදිරිසිංහ**

එහෙත් ඇමෙරිකාවේ මෙන් ඔවුන් සියල්ලම නව රට නිත්‍ය පදිංචියට තෝරා නොගත්තේ මේ රජු වෙස් පෙරළෙන්නකු බැවිනි. මෙසේ වෙස් පෙරලුණු විට මරණය පවා නියතය. ඒ නිසා එසේ අල්ලා ගත් බොහෝ අය කෙසේ හෝ ආපසු පළා ගියහ. සුප්‍රකට රොබට් නොක්ස් මේ ගණයට අයත්ය. ඔහුගේ ග්‍රන්ථයේ එක් තැනක ඔහු මෙවන් දෙයක් සඳහන් කරයි. ලන්දේසි බස ඉගෙන ගැනීමට රජු ලන්දේසි තරුණයකුගේ ආධාර ලබා ගත් බවද එසේ ඉගෙන ගැනීමෙන් පසු ඔහුට 'ගිබරිෂ්' නැතහොත් 'විගඩම් බසක්' ඉගැන්වීමේ වරදට ඔහුගේ හිස ගසා දැමීමට අණ කළ බවත්ය.

මේ ආරංචියෙන් පසු තමාටද රජුට ඉංග්‍රීසි ඉගැන්වීමට ආ ඇරැයුමෙන් පසු 'විගඩම් බසක්' ඉගැන්වීමේ චෝදනාව මත තමන්ටද ඒ ඉරණමම අත් වේ යයි යන සැකය මත නොක්ස් මාලිගාව පැත්තේ කිසි දිනෙක නොගිය බවද ඔහු ලියයි. නොක්ස් තම මොළය පාවිච්චි කළ බැවින් පණ නල රැක ගෙන ආපසු සිය රටට පැන ගත්තා පමණක් නොව ලෝක ප්‍රකට පොතක්ද අපේ රට ගැන ලිවීමට එම පණ නල උපයෝගී කර ගත්තේය.

එසේ පලා නොගියෝ ඇතැමෙක් මරු දුටුහ. වඩා වාසනාවන්තයෝ රජුගේ අනුග්‍රහය ලබමින් මෙහිම පැළපදියන් වූවා පමණක් නොව ජාති වාදය බොරු කරමින් සිංහල ජාතියට ඇතුළු වූහ. ලැනරෝල්ලා, දස්කොන් නැතහොත් ගැස්කන්ලා මේ ගණයට අයත්ය. රජ බිසවක් සමග පටලැවිල්ලක් නිසා දස්කොන් පරපුර තරමක් පසු බෑවද ලැනරෝල් පරපුර සිංහල සාහිත්‍ය හා භාෂා ප්‍රබෝධයට ප්‍රබල දායකයින් බවට පත් වූහ.

කෙසේ වුවද රාජසිංහයින්ගේ මේ 'චාපල්‍ය' ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් හැඳින්විය නොහැකිය. එහෙත් අප දිවයිනේ භූගෝලීය පිහිටීම නිසා සාගරය හරහා සතර වටින් විවිධ ජාතින් මෙහි එකී එක් කාල වකවානුවල සුළු වශයෙන් හෝ පදිංචි වීම නිසා ඇමෙරිකාව ආයාසයෙන් ගොඩ නගා ගැනීමට උත්සාහ කරන දේ අප රටේ ඉබේම වාගේ ගොඩ නැගී ඇති බව පෙනේ. මට එය පැහැදිලිව පෙනුණේ මඩකළපු නගරයේය. ඒ නගරය හා අවට ප්‍රදේශය විවිධ ජාතීන්ට නිවැසිය. ඔවුන් සියල්ලම ගැන ලිවීමට අදහස් නොකරමි. එහෙත් එක් ජන කොටසක් ගැන පමණක් ලිවීමට අදහස් කරමි. ඒ එහි නිවැසි ලන්දේසි පවුල් විශේෂයක් ගැනය. බැටික්ලෝ බර්ගර්ස් යන ගණයෙන් මොවුන් වෙනස් යැයිද මට සිතේ.

උතුර නැගෙනහිර යුද ගිනි ඇවිලෙන සමයේ මා මඩකළපු යෑමද එක්තරා අරුමයකි. එහි පසුබිම මෙසේය. විද්‍යාපීඨ අධ්‍යක්ෂ තනතුරින් මා විශ්‍රාම යාමෙන් පසු අවලංගු කාසියක තත්ත්වයට මම පත් වුනෙමි. ඒ අපේ රටේ ගති ස්වභාවයයි. එය ප්‍රසන්න තත්ත්වයක් නොවන බව පමණක් කියා නවතිමි. මේ අවලංගු කාලයේ මට අධ්‍යාපන වැඩ සටහනකට ඇරැයුම් කළ එකම විද්‍යා පීඨය ද්‍රවිඩ මාධ්‍ය විද්‍යා පීඨයකි.

ඒ මඩකළපු විද්‍යා පීඨයයි. තරමක අමුතු පළාතක් බැවින් මම ඒ නගරයේ ඇවිද්දෙමි. කැඩුණු සිංහලෙන් හෝ ඉංග්‍රිසියෙන් කඩ සාප්පුවල වෙළෙන්දෝ මා සමඟ රටේ තත්ත්වය ගැන කතා කළහ. කථිකාචාර්යවරයෙක් මා 'ඩච් බේ' (Dutch Bay) වෙත කැඳවාගෙන ගියේය. ඒ එහි සිටින ලන්දේසීන් දැක බලා ගැනීමටය. එහෙත් සුනාමියෙන් ඩ බේ නැතහොත් 'ලන්දේසි බොක්ක' විනාශ වී ඇති බව ඔහු පවා නොදැන සිටියේය. එයින් දුර්මුඛ නොවූ ඔහු ඔවුන්ගෙන් කොටසක් පදිංචිව සිටින වෙනත් වීදියකට මා කැටුව ගියේය. බර්ගර් ජාතිකයන් අපට අමුතු ජාතියක් නොවේ. එහෙත් මොවුන් හමු වූ විට ඔවුන්ගේ විශේෂත්වයක් දුටිමි.

මම 17 වැනි ශත වර්ෂයේ මුල් දශකයට මගේ සංකල්පනය මත නැගී පළා ගියෙමි. ඒ කන්ද උඩරට පළමුවැනි විමලධර්ම පාලන සමයයි. ඔහුගේ වත ගොත කවුරුත් දන්නා බැවින් මෙහි නොලියමි. සිංහල ජාතියේ හා බෞද්ධාගමේ පුනර්ජීවනයට මුල් වූයේ මොහුය.

එකල අරුම පුදුම දේ සිදු වූ කාලයකි. පරංගීන්ගේ සෙවනෙහි සිය යෞවනත්වය ගත කරමින් යුද ශිල්පය ප්‍රගුණ කළ ඔහු ඔවුන්ගේ කාලතුවක්කු ඔවුන්ටම පසු කලෙක එල්ල කළේය. ඔවුන් නෙරපා දැමීමට ඉන් පසු ලන්දේසීන් සමග මිත්‍ර සම්බන්ධයක් ඇරැඹීය. ස්පිල්බර්ජන්ගේ ලංකා සම්ප්‍රාප්තිය ඇති වූයේ මේ නිසාය. යට කී විදියේ පදිංචි පවුල කොට්ටියාරමේ සිට මේ දූතයා යන අතරේදී දමා ගිය අයගෙන් පැවැතෙන්නන්ද යන පැනය මට මොහොතකට ඇති විය.

එතරම් ඔවුන් ඒ ජාතියේ මූලික ලක්ෂණ පෙන්නුම් කරති. ඔවුන් එකිනෙකා සමග කතා කරන්නේ ලන්දේසි බසින් බව ඔව්හු කීහ. අද අපේ බර්ගර්වරු කතා කරන්නේ ඉංග්‍රීසියෙනි. නැතහොත් සිංහලෙනි. ලන්දේසි බසින් නොවේ. මේ අයගේ ආගම පවා රෝමානු කතෝලික ආගම නොවේ. රෙපරමාදු ආගම් විශේෂයකි. ඔවුන්ටම ආවේණික සංස්කෘතියක් ඔවුන් ආරක්ෂා කරති. ඔවුන් මඩකළපුවට පාත් වූයේ කොහින්ද? ඔවුහු පවා එය නොදනිති.

මඩකළපුව ලස්සන නමක් නොවේ. මඩින් පිරුණු කළපුව එහි අදහසයි. පුරාණයේදී මේ පළාතට ලස්සන සිංහල නමක් භාවිත විය. ඒ දිගාමඩුල්ල නොවන්නේද? මඩකළපුවේද ගවේෂකයෝ වෙති. එක් අයෙක් නම් Batticaloa Bibliography ග්‍රන්ථය සංස්කරණය කළ එස්. සෙල්වරාජාය. ඔහු මඩකළපු පුස්තකාලයේ අධිපති බව මට යාංතං මතකය. මට ඔහු තෑගි දුන් ඒ කෘතිය අනුව අද මඩකළපුවේ දෙවෙනි ජන කොටස බවට පත් වී ඇති ද්‍රවිඩයන් මෙහි පැමිණ ඇත්තේ මලබාර වෙරළිනි. ඒ ශත වර්ෂ ගණනාවකට ඉහතදීය. සුන්දර කලපුව ඈතින් දිස් වෙත්ම මඩ්ඩකළප්පාඩ කියා ඔවුන් කෑ ගැසුවේලු. එසේ කෑගැසූ පමණින් නම ස්ථිර විය. මඩ ගොඩක් දුටු විටද හැඟීම් ඉලිප්පේ. එහෙත් එය මඩ ගොඩක් නොවේ. අතිරමණීය කලපුවකි.



අද ප්‍රධාන වශයෙන් මුස්ලිම් හා ද්‍රවිඩ ජනතාවගේ වාසභූමිය වී ඇති මේ ප්‍රදේශය අතීතයේ ප්‍රබල රුහුණු රාජ්‍යයේ ඉතා වැදගත් කොටසකි. දුටුගැමුණු රජ සිය සහෝදරයාට බාර දුන්නේ වී අස්වැන්නෙන් සශ්‍රීක මේ ඉසව්වයි. එහි අගනුවර දීඝවාපිය වශයෙන් සැලැකේ. මහාවංශයේ ඒ දිගාමඩුල්ලය. විවිධ සිදුවීම් නිසා මේ ප්‍රදේශය නොයෙක් ජන කොටස්වලට කල් යාමේදී නිවැසි විය. අද මේ පළාතේ ප්‍රධාන ජන කොටස බවට පත් වී ඇති මුස්ලිම්වරුන්ගේ ආදි මුත්තන් එහි පදිංචි කරන ලද්දේ විමලධර්ම සූර්යයන්ගෙන් පසු කන්ද උඩ රට රජ පැමිණි සෙනරත් රජු විසිනි. ඒ යට කී ඇමෙරිකන් ප්‍රතිපත්තියෙන් මෙහෙය වී නොවේ. ඔවුන් පෘතුගීසින්ගෙන් බේරා ගැනීමටය. පරංගී හා මුවර්වරු ජාත්‍යන්තර වෙළෙඳ ක්ෂේත්‍රයේ උග්‍ර වෛරක්කාරයෝය. මේ නිසා නිරිතදිග වෙරළේ පදිංචිව සිටි මුවර් නැතිනම් මුස්ලිම්වරු නොයෙක් පීඩාවලට භාජන විය. ඔවුන්ට අනුකම්පා කළ මේ රජු මුස්ලිම් පවුල් 4000 ක් මේ වෙරළ ආසන්නව පදිංචි කළේය. රට අභ්‍යන්තරයටද කල් යාමේදී ඔවුන්ගේ ජනාවාස පැතිරිණි. ඒ ඔවුන්ගේ තවලම් ගිය මාර්ග දිගේය. තවලමක් කොහි නතර වේද එතැන මුස්ලිම් ගම්මානයක් උපත ලැබීය.

තවලම් යන්න මුස්ලිම් සංස්කෘතිය හා බැඳුණු වදනක් බව මා කියෙව්වේ ෂබිර් නම් ලේඛකයා ලියු ග්‍රන්ථයකය. එය බේරුවල ඉස්මත් නම් ව්‍යාපාරිකයා මට තෑගි දුන් ග්‍රන්ථයකි. ඔහු මගේ පාඨකයෙකි. මා දිරි ගන්වමින් දුරකථන පණිවිඩ එවීම සිරිතක් කර ගෙන ඇත. මගේ 'කර්ස්' නම් ඉංග්‍රීසි නවකතාව ඔහු අගය කරයි.

මඩකළපුවට ආපසු යමු. අද මේ ප්‍රදේශයේ සියේට හැටක් පමණ ජනයා මුස්ලිම් හා ද්‍රවිඩ ජන කොටස්වලින් සැදුම් ලද බව පැහැදිලිය. අපේ රටේ විවිධ ජන සංකීර්ණත්වය විචිත්‍ර පැදුරු මෝස්තරයක් හෝ රටාවක් වශයෙන් සලකන්නේ නම් ඒ රටාව වඩා රමණීය කරන්නට ප්‍රධාන ජන කොටස් පමණක් නොව යට කී කුඩා ජන කොටස්ද සම්මාදම් වී ඇති බව පෙනේ. ඒ විවිධත්වය ආශිර්වාදයක් වශයෙන් සැලකීමට පුරුදු වීම කාගේත් හිත සුව පිණිස වේ. එකිනෙකා සමඟ කා කොටා ගැනීමට වඩා එය යහපත්. එසේම එය බෞද්ධ චින්තනයට අදාළ විකල්පයක් නොවන්නේද?

## සියවස පිරූ අම්මාට

දස මස කුස දරා අප බිහි කළ අම්මා
රස කිරි පොවා ජීවය සරි කළ අම්මා
සිය වස සරි කළා පසුගිය දින අම්මා
අස අද අපේ පොඩි දරුවෙකි අපෙ අම්මා

හොඳින් නරක වෙන් කර පැහැදූ අම්මා
රුවන් රන් රිදී නොම ඇදහූ අම්මා
ගිලන් අයට සත්කාරය කළ අම්මා
නිවන් පුරට මග හෙළිකර ගත් අම්මා

මදහස නගයි සඳ පෑයූ විලස මුවේ
සෙනෙහස කරුණාව සැම වෙත නිබඳ මැවේ
සරතැස නිවන දිවි ගමනෙහි අපගෙ ලොවේ
සිහිලැස ගඟුලක්ය නිරතුරු සඳන සුවේ

සතුටයි සිනාවයි ඔබගේ මිතුරු කැල
ලද පමණින් සැනසුණා නැහැ මසුරු මල
නිවහන බිම අසරණුන් හට පුදා හල
වෙසතුරු ගුණය අම්මේ කළ නොහැක මිල

වදනින් කියා නිමවනු බැරි ඔබගෙ ගුණෝ
බිඳකින් මෙසේ කවකට මා යොදමි අනේ
මිහිරෙන් පිරුන සියවස ලැබූ ගත වූ දිනෝ
දැහැමින් සුවෙන් තව කල් දිවි ගෙවනු මිණෝ

**තයාගා ගමගේ - බ්‍රැම්ප්ටන්**

## අත් හරිමි මම සසර

අතර මගදී බැඳි පෙමින්
සසර සරනාවිට දුකින්
බෙහෝ වෙති හමුවූ දනන්
සිටිමි උන් අත් හැර සිතින්

මතක නැත සිටි බව පෙමින්
ගැලූ කඳුළැලි යුග නෙතින්
සබඳ මතු සසරෙදි නිතින්
ඔබද හිමි නැත මට ඉතින්

දෙසූ සදහම් බුදු මුවින්
හදේ අලවා බැති සිතින්
පසක් කරනට අම නිවන්
සරණ වේවා මට නිතින්

**පියසීලි විජේනායක**

## අනේ අපේ ලක් මව හඬවන්න එපා !

මළවුන් තුළින් උත්ථානය ලැබුව දිනේ
සමරණු පිණිස ගම්වාසින් එකතු වුණේ
ජේසුස් වහන්සෙගෙ මහිමය දක්වමිනේ
සැම දෙන රොක් වුනිය පූජාවට මෙදිනේ

සුපුරුදු ලෙසට පූජාසනයත් සැකසී
මව්පිය දූ දරුන් නව ඇඳුමෙන් සැරසී
පල්ලිය තුළට ඇතුළුව දණ නමා නිසී
ජේවුනි බැතින් කියනට යැදුමන් ඇවැසී

කිසිවෙකු නොසිතු මොහොතක මහ ඝෝර හඬක්
නඟමින් යමක් පුපුරා යනු දුටු මොහොතක්
අදහනු නොහැකි ලෙස සිදුවුණු කලබලයක්
සැණෙකින් වැනසුනා ජීවිත සිය ගණනක්

'බලගතු බෝම්බය' කියනා රුදුරු යකා
සැනසුම සමාදානය මොහොතකින් මකා
හදවත් කළා කුඩුපට්ටම් කර නිසැකා
ලක්මව හැඬෙව්වා හද පුරවමින් සැකා

උදාසීන නිලදරුවන් සිටින විට
ජනතා දිවිය රැකගනු කෙලෙසක එවිට
වගකීමක් නොගෙන කටයුතු කරන විට
අරුමයකුදු නොවේ භීෂණ දකින විට

අනේ අපේ ලක් මව හඬවන්න එපා
අසල්වාසි අය හට දුක් දෙන්න එපා
පවුල් වනසලා හදවත් තලනු එපා
ආලෝකයෙන් අඳුරට ඇද දමනු එපා

අඳුර මැදින් වුව එළියක් සොයා යමු
ජාතිය ආගමට සම තැන ලබා දෙමු
මිනිසත් බවේ වටිනාකම හදට ගමු
යහ ගුණ තුළින් යළි අප රට ගොඩ නඟමු

**ෆ්‍රීඩා විල්ලවරායන් - ටොරොන්ටෝ**

## kඩක වැදය

මානය
බිඳ දමා
සමානව
විසීමේ
විමුක්ති
මගට
යොමුවන
පිළිවෙතක
තැතය

**කරුණාරත්න අත්තනායක**

## බුදුන් දකින්නට

කරුණා දයා මෙත් ගුණ සදහම් කිරණ
පායා වෙසක් සඳ සරසයි මේ දෙරණ
යහ ගුණ පුරා අව ගුණ කළහොත් හරණ
බුදු හිමි දැකිය හැක ලැබ ගෙන බුදු සරණ

**ඇල්බට් ඇම්. ලියනගේ**

## නුඹ විඳින දුක් ගැහැට

නුඹ විඳින දුක් ගැහැට අපමණයි
අවමාන නින්දා ද එපමණයි
නෙත කඳුළු දරාගෙන - දරුවන්ද සදාගෙන
වෙහෙසුණත් නුඹ තාම තරුණයි

අප නමින් එදා සිත උපන් පෙම
රිදුම් දෙයි නුඹ ඇසේ කඳුළු දැක
නිදහසේ ගලා ගිය සෙනෙහෙ ගඟ
අතරමග වියැලුනේ කෙලෙසකද

පිහිටවනු කෙසේ මම අද නුඹට
මගෙ ලොවේ රැජින නුඹ නොවන කොට
මිල මුදල් අතමිටේ නොමැති වුව
බිලි නොදී රැක ගනින් නුඹේ කය

**චම්පා කුමාරසිංහ - මිසසාගා**

## බර

පටව ගෙන
බර
කන්දරාවක්
ඇදෙයි ගැල
හති දදා
අදී ගොනු
ගිය පසුව
නිසි තැනට
බරින් වූ
නිදහස්ය
එහෙත්...
ගැල සමඟ
ගමන් කළ
හාම් පුතු
හිස පුරා
දැරූ
බර
මියෙන තුරු
හිසේ
බර

**සූරිය මැදගෙදර**

## උකස් කළ ජීවිතය එගොඩ කළ මාණිකය

මුදු සුළඟ වෙලෙනා පොඩි කඳුගැටය
සුන්දර මතක තෝතැන්නකි සරසවිය
දකුණු ලකට පිං කෙතකිය මේ රුහුණ
සුවිසල් කන්දකි මහවිදුධරයින්ගෙන් පිරුණ

අවට සුන්දරද බිම මේ තරම් ව
බැලුවම ගුවන සිට කොයි තරමටම දුවී
යායක් සේ පිහිටි බිම මහ ගොඩනැගිලි
තැනුවේ ගහකොළට බාධා නොවන අටී

විදු දැය දැනුම රට රටවල් යා කෙරෙන
ගම් බද පරිසරයේ සිටියත් නැත වෙනස
භාෂා ඥාණයත් මහපොළොවට නොපෙන
තරමට විශාලයි පොත පත තුළ රැඳෙන

**අසංක ප්‍රභාත් උඩතියවල**

The Diamond Realty Inc Brokerage

The Diamond Realty Inc. Brokerage

# Looking to List, Buy or Rent?

**Get your Listing Noticed!**

**Newspaper ads**

**Weekly Open Houses**

**Free Market Evaluations**

**Network of professionals to help you achieve your real estae goals!**
(Mortgage specialists, lawyers etc,)

**AND MORE!**

# DAN

**Attana Kumbure Gedara (BSc. Hons)**

**647-995-3391**
**danakg.realtor@gmail.com**



REALTOR®

MLS MULTIPLE LISTING SERVICE®

**DIRECT: 647 995 3391**
**DANAKG.REALTOR@GMAIL.COM**
**OFFICE : 416 235 2500 | FAX: 416 235 2828**



# සිංහල ආහාර සංස්කෘතියේ අරුත කියා දුන් රාජ භෝජනය

රාජ භෝජනයක් කියන්නේ එසේ මෙසේ කෑම වේලක් නම් නොවේ. 'රජෙක් වාගේ කන්න ඕනෑ' කිව්වම බොහෝ දෙනෙක් තේරුම් ගත්තේ බඩ කට පිරෙන්න මහා බත් පිඟානක් කනවා කියාය. නමුත් ඉතිහාසයේ එවන් වැකියක් පට බැඳී තිබෙන්නේ, ඖෂධීය ගුණයෙන් යුතු, ශක්තිය වඩන, නිරෝගිමත් කෑම වේලක් නොකඩවා ආහාරයට ගන්නේ රජ්ජුරුවෝ පමණක්ම බවට මහජනතාව පිළිගත් සත්‍යයක්ව පැවතීම මතයි.

රාජ භෝජනය සැකසීම අපූරුය. සැබැවින්ම එය ඓතිහාසික ගාම්භීරත්වයක් සහිත සංස්කෘතික ක්‍රියාවලියකි. මනා පෙළ ගැස්මකි. රාජ භෝජනාගාරයේ දෛනික වැඩපිළිවෙල කොපමණ නම් සංකීර්ණද යන්න මොනවට පැහැදිලි වන්නේ එක් වේලක් සැකසීම සඳහා පෙළ ගැසී සිටින සේවක පිරිසත් භෝජනය සැකසීමේ ක්‍රමවේදයත් පිළිබඳ සලකා බලන කලය. එහි යටගියාව අදටත් අපට පරිශීලනය කළ හැක්කේ, පුස්කොළ පොත් කියැවීමෙනි. අදාළ පුස්කොළ පොතෙහි මූලික වෙළුම් දෙකක් තිබී ඇති අතරම අදටත් එය ශ්‍රී දළදා මාළිගාවේ ප්‍රාචීන පුස්තකාලයේ සුරැකිව ඇත්තේය.

### දායක වූ පිරිස

එකල රාජමාළිගාවේ රාජභෝජනය සැකසීම මූලික සහ ප්‍රධානතම කාර්යය වූ අතර ඊට දායක වූ පිරිස ගණනින් සූසැටකි. ඉනුත් මුල් තැන ගත්තේ සොළොසකි. බෙහෙත්ගෙයි මුහන්දිරම්, බත් වඩන නිළමේ, මුලගිනා, මඩප්පු නිළමේ, මඩප්පු රාළලා, පිහන රාළලා, දෙහි දොඩම් කාරයෝ, පැහිදුම්කාරයෝ, තටුකොළ පහින්දම්කරුවෝ, ඇතුළුව රාජෝත්තමයන්ගේ ආයු වඩන්නට දිවි කැප කළ පිරිස බොහෝය.

රජ්ජුරුවන් උදෙසා වන ආහාර වේල් සැකසීමට වෙන් වෙන් වශයෙන් සේවක පිරිස් සිට ඇත. දිවා ආහාරය සැකසීමට පෙළ ගැසෙන්නේ රජ්ජුරුවන් උදෑසන මළපහ කළ අවස්ථාවේ සිටය. අද මෙන් නොව එදා සියල්ල සිදුව ඇත්තේ කලටය. වෙලාවටය.

රජු අවදි වූ මොහොතේ සිට ඒ අසල දැවටෙන්නේ බෙහෙත්ගෙයි මුහන්දිරම්ය. ඔහු රජුගේ මානසික තත්ත්වයත් පෙර දින නොවූ යම් වෙනසක් වේද යන්න ගැනත් විමසිලිමත් වෙයි. මුව සෝදා පඩික්කමට හල කෙළ මුසු ජලයද, මුත්‍රා සහ මළපහද, හොඳින් පරීක්ෂා කරන බෙහෙත් ගෙයි මුහන්දිරම් එදින රජුගේ ශරීර සෞඛ්‍යයේ වතගොත පිළිබඳව මුලුතැන්ගෙයි බත්වඩන නිළමේ වෙත දැනුම් දෙයි.

බෙහෙත් ගෙයි මුහන්දිරම්ගේ සේවාව ගම්පොළ යුගයේද පැවැති බව සඳහන්ය. ජාත්‍යන්තර මට්ටමේලා සැලකෙන එම වෛද්‍ය ක්‍රමය මුස්ලිම් ජනයාගෙන් උගත් බවත් වේගිරිය හා තදාසන්න ප්‍රදේශවල විසූ වෛද්‍යවරු අතර ප්‍රචලිතව පැවැති බවත් ඉතිහාස කරුණු පෙන්වා දෙයි.

### කෑම වට්ටෝරුව

බත්වඩන නිළමේ නොහොත් මුලුතැන්ගෙයි ප්‍රධානියා බෙහෙත්ගෙයි මුහන්දිරම්ගේ පණිවුඩයට පසුව රජුගේ දිවා භෝජනය ගැන සැලකිලිමත්ව ඊට සුදුසු-නුසුදුසු ආහාර වට්ටෝරු සකසයි. බොහෝවිට දෛනිකව උදෑසන හය හෝ ඊට ආසන්න වේලාවක සිට දිවා ආහාරය සැකසීම අරඹයි. බත් වර්ග හතක් මස් මාළු වර්ග තිහක් සහ කොළ එළවළු වර්ග තිහක්ද කැවිලි වර්ග පනස් පහක්ද ගිතෙල් වෙඬරු හෝ කිරි ආශ්‍රිත ආහාරද ඖෂධීය ශාක වර්ග ඇසුරින් සකසන ලෙයිය වර්ගද හීනටි හාල් අතුරුපසද කිරි පැණිද බුලත් විටද ඇතුළත්ව රාජ්‍ය දිවා භෝජන වට්ටෝරුව සැකසේ.

එකල දිනපතා සැකසෙන රාජ භෝජනය නිත්‍ය රටාවක්ම බැවින් මුලුතැන්ගෙයි සේම ඒ අවට සේවය කළ උදවිය සිය ඒකාකාරී බව පලවා හරිනු වස් කවි කීහ. ඒ අතර උන් ඇතැම්හු හිට්වන කවි තැනූහ. ඇතැම්හු උසුළු විසුළු පිණිසද කවි තැනූහ. ආහාර පිසින්නෝද සිය කාර්යය කවියට පෙරළා ගායනා කළෝය.

මුංපියලි නැලියක
සහල් ගනු තුන් නලියක
කෙටූ පිටි විතරක
උයාවී කිරිලා පදම් දැක
පත්පැර වියලනු
අත්සුනු සකුරු මෙහිලනු
ඉස ඉස බැද ගනු
ඊට මුතුලාල යයි නම් දෙනු

.....ආදි ලෙස ගායනා කර තිබේ. යටවර නමැති කිවිඳු රාජ භෝජන ආහාර වට්ටෝරු කවි තුන්සිය හතලිස් හතරකින් පුස්කොළ පොතෙහි ලියා ඇති අතර පසු කාලීනව පුංචි බණ්ඩාර සන්නස්ගල පුස්කොළ පොතෙහි කවි සංස්කරණය කොට කෑම වට්ටෝරු එකසිය විස්සක් පමණ ග්‍රන්ථාරූඪ කර ඇත.

රාජ කෑම වට්ටෝරුවේ බත් වර්ග හත, සිරෝවල්ලි සම්බා, බාස්මතී, සුවදැල්, ඇතුළු අග්‍රගණ්‍ය සහලින් සමන්විතය. මහනුවර යුගයේ වාසලට දෛනික සහල් සැපයූවේ පැණිදෙණිය, ගුරුදෙණිය අටුවලින් බවද සඳහන් වේ.

### අනුභවය

බත් වඩන නිළමේගේ ආහාර වට්ටෝරුව මඩප්පු නිළමේගේ අධීක්ෂණය යටතේ මඩප්පු රාළලාගේ කැපවීමෙන් රසවත් වේ. සාදා නිමකරන සෑම අහරක්ම ආරක්ෂා කරන්නේ පිහන රාළලා විසිනි. සෙසු කටයුත්තන්හිදී සේම දෙහි දොඩම්, පොල්, තුනපහ, දර, කෙසෙල් කොළ, පැණි හකුරු, ආදී සියලු අමුද්‍රව්‍යය මාළිගා මුලුතැන්ගෙට සපයන්නේ ඒ ඒ රාජකාරියේ නියුතු උදවිය විසිනි. අරක්කැමියා හෙවත් මුලගිනා ලුණු ඇඹුල් නොබලා, යස පදමට රස ගලපන්නේ සිය පලපුරුද්ද පෙරදැරිවය. මාළු පිනි හැටද කැවිලි පනස් පහද සෙසු සියලුම ආහාරද පිසිනුයේ උදෑසනමය. පෙරදා සැකසූ කිසිවක් රාජ භෝජනයට කැප නොවේ. පිසින ලද සියලුම ආහාර රස බැලීමේ වරම් ඇත්තේ, අගු බලන්නාට පමණි. ඔහු සියලු ආහාර ගෙන සිංහල පැයක් පසු වූ තැන බෙහෙත්ගෙයි මුහන්දිරම් ඔහුව පරීක්ෂා කොට, අනතුරුව රජ්ජුරුවන්ට කෑමට ආරාධනා කරයි.

රජු ආහාර ගන්නේ, කෑම ශාලාවක නොවේ. මාළිගයේ හිස් ශාලාවක කිසිවෙකුටත් නොපෙනෙන මුලුගැන්වූ ස්ථානයක සිටය. බුමුතුරුණක් මත එරමිණිය ගොතා හිඳ ගන්නා රජ තෙමේ ඔඩොක්කුව මත රන් සළුවක් එලනු ලබයි. දිය වඩන නිළමේ පැමිණ රන්තලියක වතුර බහා අත සෝදවා තෙත මාත්තු කොට ඉවත්ව යයි. අනතුරුව බත්වඩන නිළමේ පැමිණ රන්තැටියක් තබා, බත් හැන්දක් එක් ව්‍යංජනයක් බැගින් වරින් වර බෙදනු ලබයි. ව්‍යංජන අතරේ තිරිවානා හොද්ද විශේෂ වන්නේ එය වාජීකරණය සඳහා වරා පොතු සහ තිරිවානා ගල් උපයෝගී කොට සකසන ලද්දක් බැවිනි. බත් හා ව්‍යංජන ඇතැයි රජ සැලකල පසුව, කැවිලිද, කිරිවලින් තැනූ අහරද, හීනටිහාල් අතුරුපසද, කිරි පැණිද ආහාරයට ගනී. අනතුරුව රාජකීය වෛද්‍යවරයා නොහොත් බෙහෙත්ගෙයි මුහන්දිරම් සැකසූ ලෙයිය වර්ග අහරට ගනී.

මේවා තලියක දමා පිළිගන්වද්දී රජ එය ලෙවකෑ යුතුය. නිසි ඖෂධීය ගුණ සිරුරට ලැබෙනුයේ එවිටය.

රාජ භෝජනය ඓතිහාසික වූයේ, සූප කලා සාහිත්‍යය හරහාය. නිරෝගිමත් ජීවිතයක් උදෙසා එවන් සාහිත්‍යයක හරය අදටත් වැදගත් වන බව සිතීමද වැදගත්ය.










# INTERNATIONAL BUDDHIST DAY CELEBRATION

ථෙරවාද, මහායාන සහ වජ්‍රයාන බෞද්ධ සම්ප්‍රදායයන්ට අයත් සියලුම බෞද්ධ විහාරස්ථානයන්හි සහභාගිත්වයෙන් සංවිධානය කරන ලද 5 වන ජාත්‍යන්තර බෞද්ධ දිනය මිසසාගා විහාරස්ථානයේදී සමරනු ලැබූ අවස්ථාව කැමරා ඇසින්....

සේයා රූ සටහන් - නිමල් එගොඩගෙදර






















EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca



**We'll Target The Best Rates!**

Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.

**Mortgage Renewals and Refinancing**

First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!

**Investment Properties**

Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!

**Safe and Secure Application**

Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.

**Manzeel Patel**
Mortgage Broker - M11002628

**Direct: 647-272-8355**

Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7

T 416 - 840 - 6368
F 416 - 850 - 5153

info@everythingmortgages.ca
www.everythingmortgages.ca

MERIX Lendwise · Scotiabank · Paradigm · Alterna · Equitable Bank · blueprint · Bridgewater Bank · MCAP · Industrial Alliance · radius financial · ICICI Bank · National Bank · Canadiana · CMLS Financial · First National Financial LP · B2B Bank · Optimum Mortgage · TD · XCEED · Street Capital · Fisgard · Home Trust · Homequity · IC Savings

The Power Tools To Sell Your Property

Renovation Cost upto $4000.00 Free

Advertising Signage & Photos Free

Lawyer's Fee Free

Market Evaluation & Home Inspection Free

Home Staging Free

Open Houses Showing Free

**Some conditions apply. This promotion can be discontinued without prior notice. Not intended to solicit buyers or sellers currently under contract.

Save money when selling your home!

Selling real estate is what I do. I can help you save thousands when listing your property. You will pay less and get a full service listing with no hidden fees. My home marketing strategy will attract the greatest number of potential buyers and help you sell quickly and hassle-free for the best value.



Nishantha Donsiyambalapitiyage
Real Estate Sales Representative

Mobile: 416 417 0763
Email: nishan.don@gmail.com
Mississauga Office: 350 Burnhamthrope Dr. W. Unit 127
Scarborough Office:2250 Markham Road Unit #3 Scarbotough ON M1B2W4

Century 21
INNOVATIVE REALTY INC

## සිංහල බයිස්කෝප්

# සිංහල දෙබස් කවා තිරගත වූ ''අම්බපාලි''







සිංහල සිනමාවට වරින්වර එක්වුණු විවිධ චිත්‍රපට අතර වන තවත් එක් චිත්‍රපට වර්ගයක් තමයි දෙබස් කැවූ චිත්‍රපට. විවිධ රටවල විවිධ භාෂාවලින් නිපදවූ චිත්‍රපටවලට සිංහල දෙබස් ඇතුළත් කර ප්‍රදර්ශනය කිරීම සිනමාවේ ආරම්භයේදී බහුලව සිදුවුණා. මෙලෙස දෙබස් කැවූ චිත්‍රපට වැඩිහරියක් හින්දි හෝ දෙමළ චිත්‍රපට. එයට අමතරව ඉන්දියාවේ වංග නැතිනම් බෙංගලි බාසාවෙන් හැදුන චිත්‍රපටත් දෙබස් කවා ලංකාවේ ප්‍රදර්ශනය කළා. චිත්‍රපටයේ නම සිංහලට ගැලපෙන ලෙස වෙනස් කරනවා. විදේශ චිත්‍රපටයේ සියලුම දෙබස් ඉවත් කර ඒ වෙනුවට සිංහල දෙබස් හඬ කැවීම් ශිල්පීන් ලවා ඇතුළත් කරනවා. චිත්‍රපටයේ විදේශ ගීත වෙනුවට සිංහල ගීත යොදනවා. මෙම දෙබස් රචනා කිරීමේදි සහ ගී පද රචනයේදි විදේශ චිත්‍රපටයේ නළු නිළියන් කට සොලවන ආකරයට වෙනසක් නොදැනෙන්න දෙබස් සහ ගී රචනා කිරීමට උත්සාහ කළා කියලයි සිනමා ලිපි ලේඛනවල දැක්වෙන්නෙ. අද ඔබේ රස වින්දනය සඳහා සොඳුරු මතකයන් සහ ගීත පිළිබඳව විස්තර ඉදිරිපත් කරන්නේ සිංහල දෙබස් කවා ප්‍රදර්ශනය කළ 'අම්බපාලි' චිත්‍රපටය ගැන තොරතුරුයි. මෙම චිත්‍රපටය බුදුරජාණන් වහන්සේ ජීවත් වූ කාලයට අදාළ අප හොඳින් අසා ඇති චරිත මුල් කරගෙන නිපද වූ චිත්‍රපටයක්. අම්බපාලි චිත්‍රපටයේ ඇතුළත් වූ එක් මියුරු ගීතයක් බුදුගුණ වර්ණනා කරන ගීතයක්.

**සම්බුද්ධ සුධාකර වු අංගීරස මහ මුණිදා...**
**ගායනය - බී. වික්ටර් පෙරේරා**
**පද රචනය - විමල් අභයසුන්දර**
**සංගීතය - බී. වික්ටර් පෙරේරා**

අම්බපාලි සිංහල චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂකවරයා පී. එල්. ඒ. සෝමපාලයන් වුණත් වික්ටර් පෙරේරා ගයන මෙම ගීතයේ සංගීත නිර්මාණයත් වික්ටර් පෙරේරා. ලංකාවේ බිහි වූ සිංහල භාෂාව පිළිබද පඬිවරයෙක් සහ විද්වතෙකු වූ විමල් අභයසුන්දරයන් රචනා කළ ප්‍රථම සහ එකම චිත්‍රපට ගීතය මෙය බවටයි සඳහන් වෙන්නේ. චිත්‍රපටයේ ගීත තැටි වශයෙන් නිපදවූයේ නැති නිසා මෙම ගීතවල මුල්ම ගීත සොයාගැනීම අපහසුයි. පසුකලෙකදි වික්ටර් පෙරේරා විසින් ගයන ලද ගීතය තමයි ඉතිරිවෙලා තියෙන්නේ.

ශ්‍රී නාරා ශංකර් අධ්‍යක්ෂණය කළ 1959 දී තිරගත වූ අම්රපාලි කියන බෙංගලි චිත්‍රපටය තමයි සිංහලෙන් දෙබස් කවා අම්බපාලි ලෙස 1964 ජූනි 20 වෙනි දා සිට ප්‍රදර්ශනය කළේ. බෙංගාලි භාෂාවෙන් නිපද වූ අම්රපාලි චිත්‍රපටයේ අධ්‍යක්ෂක ශ්‍රී නාරා ශංකර් මහා බෝධි සමාග මේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙක්. මෙම ඉන්දියානු චිත්‍රපටය නිපදවීම සඳහා මහාබෝධි සමාගමේ අනුග්‍රහය මෙන්ම උපදේශකත්වයද ලැබී තිබෙන බවයි ලේඛනවල සඳහන් වන්නේ. අම්බපාලි සිංහල චිත්‍රපටයේ පිටපත දෙබස් රචනය කළේ පූජ්‍ය උඩකැන්දවල ශ්‍රී සරණංකර හිමියන්. ඒ සඳහා උපදේශකත්වය දීල තියෙන්නෙ මහාබෝධි සමාගමේ ගරු නෙළුවේ ජිනරතන හිමියන් සහ දේවප්‍රිය වලිසිංහ මැතිතුමා. දෙබස් කැවීම් අධීක්ෂණය කරල තියෙන්නේ ශ්‍රීපාලි වයමන්, ලලිත් එස්. මෛත්‍රීපාල සහ එම්. එස්. පෙරේරා මහත්වරුන්. සිංහල පිටපත නිෂ්පාදනය සරසවි චිත්‍රපට සමාගම වෙනුවෙන් එම්. එස්. පෙරේරා. 1966 දී අම්රපාලි නමින් හින්දි චිත්‍රපටයක්ද නිපදවල තිබෙනවා.

අම්බපාලි සිංහල දෙබස් කැවූ චිත්‍රපටයේ තවත් සුවිශේෂ ගීතයක්,

**ත්‍රෛලෝක්‍ය නේත්‍ර මෝහ අන්ධකාර පරිභූර්ත වූ....**
**පද රචනය - රැපියෙල් තෙන්නකෝන්**
**ගායනය - සුනිල් ශාන්ත**
**සංගීතය - සුනිල් ශාන්ත**

පසුකලෙකදී නැවත ගායනය කළ ගීතය තමයි අද වන විට අපට අහන්න ලැබෙන්නෙ. මෙම ගීතයේ පද රචකයා වන රැපියෙල් තෙන්නකෝන් රචනා කළ එකම චිත්‍රපට ගීතය. වෘත්තියෙන් ගුරුවරයෙකු වූ තෙන්නකෝන් සූරින් සිංහල පඬිවරයෙක් මෙන්ම දක්ෂ කවියෙක්. ඔහු තමයි වවුලුව කියන සංදේශ කාව්‍යයේ රචකයා.

සුප්‍රියා චෞද්රි, අසිත් වරන්, චබී බිස්වාස්, කමල් චිත්‍රා , දීපක් මුඛර්ජි, අජිත් ප්‍රකාශ්, ශෝභා සහ සුදිප්තා යන නළු නිළියන් රංගනයෙන් දායක වුණු අම්බපාලි චිත්‍රපටයේ කතාවට පාදක වන්නේ බෞද්ධ සාහිත්‍යයේ එන අම්බපාලි නගර ශෝබනියගේ කතාව.

අඹ වනයක සිටි දැරියක් මගධ දේශයේ නායක සිටුවරයා විසින් සිය නිවසට ගෙනවිත් හදාගන්නවා. අම්බපාලි කියන්නේ අඹ වනයක ඉපදී හැදුන කියන අදහසට. තරුණ වියට එලඹෙන විට ඇය ඉතාමත් රූමත් ළඳක් බවට පත්වෙනවා. ඇගේ රූපයට ආසා කරන බමුණන් තම බලය යොදවා ඇයව නගර ශෝබනියක බවට පත් කරනවා. ඇයව දකින බිම්බිසාර රජතුමා ඇයට ආදරය කරනවා. ඇය සමග දින කිහිපයක් ගත කරනවා. රාජ සලුවත්, රාජ මුද්‍රාවක් සහ තවත් වස්තූන් ඇයට දෙන රජතුමා තමා නිසා ඇයට පුතෙක් ලැබුණොත් එම පුතාව රාජ සලුව සහ රාජ මුද්‍රාව සමග මාලිගයට එවන ලෙස ඉල්ලනවා. දරුවකු ලබන ඇය දරුවා නිසා නගර ශෝබනි රැකියාවෙන් ඉවත් වෙනවා. බමුණන් දරුවා මරා දැමීමට කුමන්ත්‍රණය කරනවා. ජීවිතය ගැන කලකිරෙන අම්බපාලි බුදුන් සරණ ගොස් පැවිදි වෙනවා. මේ අම්බපාලි චිත්‍රපටයේ කතාවේ සාරංශය.

අම්බපාලි සිංහල චිත්‍රපටයේ ඉතිරි ගීත තුනෙන් දෙකක් ගායනා කරල තියෙන්නේ අයිරින් ද සිල්වා කියන ගායිකාව. රචනා කරල තියෙන්නෙ ධර්මසිරි ගමගේ. සංගීතය පි. එල්. ඒ සෝමපාල. 'වැසි දිය මුතුඇට' සහ 'යෞවන පෙම් ළිය' කියන එම ගීත දෙකේ තැටි සොයා ගැනීමට අපහසුයි. අම්බපාලි චිත්‍රපටයට ඇතුළත් වූ ඉතිරි ගීතය ගායනා කරන්නේ සුජාතා පෙරේරා සහ අයිරින් ද සිල්වා. සංගීතය පි. එල්. ඒ. සෝමපාල. මෙම ගීතයේ රචකයාත් ධර්මසිරි ගමගේ. ලාංකික කලා ක්ෂේත්‍රයේ පුවත්පත් කතුවරයෙකු, කවියෙකු, පරිසර හිතකාමියෙකු, ගීත රචකයෙකු, චිත්‍රපට දෙබස් සහ තිරපිටපත් රචකයෙකු, චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකු මෙන්ම නවකයන්ට අතහිත දුන් මහත්මා ගතිගුණවලින් හෙබි ගුණ යහපත් පුද්ගලයෙකු ලෙස කලා ලොව ප්‍රචලිත වූ ප්‍රවීන කලාකරු ධර්මසිරි ගමගේ මහතාගේ චිත්‍රපට ගී රචනයේ ආරම්භය සනිටුහන් කරන්නේ සිංහල දෙබස් කැවූ අම්බපාලි චිත්‍රපටයට ගීත රචනා කිරීමෙන්. හින්දි චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂවරයා අනිල් භාග්වි.

**තවත් සිංහල බයිස්කෝප් එකක විස්තර සමග නැවත හමුවෙමු.**

සිංහල බයිස්කෝප්වල සොඳුරු මතකයන් සහ මියුරු රසවත් ගීත ඔබට රසවිඳින්න පුළුවන් ටොරොන්ටෝ සිට විකාශනය වන 'සවන' අන්තර්ඩාල ගුවන් විදුලියේ සිංහල සිනමා ගී චාරිකාව 'මධුරයාමේ' වැඩසටහන තුළින් සෙනසුරාදා උදේ 11 ටත් සඳුදා රාත්‍රි 7 ටත්. ඒ සඳහා sawana.ca වෙබ් අඩවියට පිවිසෙන්න.

■ **ආචාර්ය ජගත් රූපසිංහ ලියයි.**









■ **එම්. ඒ. කරුණාරත්න**

'සතුට පරම ධනය වේ' යයි දේශනා කරන බුදු දහම ඉන්දීය දර්ශනයේ අන්තවාදීත්වයෙන් තොර මැද පිළිවෙත් සැපත නිර්දේශ කර ඇත. සේද මාවත ඔස්සේ පෙරදිග දැනුම බටහිරට යාමෙන් පසු, විද්‍යා පුනර්ජීවනයේ ආභාෂය ලබා බටහිර මනෝවිද්‍යා දැනුමට එය සංකලනය වී ඇත.

ඉහත කී විෂයන් දෙකෙන්ම උගන්වන්නේ පෞරුෂත්ව වර්ධනය, සමාජයීය චින්තනය හා පුද්ගල අභිලාෂය සමඟ සහජීවනයත් ඊට අදාළ විනය මිස දුගතිය නොවේ. පෙර කල කිතුනු සමාජය මත පැටවී තිබුණු අධිපතිවාදී චින්තනය දේවවාදී (Determinism) න්‍යායකි. ඊට එරෙහිව බටහිර මනෝ විද්‍යාවේ උද්ගත වූ මානුෂික මනෝ විද්‍යාවෙන් ඉගැන්වූයේ පුද්ගල නිදහස හෙවත් ස්වීයත්වය සකසා ගැනීමයි. ජෝන් ලොක්, ඩේවිඩ් හියුම්, කාල් රොජර්ස් හා ඒබ්‍රහම් මාස්ලෝ ඊට පුරෝගාමී වූහ. එපරිදිම බුද්ධකාලීන සමාජයේ බමුණු මත රජ කළ බැවින් කුලහීන පීඩිත පන්තියක් බිහිවිය. එහෙත් බුදුන් වහන්සේ ඊට එරෙහිව සටන් කොට රොඩී කුලයේ අය පවා රහත් බවට පත්කොට සිටුවරු හා වංශාධිපතීන්ගෙන් මෙන්ම රජුන් ලවාද වැන්දවීමට සැලැස්වූහ. එබැවින් මේ විෂයන් දෙකේ සමානකම් ඇත.

බුද්ධ චරිතයෙන් පෙනෙන්නේ විවිධාකාර පුද්ගලයින් නපුරින් තොරව දමනය කිරීමට මානසික ක්‍රමවේදයක් යොදාගත් බවයි. ඒවා තැනට ගැලපෙන ආක්‍රමණශීලීත්වයයි. අංගුලිමාල, නාලාගිරි, චිංචිමානවිකා, සච්චක ආදීන් වෙත දමනය යොමු වූයේ වෙනස් අයුරිනි. බටහිර මනෝ විද්‍යාවෙන් දැක්වෙන්නේත් පළිගැනීමෙන් හා කායික දණ්ඩනයෙන් තොර විනය ගැන්වීම් බුදු දහමේ ක්‍රමයට සමාන දෙයකි. විවිධාකාර ස්ත්‍රීන් හැසිරවූ ආකාරයෙන් බුදුන් වහන්සේගේ මනෝවිද්‍යාත්මක හැකියාව පෙන්නුම් කරයි. එබැවින් බෞද්ධ ජීවන ක්‍රමය ස්ත්‍රීන්ගෙන් තොර වන අරණෝ උග්‍ර තපස් ක්‍රමයක් නොවන බවද පෙන්නුම් කරයි.

බුද්ධ චරිතය පටන් ගන්නේ ස්වකීය චරිතයට උචිත සහජ හැකියාවට ගැලපෙන සතුට සොයා ගෙන තමා උත්කෘෂ්ඨත්වයට පත් කෙරෙන ප්‍රඥාවන්ත දුෂ්කර ක්‍රියා මාර්ග මාලාවකිනි. ඇතැම් අයට එහි දෝෂයක් පෙනුනත් එම ක්‍රියා අනිවාර්ය බව පෙනේ. ප්‍රඥාවන්ත බෝසත්වරයකු කල්ප ගණන් ගෙවා එකතු කරගත් නුවණ සම්භාරයෙන් යුතුව අන්තිම ආත්මයේ කිසිසේත්ම නිසරු වැඩ නොකරනු ඇත. එහෙත් තරගකාරී සත්‍යගවේෂී සමාජයේ අයට විමුක්ති මාර්ගය දැකීමට නම්, ප්‍රායෝගිකව අදාළ කාර්යයක යෙදී එහි අනිටු විපාක දැක්වීම අනිවාර්ය විය. පුහුදුන් අනුගාමිකයින්ට කරුණු ඒත්තු ගැන්වීමට බුදු බව ලබාගත් පසුව පවා යමා මහ පෙළහර දැක්වීම ආදිය අනිවාර්ය විය. තරගකාරී සමාජ මානසිකත්වය එබඳු නිසා දුෂ්කර ක්‍රියා අවශ්‍ය විය.

එබඳු තවුස්දම් සියල්ලන්ටම එපරිද්දෙන්ම අවශ්‍යය යන නරුමවාදී අදහස එයින් ගම්‍ය නොවේ. බටහිර මනෝවිද්‍යාවේද එවැනි දේ උගන්වනු නොලැබේ. ඔලිම්පික් රන් පදක්කමක් උපයා ගැනීමට වුවද දුෂ්කර ක්‍රියා අනිවාර්ය වේ. එබඳු අචින්ත බුදු ගුණ ගැන ඇතැම්විට කිතුණුවකුට නොවැටහේ. එවැන්නෙක් බුදු දහමේ දුක්ඛ පක්ෂය දකින්නේ ඔහු තුළ ඇති අගතිය හා අවිද්‍යාව නිසාය.

එය බටහිර මනෝවිද්‍යාවට සම්බන්ධ නැත. දෙවැනි පෝප් පෝල්ගේ Beyond the Threshold නමැති පොතෙහි නරුමවාදයක් ගැන සඳහන්ව ඇත. බටහිර මනෝ විද්‍යාව 'දේව නියමය' ට එරෙහිව ගොඩ නැගුනකි. එවැනිම හින්දු දේව වාදයට එරෙහි වූ දර්ශනය බටහිර මනෝවිද්‍යාවට සමානකම් දක්වයි. බුදුන් වහන්සේ ලෞකික ජනතාවගේ දියුණුව උදෙසා අවුරුදු 45 ක කාලයක් වෙහෙසකර සමාජ සේවයේ යෙදුන සේක. ඊට හේතුව ඉන් ලැබිය හැකි සාපේක්ෂ (නිරාමිස) උතුම් සතුටයි. 'චරථ භික්ඛවේ' යනුවෙන් දේශනා කරන විට එයින් ඉස්මතු වී පෙනෙන්නේ ජීවිතයේ දක්නා සැප අන්තර්ගතය නොවේද? එපරිදි තම සමීප අනුගාමිකයින්ට පවසා තමන් වහන්සේද ඊට ආදර්ශ දීමට දිවා රෑ වෙහෙස නොබලා එම කටයුත්තෙහි යුහුසුලු වූයේ තම බැටලු රැළ රැකගැන්මට අසු පිට නැගි ප්‍රවීණ අසරුවෙකු පරිද්දෙනි. එයින් බුදු දහමෙහි ලෞකිකත්වයක් හා ජන නායකත්වය ගැන අදහස් ප්‍රදර්ශනය කරයි. එය සතුට සඳහාය. බටහිර මනෝ විද්‍යාවේද එවැනි දේ ඇති බැවින් සමානකම් බොහෝය. නිසි අභ්‍යාස මගින් මනස වෙනස් කිරීම හා හසුරුවා ගැන්ම බුදුදහමින් උගන්වන පරිදිම බටහිර මනෝවිද්‍යාවේ චර්යාවාදයෙන් උගන්වනු ලැබේ. ජේ. බී. වොට්සන් හා පාවුලෝ ආදීන් සතුන්ද උදවු කරගෙන මේ පිළිබඳ පර්යේෂණ කළහ. ඊට සමාන වූ 'පුද්ගලයා සමාජයෙන්, අනුකරණයෙන් උගනී' යන න්‍යාය බටහිර මනෝවිද්‍යාවේ ව්‍යුහවාදය (Structuralism) නමින් හැඳින්වේ.

බුදු දහමේද අංගුලිමාල කථා වස්තුවෙන් මෙය විශිෂ්ටව ප්‍රකාශ වේ. ගිරා කූඩුවක සිටි පැටවුන් දෙදෙනෙක් වෙනස් පරිසරයනට වැටුණු විට වෙනස් චරිත දැක්වූ බව පවසන කථා වස්තුවකින්ද එම න්‍යාය උගන්වයි. එබැවින් මේ විෂයයන් දෙක සමානය.

භද්‍ර වර්ගීය කුමරුන්ට 'තමා කවරෙක්දැයි' හඳුනා ගැනීමට උපදෙස් දීම පවා විශිෂ්ට මනෝවිද්‍යාත්මක වටිනාකමක් දක්වයි. නිදසුනක් වශයෙන් තමාගේ තත්ත්වය අධිතක්සේරු කිරීමෙන් පුද්ගලයෙකු දරුණු තිරිසනකු සේද ක්‍රියාකරන බව දෙවන මහා ලෝක යුද්ධය බිහිකළ කිතුනු සමාජයේ කුරිරු හිට්ලර්ද මෙය අපට මැනවින් ප්‍රදර්ශනය කර ඇත. සංසාර පුරුද්ද යනු යහපත් අනාගතයක් ප්‍රාර්ථනා කරන සුබවාදී කෙනකුට බාධා කරන දෛවෝපගත න්‍යායක් නොවේ. උපස්ථම්භක, උපඝාතක...ආදී කර්ම උදවු කරගෙන පාපය වළක්වා සුගතිය උදාකර ගත හැකිය. මෙපරිදි බටහිර මනෝවිද්‍යාවේද මූලික පරමාර්ථය වන්නේ මනස සංවර්ධනය කර ගැනීමය. මනෝවිද්‍යාවේ පියා ලෙස සලකන ෆ්‍රොයිඩ් මිනිස් මනසේ ඇති ලිංගික ප්‍රේරණයේ වැඩි බලයක් දුටුවේය. බුදුන් වහන්සේද මිනිසා හැඳීන්වීමේදී ඔහුව ලෝක 'සත්වයා' ගණයට ලා වර්ග කළ සේක. හේතුව පරිණාමය වූ මිනිසාගේ මනසට ඉතිරිව ඇති රාගික අධිබලය උන්වහන්සේද දුටු බැවින් සමානකම් එමට ඇත. ෆ්‍රොයිඩ්ගේ සමකාලීනයකු වූ කාල් යුං ෆ්‍රොයිඩ් ගොඩනැගූ පුද්ගල උත්නතියට (අහංභාවයට) එරෙහිව, සභ්‍යත්වයට හා සුසිරිතට නැඹුරුවූ සමූහ සමාජ විඥානයක් ඇතැයි දුටහ. එය සත්‍යයක් වන්නේ පරාර්ථකාමී 'මහත්මා ගාන්ධි' වැනි ශ්‍රේෂ්ඨ චරිත ලෝක ඉතිහාසයේ දක්නට ඇති නිසාය.

කාල් යුං ඉදිරිපත් කළ අන්තර්වර්තිත/බහිවර්තිත (Introvert/Extrovert) න්‍යාය ආදී සීමිත පෞරුෂත්ව බෙදීම් පසුකාලීන මනෝවිද්‍යඥයින් නොසලකා හැරියහ. එපරිදිම බුදුන් වහන්සේද රාග, ද්වේෂ, මෝහ, ශ්‍රද්ධා ආදී චරිත ප්‍රභේද විශාල සංකලනයක් දක්වා ඇත. එබැවින් බුදු දහමේ ඇති අගනා බටහිර මනෝවිද්‍යාත්මක ප්‍රවේශය ප්‍රශංසනීය නොවේද?

බුදුන් වහන්සේ ගිහි සාමාන්‍ය ජනතාවගේ භෞතික දියුණුව උදෙසා දේශනා කරන ලද දේ ආර්ථික දියුණුවෙන් ලබාගත හැකි උසස් සමාජ ප්‍රමිතිය සඳහාම වේ. උපයා ගන්නා ධනයෙන් ඉතා වැඩි කොටසක් ඉතිරි කිරීමට උපදෙස් දී ඇත්තේ එහෙයිනි. (ඒකේන භෝගේ භුංජෙයිය) එයින් රදළ සමාජයෙන් මිදී ඊට වඩා තරමක් හෝ වටිනා ධනවාදී ක්‍රමය සැකසීමෙන් සීමිත සමාජ මෙහෙවරක් කළ හැකි බව කාල් මාක්ස් මහා ප්‍රාඥයාද දුටු විලාශයක් පෙන්වයි. මාක්ස් ඉදිරිපත් කළේ සමාජමය විඥානය පිළිබඳ විද්‍යාත්මක කරුණුය. බුදුන් වහන්සේද එපරිදිම දක්වා ඇත්තේ රජු ජනතාව ගැන නොසලකා අකාර්යක්ෂම වන විට අධාර්මික සමාජයක් බිහිවන බවත්, කැළඹිලි හා විප්ලව ආදිය සමාජ උන්නතිය සඳහා බිහිවන බවත්ය. එම දේශනාවේ විශේෂත්වය නිසාදෝ එම සූත්‍ර දේශනා කළ පසු අහස පොළව හා විශ්වය දෙදරා කම්පා වී සතුට දැක්වූ බව දැක්වේ. සමාජ ආර්ථිකය හා ගිහි දියුණුවට දී ඇති සිය ගණනක් උපදෙස් විවිධ සූත්‍රවල ඇත. පරාභව, මංගල, ව්‍යග්ග පජ්ජ, සිඟාලෝවාද, වසල හා කරණීය මෙත්ත ආදී සූත්‍රවල කරුණු හා දස පාරමිතාවේ කරුණු මෙලොව සතුට සඳහා අගනේය. එබැවින් බුදු දහමේ භෞතිකවාදී ස්ථාවරය බටහිර මනෝ විද්‍යාවේ ආකල්පවලට සමානය. ගිහි ගෙය හැර සසුන්ගත වීම අවශ්‍යම යැයි උපදෙස් දෙන අය මෙය තේරුම් ගත යුතුය. ගිහි ජනතාවගේ ප්‍රයෝජනය සඳහා ආදර්ශයක් දීමට පැවිදි පූජ්‍ය පක්ෂයක්ද පිහිටවනු ලැබීය. පරලොවට පත් ආත්මයෙන් උපදින පුද්ගලයා "න ච සෝ න අඤ්ඤෝ" වන බැවින් මෙලොව ධාර්මිෂ්ට සුගතිය උදෙසා වෙහෙසීම වඩාත් වැදගත්ය.

ඇන්ටන් මෙස්මර් (1734-1815)ගෙන් පසු මෙකල බටහිර පවත්නා මෝහන ප්‍රතිකාර ක්‍රමයට අනුබල දුන් අයෙකි, පියර් ජෙනට් (1859 - 1947). ඊට පෙර එම ආකාරයේම බුදු දහමේ දක්නා විවිධ භාවනා ක්‍රම - සමත, විදර්ශනා, අශුභ, සතිපට්ඨාන, ආනාපාන සති... ආදිය සහමුලින්ම මනස සැකසීම සඳහාය. ඉහත කී බටහිර මනෝවිද්‍යාවේ මෝහන ක්‍රමය සමඟ මනසට අදහස් කැවීම බුදු දහමේ භාවනාවලට සහමුලින්ම සමානය. නන්ද කුමරු ජනපද කල්‍යාණියගෙන් වෙන්කර ගැනීමට "වීතරාගී" බුදුන් වහන්සේ දුන් තාවකාලික කමටහන් අතිවිශිෂ්ට ඒවාය. කමටහන් දීමට සියල්ලෝම ප්‍රවීණයෝ නොවෙති. බටහිර උපදේශන මනෝවිද්‍යාවේද මෙවැනි දේ ඇත.

ඒ ඒ විෂයන් තුළ විෂමතාවයන් (නිදසුන් වශයෙන් නිකායවාදී දාර්ශන ගැටුම්) දක්නට තිබියදීත් අප විසින් ලෝක ප්‍රජාවගේ දියුණුව උදෙසා සැලකිල්ල දැක්විය යුත්තේ සමාන කම් තුළින් අන්‍යෝන්‍ය ප්‍රයෝජන ගැනීමට මිස විරසකයන් මතුකර ගැනීමට නොවේ. නිදසුනක් වශයෙන් පවුලක අඹුසැමි යුවළ අනිකාගේ ඇදකුද පමණක් ඉස්මතු කරගත් විට එතැන ඇත්තේ ස්ථිරසාර අනාගතයක් නොවේ. ඇත්තේ නන්නත්තාර වීමකි.



කෙටි කතාව

# වෙසක් තෝරණ

■ පියසීලි විජේනායක

"ආතේ, මෙදා පාර තොරණට අඳින්නෙ මොකක්ද?"

"මෙදාපාර..... මෙදාපාර.... බලාහල්ලකො මං අඳිනකොට....."

වෙසක් මාසය එළඹෙන්නට පෙර එමානිස් ආතා තොරණේ වැඩ කටයුතු ආරම්භ කළේ හොඳ නැකත් වේලාවක් බලා පින්සල් පාර ගැසීමෙන් අනතුරුවය. ආතා චිත්‍ර අඳින්නට විශ්වකර්මයකු වගේ යයි බොහෝ දෙනා කියති. එහා මෙහා හැරෙන පමාවෙන් එමානිස් ආතාගේ පින්සල් පහරවලට පණ පෙවී එයි. එමානිස් ආතා ගිය වතාවේ ඇන්දේ වෙස්සන්තර ජාතකයයි. විදුලි බුබුළු දැමීමට පෙර වුවද කතාවේ එකිනෙක කොටු සිතුවම් කරන විට වුවද රූප පණ පිටින් ඉන්නා සේ දිස්වෙයි. අහල පහල ගැහැනු උදවිය රෙදි පටෙන් කඳුළු පිස දමා ගත්තේ, ජූජක බමුණා වේවැල් පහර දෙමින් ක්‍රිෂ්ණාජිනා සහ ජාලිය රැගෙන යන විටය.

"දැන්මම ඔහොම නං උඹල තොරණ හයිකරද්දි කොහොම අඬයිද?"

එමානිසා ගමේ ගැහැනුන්ට එසේ කියමින් සරදම් කරයි. වෙසක් තොරණේ කතා වස්තුව ආතාට කට පාඩමින් වුවද විස්තර කර දිය හැකිය.

එමානිස් ආතා මෙදාපාර අඳින්නේ පටාචාර කතා වස්තුවය. අචිරවතී ගංගාව දෙගොඩතළාගෙන යද්දී අපේ බුදු හාමුදුරුවො පිහිට උණා. පටාචාරාවගේ හිස කෙස්ද අවුල්වෙලාය. ඇය ගඟ මැද සිට අත්පොළසන් දෙන අයුරු එක් කොටුවකින් දිස්වෙයි. මස් වැදැල්ලක් ලෙස ඈතට දිස්වෙන බිළිඳුද අලුත උපන් බිලිඳා උකුස්සකු විසින් ඩැහැගෙන යද්දී පටාචාරාව අත්පුඩි ගසන හැටිද එහා ඉවුරේ සිටි දරුවා ගඟට පනින අයුරුද ආතා විසින් ඇඳ ඇත්තේ ජීවමාන රූප ලෙසටය. ඇගේ ඇඳිවතද එහාමෙහා වෙලාය. ඇයට සිහි එළවාගත නොහැකි බව ආතා දනියි. ආතාගේ චිත්‍ර බොහොමයක්ම මේ වගේ යයි සිරිමල් කොල්ලන් සමඟ පවසනුයේ කට කොනට සිනහ නංවමින්ය. ඒ මොනවා උනත් ගමටම නම ගිය චිත්‍ර ශිල්පියා එමානිස් ආතාය. එමානිස් ආතා චිත්‍ර අඳින අපූරුව බැලීමට එක් එක් වකවානුවල ගමේ අය ඔහුගේ නිවසට එක් රොක් වෙති. වැඩිමහල්, බාල මහලු, කෙලි, කොලු නඩයම ආතාගේ පැරණි කවි කතන්දර අසමින් එයට සහභාගි වෙති. ඔහුගේ කතාවලට හූ මිටි තැබීමටද අයෙක් සැදී පැහැදී සිටිති. අලංකාර ලෙස උපහැරණ දක්වමින් පරණ කතන්දර කියන්නට ආතා තරම් රුසියකු ගම් තුලානේම නැත. තේ වේලාවට නිවසේ රැඳී සිටින සියලු දෙනාටම තේ පැන් සංග්‍රහය නොඅඩුව ලැබෙයි.

"පොඩි එකෝ... අර අර.... සායම් පොල් කටුව අල්ලපන්... අර පින්සල..." මේ අයුරින් ඔහුට අවශ්‍ය දේවල් ළං කර දීමට ආවතේව කාරයෝ බොහෝ වෙති.

ආතාගේ බිරිය එමානෝනාට වෙසක් සමයට පෙරාතුව වැඩ වැඩි කාලයක් උදාවෙයි. එමා නෝනා මොන තරම් භාරධූර වැඩක යෙදී සිටියත් ආතාගේ ඕනෑ එපා කම් ඉටු කර දීමට සැදී පැහැදී සිටින්නීය.

එමානෝනාගේ ළත වෙවී එන ගමන් විලාසය ඔහුට ඉක්මන් නැත.

"නෝනේ, වරෙන්කො අඩිය ඉක්මන් කරල. ෂා! අම්මප බලපන්කො තාමත් ගිනි කිකිළි වාගෙනෙ."

"ඉඳා..... බලහල්ලකො විකාර.... නාඩගං...."

ඈ ගස්සාගෙන එතැනින් යන්නීය. මේ සියලුම විසූක දස්සන මධ්‍යයේ තොරණේ වැඩ නිම වනුයේ කිසිදු වෙහෙස මහන්සියක් නොමැතිවය. සියලුදෙනාම හක - හක ගා සිනාසෙති. ඉලන්දාරි දෙතුන් දෙනෙකු කොක් හඬලා සිනාසෙද්දී, එමානෝනා බොරු අමනාපයක් පෙන්වමින් යන්නේ,

"යනවල ළමයිනේ විහිළු නැතුව" යයි නෝක්කාඩු කියමින්ය.

නගරයේ හන්දිය මධ්‍යයේ එමානිස් ආතාගේ ප්‍රමුඛත්වයෙන් ඉදිකෙරෙන වෙසක් තොරණේ කැපී පෙනෙන අංගය වනුයේ ජීවමාන ලෙසින් දැක්වෙන චිත්‍ර පෙළයි. "කොල්ලනේ, උඹල බල්බ් දාල මගෙ තොරණෙ චිත්‍ර ටික නාස්ති කරන්න එපා" වැල යන අතට මැස්ස ගැසිය යුතුය. තද පැහැති වර්ණ සංකලනයෙන් චිත්‍රවලට පණ පොවන එමානිස් ආතා ඔහුගේ නම තොරණේ පහතින්ම ලියන්නේ කලාත්මක රටාවකය.

වෙසක් තොරණ ඇඳීම පමණක් නොව එමානිස් ආතා මඟුල් මඩුවලට චිත්‍ර සහ කැටයම් කපා දෙයි. "සුබ මංගලම්" යැයි මඟුල් මඩුවට ඇතුළු වන තැන මනාල යුවළගේ පින්තූර දෙක අඳියි. මනාලයා මනාලියට අත දෙයි. පිරිත් පින්කම් කාලයට මණ්ඩපය සාදනු ලබන්නේද ආතා විසින්මය. ඒ හැරුණු විට අකුරු බෝඩ් ලිවීමටද ඔහු දක්ෂයි. බොහෝවිට ආතාට විවේකයක් නැති ගානය. අරක ඉවරවෙන කොට මේක.... මේ හම්බ කරන මුදල සුළු වුවද,

"නෝනේ, මේක අරන් තියාපන්" යැයි ඇය අතට දෙනවා මිස බීඩියක් සිගරැට්ටුවක් හෝ රා අරක්කු ටිකක්වත් ආතා කටේ නොතබයි.

"අපේ එමානිස් උන්නැහේ බෝධි සත්වයකු වාගෙ මතු මත්තෙදි නිවන් දකින්නෝනැ මේ බෝධි සත්ව කතා අඳිනකොට...."

වයසක අය එසේ කියනුයේ මුණිච්චාවට නොවන වග ඔහු දනියි. එමානිස් ආතාගේ ඇඟිලි සිහින්ය. දිගටිය. ගිය ආත්මේදී සිටම ආතා මේ කරුමාන්තෙට උපන් හපන්කම් ලබා ඇතැයි සිතන තරමට එමානිස් ආතා චිත්‍ර කරුමාන්තයට රුසියකු බව බොහො දෙනෙක් පැවසූහ. ආතා යන විට ඔහුගේ දිගු සිහින් ඇඟිලිවලින් යුත් දෑත තාලයකට පැද්දෙයි. ඇඳිරි වැටෙන තෙක් සිතුවම් අඳින ඔහු වෙහෙසට පත් වූ විට මැන්ඩලිනය වයයි. ගීත වාදනය සමඟ පැරණි නාඩගම් ගීයක් ඔහුගේ මුවින් ඇසෙයි. ඇතැම් ගීත, වාදනය මොහොතකට නතර කරන එමානිස් ආතා දෑස් පියාගෙන දැහැනකට සම වදින්නා සේ පසුවෙයි.

"ආතේ, තව එකම එක සිංදුවක්"

"හිටපල්ලකො, කට පියාගෙන. හෙටානිද්දම තොරණෙ ඉතුරු වැඩටික අහවර කරන්න ඕන. ඉතුරු කොටුවල චිත්‍ර ගැනයි මං කල්පනා කළේ."

එමානිස් ආතා කල්පනා ලෝකයේ සැරිසරනුයේ දැහැනකට සමවදින්නා සේ ය. වෙසක් දිනවල නගරයේ මෙන්ම නිවෙස්වලද සැණකෙලි ස්වරූපයක් උසුලයි. නූල් සූත්තරෙන් නැටුම් නටමින් යන මරඟනන් තිදෙනාද සෑම වසරකම කලඑළියට එනුයේ මාර්ටින් ප්‍රේරාගේ මූලිකත්වයෙනි. එයට සමගාමීව එමානිස් ආතාගේ තොරණ හන්දියේ දිස්වෙයි.

"එමානිස් අයියේ, එමානිස් අයියේ"

"ඇයි පුතෝ"

ආතා විහිළුකාරයකුගේ ස්වරූපයෙන් කියයි.

විජේපාල හති දමමින් දුවගෙන ආවේ එමානිස් ආතා වෙත අලුත්ම ආරංචියක්ද රැගෙනය. ආතා විහිළුවෙන්ම එයට සවන් දුන්නේ කාරණාවේ බරපතළකම හිතට නොගෙනය.

"කොළඹ මහත්තය කියල කෙනෙක් එක්ක කට්ටියක් වැවේ අලුතෙන් තොරණක් ගහනවලු."

"ඉතින් තොරණ ගහන්ඩ කාටවත් තහනම් කරල නෑනෙ."

"නෑ මං කිව්වෙ. නෑ මං කිව්වෙ."

"අනේ පල කොලුවෝ ඔය අලුත් කුරුකුට්ටයියල තොරණ අඳිනකොට මුළු සිරිලංකාව පුරාම තොරණ ගහනව ඇති. ඒත් ඉතින් මේ තොරණවලට ඇබ්බැහි වුණ මිනිස්සුන්ගෙ හිත් දුවන්නෙ ඔය අලුත් දේවලට නෙවෙයි. අපේ මේ සිත්තර වලටයි."

ඊළඟ දිනයේ විජේපාල ගෙනාවේ ඒ ආරංචියට පලිප්පු දමමින්ය.

"කන්ථක අස්සයා නේරංජනා ගංගාවෙන් එගොඩවෙන හැටි තමයි කොළඹ මහත්තය පෙන්නන්නෙ."

"වැවේ මෙහා ඉවුරෙ ඉඳල එගොඩට පනින විදිහට වැඩේ සෙට් කරලලු."

විජේපාල මඳ විරාමයක් හෝ නොතබා එක හුස්මට විස්තර කළේය.

"මාරයි. එහෙනම් නියම ගති නේද?" එතැන සිටි කොලු කුරුට්ටෝද කට ඇරගෙන එය අසා සිටියෝය.

තොරණේ වැඩ අවසාන වී එය ලොරියට පටවන විට අහල පහල උදවියද ඒ සඳහා උදව්වට පැමිණියෝය. කෑලි පටවාගෙන ගොස් වෙසක් දිනයට පෙර දා රාත්‍රියේ ඒවා සවි කළෝය.

"ආතා තොරණ ඇන්දට සෙට් කරන්නෙ වෙන කට්ටියක්."

ඉලන්දාරියකු එසේ පැවසුවේ තොරණ ඇඳීමට එමානිස් ආතාට ආවතේව කිරීමේ උජාරුවෙන්ද යුතුවය.

වෙසක් සඳ වැව ඉස්මත්තට උඩින් පායා එයි. පන්සලේ ඝණ්ටාර නාදය ඇසෙයි. තොරණ විවෘත කිරීමේ උත්සවය පස්වරු හතට යෙදී තිබිණි.

එකවරම කන් බිහිරි කරවන රතිඤ්ඤා හඬ ඇසෙන්නට විය. පිට පිටම රතිඤ්ඤා පත්තුවෙයි. ශබ්ද වාහිනී යන්ත්‍රයද ක්‍රියාත්මක විය. ප්‍රභූ පිරිසක් තොරණ අසළට රැස්වී සිටියෝය. ශබ්දවාහිනී යන්ත්‍රයේ හඬ සුළං පහරට අඩු වැඩි වෙමින් ඇසෙයි. සුබ නැකතට තොරණ විවෘත කළ මන්ත්‍රී තුමාගෙන් මුදල් කවරයක්ද ලැබුණි.

"මෙයා තමයි එදා ඉඳලම චිත්‍ර අඳින්නෙ."

එමානිස් ආතා හඳුන්වා දෙමින් සංවිධායක තැන එසේ කීවේ සිනහමුසු වෙමින්ය. මන්ත්‍රී තුමා සිනහමුසු වෙමින් එමානිස් ආතාගේ අත තරයේම අල්වා ගත්තේය.

"බොහොම සන්තෝෂයි. පන්සලේ චිත්‍ර ටිකත් අලුතෙන් සකස් කරන්නයි යන්නෙ. ඔබතුමාගෙ උදව් අපට අවශ්‍ය වෙනව."

එමානිස් ආතාගේ සුරත අත නොහැරම අල්වා සිටි මන්ත්‍රී තුමා එසේ කියමින් පිරිසෙන් සමුගත්තේය. ජනගඟ ගලා යන්නා සේ සෙනඟ පොදි කන්නට වූහ. ඒ සැණෙන් ඔවුන් විසිරී යන්නට වූයේ මී මැසි පොදියක් තවත් තැනකට යන්නා සේය.

"අන්න අරහෙ ලස්සන තොරණක් තියනව වැව ළඟ."

"ඒක තොරණක්ම නෙවෙයි. ඒත් ඒක හරි අපූරුයි. කන්ථක අශ්වයා ගඟෙන් එගොඩ වෙන හැටි ලස්සනට හදල."

ගැටවර පිරිස අලුත් තොරණේ අංග ලස්සන විස්තර කරන්නට වූයේ තව තවත් කෑලි එයට එකතු කරමින්ය. මේ අතරේ එමානිස් ආතා තමා විසින් අඳින ලද තොරණේ කිසියම් අඩුපාඩුවක් ඇද්දැයි විමසිලිමත් විය. තොරණේ අලංකාරය වඩාත්ම දිස්වූයේ විදුලි බුබුළුවලින්ය. විදුලි බුබුළු සිය දහස් ගණන් නිවිනිවී දැල්වෙයි.

"අනේ අම්මප මුන් මගෙ තොරණෙ චිත්‍ර ටික විනාශ කරල." කතාව විග්‍රහ කිරීමට නම් තොරණ අසලටම ගොස් එය නැරඹිය යුතුය.

අංක 12 කොටුවෙන් විස්තර වනුයේ ගඟ මැදට වන් පටාචාරාව සිය පුතු රැගෙන යන උකුස්සාට අත්පුඩි ගැසීමයි. තමාගේ ප්‍රාණය හා සම සිඟිති පුතා ඩැහැගෙන යන විට ඇය ශෝකයෙන් හා භීතියෙන් අත්පුඩු ගැසූ ආකාරය ඉන් විදහා දැක්වෙනවා.

එතැන ඝෝෂාව කෙමෙන් තුනී වී යද්දී බොම්බයි මොටන් වෙළෙන්දා නළාව හඬවමින් පියමන් කළේය. බැලුම් වෙළෙන්දෝ සරුවත්, අයිස්ක්‍රීම් වෙළෙන්දෝ ළමා ළපටියන්ගේ සිත් එහි අද්දවා ගැනීමට යුහුසුලු වූහ. හඳ පායා වටකුරුවට දිලිසෙයි. ජලතලයට සඳරැස් වැටී රිදී පාටින් දියරැලි සෙලවෙයි. වැවට ඉහළින් සිදුහත් කුමරු කන්ථක අසු පිට නැගී මහාභිණිෂ්ක්‍රමණය කරන ආකාරය ප්‍රාතිහාර්යයක් මෙන් අවට සිටින අය නරඹති.

"හැමදාම එකම විදිහේ තොරණ බලන්ඩ ආස නෑ. ඔන්න මෙදා පාර අලුත් දෙයක් කරල තියනව."

"බලන්ඩ එපායැ. මෙතන සූ ගාල සෙනඟ රොක්වෙලා ඉන්න අපූරුව."

වැව අයිනේ වූ දැවැන්ත රුක් අත්තන ගහ මායිම් කරගත් වැව හාත්පස දැල්වෙන පාට පාට විදුලි බුබුළුවලින් ආලෝකවත් වී ඇත.

"යමුද මස්සිනේ, අපිත් අර පැත්තට" එක්කෙනෙක් එමානිස් ආතාගේ කරට අත දමා ගෙන වැව පැත්තට යාමට ඔහුට ඇරයුම් කළේය.

ළඟටම නොගියත් එය විස්මය දනවන ආකාරයෙන් ඈතට දිස්වෙයි.

"හැබෑටම ලස්සනයි නේන්නම්."

එමානිස් ආතා එසේ කියනවිට ඩේවිඩ් හයාගත් මුවින් යුතුව බලා සිටියේය.

"ඒක හැබෑව තමයි"

"ඒත් මස්සිනේ...."

"මොකද මස්සිනේ, ඒත් කියන්නෙ?

"ගංගාවෙන් එගොඩ වෙච්ච අස්පය ගිහිල්ල ආයෙත් එගොඩ වෙන්න ආපහු ආවෙ නෑ."

එතැන ඉතිරි වී සිටි කොලු කුරුට්ටෝ මහා හඬින් සිනාසෙන්නට වූහ. එමානිස් වහා හැරී වට පිට බලන්නට විය. හැම දෙනාගේම නෙත් සිත් යොමු වී තිබුණේ ඈත අවකාශය වෙතටය. එමානිස් ආතාද ඉන් වශීකෘත වූ සේම ඒ දෙස බලා සිටියේය.

# කවිය සහ කවියා

■ මහගම සේකර

**මහගමසේකරයන්ගේ 90 වෙනි ජන්ම දිනය අප්‍රේල් මස 07 වෙනි දිනට යෙදී තිබුණි. 1929 අප්‍රේල් 07 වෙනි දින උපන් සේකරයන් 1976 ජනවාරි 14 වෙනි මෙලොව හැර ගියහ. මහගම සේකර විසින් සම්පාදිත මෙම ලිපිය 1966 ඔක්තෝබර් 21 වැනිදා 'සිළුමිණ' පුවත්පතේ පළ වූවකි.**

රසය ආත්ම කොට ගත් වාක්‍යය කාව්‍ය යයි කියති. එහෙත් රසය යනු කුමක්දැයි විග්‍රහ කිරීම අමාරුය. ඒ වූ කලී තමන්ම විඳ අවබෝධ කරගත යුත්තකි. කාව්‍ය රසය තබා දිවට දැනෙන ඇඹුල් රසය වැනි රසයක් වුවද වචනයෙන් හඳුන්වා දිය නොහැක.

රසය වනාහි සිතෙහි ඇති වන ප්‍රසන්නතාවයෙකැයි දළ වශයෙන් කිව හැක. මලින් පිපුණු ගසක් දුටු විටද සන්ධ්‍යා වලාවක් දුටු විටද සිත මොහොතක් පහන් වේ. කාව්‍යයකින් ලැබෙන රසය මීට වඩා උසස්ය. රසය යනු සතුට නොවේ. රසය කෙලෙසුන් කෙරෙන් දුරුය.

කවිය නිර්මාණය කරන්නේ කවියාය. අත්දැකීම් ඔහුගේ කවියට වස්තු වෙයි. දුප්පත් පොහොසත් කවුරුත් දිනපතා විවිධ අත්දැකීම් ලබති. සමහර අත්දැකීම් දුබලය. සමහර අත්දැකීම් ප්‍රබලය. අත්දැකීම් මඟින් සිතේ උපදින හැඟීමද විවිධ වේ. දුබල හෝ ප්‍රබල වේ. කිසියම් අත්දැකීමක් නිසා තම සිත්හි උපන් හැඟීමක් වචනයෙන් කියා පා එම හැඟීම් අනුන්ගේ සිත්හිද ඉපදවීමට කවියා වෑයම් කරයි.

ඔහු තම පෞද්ගලික අත්දැකීම් කපා කොටා අනවශ්‍ය අංග බැහැර කර අවශ්‍ය අංග අලුතින් එකතු කර එය කාටත් පොදු අත්දැකීමක් බවට සකස් කරයි. එවිට කවිය කියවන පාඨකයා එය තම අත්දැකීමක් හැටියට පිළිගනී.

එවැනි අත්දැකීම් නිසා කලින් ඔහුගේ සිතේ පහළ වී කිඳා බැස තිබුණු හැඟීම් කවිය නිසා යළිත් ප්‍රබෝධ වෙයි. මෙවර ඒ හැඟීම් මතු වන්නේ මුලින් මෙන් කර්කශ ලෙස නොවේ. වඩා මුදු මොලොක්ව ඔප මට්ටම්වය. අන් ලෙසකින් කිවහොත් මෙවර ඇති වන්නේ ඒ හැඟීම්වල ඡායාමාත්‍රයක් සුවඳක් පමණි. රසය ඒ සුවඳට කා වැදී පවතියි.

කවියේ රසය මුලින්ම විඳින්නේ කවියාය. ඔහු කවිය මුලින්ම විභාග කර බලන විචාරකයාද වෙයි. පාඨකයාද කවියකු නම් කවියකින් උසස් රසයක් විඳීමට ඔහුට පුළුවන. එහෙත් සාමාන්‍ය පාඨකයෝ කවීහු නොවෙති. ඔවුන්ට කවි රස විඳීම සඳහා පිටින් පිටුවහලක් වුවමනාය. විචාරකයා මේ පිටුවහල ලබා දෙයි. මේ සඳහා කවියාට පමණාම නිර්මාණ ශක්තියක් විචාරකයාටද අවශ්‍යය. විචාරකයාගේ මග පෙන්වීම අනුව යන පාඨකයෝ තමතම නැණ පමණින් කවි රස විඳිති.

කවියාටම විචාරකයා වීමට බැරිද? බැරි නැත. දැනට මේ රටේ බොහෝ විට මෙය සිදුවෙයි. ඇතැම් ලේඛකයෙක් අනුන්ගේ කෘති පමණක් නොව තමන්ගේ කෘතිද විවේචනය කරයි. මෙහිදී ඔවුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව බලවත් වරදක් සිදු වේ. එනම් තමන්ගේ කෘති හුවා දැක්වී අනුන්ගේ කෘති ඉබේම ගර්හාවට පාත්‍රවීමයි. මේ විවේචන සාහිත්‍ය රස විඳීම සඳහා මගපෙන්වීමට නොව 'තමන් ගත් මග හරිය - අනුන් ගත් මග වැරදි' යයි කීම සඳහා ලියූ ලියවිලි සේ අපට හැඟේ. 'තමා වරදය නොදන්නේ - මෙරමා දොස්ම දකින්නේ' යි එක් පැරණි කවියෙක් කීය. ඔහු කවරෙක් දැයි තවමත් හරිහැටි හඳුනා ගෙන නැත. තමා වරදක් අනෙකකු පෙන්වා දුන් පමණින් කිපෙන තරමට කවීන් බොළඳ ආත්මාර්ථකාමීන් විය යුතු නැත. අපිස් දෘෂ්ටියක් ගැන කියන වර්තමාන ලේඛකයන් මෙන් නොව කෘතිය ඉදිරිපත් කර කවි නාමය සඟවා තැබීමට තරම් ඇතැම් පැරණි කවීහු අල්පේච්ච වූහ.

කවියම තම විචාරකයා වූ විට තවත් වරදක් සිදු වේ. එකම කවියා අදහස් කළ සීමාවෙන් ඔබ්බට යාමට පාඨකයාට ඇති ඉඩකඩ ඇහිරී යාමය. කවියාගේ කෘතිය පදනම් කොට ගෙන තම කල්පනා ශක්තිය මෙහෙයවා හැකි තරම් ගැඹුරට ගොස් රස විඳීමට පාඨකයාට නිදහස තිබිය යුතුය.

අන් හැම දෙනාට මෙන්ම කවියකුටද තම කෘතියේ හොඳ මිස නරක පෙනෙන්නේ කලාතුරකිනි. එසේ පෙනෙන්නේ නම් කාව්‍යය ප්‍රසිද්ධ කිරීමට පළමු ඔහු එය නිවැරදි කරනු නොඅනුමානය.

කවිය පළමුවෙන් නිර්මාණය වන්නේ කවියාගේ සිත තුළය. මෙම නිර්මාණය පිටත ලෝකයට බිහිකළ යුත්තේ වචන මාධ්‍ය කොට ගෙනය. නවකතාකරුවකුට මෙන් විශාල වචන සංඛ්‍යාවක් පාවිච්චි කිරීමේ නිදහස කවියාට නැත. වචන කීපයකින් තම හැඟීම කියා පෑමට ඔහුට සිදු වේ. මෙ නිසා හැඟීම්වලින් පිරුණු තම කාරියට ඉතාම උචිත වචන පමණක් ඔහු තෝරා ගනී. වචන තෝරාගැනීමේදී නූතන කවියකු විසින් ගත යුතු මග සොයා බැලීමට පෙර පැරණි කවීන් හා ජන කවීන් ඒ සඳහා ගත් මග විමසා බැලිය යුතුය.

රස නිෂ්පාදනය පැරණි කවියාගේ මුඛ්‍ය පරමාර්ථය වී යැයි සිතිය නොහැක. රජ ඇමතින් සිත් ගැනීම, බණ දහම කීම, අවවාද අනුශාසනා කිරීම ආදී වෙනත් පරමාර්ථයක් ඉෂ්ට කර ගන්නා පිණිස කාව්‍ය රසය ඉවහල් කර ගන්නා ලදී. සන්දේශ කාව්‍ය කීපයකුත් පද්‍යයට නගන ලද ජාතක කතා කීපයකුත් මිස උදම් ඇනිය හැකි තරම් විශාල පද්‍ය සාහිත්‍යයක් අතීතයෙන් අපට උරුම වී නැත. ගතානුගතික ලෙස එකම සැලැස්මක් අනුව ලියැවී ඇති මේ ග්‍රන්ථ කීපයද ආකෘතිය අතින් මෙන්ම භාෂාව අතින්ද බොහෝ දුරට ඒකාකාරය. කවි සමයට වැද්ද ගනු ලැබූයේ පංඩිතයන් විසින් සම්මත කර ගන්නා ලද සීමාසහිත වචන මාලාවක් හා උපමා රූපක රැසක් පමණය. මේ නිසා පැරණි කාව්‍යයෙහි එන - ඕනෑම ගැහැනියකගේ මුහුණ සඳ වැනිය. තොල් නා දළු වැනිය. පියයුරු හංසයන් වැනිය. හැම රජෙක්ම තෙදින් හිරු වැනිය. සොම් ගුණයෙන් සඳ වැනිය. තර සර ගුණයෙන් මහමෙර වැනිය.- පංඩිතයන් කීපදෙනකුට පමණක් සීමා වූ මේ වචන හා උපමාරූපක සාමාන්‍ය ජනතාව ඉදිරියෙහි ආගන්තුකයන් වැනි විය. මේ ආගන්තුකයන් පැමිණියේ කොහි සිටද යන්න පැරණි ග්‍රන්ථවලට ලියා ඇති සන්න ගැටපද දෙස බැලූ විට පෙනේ. පොදුජන වහරින් අරුත් බර වූ වචන සිය දහස් ගණනින් මෙකල මෙන්ම එකලද තිබෙන්නට ඇත. එහෙත් ග්‍රන්ථාරූඪ කිරීමට කරම් නොහොබිනා කුලහීනයන් සේ සලකා ඒවා කොන් කරනු ලැබීය. මෙසේ වෘත්ත ඡන්දස් අලංකාර ආදියෙන් පමණක් නොව භාෂාව අතින්ද පැරණි කවියාගේ නිදහස සීමා විය.

ජන කවියා කවි සමයෙහි දාසයෙක් නොවීය. ඔහු පංඩිතයකු නොවීමම ඔහුගේ කවි රසවත් වීමට හේතු විය. පංඩිත කවීන් මෙන් නොව අත්දැකීම්ම ඔහුගේ කාව්‍යයට වස්තු විය. ව්‍යාකරණය ඔහුගේ කවියට බාධා නොකළේය. සම්මත කාව්‍යාලංකාර නොදත් ඔහු අතින් අලුත් කාව්‍යාලංකාර ඉබේම බිහි විය. ව්‍යවහාරයෙන් පණ පෙවුණු වචන හා උපමා රූපක යෙදීම නිසා ඔහුගේ කවිය ජීවයෙන් මෙන්ම ප්‍රකාශන ශක්තියෙන්ද නොඅඩු විය. පංඩිත කවීන්ගේ රචනාවල රසය විඳ ගැනීමට සාමාන්‍ය ජනතාව අපොහොසත් විය. ඔවුන්ට කළ හැකි වූයේ ඒ කවීන්ගේ පාණ්ඩිත්‍යය දෙස විස්මිතව බලා සිටීම පමණකි. එහෙත් නුගතුන්ට මෙන්ම උගතුන්ටද එකසේ රස විඳිය හැකි රචනා බිහිකිරීමට ජන කවියා පොහොසත් විය. ජන කවියේ අගය වටහා ගෙන ඉන් ප්‍රයෝජන ගත් පැරණි කවීහුද සිටිති. ගුත්තිල කාව්‍යය රචනා කළ වෑත්තෑවේ හිමියෝත් කුස ජාතකය රචනා කළ අලගියවන්නත් ඉන් දෙදෙනෙකි.

කාව්‍යෝචිත භාෂාවක් ගොඩ නැගීමේදී මෙකල වෙසෙන අප විසින්ද ජන කවියන් ගත් මඟ ගැනීම මැනවැයි සිතේ. මින් අදහස් කරනුයේ ජන කවි ලියා ඇති බසින් අපද කවි ලිවිය යුතු බව නොවේ.

එසේ නම් එය ද එතනා, පෙතිගෝමර මැණිකේ වැනි වචන කීපයකට සීමා වනු ඇත. ජන කවියා තම සමාජයේ ව්‍යවහාර වූ භාෂාවෙන් කවිය සඳහා වචන තෝරා ගත්තේය. අපද අප වෙසෙන සංකීර්ණ සමාජයේ ව්‍යවහාර වන භාෂාවෙන් ගැමියන් මෙන් ම නාගරිකයන්ද ව්‍යවහාර කරන භාෂාවෙන් කවිය සඳහා වචන තෝරා ගත යුතුය. වර්තමානයේ වසන මිනිසාට වර්තමාන සමාජයේ සිතුම් පැතුම් කීමට ඉතාම උචිත භාෂාව එය වන්නේය.

අප කවි රචනා කරන්නේ පෙර මෙන් උගතුන් අතලොස්සක් හෝ ගැමි සමාජයක් සඳහා නොවේ. මුලු මහත් ජනතාව උදෙසාය. ජන කවි පහළ වූ සමාජය වෙනස් වී ඇති බැවින් ජනකවි බසින් කවි ලිවීමෙන් වැඩක් නැත. අතීතයේ ජීවත් වන උගත්තු නම් තවමත් අතරින් පතර සිටිති. ඔවුන් සඳහා, තවමත් දුෂ්කර බන්ධන බඳිමින් කල් යවන මහා කවියන් එකකු හෝ දෙදෙනකු සිටීම හොඳටම ප්‍රමාණවත්ය. පද්‍ය උගතුන්ට පමණක් සීමා කිරීමට අමතරව, තවත් වරදක් පැරණි කවීන් අතින් සිදු විය. එනම් අප අතර ව්‍යවහාර වන පාලි, සංස්කෘත, දෙමළ ආදී වචන එලෙසින්ම නොයොදා ඒවා සිංහලට බිඳ හුදු හෙළ වදන් කර ගැනීමයි.

මෙසේ කිරීමේදී ඒ වචනවල පැවැති ඕජෝ ගුණය සිඳී ගොස් කෘතිම වචන රැසක් ඒ වෙනුවට පහළ විය. 'සාගර' යන වචනයෙන් ඇති වන ප්‍රබල හැඟීම 'සයුරු' යන්නෙන් කිසි විටෙක නූපදී. පැරණි ගද්‍ය රචකයා අතින් මේ වරද සිදු නොවීය. එහෙයින් පැරණි ගද්‍ය භාෂාව පද්‍ය භාෂාවට වඩා විචිත්‍ර විය. ප්‍රකාශන ශක්තියෙන් පොහොසත් විය. එමෙන්ම පැරණි ගද්‍ය රචකයා ග්‍රන්ථ රචනා කළේ උගතුන් කීප දෙනකු සඳහා නොව පොදු ජනතාව සඳහාය. එහෙයින් ඒ ග්‍රන්ථ ජන ජීවිතයට වඩා ආසන්නය.

ජන ව්‍යවහාරයේ එන යෙදුම හා වචනද ජන ජීවිතයේ තොරතුරුද, නොඅඩුව ඇතුළත් ජාතක පොත, සද්ධර්ම රත්නාවලිය වැනි ග්‍රන්ථවලින් මේ බව පැහැදිලි වේ. මේ අනුව කාව්‍යය සඳහා වචන තෝරා ගැනීමේදී නූතන කවියකුට වඩා ප්‍රයෝජනවත් වන්නේ පැරණි පද්‍ය භාෂාව නොව පැරණි ගද්‍ය භාෂාවය.

පිට ජාතිකාරයන් මෙන්ම අශිෂ්ටයන් හැටියටද සලකා පංඩිතයන් විසින් ඇතැම් වචන කොන්කර දමනු ලැබේ. ද්වනිතාර්ථවලින් පිරුණු කොපමණවත් වචන මේ අතර ඇත. නූතන කවියෙකුට එබඳු වචනවලින්ද ලැබිය හැකි පිටුවහල අපමණය. මේ මොහොතෙහි මට මතක්වන එබඳු වචන කීපයක් මෙසේය. උජාරු, නොසංඩාල, ජාඩි, බයිස්කෝප්, සෝඩා, පලිප්පු, ට්‍රැක්ටර්, අච්චාරු, මජං, බායි, සූර්, සර්, දොරේ, පෙරේතයා, ගෑස්.

කවියේ විරිත පිළිබඳ ප්‍රශ්නය මීළඟට පැන නගී. පැරැන්නෝ විරිතට විශේෂ තැනක් දුන්හ. ඇසින් බලා නිශ්ශබ්දව කියවා රස විඳීම වෙනුවට, එකකු හඬ නඟා කියවනු තවෙකකු කනින් අසා රස විඳි යුගයක විරිත අත්‍යවශ්‍ය විය. මුද්‍රණ ශිල්පය නොතිබීම, උගතුන් විරල වීම යන අඩුපාඩු දෙක මකා දැමීමට විරිත උපකාර විය.

එහෙත් අති මිහිරි වෘත්ත, එළිවැට අනුප්‍රාස ආදිය කවියේ මූලික රසයට හානි පමුණුවයි. කවියකට අවශ්‍ය වනුයේ අර්ථය හා ගැලපෙන සියුම් රිද්මයකි. කවියේ අර්ථ රසය එයින් උද්දීපනය වෙයි. ගීතමය ස්වභාවය අධික වූ පමණට අර්ථ රසය මැඩපවත්වා, අර්ථ රසයෙන් ඉවත වෙන අතකට සිත ඇද ගෙන යයි. වෘත්තය කවියාගේ නිදහස සීමා කරයි. කවියාට සිදුවන්නේ නියමිත දිග පළල ඇති රාමුවක් ඇතුළත සිරවී සිට ගෙන ස්වකීය නිර්මාණ කිරීමටය. ඊටත් වඩා වෘත්ත අනුප්‍රාස ආදිය, පැණි රස ලාමක බවක් කවියට ආරූඪ කරයි. කවියේ නිර්ව්‍යාජ නිරහංකාර කමට බාදා කරයි.

මුනිදාස කුමාරතුංග කීවාක් මෙන් ඒ වූකලී තිරිසනුන්ට පවා රස විඳිය හැකි ලාභ බොළඳ රසයකි. වෘත්ත පහළ වූයේ සිතා මතා ඇද ගත යුතු අර්ථ රසය සඳහා නොව ක්ෂණිකව කන පිනවන සමූහ ගායනා සඳහාය. තාලයට ඇද පැද කීම සඳහාය. එවිට එය නැළවිල්ලක ස්වරූප ගනී. කවියාගේ හැම හැඟීමක්ම නැළවිල්ලක මාර්ගයෙන් ප්‍රකාශ කළ නොහැක. නැළ විය යුත්තේ බොළඳුන්ය.

ශබ්ද රසයෙන් ගැඹුර ආස්වාදයක් විඳිනු කැමැතියවුන්ට සංගීතය නමින් වෙනම කලාවක් පහළ වී ඇත්තේය.

'කෙළ සුවහස් විරිත්' ගැන සඳහන් කරන ලද්දේ ඉහතදී කෙළ සුවහස් විරිත් මෙරට ප්‍රචලිතව පැවති නිසා නොව, ප්‍රතිභා පූර්ණ කවියකුට වුවමනා තරම් විරිත් නිපදවාගත හැකි බව කීමටය. මාත්‍රා දෙකේ හා මාත්‍රා තුනේ කැටි සිංහල වෘත්ත ශාස්ත්‍රයෙහි පදනම වෙයි. මේ මාත්‍රා කැටි දෙවර්ගය, මිශ්‍ර කර හෝ නොයෙක් වෘත්ත සාදා ගෙන ඇත. 'සත වෙත පත මෙත සඟ හස සෙවි පසිඳු' යන කවි පදයෙහි මාත්‍රා දෙකේ කැටි නවයක් ඇත. 'රැගත් සුරා පිරූ විතින්' යන කවි පදයෙහි මාත්‍රා තුනේ කැටි හතරක් ඇත. 'සලා සිකි පිල් සලග ලැග්ගේ' යන කවි පදයෙහි මේ මාත්‍රා දෙවර්ගය නියමිත පිළිවෙළක් අනුව මිශ්‍ර කර යොදා ඇත. එනම් මාත්‍රා තුනේ කැටියක් ළඟට මාත්‍රා දෙකේ කැටි දෙකක් සිටින පරිදිය. මෙසේ බලන විට, සිංහලයේ ආඝාත සහිත වෘත්ත සියල්ල නිපදවා ඇත්තේ දෙමත් කැටි හෝ තෙමත් කැටි නියමිත පිළිවෙළක් අනුව මිශ්‍ර කර හෝ මිශ්‍ර නොකර නැවත නැවත යෙදීමෙන් බව පෙනී යයි.

කවිය සඳහා අවශ්‍ය රිද්මය ගොඩ නඟා ගැනීමේදී නූතන කවියා වඩා ගැඹුරු විය යුත්තේ ගී විරිත දෙසට යැයි සිතමි. ආඝාත රහිත ගී විරිත ආඝාත සහිත වෘත්තය මෙන් අති මිහිරි නැත. එහෙයින්ම බොළඳ ගතියෙන්ද අඩුය. එළි වැටක් නැති බැවිනුත්, මාත්‍රා යෙදීමේ ක්‍රමික රටාවක් නැති බැවිනුත් එහිදී කවියාට ලැබෙන නිදහසද වැඩිය.

කථා ව්‍යවහාරයෙහි ඇත්තා වූ රිත්මයෙන් නූතන කවියකුට, මීටත් වඩා ප්‍රයෝජන ගත හැක. මේ රිත්මය කෙවැන්නක්ද යන්න මිනිසුන් හැඟීම්වලින් ආකූලව කථාකරන අවස්ථාවන්හිදී දැක්ක හැකිය. කවියාද හැඟීම් කියාපාන්නෙකි.

හැඟීම් බර අවස්ථාවන් හිදී මිනිසුන් කථා කරන්නේ ඒ ඒ හැඟීමට අදාල රිත්මයක් අනුවය. දොරකඩ වාඩි වී සිටින ළමයෙක් මිදුලේ අඹ ගසින් ගෙඩියක් වැටෙනු දකී. "අන්න අඹයක්. ඒක මට" යි කියමින් ඔහු එදෙසට දිවයයි.

ඔහු ඒ වචන කියන්නේ සතුට හඟවන රිත්මයකට අනුවය. "බැහැපිය දොට්ට" යි එකකු තවෙකෙකුට

48 වන පිටුව බලන්න



# බුද්ධඝෝෂ හිමියන් ත්‍රිපිටකය විකෘති කළාද?

■ මිල්ටන් මද්දුමාගේ

පන්සිය වසරක් තිස්සේ ශ්‍රී ලංකාව යටත් කරගෙන සිටි අධිරාජ්‍යවාදී ක්‍රිස්තියානි පාලකයා මේ රට මිලේච්ඡයන්ගේ රටක් බවත්, මිලේච්ඡ ආගමක් අදහන ජනතාවක් වසන බවත්, ඔවුන් එයින් මුදවාගෙන සම්‍යක් මාර්ගයට ගත යුතු බවත් කියා සිටියේය. එයට ප්‍රතිකර්ම වශයෙන් ඔවුන් අතට ලැබුණු හැම බෞද්ධ පොතක් පතක්ම විනාශ කළහ. පන්සල් සහ ඓතිහාසික වැදගත්කමකින් යුත් සිද්ධස්ථාන කඩා බිඳ ගිනිබත් කළහ.

මේ ආකාරයෙන් බුද්ධ ධර්මයත්, බුද්ධ ධර්මය ඉදිරියට ගෙන ගිය පාලි භාෂාවත් සිංහල භාෂාවත් 19 වන ශත වර්ෂය වන විට ලංකාවෙන් බොහෝදුරට අතුරුදන් කරවීමට ඔවුහු සමත් වූහ. ලෝක උගත් ජනතාවට ඔවුන් පෙන්වා දුන්නේ බුද්ධාගම යනු වෙනත් ආගමක් නොව හින්දු ආගමම බවත් බුදුන් වහන්සේ නමැති පැවිද්දා වෙනත් ආකාරයෙන් එය දේශනා කළ බවත්ය. පාලි ත්‍රිපිටක පොත් එංගලන්තයට ගෙන ගිය ඔවුහු ඒවායේ වැදගත් ලක්ෂණ සඟවා හින්දු ලක්ෂණ පෙන්වන කොටස් උලුප්පා පෙන්වා සිය මතය තහවුරු කරන්නට තැත් දැරූහ.

ඒ වෙනුවෙන් ඔවුන් කළ සාවද්‍ය ප්‍රකාශ රාශියකි. ඕල්ඩන්බර්ග්, වින්ස්ටර්නිට්ස්, එච්. විල්සන්, රොමිලා තාපර් ආදී උගතුන් බුදුන් වහන්සේ 'එකම වයින් වෙනත් හැඩයේ බෝතල්වලට දැමුවාක් මෙන්' හින්දු ආගම දේශනා කළ බවද බුදුන් වහන්සේ විශේෂ හැකියාවක් නැති සාමාන්‍ය පැවිද්දෙක් බවද කීය.

රොබට් නොක්ස් 1660 දී බුදුන් වහන්සේ පිළිබඳව කියා තිබුණේ මෙසේය. 'ඔවුන් බුදුන් යැයි කියා ගන්නා හෙතෙම මහා දෙවියෙකි. ආත්මවල විමුක්තිය රඳා පවත්නේ ඔහු කෙරෙහිය.' ඒ ප්‍රකාශය අනුව රොබට් නොක්ස් දැක ඇත්තේ ක්‍රිස්තියානි ආගමේ ඉගැන්වීම මිස වෙනකක් නොවේ.

ශාක්‍ය මුනිවරයා වූ කලී සත්‍ය පුද්ගලයකු නොවේ. ඔහු ගැන කියා තිබෙන සියල්ලක්ම ඔහුගේ පෙර ආත්ම ගැන කියා තිබෙන දේ මෙන්ම හුදු ප්‍රබන්ධ කථා ය. (බුදුන් සහ බුදු සමය, එච්. එච්. විල්සන් )

පුරාණ බුද්ධ ධර්මය හැටියට මෙතෙක් කියා තිබෙන දෙය බොරුය. එහි මූලික අදහස කාලයාගේ ඉකුත්වීමත් සමඟ අවබෝධ කර ගත නොහැකි විය. (ජී. ග්‍රීම්, 1926)

බුද්ධ භාෂිතයම සඳහන් වෙතැයි කියනු ලබන ත්‍රිපිටකයේ කොටස්වල බුදුන් ගැන සඳහන් වන දේ කෙරෙහි පවා එතරම් විශ්වාසයක් තැබිය නොහැකිය. වෙනෙකක් තබා බුද්ධත්වය ලැබීමෙන් පසු දේශනා කරන ලද ප්‍රථම ධර්ම දේශනාව පවා බුදුන්ම දෙසූවක් යැයි සැක සහිතයි. (අසිරිමත් ඉන්දියාව, බෂාම්, 1953)

බුදුන් ඉගැන් වූ ධර්මයත් උපනිෂද් සෘෂිවරුන්ගේ ධර්මයත් අතර සැලකිය යුතු වෙනසක් නැත. පුනර්භව ධර්මය බුදුන් විසින් ප්‍රතික්ෂේප කළ බවත් උන්වහන්සේ ඉගැන් වූයේ එක පරම්පරාවක අය ඊට පෙර පරම්පරාවේ කටයුතුවල ප්‍රතිඵල විඳින බව කාටත් පැහැදිලි සත්‍යයයි.

යුරෝපීයයන් කළ මේ සාවද්‍ය ප්‍රකාශවල වරද පෙන්වා දුන්නේ යුරෝපීයයන් විසින්මය. ඒ බව ඊ. ජේ. තෝමස් විසින් මෙසේ ප්‍රකාශ කොට තිබේ.

ඔවුන්ගේ වචනවලින් ඇඟවෙන පරිදි සත්‍යය සම්පූර්ණයෙන් මේ ලේඛකයන්ට අවබෝධ වී නැති බව පෙනේ. ( බුද්ධ චරිතය, පෙරවදන)

ත්‍රිපිටකය තිබෙන්නේ ශ්‍රී ලංකාවේ පමණක් නොවේ. මේ ක්‍රමයටම සකස් නොවුණත් ත්‍රිපිටකයේ එන පුරාණ සූත්‍ර ටිබෙට්, චීන, බුරුම, සංස්කෘත, ප්‍රාකෘත භාෂාවලින්ද පවතී. ඒවා 3 වන ශත වර්ෂයට අයත් බව ඊ. ජේ. තෝමස් කියයි. (බුද්ධ චරිතය, පෙරවදන)

1881 දී රීස් ඩේවිඩ්ස් මැතිතුමා විසින් පාලි පොත් සංගමය ආරම්භ කළ අතර පාළි භාෂාව ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ප්‍රමුඛ අධ්‍යයන විෂයයක්ද විය. ශ්‍රී ලාංකික උගතුන් බොහෝ දෙනකු පාලි භාෂාව උගත්තේ එහිදීය. 1926 දී ඒ. පී. ද සොයිසා මහතා විසින් ලන්ඩන් පාලි භාෂා සංගමය නමින් සංගමයක්ද ආරම්භ කළේය. එංගලන්තයේ ආරම්භ කළ පාලි පොත් සංගමය (පී. ටී. එස්.) මගින් එතෙක් පාළියෙන් තිබූ ත්‍රිපිටකය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලදී. ඒ. පී. ද සොයිසා මහතා තම සියලු ධනය වැයකොට එකල ලංකාවේ විසූ වියත් ධර්මධර භික්ෂූන් වහන්සේලා සහභාගී කරවාගෙන ත්‍රිපිටකය සිංහලට පරිවර්තනය කළේය.

1957 දී බණ්ඩාරනායක රජය මගින් සංස්කෘතික දෙපාර්තමේන්තුව පිහිටුවා එහි ත්‍රිපිටක අනුමණ්ඩලය මගින් ත්‍රිපිටකය සිංහලට නැඟීමේ කාර්යය ආරම්භ කළේය. එක් පැත්තකින් සොයිසා මහතාත් අනෙක් පැත්තෙන් ත්‍රිපිටක අනුමණ්ඩලයත් සිංහලට පරිවර්තනය කළ ත්‍රිපිටක පොත් පෙළ නිසා ලාංකික බෞද්ධයන් අතර ත්‍රිපිටක දැනුම වර්ධනය වූ අතර පාලි භාෂා උගත්තු විශාල පිරිසක් බිහිවූහ. වැලිවිටියේ සෝරත, පරවාහැර වජිරඤාණ, බළන්ගොඩ ආනන්ද මෛත්‍රිය, අම්බලන්ගෙ ාඩ කුසලධම්ම, පලන්නොරුවේ විමලධම්ම, ලබුගම ලංකානන්ද, මඩිහේ පඤ්ඤාසීහ, පොල්වත්තේ බුද්ධදත්ත, ආදී ආශුබෝධ බුද්ධිප්‍රභා ඇති යතිවරයාණන් වහන්සේලාත් ඩී. බී. ජයතිලක. ඊ. ඩබ්. අදිකාරම්, ජී, පී. මලලසේකර ආදී වියත්තුත් ඒ අතර වූහ. ඒ අය බුදු දහම අලලා පර්යේෂණාත්මක ග්‍රන්ථ ඉදිරිපත් කරමින් යුරෝපීයයන්ගේ සාවද්‍ය මත සමාජයෙන් බැහැර කළහ. මේ වන විට ඒ උගතුන් සියලුදෙනා අප අතරින් වෙන් වී ගොසිනි. අලුතෙන් කිසිදු පාලි උගතකු බිහි නොවීය. දැන් දහම් පාසලක උගන්වන්නට තරම් පාලි දන්නා ගිහියකු හෝ පැවිද්දකු නොවීම නිසා පාලි උගන්වන්නේ කලාතුරකින් දහම් පාසලක පමණි.

මෙයින් ප්‍රයෝජන ගන්නා ඇතැම් පිරිස් දැන් අප භාවිත කරන ත්‍රිපිටකය බුදුන් වහන්සේ දේශනා කළ ත්‍රිපිටකය නොවන බවත්, එය බුද්ධඝෝෂ හිමියන්ගේ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බවත් එතෙක් පැවැති සිංහල ත්‍රිපිටකය ගිනි තැබූ බවත් ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකාව තුළ මහත් කලබැග ෑනියක් ඇති කරන්නට පටන්ගෙන තිබේ. මේ පිළිබඳ කථා කරන්නට තරම් දැන උගතෙක් නොවීම නිසා නූගත් ජනතාවගේ ඔළු ගෙඩි මේ මූඪ අදහස්වලින් පුරවන්නට සමත් වී තිබේ.

බුදුන් වහන්සේ විසින් පන්සාලිස් වසක් තිස්සේ දේශනා කරන ලද ධර්මය විසිරී ගිය මල් ගොඩකින් මල් දමක් අමුණන්නාක් මෙන් ක්‍රමවත්ව සංවිධානය කිරීමෙන් පහසුවෙන් මතක තබා ගත හැකි පරිදි සංගායනා කළ බව චුල්ලවග්ග පාලියේ පංචසතිකකන්ධකයේ සඳහන් වේ. ප්‍රථම ධර්ම සංගායනාවේදී මහා කාශ්‍යප, උපාලි හා ආනන්ද තෙරුන් විසින් අත්තනෝමතිකව අනෙක් අයගේ අනුකූලත්වය නොතකා මේ සංගායනාව කළ බව අබෞද්ධයකු වූ ආචාර්ය බී. සී. ලෝ කියා සිටියේ ඔවුන්ගේ ව්‍යාපාරයට එක් නිදසුනක් සැපයීමේ අරමුණෙනි.

ත්‍රිපිටකය සකස් වූයේ ඉන්දියාවේදීය. සුළු කොටස් කීපයක් පමණක් ලංකාවේදී එක් වී යැයි සිතිය හැකිය. විනය පිටකයට අයත් පරිවාර පාලි නම් ග්‍රන්ථය එසේ ලංකාවේදී සකස් කරනු ලැබ විනය පිටකයට ඇතුළත් කරන ලදැයි මතයක් තිබේ. සුත්ත නිපාතයටද, බුද්ධ වංසයටද ඇතැම් කොටස් ලංකාවේදී එක් කරන ලදැයි විශ්වාස කෙරේ. දීඝනිකායේ මහාපරිනිබ්බාන සූත්‍රයේ ධාතු බෙදීමේ කතා ලංකාවේදී රචනා වූයේ යැයි සුමංගල විලාසිනියම ප්‍රකාශ කරයි.

බුදු රජුන් විසින් ඒ ඒ තැන පවත්වන ලද පකිණ්ණක දේශනාව අට්ඨ කථා යැයි සාරත්ථදීපනියෙහි සඳහන් වේ. සැරියුත් තෙරුන් ආදී බුද්ධකාලීන මහා ශ්‍රාවකයන් වහන්සේලා විසින් ප්‍රකාශ කරන ලද බුද්ධ ධර්මය පිළිබඳ විශේෂ විස්තරද අටුවාට ඇතුළත් විය. ඒ අනුව අප පිළිගත යුතුව ඇත්තේ ත්‍රිපිටක පාලිය මෙන්ම අට්ඨ කථාවේ බොහෝ කොටස්ද බුදු රජුන්ගේම දේශනාවක් බවයි.

මහා කාශ්‍යපාදී 500 ක් මහ රහතුන් වහන්සේ විසින් ප්‍රථම සංගීතයේදී ත්‍රිපිටකය සංගායනා කොට අනතුරුව ඒ ත්‍රිපිටකයේ අර්ථය ප්‍රකාශ කරනු සඳහා බුදුන් වහන්සේ වදාළ ප්‍රකීර්ණක දේශනාවන් සංගෘහිත අර්ථ කථාවද සංගායනා කරන ලද්දේය. ආචරියවාදයයි කියන ලද්දේ ඒ අට්ඨ කථාවලටය.

මුල් සංගායනා තුනේදී කරන ලද සංගායනා තොරතුරුම මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙනැවිත් දීප භාෂාවෙන් තබන ලදී. ඒ ධර්මය භාෂාව පමණක් බැහැර කොට පාලි භාෂාවට නැඟූ බව බුද්ධඝෝෂ හිමියෝ ප්‍රකාශ කරති.

**ආගතා පන ථේරේන මහින්දේන තමුත්තමං
යදීපංදීපවාසීනං පච්ඡාපි ච ඉසීගියා**

මගධ බසින් වැටෙමින් ආ බුදු කැලි අටුවා හෙළදිව් ඇජුරෝ හෙළ බසින් තැබූහයි. ධම්පියා අටුවා ගැටපදයෙහි සඳහන් වේ. (ජයතිලක, 6 පිට)

මෙසේ සිංහලට නැඟුවේ අන්‍ය නිකායවල මතවාදවලින් බේරා ගැනීමට බව මහාබෝධිවංස ගැටපදයෙහි සඳහන් වේ. (නිකායාන්තර ලද්ධි සංකර පරිහාරත්ථං සීහළ භාසායඨපිතෙ - 133 පිට)

බොහෝ විට බුදු සමයට නිකායාන්තර මත ඇතුළත් වූයේ සංස්කෘත භාෂාව පදනම් කොට ගෙනය. මෙසේ සිංහල භාෂාවට පරිවර්තනය කිරීම එයින් බේරීමේ උපක්‍රමයක් විය. අන්‍ය ලබ්ධි ගැන්වීමෙන් බේරා ගැනීමට සිංහලයට පරිවර්තනය කළ ත්‍රිපිටකය අන්‍ය ලබ්ධීන් ඇතුළත් කිරීම සඳහා මහාවිහාරිකයන් විසින් බුද්ධඝෝෂ හිමියන්ට දුන්නේ යැයි කීම අමනෝඥ කථාවකි.

මහාවංසයට අනුව බුද්ධඝෝෂ හිමියන් ලංකාවට ආවේ ත්‍රිපිටකය පරිවර්තනය කරන්නට නොව ඉන්දියාවේ නොවූ හෙළටුවා පරිවර්තනය කිරීමටය. (පාළිමත්තමිධානීතං නත්ථි අට්ඨකථා - 122 ගාථාව)

සෑම අටුවාවකම ආරම්භයේ එය බුද්ධඝෝෂ හිමියන් විසින් පාලියට නැඟූ බව සඳහන් කර තිබීමෙන් එහි පරිවර්තනය පිළිබඳ සැකයක් ඇතිකර ගැනීම අවශ්‍ය නොවේ.

ආචාර්ය අදිකාරම්තුමාගේ අදහස වූයේත් මෙරට වු හෙළටුවා ක්‍රි. ව ප්‍රථම වර්ෂය තෙක් පැවැති ඒවා බවය. එබඳු අට්ඨ කථා මූලාශ්‍ර 28 ක් අදිකාරම්තුමා විසින් සඳහන් කර ඇත. ඒ අතරින් වඩාත් ප්‍රචලිත වූ අට්ඨ කථා 7 කි.

1 අනුරාධපුර මහා විහාරයට අයත් මූලට්ඨකථා හෙවත් මහාට්ඨකථා

2 අනුරාධපුර උත්තර විහාරයට අයත් උත්තර අට්ඨකථා

3 මහාපච්චරී අට්ඨකථා

4 දකුණු ඉන්දියාවේ කාංචිපුරයේ අට්ඨකතා

5 කුරුළු විහාරයට අයත් කුරුන්දි අට්ඨකතා

47 වන පිටුව බලන්න

## Saliroo Creations

**All Your Publishing Needs under one roof**

### Graphics
Illustrations, Logos, Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

### Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

### Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**
**Tel : 416 201 0628**

## French Tutoring

Individual and small group classes for French learners
'French reading, writing, and conversing'
Any grade from grade 1-12, university minors and French Immersion

**Kumudu Abeywardena,**
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
**T.P - 647 824 1897**

## MARRIAGE PROPOSALS

English Trained teacher working in Sri Lanka aged 52 seeking a partner. Divorced and having one daughter aged 14. Highly educated family, Father Doctor Mother Teacher (Living in Canada), 2 brothers, and one sister all are University graduates living citizens in Canada. Waiting for an early reply please

**+1 (226) 787 7943 or +1 (613) 843 1550**

**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා**

# බුලතා යෝධයා සොරබොර වැව බඳියි - ඔහුගේ බිරිය ගල් පඩිපෙළ බඳියි

ඒ අනුරාධපුර අගනුවර කරගෙන පළමු වරට මුළු ලංකාවම එක්සේසත් කොට දුටුගැමුණු රජු (ක්‍රි. පූ. 161 - 137) රජ කරන අවධියයි. රජරට රජ කළ ද්‍රවිඩ එළාර රජු පරදවා රටේ විසිර තිබූ කුඩා රාජධානි එක්කොට පළමු වරට ලංකාව එක්සේසත් කළේ මාගම රජ පරපුරෙන් ආ දුටුගැමුණු රජුය. ඔහුගේ බිසව ජනප්‍රවාද අනුව කොත්මලේ කොටගේපිටියේ වීසුරු ගෙදර රන්මැණිකාය. කැකිරාව කොස්ගම කන්ද ලෙන් ලිපියක ගැමුණු රජුගේ බිසවක් වූ 'කතී' ගැන කියැවෙයි. පියංගල ලෙන් ලිපියක් අනුව 'රජිතා' රජුගේ තවත් බිසවකි. 'උතුරු - නැගෙනහිර සිංහල බෞද්ධ උරුමය' ග්‍රන්ථයේ පූජ්‍ය එල්ලාවල මේධානන්ද මාහිමි ලෙන් ලිපිවල එන ගැමුණු රජුගේ තවත් බිසෝවරුන් කීපදෙනෙකු ගැන තොරතුරු දෙයි. ජනප්‍රවාද අනුව රජුගේ මරණයට හේතුවද නාග කන්‍යාවකට රජුගේ සිත බැඳී යෑමයි.

මහාවංශය - පාලි රසවාහිණී - සද්ධර්මාලංකාරය ගැමුණු රජුට සිටි යෝධයින් දහදෙනෙකු ගැන තොරතුරු කියයි. ඉන් හතර දෙනෙකු ගැන කියවෙන ලෙන් ලිපි හමු වී ඇත. වංශකථාවල නොසඳහන් රජුගේ යෝධයින් තුන්දෙනෙකු ගැන සාහිත්‍යය ග්‍රන්ථවල තොරතුරු එයි. ජනප්‍රවාදවල එන බුලතා යෝධයා ගැමුණු රජුගේ තවත් එක් යෝධයෙකි. බුලතා වාසය කළේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිරි පට්ටිය ගමේය. ගැමුණු රජුට බුලත් වැඩීම ඔහුට පැවරුණු රාජකාරිය බැවින් ඒ රාජකාරි පදවියේ නමින් ඔහු 'බුලතා' නමින් ප්‍රසිද්ධ විය. ඔහුගේ බිරියද ඔහු මෙන්ම ශක්තිමත් එකියක වූවාය. ඇගේ නම අප්‍රකටය.

ගැමුණු රජු එළාර සමඟ සටනට යද්දී මහියංගණයේ මහවැලි ගඟබඩ දෙමළ බළකොටු බිඳ බුදු හිමිගේ කේශධාතු තැන්පත් කොට සමන් දෙවි මුලින්ම කරවූ මහියංගණ දාගැබ විශාල කොට බැඳවීම ආරම්භ කළේය. ඒ සඳහා කාලයක් නැවතී වෙහෙසීමට සිදු විය. මේ කාලයේ කිරිපට්ටිය ගමේ සිට දිනපතා රජුට බුලත්විට සැපයීමේ රාජකාරිය සඳහා බුලතාට දිනපතා මහියංගණයට යෑමට සිදු විය. (මේ අඩවිය එදා මැණික් බහුල වූ බැවින් මිණිබේ නමින් ප්‍රසිද්ධ විය. එහි අර්ථය මැණික් බහුල වීම යනුයිශ්‍රී අද එය 'මිණිපේ' ලෙස ව්‍යවහාර වෙයි. මැණික්වලට අදත් ප්‍රසිද්ධ රත්නඇල්ල දියඇල්ල පිහිටියේ හසළක කඩ මණ්ඩිය නුදුරුවයි.) බුලත් වැඩීමේ රාජකාරි නිමකළ පසු බුලතා ඉඩ ලද විට විවේකයේදී තුන් පැත්තකින් කඳුවලින් යට වූ අනෙත් පැත්තෙන් ස්වභාවික ගල් තලාවකින් වට වූ බිමක තනිව සොරබොර තැනුවේයශ්‍රී සොරබොර එදා වැදි අඩවියේ බළකොටුව වියශ්‍රී අදත් දඹාන පිහිටියේ මේ අසලයිශ්‍රී

රජුට රහස රැක ගනිමින් සොරබොර වැව ඔහු තනිව ඉදිකළේ අවසාන මොහොතේ රජු විස්මයට පත්කිරීමේ අදහසිනි. කඳුවලින් වට වූ වතුර ස්වභාවිකව ගලා ආ වගුරු බිමේ එක්රැස් වූ ජලය ගබඩා කිරීමට ගල්පොත්ත දිගේ ගල් බැම්මක් හා පිහිටි ගලේම සොරොව්ව කැපුවේයශ්‍රී මේ සඳහා කළුගල් මෙළෙක් කරන ඖෂධ වර්ග කලින් යොදා අවශ්‍ය පරිදි ගල සකස් කරගත් බව පෙනී යයිශ්‍රී මේ වැව සෑදීමට ඔහුට කාලයක් ගත විය.

යෝධ වෙරවීරිය ඇති බුලතාගේ බිරිය දිනපතා බුලතාට දිවා ආහාරය රැගෙන මහියංගණයට යෑමට පුරුදුව සිටියාය. කිරිපට්ටිය ගමේ සිට මහියංගණයට යාමට දහඅට වංගුව පාර එදා භාවිත වූයේ නැත. උඩදුම්බර හෙවත් පැරැණි නමින් මාඩුගොඩ ගම්මානයේ සිට මහවෙල දක්වා ගමන් කොට මහවෙල අම්බලම ළඟින් ශීඝ්‍ර බෑවුමක් දිගේ හැතැම්මක් පමණ පහළට බැසි විට හඳගනාව හමුවෙයි. හඳගනාව සිට මහියංගණයට කෙටි දුරයි. දිනපතා මේ මහවෙල සිට හඳගනාව දක්වා ශීඝ්‍ර බෑවුමේ පහළ බහින උඩට නඟින බුලතාගේ බිරිය දැවැන්ත ගල් කුට්ටි බෑවුම දිගේ තනිවම ගෙනවුත් තබා පියගැටපෙළ බැඳීම පටන් ගත්තාය. බුලතා සොරබොර වැව බඳින විට ඔහුගේ බිරිය ගල් පඩිපෙළ බැඳීම දිගටම කළාය.

දුටුගැමුණු රජු මහියංගණ දාගැබ් වැඩ නිමා කොට කොත පලඳවන උත්සවය දා ඒ රාජකීය උත්සවයෙන් පසු බුලතාගේ ආරාධනාවෙන් දුටුගැමුණු රජු ඔහු තනිව කරවූ සොරබොර වැව බැලීමට ගියේය. වැව දුටු රජු පුදුමයට පත් විය. ආගමික සිද්ධස්ථාන මිස ගැමුණු රජු වාරි කර්මාන්ත කරවූයේ නැත. නළලට අත ගසා ගත් රජු වැවේ ඈත මෑත බලා 'හරබර වැවක්' යනුවෙන් කීවේය. රජුගේ මුවින් පිට වූ 'හරබර' නම අනුව බුලතා ඉදිකළ වැව සොරබොර නම් විය. ඉන්පසු රජු ඔහුට කිරිපට්ටිය ගම සහිත ගම්වරයක් තෑගි කළේය. මේ උත්සවයෙන් පසු බුලතාගේ ආරාධනාවෙන් දුටුගැමුණු රජු බුලතාගේ බිරිය කරවූ පඩිපෙළ බැලීමට පැමිණියේය. ඇගේ හපන්කම් දැක රජු මවිත විය. බුලතා මෙන්ම ඔහුගේ බිරිය දළ බෑවුම දිගේ යෝධ ගල් තබා සකස් කළ ගල් පඩිපෙළ ගැන රජු බෙහෙවින් සතුටුව ඇයටද තෑගි බෝග සම්මාන පිදුවේය.

තනි ගලින් කළ සොරොව්වක් හා ගල් බැම්මක් සහිත සොරබොර වැව මහියංගණයේ සිට සැතපුම් පහක් පමණ ඈතින් පිහිටා ඇත. සොරබොර වාරි තාක්ෂණයේ විශිෂ්ට නිර්මාණයකි. මෑතක් වනතුරු සොරබොර දහස් ගණනක් කිඹුලන්ගේ කෙම්බිමක් විය. එහෙත් අද එහි එකම කිඹුලෙකුවත් නැත. උඩදුම්බර නගරයේ සිට මහවෙල දක්වා ගිය විට මහවෙල විදුහල අසළ මහවෙල අම්බලම හමුවෙයි. එතැනින් පහළට පියගැටපෙළ හඳගනාව දක්වා විහිදෙයි. ගල් පඩිපෙළ බසින විට නිවාස කිහිපයකින් යුතු කුඩා පැරැණි ගම්මානයක් විය. ශීඝ්‍ර - සෘජු ප්‍රපාතය - දරුණු සුළඟ ඇඟ කිලිපොළවයි. මිණිපේ දහඅට වංගුව පාර බහුලව භාවිත කිරීම නිසා අද භාවිතය ඉතා අඩු වී ඇත. එහෙත් සොරබොර වැවත් ගල් පඩිපෙළත් දකින විට බුලතා යෝධයා හා ඔහුගේ බිරිය අදත් අපේ සිහියට නැගෙයි.

**එස්. කේ. ජයවර්ධන**

**පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා**

# ලක්දිව
# වෙසක් උත්සව පුරාණය

■ පූජ්‍ය උඟුරුගමුවේ අස්සජි හිමි

ශ්‍රී ලංකාව වූ කලී ලොව ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය ලත් පෙරදිග ලෝකයේ සුවිශේෂී රාජ්‍යයකි. ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ බෞද්ධ සංස්කෘතික හර පද්ධතීන් ප්‍රමාණවත් පසුබිමක් යටතේ ස්ථාපිත වූයේ ක්‍රි. පූ. 3 වැනි සියවසේදී නොහොත් බුද්ධ වර්ෂ 236 දී සිදුවූ මිහින්දාගමනයෙන් පසුවය. එබැවින් බුදුසමයේ බලපෑම මත එතෙක් මෙරට පැවැති සංස්කෘතිය 'බෞද්ධ සංස්කෘතිය' බවට පරිවර්තනය විය. තත්කාලීනව පැවැති සමාජගත අභිචාර විධි ආදී සියල්ලක්ද අනුක්‍රමයෙන් වෙනස් මඟකට අවතීර්ණ විය. බෞද්ධ ජීවන ප්‍රතිපදා මාර්ගයට අනුගත වූ ජනතාව ආගමික උත්සව පැවැත්වීම කෙරෙහිද වැඩි රුචිකත්වයක් දැක්වූහ. එබැවින් අවිහිංසාව, ශ්‍රද්ධාව, භක්තිය හා බුද්ධිය පදනම් කරගත් ආගමික උත්සව රැසක්ද ඒ හා සමගම ආරම්භ විය. මෙම පූජෝත්සවයන් තුළින් අපේක්ෂිත පරමාර්ථය වූයේ විනෝදය සැපයීමත්, ආගමික හැඟීම් තෘප්තිමත් කිරීමත්ය. අනුක්‍රමයෙන් සංඛ්‍යාත්මකව වැඩිදියුණු වී ගිය මෙබඳු උත්සව වසර පුරාම මහත් හරසරින් පවත්වන තත්ත්වයක් පෙන්නුම් කෙරිණි. අනුරාධපුර යුගයේ පටන්ම ක්‍රමවත් පදනමක් යටතේ ඇරැඹි මෙම උත්සව ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ තදින්ම මුල්බැස ගත්තේ ඒවායෙහි පවත්නා උසස් ආගමික, දාර්ශනික හා සංස්කෘතික වටිනාකම් නිසාය.

මේවා අතර පාරම්පරික රාජ්‍ය චාරිත්‍රයක් වන වෙසක් උත්සවය ශ්‍රී ලාංකේය බෞද්ධයනට අන් හැම උත්සවයකටම වඩා වැදගත්ය. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, බුදුවීම හා පිරිනිවීම යන අවස්ථාත්‍රය සිහිකිරීම් වස් මැයි මාසයේදී මෙම වෙසක් උත්සවය පැවැත්වෙයි. වෙසක් මඟුල අතිපුරාණ බෞද්ධ උත්සවයක් බවත් ආදි කාලයේ පටන් ඉන්දියාවෙහි පවා පැවැත්වුණු බවත් චීන ජාතික පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාවලින් හෙළි වෙයි.

පුරාතන ශ්‍රී ලංකාවේ පැවැති වෙසක් උත්සවයක් පිළිබඳ ප්‍රථම වාර්තාව මහා වංසයෙහි හමුවන්නේ දුටුගැමුණු (ක්‍රි. පූ. 101 - 77) රාජ්‍ය සමයේදී ය. දුටුග ැමුණු රජු වෙසක් උත්සව විසිහතරක් පැවැත්වූ වග එහි කියවෙයි. ඓතිහාසික ලිඛිත වාර්තා නොමැති වුවද වෙසක් උත්සවය එයට කලින්ද පැවැත්වුණු බව විශ්වාස කළ හැකිය. දේවානම්පියතිස්ස රජු වෙසක් උත්සවය සිදු කරන්නට ඇතැයි පිළිගත හැකිය. එබැවින් බෞද්ධ ලංකාවේ වීරයා වූ දුටුගැමුණු රජු වෙසක් උත්සවය යළි පිහිටුවා පෙරටත් වඩා විචිත්‍ර අන්දමින් පැවැත්වූ බව සිතීම හේතු යුක්ති සහගතය. දුටුගැමුණු රජුගෙ න් පසු තවත් බොහෝ රජවරු වෙසක් උත්සවය අඛණ්ඩව පැවැත්වූහ. භාතිය රජු (ක්‍රි. ව. 38 - 67) වෙසක් උත්සව විසි අටක් සිදු කළේය. බුද්ධ රූපය තනා රථයක තැන්පත් කොට වීථි සංචාරය කරමින් පැවැත්වූ මෙම උත්සවයේදී දුගී, මඟී යාචකාදීන්ට කෑම් බීම් දීමේ සිරිතද පැවතිණි. වසභ රජු ද (ක්‍රි.ව. 127 - 171), ඔටුනු පළන් වර්ෂයේ තමන්ම පිළිවෙළින් වෙසක් උත්සව විසි හතරක් කරවීය. වෝහාරිකතිස්ස රජු ද (ක්‍රි. ව. 269 - 291) වෙසක් උත්සවය සිදුකොට ලක්දිව සියලු භික්ෂූන් වහන්සේලාට තුන් සිවුරු පිදීය. එමතු නොව ගෝඨාභය රජු ද (ක්‍රි. ව. 323 -333) ජෙට්ඨතිස්ස රජුද (ක්‍රි. ව. 611 - 617) දල්ල මොග්ගල්ලාන රජුද (ක්‍රි. ව. 851 - 885) 2 වැනි සේන රජුද, රටවාසීන් හා එක්ව මහත් හරසරින් වෙසක් උත්සවය පැවැත්වූ බව සඳහන්ව තිබේ.

වෙසක් උත්සවය රාජානුග්‍රහය මත වර්ෂයක් පාසාම අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීම කෙරෙහි පූර්වෝක්ත රජවරුන් උත්සාහ ගෙන ඇත. මේ අනුව රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මුදල් විශාල ප්‍රමාණයක්ද වෙසක් උත්සවය සඳහා වෙන් කෙරිණි. රාජ්‍ය චාරිත්‍රයක් ලෙස සෑම රජ කෙනකුගේම අනිවාර්ය ධර්මතාවක් වූ මෙය පොළොන්නරු යුගය වනවිට තව තවත් දියුණුවට පත්විය. දඹදෙණි යුගයේ පැවැති ඉතා චමත්කාරජනක වෙසක් උත්සවයක් පිළිබඳ වාර්තාවක් 'පූජාවලිය' තුළින් හමුවෙයි. ඒ මෙසේය.

'එදවස් මේඝ රාජයාණන් හස්තිරූප ව්‍යාජයෙන් බුදු මඟුලට බැස මිහි මඬලෙහි ඇවිදිනා සේ ඒ ඒ දිග් හි යන්ත්‍ර බලයෙන් ඇවිදිනා හස්තිරූප පංතීන් හා පූජා ලෝලීන් දිවූ සමුද්‍රරාජයා ගේ මහ රළ පෙළ සේ ඒ ඒ දිග්හි යන්ත්‍ර බලයෙන් දිවන අශ්වරූප පංන්තීන් හා බුදුන්ගේ මහා මංගල්‍යයෙහි අලංකෘත වූ පූජාවෙන් වෙහෙර සරසා සහස් සුවහස් ගණන් සංඝයා හා මුළු ලක්දිව සියලු මනුෂ්‍ය සේනා රැස්කොට වෙහෙර සිසාරා ගවු ගවු මානයෙහි පූජා පෙළහරින් සිටගත් මනුෂ්‍ය සේනාවම අතුරු නොදී සිටිනා සේ නියෝග කොට...'

මෙම වෙසක් උත්සවය සිදුකරනුයේ දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජු ගේ (ක්‍රි. ව. 1250 - 1285) මූලිකත්වයෙනි. ඒ තුළින් වෙසක් උත්සවයක තිබිය යුතු සියලුම අංගෝපාංග ප්‍රකාශ වෙයි. එබැවින් මෙය පුරාතනයේ පැවැති වෙසක් උත්සවයක නියම ස්වරූපය යැයි, නියත වශයෙන්ම පැවැසිය හැකිය. මෙහි 'බුදු මඟුලට බැස' යනුවෙන් සඳහන්ව ඇති බැවින් වෙසක් උත්සවය සඳහා 'බුදු මඟුල"Z යන්න යොදා ඇති බැව් පැහැදිලිය.

නුවර යුගයේ මෙරට පැවැති උත්සව හතරක් ගැන සඳහන් වන අතර, එහි පළමුවැන්න වෙසක් උළෙල ලෙස දක්වා ඇත. තවද වෙසක් උත්සවය පැවැත්විය යුතු ආකාරය දක්වමින් සම්මත නීති මාලාවක්ද එකල පැවැති බව මහාවංසයෙන් තහවුරු වෙයි. වෙසක් උත්සවය ආරම්භ කළ යුත්තේ කෙසේද? ආරම්භ කරන්නේ කුමකින්ද? යනු එම නීති මාලාවට අන්තර්ගත වී තිබෙන්නට ඇතැයි, විශ්වාස කල හැකිය.

කෝට්ටේ යුගයෙහි කළ වෙසක් උත්සව ගැන කරුණු විරලය. බුද්ධ පූජා පැවැත්වූ රජවරුන් රාශියක ගැන සඳහන් වෙතත් ඒවා වෙසක් උත්සවදැයි නිර්ණය කිරීම අපහසුය. කොළඹ යුගයේදී ඉතා විචිත්‍ර අන්දමින් වෙසක් උත්සවය සිදු කෙරිණි. මේ තාක් ලංකාවෙහි වාර්ෂිකව වෙසක් උත්සවය සිදු කෙරෙයි. වෙසක් පොහොය දා සිද්ධස්ථාන වැඳීම සඳහා වන්දනාවේ යන සැදැහැවතුන් උදෙසා සංග්‍රහ කිරීම පිණිස යම් යම් පුද්ගලයෝ සමිති වශයෙන් සංවිධානය වී රටපුරා දන්සල් පවත්වති. තවද මෙකල සිදු කෙරෙන වෙසක් උත්සවයන් හිදී 'වෙසක් තොරණ' හා 'වෙසක් පහන් කූඩු' කෙරෙහිද ඉතා උසස් ස්ථානයක් හිමි වෙයි.

## බුද්ධඝෝෂ හිමියන්...

45 වන පිටුවෙන්

6 සංඛෙපට්ඨකථා
7 අන්ධකට්ඨකතා

බුද්ධඝෝෂ හිමියන් සිය අටුවා ලියන ලද්දේ මේ සියලු අටුවා කියවා බලාය. මහා අට්ඨකථාව ඇතුළත් කරමින් මහාපච්චරී හා කුරුන්දි අටුවාවේ අඩංගු නිගමනයන්ගේ අදහස් බැහැර නොකරමින්, පැරණියන්ගේ මත අන්තර්ගත කරමින් එම අටුවාවල භාෂාව සකස් කොට වැඩි විස්තර තැන් කෙටි කරමින් පාලි රීතිය අනුගමනය කොට මේ අටුවාව ලියමියි සමන්තපාසාදිකා සංඥාපනයේ සඳහන් කොට ඇත.

'සම්බ අට්ඨකථාසු වුත්තං' සියලු අටුවාවල කියා තිබේ. 'අයං පන මේ අත්තනො මති' මේ මගේ මතයයි කියා කරුණු ඉදිරිපත් කිරීම ඉතාම ශාස්ත්‍රීය ක්‍රමවේදයකි.

බුද්ධඝෝෂ හිමියන්ගේ කීර්තිය පිළිබඳව සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ පමණක් නොවේ. බුරුම බසින් ලියා ඇති බුද්ධඝෝෂුප්පත්ති නම් කෘතියේ උන් වහන්සේ පිළිබඳ තොරතුරු දක්වා ඇත. උන් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණියේ ක්‍රි. ව 412-434 අතර කාලයේදීය.

උන්වහන්සේ දඹදිවදී ලියන ලද ඤාණෝදය නම් ප්‍රකරණය දුටු රේවත නම් තෙර නමක් සිංහල දේශයේ අටුවා ඇති බැවින් එහි ගොස් මෙහි ඇති අඩුපාඩු දැන ගන්නැයි ප්‍රකාශ කිරීම නිසා ලංකාවට පැමිණි බවත් සඳහන් වේ. දඹදිවින් පිටත්ව මහානාම රජුගේ කාලයේ දී ලක්දිවට පැමිණ අනුරාධපුර පධානඝරයෙහි විසූ සංඝපාල තෙරුන්ගෙන් අටුවා ඉගෙන ගත්තේය.

උන්වහන්සේට අටුවා ලියන්නට මහාවිහාරික භික්ෂූන් වහන්සේලා බාර දුන්නේ සංයුක්ත නිකායේ එන 'අන්තෝ ජටා බහි ජටා' යන ගාථාවන් දෙක සඳහා පර්යේෂණ ග්‍රන්ථයක් ලියා එහි සාර්ථකභාවය දැකීමෙන් පසුවය. ග්‍රන්ථාකරයක් වූ දුරසංකර පිරිවෙනෙහි වැඩ සිට මගධ බසට පෙරළන ලද අටුවා සියලුම ථෙරවාදී නිකායික ආචාර්යවරයෝ සියල්ල නිවැරදි යැයි පිළිගත්හ. විසුද්ධි මාර්ග සන්නය ලියූ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා ඒ බව සිය කෘතියේ සඳහන් කොට ඇත. බුද්ධඝෝෂ හිමියන් විසින් පාලියට නැඟීමෙන් පසු හෙළටුවා විනාශ කරන්නට ඇතැයි යන්න බෞද්ධ ජනතාව මුළා කරන්නට බහුශ්‍රුත පණ්ඩිතයන් විසින් ඉදිරිපත් කරන ලද අදහසකි. එය ඔවුන්ගේ ඔළුවට එන්නට ඇත්තේ 19 වන ශත වර්ෂයේ ක්‍රිස්තියානිකාර යුරෝපීයයන් ලියූ මෙතෙක් නොදුටු පොත් දැකීමෙනි.

ධම්පියා අටුවා ගැටපදය ලියන ලද්දේ 10 වන ශත වර්ෂයේ 5 වන කාශ්‍යප රජු විසිනි. එහි හෙළටුවාවෙන් ගත් බව කෙළින්ම ප්‍රකාශ කළ පාඨ ගණනාවක් දක්නට ලැබේ. මේ ඒ සඳහා නිදසුන් කීපයකි. හෙළටුවාවෙහි අප්පමාදම්හි පණ්ඩිතා හජෙඨ යුහු (79) සාමාවතියා වත්ථු නාම පඨමං යි මහ අටුවාවෙහි ආ බැවින් (80) සාලිත්තක සිප්පෙ පයත් හකුරු ලන සිප්හි හෙළටුවාවෙහි, ලකුණ්ටකොවදාන කිරස්ස නැමි යනු හෙළටුවාවෙහි (148) රහදො වදාන කිද ආවාටහි නම් හෙළටුවාවෙහි (149) ඒ වන විට හෙළටුවා නොවී නම් කාශ්‍යප රජතුමා ඒවා සොයා ගත්තේ කෙසේද එතුමාට දිවැස් තිබුණා යැයි සිතිය නොහැකිය. මේ කොටස්වල භාෂා ලක්ෂණ විමසා බලන විට පැරණි යුගයේ භාෂා ලක්ෂණ ඒ ආකාරයෙන්ම දක්නට ලැබේ.

ගුරුළුගෝමීහුගේ ධර්මප්‍රදීපිකාවේ ථූප කථාව සහ දෙවන පරාක්‍රමබාහු රජුගේ විසුද්ධි මාර්ග සන්නයේද හෙළටුවාවලින් ගත් පාඨ සඳහන් වේ. ඒ අනුව ගුරුළුගෙ ් මින්ටද හෙළටුවා දක්නට ලැබී ඇත.

බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණෙන විට අටුවා ග්‍රන්ථ තිබුණේ මහා විහාරයේ පමණක් නොවේ. එහි පිටපත් ලංකාවේ බොහෝ තැන්වල තිබූ බවට සාධක ඇත. කුරුන්දි අටුවාව අයත් වූයේ දකුණේ කුරුඳු විහාරයටය. මහාපච්චරී අටුවාව ලියුවේ මාතර නිල්වලා ගඟේ සිටය. උත්තර විහාරට්ඨ කථා අයත් වූයේ උතුරු මූල විහාරයටය. බණ්ඩාරගම රමුක්කන විහාරයේ ඇති 2 වන ශත වර්ෂයට අයත් සෙල්ලිපියක එහි විසූ භික්ෂු නමක් සංයුක්ත නිකාය සජ්ඣායනා කළ බව සඳහන් වේ. අනුරාධපුර සමයේ ලංකාවේ ප්‍රබල මහ පිරිවෙන් පහක් විය. ඒ මහා විහාරය අභයග ිරිය, සිතුල්පව්ව, තිස්සමහා විහාරය හා මුහුදු මහ විහාරයයි. ත්‍රිපිටක අටුවාවන්හි ශ්‍රී ලංකාවේ විහාරස්ථාන ගණනාවක සිදු වූ පුවත් සඳහන් කොට ඇත. රෝහණවාසී මහාතිස්ස, සිතුල් පව්ව අසල වසාල නුවර (සං. නි. අටුවාව) මාගම තිස්ස මහා වෙහෙර, (දී. නි. අ) තිස්ස මහාරාමයේ තලගුරු වෙහෙර (අං. නි. අ) කස්සක ලෙන (ම. නි. අ) දකුණු ගිරි විහාරය (ම. නි. අ) මුලුප්පලවිහාරය, සෝණ විහාරය, රුහුණේ ගාමණ්ඩවාල විහාරය, අම්බලන්තොට කරඹගල ලෙන (වි. මා) සිතුල්පව්වේ නිංකපොත්ථක පධානඝරය (ම. නි. අ) යන විහාර පිහිටා තිබුණේ දකුණේය. කැලණි මහ වෙහෙර (විභංග අටුවා) ලක්දිව බටහිර දිග මල්වැස්සා විහාරය, වට්ටාරම මණ්ඩලාරාමය, (අං. නි. අ) පැවතියේ බටහිර ප්‍රදේශයේය. කඩරොද කොරණක වෙහෙර, (වි. මා) ලෙනගල විහාරය (දී. නි. අ) රට මැද ය. කාලදීඝවාපී විහාරය, මුතියංගණ විහාරය නැගෙනහිරය. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ මාතලේ අලු විහාරයේය. මේවා විහිදී තිබුණේ ලංකාව පුරාම බැවින් මේ සියලු අටුවා පොත් සොයා පුළුස්සා දමන්නට තරම් ඉඩක් බුද්ධඝෝෂ හිමියන්ට වූහයි සිතීම සිහි බුද්ධියෙන් තොර වූවකුගේ මනඃකල්පිතයක් පමණි. එවැනි හපන්කමක් කරන්නට තරම් ආක්‍රමණශීලී බලපුළුවන්කාරකමක් උන් වහන්සේට තිබිය හැකිද? බලවත් රජෙකුගේ ආධාර උපකාර ලැබුණු බවටද කිසිදු සාධකයක් නැත.

ත්‍රිපිටකයේ හෝ අටුවාවේ කිසිදු තැනක හින්දු මතවාද දක්නට නොලැබේ. එහි ඇත්තේ හින්දු මතවාද නිර්දය ලෙස විවේචනය කිරීමය. යඤ්ඤ, කන්දරක, තෙවිජ්ජ, අස්සල්ලායන මධුර ආදි සූත්‍ර ඒ සඳහා නිදසුන්ය. බුදුන් වහන්සේ බුද්ධත්වය ලැබීමට පෙර චතුර්වේදය පිළිබඳව පාරප්‍රාප්ත ව සිටියහ. උන් වහන්සේ තම අදහස් සනාථ කිරීම උදෙසා බොහෝ දුරට හින්දු මතවාද උපයෝගි කර ගත්හ. වෛදික ආගම්වල එන යාග. බ්‍රාහ්මණ, වේද, යඤ්ඤ, උපෝසථ, අත්ත ආදී වචනවලට පවා නව අර්ථකථන දුන්හ.

ත්‍රිපිටකයේ ඇතැම් තැනක හින්දු කථා ඇත. ඒවා දක්වා ඇත්තේ පෙර වූ කථාවක් කියමියි භාරතයේ පැවැති කථාන්තරයකි. සංයුක්ත නිකායේ සක්ක වග්ගයේ දක්නට ලැබෙන සුරාසුර යුද්ධ හින්දු ආගම නොව භාරතීය ජනප්‍රවාදයන් ය. බුදුන් වහන්සේ ඒවා දේශනා කළේ ජනතාව යහමගට ගැනීම උදෙසාය. විමානවත්ථුවල ඇති කථා හින්දු ආගමේ දැක්වෙන දේවසංකල්පවලට කිසිසේත් සමාන නොවේ.

බුදුන් වහන්සේ හින්දු දෙවියන් පිළිබඳව සඳහන් කළ තැන් බොහෝය. එහෙත් ඒ එකදු තැනකවත් හින්දු ආගමේ උගන්වන ලෝකය මවන, පාලනය කරන සුවිශේෂ ශක්තීන් ඇති පුද්ගලයන් ලෙසින් නොවේ. රාගයෙන්. දෝෂයෙන්, මුළාවෙන්, ඊර්ෂ්‍යාවෙන්, මානයෙන් පිරුණු, සා පිපාසාවෙන් ශාරීරික වෙහෙසීමෙන් පීඩා විඳින කොටසක් ලෙසිනි. බුද්ධඝෝෂ හිමියන් හින්දු ආගමික කුමන්ත්‍රණකරුවකු නම් කිසිසේත් මෙවැනි කථා ලියනු ඇතැයි සිතිය නොහැකිය. ත්‍රිපිටකයේ පමණක් නොව අටුවාවෙහි ද දක්වා ඇත්තේ ඒ ආකාරයෙන්මය. අධර්මිෂ්ඨයකු වූ වසවර්ති මාරයාද දේව පුත්‍රයෙකි. නිර්වස්ත්‍රව සිටින කුණු ගඳ ගහන දෙවිවරුද මේ අතර සිටියහ.

# කවිය සහ කවියා...

44 වන පිටුවෙන්

බැණ වදින විට කෝපය හඟවන රිත්මයක් ඒ වචනවල ගැබ්ව ඇත. "කවද්දෝ ඉතින් දකින්නේ" යයි මළගෙදරක ගැහැණියක් විලාප නගයි. ශෝකාන්විත රිත්මයක් ඇගේ ස්වරයෙහි කා වැදී ඇත.

මෙවැනි කියමනක ඇත්තා වූ රිත්මය ඉන් පළවන හැඟීම සමග ඉතා තදින් එකිනෙකට සම්බන්ධ වී ඇත. එබැවින් ඒ රිත්මය ජීවමත්ය. සමුද්‍රඝෝෂාදී වෘත්ත අනුව ලියන ලද පැරණි පද්‍යයන්හි මේ ලක්ෂණය දැක්ක හැක්කේ කලාතුරෙකිනි. එහිදී වෘත්තය වූ කලී අර්ථය සමඟ තදින් සම්බන්ධ නොවූ ඉන් පරිබාහිරව පවතින කන පිනවන ශබ්ද මාලාවක් පමණය. එය, එකම පලා පෙත්ත යාන්ත්‍රික ලෙස නැවත නැවත ගලපා සාදා ගනු ලබන මෝස්තරයක් වැන්න. පැරණි වෘත්ත සියල්ලම පාහේ මෙසේ යාන්ත්‍රික ලෙස පිටින් අලවා ඇති සැරසිලි මෝස්තරයි. මෝස්තරය කවියෙන් ගලවා ඉවත් කළ විටද බොහෝ අවස්ථාවලදී අර්ථරසයට හානියක් නොවේ. එමෙන්ම ඉන් ලැබෙන ලාමක ශබ්ද රසය, අර්ථයක් නැතිව නිකම් 'නනන නනන නනන නානා' යි කීවිටද ලැබේ.

මෙවැනි ලාභ වෘත්තවලට ඇබ්බැහි වූවනට කථා ව්‍යවහාරයෙහි ඇති රිත්මය, රිත්මයක් සේ නොපෙනෙන්නට පුළුවන. එය හැඟීමත් සමඟ දැඩිව කා වැදී ඇති නිසා, අදහසත් සමඟම ගෙන මිස, ඉන් වෙන්කොට ගෙන වටහාගත නොහැක. හැඟීමෙන් යුතුව කවිය කියවන විට රිත්මය ඉබේම හසුවනු ඇත.

එකිනෙකාගේ ශක්තිය අනුව අඩු වැඩි වශයෙන් කවියක අර්ථ රසය පාඨකයෝ විඳිති. එහෙත් ශබ්ද රසයේදී පමණක් කොයි කාටත් පහසුවෙන් හසුවන පිළුණු වෘත්ත කීපයකට කවියා සීමා වෙයි. ශබ්ද රසයට පමණක් මෙසේ විශේෂ පහසුකම් සැලසීමට හේතුව කුමක්ද? මේ න්‍යාය අනුව නම් කොයි කාටත් එක සේ රස විඳිය හැකි ලාභ අදහස් පමණක් කවියට නැංවිය යුතුය. ශබ්ද රසයට මෙසේ විශේෂ තැනක් දීම, කවියාද සිතා මතාම අර්ථ රසය ඔබා තබා ශබ්ද රසය ඉස්මතු කරලීමකි.

කථා ව්‍යවහාරයේ ඇති රිත්මය වෘත්තයක් මෙන් අදහසින් වෙන්කළ නොහැක. එමෙන්ම එහි ශබ්ද රසය විඳිය හැක්කේද (අර්ථ රසය මෙන්ම) එකිනෙකාගේ පෞද්ගලික ශක්ති ප්‍රමාණය අනුවය. මෙසේ බලන විට සිංහලෙන් කවි ලියන්නෙකුට කෙළ සුවහසක් වුවත් විරිත් (විරිත් යන නම මෙතැනට නොගැලපේ) නිපදවා ගැනීමට බැරි කමක් නැත.

මෙසේම පිට රටකින් ගන්නා කාව්‍ය ආකෘතියක් වුවද මෙරටට උචිත පරිදි සකස් කර ගත හැක. නිසඳැස් කවි ක්‍රමය, සිංහල සම්ප්‍රදායයට අනුකූල නැතැයි කියනු පිණිස ඇතැමුන් ග්‍රන්ථ පවා රචනා කර ඇත. නිසඳැස් කවිය සිංහල කවි සම්ප්‍රදායයට කා වැදී නැතැයිද, එය දැනට අවසාන වී ඇතැයිද ඔවුහු කියති.

එසේ නම් ඒ බව කීම සඳහා ග්‍රන්ථයක් රචනා කිරීමට වෙහෙසුණේ ඇයි? ඒ ගැන ග්‍රන්ථයක් ලිවීමට සිදු වූයේ එය දැනටමත් සිංහල කාව්‍ය සම්ප්‍රදායයට කා වැදී අවසාන බැවිනි. නිසඳැස් කවි ක්‍රමය, පිටරටින් මෙරටට ගොඩ බෑවා වූද, අපේ කවි සම්ප්‍රදානයට ප්‍රතිවිරුද්ධ වූද එකකැයි ඔවුහු කියති. මේ කියමන මඳක් විමසා බැලිය යුතුය.

කවිය යනු ගීතය නොවේ. මෙය මෙසේ කී විට කවුරුත් ඒ බව එකහෙලා පිළිගනිති. එහෙත් අප කවි හැටියට හඳුන්වන ඇතැම් රචනා කවි නොව ගීත ප්‍රබන්ධ බව කිවහොත් ඒ බව පිළිගැනීමට මඳක් පසුබට වනු ඇත. එහෙයින් මේ ප්‍රශ්නය ගැන තවදුරටත් සිතා බැලිය යුතුය. කවිය යනු ගීතයමද? එසේ නැත්නම් නව කථාව හා කෙටි කථාව මෙන් එකිනෙකට වෙනස් සාහිත්‍යාංග දෙකක්ද?

පද්‍යයේ ඉතිහාසය දෙස බලන විට මුලින්ම ගී කාව්‍ය හමුවෙයි. මේ ගී සම්මත විරිත් අනුව බඳනා ලද ඒවායි. එහෙයින්ම ඇද පැද ගායනා කළ හැකිද වේ. ඊළඟට හමුවන ආඝාත සහිත සිව්පද විරිත් මීටද වඩා පහසුවෙන් ගායනා කළ හැක.

එළි සම කොට සිව් පදයෙහිම විරාම ස්ථාන එක සමාන කොට, සම මාත්‍රා ඇතිව රචනා කිරීම සිව් පද කවියෙහි සාමාන්‍ය ලක්ෂණයයි. ඒ නිසා ඒ කවි වඩා මිහිරි ලෙසද ගායනා කළ හැක.

සංගීතය හා ඒ අනුව ගැයූ ගී ගැන පැරණි සාහිත්‍යයෙහි බොහෝ විට සඳහන්ව ඇත. එහෙත් නිදසුන් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා ඒ ගී අප අතර නොමැති බැවින් ඒවායේ ආකෘතිය ගැන යමක් කීමට නොහැක. මීට අමතරව ජන ගී ජන ගායනා යන නම්වලින් හැඳින්වෙන ජනකවි සම්භාරයක්ද අපට ඇත්තේය. ඇතැම් විට පැරැන්නන් ගී නමින් හඳුන්වන ලද්දේ මිහිරි වෘත්ත අනුව පබදිනා ලද පද්‍යම විය හැක.

පොත පත හා උගතුන් දුලබ වීම නිසා කනින් අසා කවි රස විඳි යුගයක, මිනිසුන්ගේ අවධානය රඳවා ගැනීමේ උපක්‍රමයක් හැටියට, පැරණි කවියා විසින් ළඳිරි වෘත්ත උපකාර කර ගන්නා ලද බව කලින් කියන ලදී. මේ නිසා සංගීතයත් කවියත් අතර දැඩි සම්බන්ධයක් අතීතයේ සිට පැවතිණි. කවියේ ගීතමය ස්වභාවයක් තිබිය යුතු බව මෑතක් වනතුරු ම කවීහු පිළිගත්හ. නූතන කවීන්ගෙන් ඇතැමකු තම පද්‍ය රචනා සඳහා යොදා ඇති ගංගාවේ ගීතය, ධීවරී ගීතය, පාදඩ ගීතය යනාදී මාතෘකාවලින්ම මෙය පැහැදිලි වෙයි.

කවියා මෙන්ම ගීත රචකයා කරන්නේද අත්දැකීම් මගින් තම සිත පහළ වූ හැඟීම් වචනයෙන් කියා පා එමගින් රසයක් ඉපිදවීමය. කවිය මෙන්ම ගීතයද සාහිත්‍ය කෘතියකි. උගතුන්ගේ හා සාහිත්‍ය විචාරකයන්ගේ අවධානය තවමත් හරිහැටි යොමු නොවුවද උසස් ගීත සාහිත්‍යයක් දැනටමත් මෙරට පහළ වී ඇති තනි ගීත වශයෙන් පමණක් නොව ග්‍රන්ථ වශයෙන්ද මේ සඳහා සාධක ඉදිරිපත් කළ හැක. ආචාර්ය සරච්චන්ද්‍රගේ සිංහබාහු නාටකය එක් නිදසුනකි. හින්දුස්තානි තනුවලට සිංහල වචන යොදා ගීත තනා ගැනීම කලකට ඉහතදී මෙරට පැවති ක්‍රමය විය. දැනුදු එය ඇතැම්විට කෙරේ. සමුද්‍රඝෝෂාදී සම්මත විරිතක් අනුව කවි ලියන තැනැත්තා කරන්නේද එවැනිම ක්‍රියාවකි.

කවියේදී වඩා වැදගත් වන්නේ අර්ථ රසයයි. ඒ සඳහා අවශ්‍ය වන්නේ අදහස හා බැඳුණු සරල රිත්මයක් පමණි. කවියේදී මෙන් නොව ගීතයේදී සංගීතයත් අදහසත් එක සේ වැදගත්ය. සම්මත වෘත්තවලින් ලැබෙන ශබ්ද රසයද උසස් සංගීත රසයක් නොවේ. ගීතයේදී උසස් සංගීත රසය සාහිත්‍ය රසය සමඟ සම්මිශ්‍රණය වෙයි. සංගීතයත් සමඟ හවුල්ව, වෙනම සාහිත්‍යාංගයක් හැටියට දියුණු වීමට ගීතයට ඉඩ හැරී කවිය සංගීතයෙන් වෙන් විය යුතු කාලය පැමිණ ඇත. එවිට කවියද ස්වාධීන ලෙස දියුණුව කරා යනු ඇත.

ජාතික චිත්‍ර කලාවක් දේශීය සංගීතයක් හා දේශීය කාව්‍ය සම්ප්‍රදායක් ගැන කතා කරනු නිබඳව අසන්නට ලැබේ. දේශීයත්වය යනු පිටරටින් ආ පළියට යමක් ප්‍රතික්ෂේප කිරීම විය නොහැක. හැරත් යමකට දේශීයත්වයක් ලැබෙන්නේ ආකෘතිය වැනි සුළු දෙයක් නිසා නොව, ඒ ආකෘතිය තුළට කා වැදී ඇති හරය නිසාය.

ගතින් සිතින් සිංහල වූවකු කලා කෘතියක් නිර්මාණය කරන කල ඔහුගේ අධ්‍යාත්මයෙන් බිංදු මාත්‍රයක් කලා කෘතියට කා වදී. දේශීය සුවඳ වහනය වන්නේ එකී අධ්‍යාත්ම බිංදුවෙන් මිස ආකෘතියෙන් නොවේ. ආකෘතිය වුවද දේශයට සරිලන පරිදි සකස් වන්නේ එවැන්නකු අතිනි. සම්ප්‍රදාය යනු කුමක්ද? පද්‍ය සාහිත්‍යයේ අතීතය දෙස බලන අපට මුලින්ම ගී කාව්‍ය හමුවෙයි. සිංහල පද්‍ය සම්ප්‍රදාය යනු ගී කාව්‍යයද? එසේ නම් ඉන් පසුව එළි සම පද්‍ය ලියූ සන්දේශ කවියාත් ඉනුත් පසුව එළු සිලෝ ප්‍රශස්ති වෘත්ත ගන්ධි රචනා ආදිය ලියූ කවීනුත් සම්ප්‍රදායට පටහැනි ලෙස ක්‍රියා කර ඇත.

අන් හැම දෙයක්ම මෙන් සම්ප්‍රදායද නිතිපතා වෙනස් වන බව පිළිගැනීම මීට වඩා නුවණට හුරුය. සාහිත්‍යයේ විවිධත්වයක් මෙන්ම ජීවයක්ද දක්නට ලැබෙන්නේ මේ වෙනස්වීම නිසාය.

පැරණි කවිය රනබරණ පැළඳ සිටින රදළයකු වැන්න. ජන කවිය චීත්ත රෙද්දක් හා ඔපනැලි හැට්ටයක් ඇද සිටින ගැමි ලියක් මෙනි. නූතන කවිය ගමේ හැදී වැඩී චාම් ඇඳුමින් සැරසී කොළඹ කාර්යාලයක වැඩට එන තරුණියක මෙන් විය යුතු යැයි මට සිතේ. ඈ ගැමි ලිය මෙන් ග්‍රාම්‍ය නැත. කුරුඳුවත්තේ ගැහැණියකගේ විකාර විලාසිතාද ඈ පිළිකුල් කරයි. ගමේ හොඳ ගතිගුණ ජන්මයෙන් ඈට උරුම වී ඇත. නගරයේ හොඳ ගතිගුණ ආශ්‍රයෙන් ඈ ලබා ඇත.

ශබ්දාලංකාරය සඳහා යොදනු ලබන වෘත්ත අනුප්‍රාස එළිවැට ආදියෙන් මෙන්ම අර්ථාලංකාරය සඳහා යොදනු ලබන උපමා රූපක සංකේත ආදියෙන්ද කවියට ලැබෙන ප්‍රයෝජන ඉතා අල්පය. අදහස යන්තමින් අලංකාර කිරීම හැර ඒ අදහස වඩා ඉදිරියට ගෙන යාමට ශක්තියක් මේවාට නැත. බොහෝ විට සිදුවී ඇත්තේ අදහස අලංකාර වීම නොව ඊට ප්‍රතිවිරුද්ධ දෙයය.

තර සර සුනෙර යන යෙදුම් ගනිමු. එක් මානසික ස්වභාවයක හැඳින්වීමට තවත් මනඃකල්පිත දෙයක් උපමාවට ගැනීම විහිලුවකි. අප කිසිවකු සුනෙර දැක නැත. ඒ ගැන අසා ඇත්තේද පණ්ඩිතයන් තුන් හතර දෙනෙකු පමණය. ඒ තුන් හතර දෙනා හැරුණු විට ඉතිරි අයට සුනෙර යන වචනය කිසිම හැඟීමක් නූපදවයි. ඔවුන්ට සුනෙර කීවත් රනෙසු කීවත් දෙකම එකය.

වත සඳ යනු තවත් ප්‍රකට යෙදුමකි. ගැහැණියකගේ මුහුණ සඳට උපමා කරන්නේ ඒ වස්තූන් දෙකෙහි කුමන සාදෘශයක් නිසාද? මුහුන වටකුරුය. එහෙත් සඳ තරම් වට නැත. මුහුණ සෞම්‍යය. සඳ සෞම්‍ය නැත. ඉර මෙන් චණ්ඩ නැතත් සඳේ ඇත්තේද සැර කාන්තියකි. පියකරු මුහුණක ඇති සෞම්‍ය ගුණය සඳේ නැත. මුහුණ සුන්දරය. සඳද සුන්දරය. එහෙත් ඒ සුන්දර වස්තූන් දෙක දැකීමෙන් ඇති වන හැඟීම් ඒකාකාර නැත. එකම අරුත් ඇති හිස සහ ඔලුව යන වචන දෙක ඇසීමෙන් පවා ඇති වන්නේ හැඟීම් දෙකකි. එකිනෙකට වෙනස් වස්තූන් දෙකක් ගැන කියනුම කවරේද?

එමෙන්ම නවීනයාට පැරැන්නාට පමණ සඳ සුන්දර නැත. පුවත්පත්හි පළ වන සඳේ ඡායාරූප නවීනයා දැක තිබේ. ඒවා කළු ගොරෝසු දූවිලි තට්ටුය. සඳ දකින නවීනයාට මේ දූවිලි තට්ටු මතක් වෙයි. රුසියානුන් හා අමෙරිකානුන් අතර පවතින තරගයද ගගාරින් වැලන්ටිනා තෙරෙස්කෝවා ආදීන්ද ලයිකා නමැති බැල්ලද මතක් වෙයි. සඳ නිසා ඇතිවන සුන්දර හැඟීම මේ මතකයන් විසින් මැඩ පවත්වනු ලැබේ.

උපමා රූපකවලින් කෙරෙන්නේ වරක් කී දෙයම නැවත කීමකි. සංකේතයද විටෙක එසේ කරයි. විටෙක වරක් කී දේට ඉඳුරාම වෙනස් දෙයක් කියයි. වරක් කී දේ නැවත කීම අවශ්‍ය නැත. වරක් කී දේට ඉඳුරාම වෙනස් දේ එකම කවියකින් කීමද සුදුසු නැත.

මෙයින් අදහස් වන්නේ මේ කාව්‍ය ප්‍රයෝග මුළුමනින්ම බැහැර කළ යුතු බව නොවේ. ඇතැම් අවස්ථාවකදී ඒවායින්ද කවියකුට ප්‍රයෝජන ගත හැක. මුලින් කීවාක් මෙන් අදහස වැඩි දියුණු කර වඩා ඉදිරියට ගෙනයාමේ ශක්තියක් මේවාට නැත. කවියක අගය වැඩි වන්නේ උසස් රසයක් ඇති අදහස්වලින් පිරුණු තරමටය. මෙවැනි බාහිරාලංකාර නැතිවද රසවත් කවි නිර්මාණය කිරීමට බැරිකමක් නැත.

කලුගලින් බැඳි බිත්තියකට වැලි මැටි ගා සුණු පිළියම් කරන්නාක් මෙන් කවියක අදහස වටා මේ බාහිර අලංකාරද යොදනු ලැබේ. වැලි මැටි ගා සමකොට සුණු පිළියම් කරන්නාක් මෙන් කවියක අදහස වටා මේ බාහිර අලංකාරද යොදනු ලැබේ. වැලි මැටි ගා සමකොට සුණු පිරියම් කළ බිත්තිය ඔප මට්ටම්ව අලංකාරවත් වෙයි. එසේ සුණු පිරියම් නොකොට රළු කළු ගල් කැබලිම මනා සේ අහුරා සිමෙන්ති බදාමෙන් කුස්තුර බැඳ ගොඩ නඟා ගත් බිත්තියකට ඊටම ආවේනික අලංකාරයක් ඇත. මුල් අවස්ථාවේදී අලංකාරය ඇති වූයේ ඔප මට්ටම නිසාය. දෙවන අවස්ථාවේදී රළු බව නිසාය. එමෙන්, යටකී කාව්‍ය ප්‍රයෝග නැතිව අදහසම නිසි පරිදි සංවිධානය කිරීමෙන් ද උසස් කවියක් නිර්මාණය කිරීමට පුළුවන.

ලස්සන ගැහැනියකට පළඳනාවලින් එතරම් පලක් නැත. අවලස්සන ගැහැනියක් ලස්සන කිරීමටද පළඳනාවලට බැරිය. ලස්සන ගැහැනියකගේ වුවද අවලස්සන ගැහැනියකගේ වුවද අධ්‍යාත්මික සුන්දරත්වයක් තිබිය හැක. උසස් කවියක තිබිය යුත්තේද එවැනි අධ්‍යාත්මික සුන්දරත්වයකි.

කවියකට වස්තු වන්නේ කිසියම් ජීවිත සත්‍යයකි. සත්‍යය පමණ සුන්දර දෙයක් තවත් නොමැති බැවින් ඊට එතරම් පළඳනා අවශ්‍ය වෙතැයි සිතිය නොහැක. කවියෙන් ජීවිතයට ලැබෙන ප්‍රයෝජනයද මෙයමය. කවියේ රස විඳින පාඨකයා ඒ අතර ජීවිතය පිළිබඳ කිසියම් සත්‍යයක්ද ඉබේම වටහා ගනී.

ජීවිතය පිළිබඳව ඔහුගේ අවබෝධය පුළුල් වෙයි. යමකුගේ ජීවිතාවබෝධය පුළුල් වන තරමට ඔහු යහපත් පුද්ගලයෙක් වෙයි. කවියේ මුඛ්‍ය පරමාර්ථය රස වින්දනය වුවද, අනියම් වශයෙන් සදාචාර සංවර්ධනය පිළිබඳ පරමාර්ථයද මෙසේ ඉෂ්ට වෙයි.

කවියා සමාජය දෙස බලන්නේ සාමාන්‍ය මිනිසා බලන මට්ටමට වඩා ඉහළින් සිටගෙනය. සාමාන්‍ය මිනිසා නොදකින ජීවිත සත්‍යයක් දැකීමට, ඔහුට හැකිවන්නේ එබැවිනි. එමෙන්ම නිර්මාන ශක්තිය දියුණු වන තරමට අධ්‍යාත්මික වශයෙන්ද ඔහු දියුණු වෙයි.

අවුකන බුදු පිළිමය නෙළූ ශිල්පියා තුළ කොතරම් ඉවසීමේ ශක්තියක් තිබෙන්නට ඇද්දැයි අපට සිතා ගත හැකිය. කවියක සංයමය පහළ වන්නේ කවියාගේ ආත්ම සංයමය ඊට බලපාන බැවිනි.

ගැහැනියක් දරුවකු බිහි කිරීමෙන් ලබන ප්‍රීතිය වැනි ප්‍රීතියක් කවිය බිහි කිරීමෙන් කවියා ලබයි. එපමණින් ඔහුට සෑහීමට පත් විය හැකි නම් එය ඉතා අගනේය. කවිය, ධනය හෝ කීර්තිය උපයන වෙළෙඳ භාණ්ඩයක් කරගන්නා ප්‍රමාණයට කවියා පිරිහෙයි. වෙළෙඳ භාණ්ඩයක් වඩා අලෙවි වන්නේ වඩා ප්‍රචාරය කළ තරමටය. මේ නිසා තම කෘතිය ප්‍රචාරය කර ගැනීමටත් අනුන්ගේ කෘති හෙලා දැකීමටත් ඔහු ඉබේම පෙළඹෙයි.

නූතන කවිය දියුණු කිරීමට අවංකව වෙහෙසෙන කවියකුට ගමන් කිරීමට සිදුවී ඇත්තේ දුෂ්කර මාර්ගයකය. සාහිත්‍යය පිළිබඳව, ප්‍රසිද්ධ පුද්ගලයන්ගෙන් පළ වන ඇතැම් දුර්මත ප්‍රතික්ෂේප කිරීමට තරම් තියුණු ඇසකුත්, කීර්තිය හෝ වෙනත් ලාභාපේක්ෂාවන් කෙරෙහි ගිජු නොවන තරම් අපිස් සිතකුත්, ඇනුම් බැණුම් මැද නව මං සොයා යා හැකි තරම් ආත්ම ශක්තියකුත් එවැන්නකුට වුවමනාය.


Tilake


Tilake


Tilake


Tilake


Tilake


Tilake




Tilake




Tilake


Tilake






Tilake


Tilake


Tilake


Tilake


VENUE - TORONTO
2300 Pharmacy Ave,
Scarborough,
ON M1W 1H8
MAY 25
2019
SATURDAY
AT 6.30 PM
TORONTO
ප්‍රියා සූරියසේන
නිරෝෂා විරාජිනී
රවීන් කනිෂ්ක
වසන්ත සංධ්වනිය
තුන් පරපුරක ගී ස්වර දැහැන
බුද්ධික
ලීඩ් ගිටාර්
ප්‍රශාන්
බේස් ගිටාර්
රුක්ශාන්
වයලීන්
ඩිලාන්
බෙර
ඉන්දික
ඩ්‍රම්ස්
සංගීතය
සුරේශ් මාලියද්ද
ප්‍රමුඛ වාද්‍ය වෘන්දය
$ 40 – SOLD OUT
$ 50 – Limited Seats Available
FOR TICKETS
ASOKA PINNADUWAGE ( 416 270 5874 )
CHAMILA JAYATILAKE ( 416 880 4874)
BADRA DE ZOYSA ( 416 496 1092)
RASAHANTHI HETTIARACHCHI ( 416 432 1532)
TICKETS
$40
$50
$100

# BEYOND YOUR EXPECTATIONS !

**Residential & Commercial**

## Real Estate

The Diamond Realty Inc Brokerage

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



**5% DOWN ? No problem!**

**I will guide you through obtaining your DREAM HOME through my proven system!**

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE

RE/MAX HALL OF FAME

President's Club

RE/MAX 100% Club Award — 2016, 2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award — 2015, 2012

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

## Call me Today !

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

# Gamini Abeysinghe. ABR, CNE

## Real Estate Sales Representative

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

## www.gaminiabeysinghe.com

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements




දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

**Gamini - 416 822 2789**

# ඔබේ නිවසටම දසත Dasatha

**සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.**

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to **Dasatha Publications**

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada

Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

**www.dasatha.com**